ADVENTURE SERIES

Enid Blyton's

# THE CIRCUS ADVENTURE

එනිඩ් බ්ලයි(ටි)න්ගේ යොවුන් නවකතාවේ පරිවර්තනය

# බෝර්කෙන් මාලිගාවේ වික්‍රමය



ළමා වසර තිළිණයකි

කුමාර සිරිවර්ධන

KUMARA SIRIWARDANA

එනිඩ් බ්ලයි(ට)න්ගේ THE CIRCUS OF ADVENTURE
යොවුන් නවකතාවේ පරිවර්තනය

# බොර්කෙන් මාලිගයේ
# වික්‍රමය

## බෝර්කෙන් මාලිගයේ වික්‍රමය

© කුමාර සිරිවර්ධන

ප්‍රථම මුද්‍රණය : 2006
පිටු සැකසුම් : කුසලා ලක්මාලි
පිටකවරය : පවර සුජිත්
මල් : 2396
මිල : රු. 150 යි.
මුද්‍රණය හා ප්‍රකාශනය :
'මල්පියලි' ප්‍රකාශකයෝ (පුද්ගලික) සමාගම,
දංකොටුව.
බෙදාහැරීම :
'මල්පියලි' පොත් මැඳුර, මරදාන.



එනිඩ් බ්ලයි(ටි)න්ගේ THE CIRCUS OF ADVENTURE
යොවුන් නවකතාවේ පරිවර්තනය

# බෝර්කෙන් මාලිගයේ වික්‍රමය

පරිවර්තක:

**කුමාර සිරිවර්ධන**

මල්පියලි ප්‍රකාශකයෝ (පුද්) සමාගම
දංකොටුව. 031-2258444

## පරිවර්තකගේ වෙනත් කෘති:

### ✿ අසංක්ෂිප්ත පරිවර්තන

- බ්‍රික්ස්ටන් විදියේ අභිරහස
- අග්‍රාවේ මහා නිධානය
- දඩයම් බල්ලා
- කහ පැහැති මුහුණ
- නාවික ගිවිසුම
- යාපා පටුනේ සිට කොළඹට පා ගමනක්
- ලංකාව - ආදම්ගේ පාරාදීසය
- මාටින් රැට්ලර්
- සොහොයුරියෝ
- මළ නොමළ මිනිසා
- සෝරෝ - කළු අවතාරය
- ෂීනා - රණවිරු කුමරිය
- සුදු අලියා
- සාතනයේ සිටුවරයා
- සාතන්ගේ සලකුණ

### ✿ සංක්ෂිප්ත පරිවර්තන

- අයිවන්හෝ
- අදිසි මිනිසා
- කාල සංචාරකයා
- දූපතක හුදකලාව
- සයුර මැද කැරැල්ල

### ✿ නවකතා

- කුලගෙය කඳුළක්
- කල්පෙකට පස්සේ



# පෙරවදන

විසිවන සියවසේ ලොව විසූ වඩාත් සාර්ථකම ළමා කතා රචිකාවිය ලෙස එනිඩ් බ්ලයි(ට්)න් හැඳින්වීමේ වරදක් නැත. 1897 වසරේ අගෝස්තු මස 11 දා එංගලන්තයේ අගනුවර වූ ලන්ඩනයේදී උපත ලද ඇය මිය ගියේ 1968 වසරේදීය. වසර 71 ක සිය ජීවිත කාලය ඇතුළත එනිඩ් බ්ලයි(ට්)න් විසින් රචනා කොට මුද්‍රණය කෙරුණු ළමා පොත් සංඛ්‍යාව හයසියයක් පමණ වන බව පැවසෙයි.

එමෙන්ම ඇය ලොව විසූ වේගවත්ම ලේඛිකාව ලෙස ද සැලකෙයි. අන්තර් ජාලයේ ඇය ගැන සඳහන් වෙබ් පිටුවකින් පැවසෙන්නේ එනිඩ් දිනකට වචන දස දහසකට වඩා ලියූ බවය.

ඇය අතින් ලියැවුණු බොහෝ කතා 'ළමා වික්‍රමයන්' ය. නොඑසේ නම් ළමයින් විසින් විසඳනු ලැබූ 'අභිරහස්' ය. ඇගේ කතා බොහොමයක් සමීප වූයේ ළමයින්ගේ සිහින වලටය. කෙසේ වෙතත් මුල් කාලයේ දී එනිඩ් බ්ලයි(ට්)න්ගේ ළමා කතා නිර්දය විචාරයට ලක් විය. මෙම විචාරයන්ගෙන් වැඩිපුර කියැවුණේ ලේඛිකාව තම කෘති හරහා ළමයින් පමණට වඩා නිදහස් සහ දඟකාර ලෝකයකට කැඳවාගෙන යන්නට උත්සාහ දරන බවය.

එනිඩ් ලියුවේ ළමා නවකතා පමණක් නොවේ. ඇය අතින් ළමා ගීත, ළමා කවි සහ ළමා නාට්‍ය පවා ලියැවිණි. එමෙන්ම ඇය ළමා සඟරා මෙන්ම ළමා සමාජ ද පවත්වාගෙන යන්නට මූලික වූවාය.

වරෙක වේගවත්ම ලේඛිකාව ලෙස නම් දුරුව ද එනිඩ්ගේ ජීවිතයේ අවසාන කාලයේ ඇගේ ලිවීමේ වේගය අඩාල වූ බව පැවසෙයි. ඒ අය ඇල්ෂෙයිමර් රෝගයට ගොදුරු වූ නිසාවෙනි. එනිඩ් බ්ලයි(ට්)න්ගේ ළමා කෘති ලොව පුරා ප්‍රකට වී ඇති අතර ඒවා විවිධ භාෂාවනට ද පරිවර්තනය වී තිබේ.

'බෝර්කෙන් මාලිගයේ වික්‍රමය' යන නමින් සිංහලයට පරිවර්තනය වී ඇත්තේ එනිඩ් ලියූ 'ද සර්කස් ඔෆ් ඇඩ්වෙන්චර්' නමැති කෘතියයි. මෙය ඇය අතින් ලියැවී ඇත්තේ 1952 වසරේදීය.

නිවාඩුව ගත කරන්නට පිටිසර පළාතකට යන ළමයින් පස් දෙනෙකු ගැන මෙම කතාවෙන් කියැවෙයි. ඒ අතරින් එක් ළමයෙකු රජ කුමරකු බව අනෙක් ළමයින් සිව් දෙනා දන්නේ නැත. ඒ බව දැනගත් වහා ඔවුහු පැහැර ගැනීමකට ලක් වෙති. විදෙස් රටකදී තමන් ද බේරී රජ කුමාරයා ද බේරා ගන්නට ඔවුන් දරන උත්සාහය මෙම කතාවෙන් කියැවෙයි.

එනිඩ් බ්ලයි(ට)න්ගේ මෙම කෘතිය සිංහලට පරිවර්තනය කිරීමට අප පෙළඹුණේ 'මල්පියලි' ප්‍රකාශන අධිපති ඇ. ලයනල් ද සිල්වා මහතාගේ උනන්දු කිරීම මත බව අප සඳහන් කළ යුතුය. කවදත් මේ රටේ ළමා පරපුර වෙනුවෙන් අගනා කෘති ලබා දෙන්නට වෙර දරන ඇ. ලයනල් සිල්වා මහතාට පළමුව අපගේ ස්තුතිය පිරිනැමෙයි.

මෙහි පරිගණක අක්ෂර සංයෝජනය සහ පිටු සැලසුම් සිදු කළ කුසලා ලක්මාලි ට ද, පිටකවරය මනාව නිර්මාණය කළ පවර සුජිත් ට ද අපගේ නොමඳ ස්තුතිය හිමි වෙයි. මෙම ග්‍රන්ථය මනාව මුද්‍රණය කර දුන් 'මල්පියලි' මුද්‍රණාලයේ සියලුම සේවක මහත්ම මහත්මීන් හට ද අප ස්තුති කළ යුතුය.

**කුමාර සිරිවර්ධන**

42 A / 259,
බණ්ඩාරනායක පුර,
කලපලුවාව,
රාජගිරිය.
011-2792518



# අත්වැල


| | | |
|---|---|---|
| 1. | පාසලෙන් නිවසට | 9 |
| 2. | ගුස්ටාව් ගේ පැමිණීම | 18 |
| 3. | ගුස්ටාව් සහ කිකී | 27 |
| 4. | බ්‍රොක්ලෙටන් බලා | 36 |
| 5. | ගල් වළ ළඟ නිවහන | 45 |
| 6. | ගුස්ටාව්ට සෙම්ප්‍රතිශ්‍යාව | 53 |
| 7. | පුදුම සිතෙන නිවේදනය | 62 |
| 8. | බිල් කරුණු පැහැදිලි කරයි | 70 |
| 9. | අමුත්තන් දෙදෙනා | 78 |
| 10. | හදිසි පණිවිඩයක් | 87 |
| 11. | රාත්‍රියේ සිදුවීම් | 95 |
| 12. | හසුවීම | 103 |
| 13. | අතිරේක මඟියා | 111 |
| 14. | ජැක් තනිවෙයි | 119 |
| 15. | සිතියමෙන් ප්‍රයෝජන | 128 |
| 16. | සර්කස් කණ්ඩායම සමඟ | 137 |
| 17. | බෝර්කෙන් වෙත ළඟා වෙයි | 145 |
| 18. | මාලිගාව ඇතුළට | 153 |
| 19. | මැදියම් රැයේ වික්‍රමය | 160 |
| 20. | රහස් මඟ | 168 |
| 21. | සැලැස්ම | 175 |
| 22. | බේරී පලා ඒම | 183 |
| 23. | වලසුන්ගෙන් පරෙස්සම් වන්න | 191 |
| 24. | අලුත් උදෑසනක් | 199 |
| 25. | හදිසි සෝදිසියක් | 207 |
| 26. | වෙලෙන්දාගේ වෑන් රථය | 214 |
| 27. | විමතිය සහ සැලැස්ම | 222 |
| 28. | නැවතත් බෝර්කෙන් මාලිගයට | 229 |
| 29. | සිටුවරයා දණින් වැටෙයි | 236 |
| 30. | රජතුමා සැරදේවා ! | 243 |

# 1. පාසලෙන් නිවසට

නිහඬව තිබූ නිවස තව දුරටත් නිහඬ වූයේ නැත. නේවාසික පාසලේ සිට ආපහු නිවසට පැමිණ සිටි ළමයින් සිව්දෙනා තම ට්‍රන්ක පෙට්ටි අවුස්සමින් එකිනෙකා සමග මහ හඬින් කතා කරමින් සිටියහ. කිකී නමැති ගිරවා ද මහත් උද්යෝගයෙන් මේ ඝෝෂාවට හවුල් වූයේ උස් හඬින් කෑ ගසමිනි.

''ඇලී නැන්දේ ! අපි ආවා'' ජැක් කෑගැසුවේය. ''නිස්සද්ද වෙන්න කිකී, ඔයාගේ කෑගැහිල්ල නිසා මගේ කෑගැහිල්ල මටවත් ඇහෙන්නේ නැහැ''

''අම්මේ ! ඔයා කොහේද?'' ඩිනා කෑගැසුවාය. ''අපි ගෙදර ආවා''

ඇගේ මව සිනාමුසු මුහුණින් යුතුව ඉක්මන් ගමනින් එතැනට ආවාය. ''ඩිනා.. පිලිප්.... මං හිතුවෙ නැහැ ඔයාලා මේ තරම් ඉක්මනට ඒවි කියලා. හොඳයි... හොඳයි.... ලූසී ඈන්, ඔයා ලොකු ළමයෙක් වෙලා. හ්ම්.... පිලිප් ඔයා අසනීප වෙලා ඉඳලා වගේ..''

''මම දන්නෙ නැහැ ඇයි කියලා'' විරිත්තු පිලිප් කනිංහැම් මහත්මියට හාදුවක් දුන්නේය. ''ඉස්කෝලෙ කෑම මට අල්ලන්නෙ නැහැ. මං ඒවා කන්නේ නැහැ''

''පරණ කතාවමයි'' කනිංහැම් මහත්මිය සිනාසෙමින් පැවසුවාය. ''හලෝ කිකී. මෙයාලගෙන් අහන්න සැප සනීප කොහොමද කියලා''

''සැප සනීප කොහොමද?'' ගාම්භීර ආකාරයෙන් විමසූ ගිරවා සිය වම් පය ඉදිරියට දිගු කළේ අතට අත දෙන්නට මෙනි.

''අලුත් දක්ෂකමක්'' ජැක් කීවේය. ''ඒ වුණාට වැරදි පාදය. ඒක පරණ වැරැද්දක්. ඔයාට තවම වම් පයයි දකුණු පයයි වෙන් කරලා අඳුනාගන්න බැරිද?''

''වම - දකුණ, වම - දකුණ, වම - දකුණ'' කිකී එකවර තාලයක් ඇතිව කියන්නට පටන් ගත්තේය. ''වම - දකුණ. වම ....''

''කිකී.. ඔය හොඳටෝම ඇති'' යැයි පවසමින් ජැක් කනිංහැම් මහත්මිය වෙත හැරුණේය. ''කොහොමද බිල්? කෝ එයා?''

''ඔයාලාව පිළිගන්න බිල් මෙහේ ඉන්න තමයි බලාපොරොත්තු වුණේ'' බිල්ගේ බිරිය වූ කනිංහැම් මහත්මිය පැවසුවාය. ''ඒත් අද උදේ එයාට හදිසි දුරකථන ඇමතුමක් ලැබුණා. ඒ එක්කම එයා කාර් එකට නැඟලා ලන්ඩනය පැත්තට වේගයෙන් ගියා''

ළමයින් සිවුදෙනාගේ මුහුණුවලින් පළ වූයේ නොසතුටකි.

''අපි පාස්කු නිවාඩුවට ගෙදර එනකොට තමයි එයාට වැඩ වැඩි වෙන්නේ'' ලුසී ඈන් පැවසුවාය. ''බිල් හැම වෙලාවෙම රහස් වැඩ කටයුතුවල පැටලෙන්නේ වැරදි වෙලාවලදී''

''මෙහෙමයි'' කනිංහැම් මහත්මිය සිය හඬ අවදි කළාය. ''මම හිතනවා එයා දැන් කොයි මොහොතක හරි, අද එනවාද නැද්ද කියා මට කියන්න දුරකථන ඇමතුමක් දේවි කියලා''

''අම්මේ, අපි මෙතැනදිම ට්‍රන්ක පෙට්ටි අස් කරලා අපේ බඩු මුට්ටු උඩ තට්ටුවට ගෙනියන්නද?'' ඩිනා විමසුවාය. ''අපේ කාමරයට ට්‍රන්ක පෙට්ටි හතරම ගෙනිච්චොත් හෙල්ලෙන්නවත් ඉඩ නැතිව යාවි''



''හිස් ට්‍රන්ක පෙට්ටි දෙකක් පහළ තට්ටුවේ තියලා අනික් දෙක උඩට ගෙනියන්න'' ඩිනාගේ මව පැවසුවාය. ''හෙට අපි නිවාඩුවට විනෝද ගමනක් යනවා. අපි හැමෝම එකට''

එය ළමයින්ට අලුත්ම ආරංචියක් විය. ඔවුහු වහා කනිංහැම් මහත්මිය වටා නටන්නට පටන් ගත්හ. ''ඔයා ඒ ගැන ලියුමක නිකමටවත් ලියලා තිබුණේ නැහැ. කොහාටද අපි යන්නේ? ඇයි ඔයා ඒ ගැන අපට කලින් නොකීවේ?''

''ඒක මගේ අදහසක් නෙවෙයි. බිල් ගේ අදහසක්'' කනිංහැම් මහත්මිය පැවසුවාය. ''බිල් හිතුවා වෙනසකටත් එක්ක එහෙම ගමනක් යන එක හොඳා කියලා. එයා ඒ ගමන සූදානම් කරන කොට මටත් පුදුම හිතුණා.''

''සූදානම් කළා? අපට එකම එක වචනයක්වත් නොකියා'' පිලිප් කීවේය. ''මම කියන්නේ..... හදිස්සියේ බිල් එහෙම දෙයක් කළා? ඒක පුදුමයක්. එයාව අන්තිමට මුණගැහුණේ අපිව බලන්න ඉස්කෝලෙට ආ වෙලාවේ. එදාත් එයා කතා කළේ පාස්කු නිවාඩුවෙදි සති හතරක් තිස්සේ ගෙදරට වෙලා අපි මොනවාද කරන්නේ කියලායි''

''විනෝද ගමනක් යොදා ගැනීම ගැන ඒ තරං පුදුම වෙන්න දෙයක් නැහැ'' ඔහුගේ මව පැවසුවාය. ''ඔයාලා දන්නවනේ තාත්තට ඔය වගේ අදහස් හදිස්සියේ පහළ වෙනවා''

''හොඳයි දැන් අපි කොහාටද යන්නේ?'' විස්කෝතු භාජනයට හොට දමන්නට සූදානම් වූ ගිරවා කිකී පසෙකට තල්ලු කරමින් ජැක් විමසුවේය.

''බ්‍රොක්ලෙටන් කියන තැනට'' කනිංහැම් මහත්මිය පැවසුවාය. ''පුංචි, හුඟාක් නිස්සද්ද තැනක්. රට මැද්දේ තියෙන්නේ. ඔයාලා හැමෝම එතැනට කැමති වේවි. දවස පුරා ඕනෙම දඟ වැඩක් එතැනදි ඔයාලට කරන්න පුළුවනි''

''බ්‍රොක්ලෙටන්'' පිලිප් පැවසුවේය. ''බ්‍රොක් කියන්නේ වලස් වර්ගයකට අයිති පොළොවේ බිල හාරන බැජර් කියන සතාට. එහේ බැජර් සත්තුන් ඉන්නවාද දන්නේ නැහැ. මට උන් ගැන ඉගෙන ගන්න හැම වෙලාවකම වුවමනා වුණා''

''එහෙම නං යන තැන ගැන ඔයාට සතුටු වෙන්න පුළුවනි'' ඩිනා පැවසුවාය. ''මට තේරෙන විදියට අපි ඒ යන තැන ගැන හරියට දන කියා ගන්නත් කලින් ඔයා බැජර් සතුන් දෙතුන් දෙනෙක් ඔයාගේ හුරතල් සතුන් කර ගනීවි වගේ''

''බැජර් කියන්නේ ආදරේ හිතෙන සතුන් ජාතියක්'' පිලිප් කීය. ''පිරිසිදු වගේම අමුතු ගති සිරිත් තියෙන සතුන්.....''

ලුසී ඈන් උපහාසයෙන් මෙන් සිනාසුණාය. ''අපොයි දෙවියනේ... උන් ඔයාට යාන්තමටවත් සමාන නැහැ වගේ පිලිප්''

''ඔය විදියට බාධා කරන්න එපා. ඒ වගේම බොළඳ කතා කියන්නත් එපා'' පිලිප් පැවසුවේය. ''මම කිය කියා හිටියේ බැජර් සතුන්...''

එහෙත් පිලිප්ට සවන් දෙන්නට කිසිවකුට අවශ්‍ය වූයේ නැත. විමසිය යුතු ප්‍රශ්නයක් ජැක් සතුව තිබිණි. ''බ්‍රොක්ලෙටන්වල හොඳ කුරුලු ජාති එහෙම ඉන්නවාද දන්නෙ නැහැ. බ්‍රොක්ලෙටන් කොහේද තියෙන්නේ? මුහුද කිට්ටුවද?''

ජැක් කුරුල්ලන් ගැන දැඩි උනන්දුවක් හා ආසාවක් දැක් වූ අයෙක් විය. කොතරම් දිගු වේලාවක් කුරුල්ලන් දෙස බලා සිටිය ද ඔහුට ඇතිවීමක් නම් නොවීය. එසේ බලා සිටීමෙන් ඔහු මහත් සතුටක් ලැබුවේය. කනිංහැම් මහත්මිය ඔහු දෙස බලා සිනාසුණාය.

''ජැක්, ඔයායි ඔයාගේ කුරුල්ලොයි, පිලිප්, ඔයායි ඔයාගේ බැජර් සතුනුයි. මම කුරුල්ලන් ගැන මොකුත් දන්නෙ නැහැ. මොකක්ද උන්ගේ තියෙන විශේෂය? උන් කුරුල්ලෝ. එච්චරයි. මම හිතන්නේ එහෙමයි. දැන්.... මේ ට්‍රන්ක පෙට්ටි දෙක උඩ තට්ටුවට ගෙනියමු. බ්‍රොක්ලෙටන් යනකොට ගෙනියන්න ගැනු ළමයින් දෙන්නාගේ ට්‍රන්ක පෙට්ටි මෙතැනම තියමු..... ජැක් .... පිලිප්..... ඒ ට්‍රන්ක පෙට්ටි ඔයාලගේ ඒවා වගේ නාස්ති වෙලා නැහැ''

''අපි මේවා අස්පස් කරලා ඉවරවෙන කොට අපට කන්න මොනවා හරි තියේවි නේද?'' පිලිප් විමසුවේය. ''මට එපා වෙලා දන්නවානේ ඉස්කෝලෙ බෝඩිමේ කෑම...''



''හරි... හරි... මං ඔය කතා මීට කලින් අහලා තියෙනවා පිලිප්'' ඔහුගේ මව පැවසුවාය. ''තව පැය බාගෙකින් ඔයාට හොඳ රසවත් දිවා ආහාර වේලක් ලැබේවි.... ඔව් ඔයා කැමතිම සීත කළ මස්, සලාද, තම්බාපු බෝංචි එක්ක තක්කාලි සෝස්. තව.. අර්තාපල්...''

''කොච්චර හොඳද?'' සැවොම එකවර පැවසූහ. කිකී තනි පයින් සිටගෙන අනෙක් පය දිග හැරියේය.

''හොඳයි'' කිකී කිවේය. ''හොඳයි. හොඳ කෑමක්. හොඳ ළමයෙක්. හොඳයි''

ට්‍රන්ක පෙට්ටි අස් කිරීම ඇරඹිණි. ''කිකී ගෙදර එන අතරතුර කෝච්චියේදී හොඳ වැඩක් කළා.'' ජැක් පැවසුවේ දෑතට ඇඳුම් පොදියක් බදාගෙන ඒවායින් අඩක් බිමට ද හලා ගනිමිනි. ''කිකී සීට් එක යටට ගියේ පරණ ටොෆි කොළ වගයක් එකතු කරන්න. වයසක මනුස්සයෙක් කෝච්චි පෙට්ටියට ගොඩ වෙලා වාඩි වුණා. ටොෆි කොළ එකතු කර කර හිටිය කිකීගේ පෙඳය කකුලේ වැදිලා ද කොහෙද ඒ මනුස්සයා පහත් වෙලා නැමිලා සීට් එක යට බැලුවා''

''එතකොටම කිකී මොන මොනවාදෝ කියාගෙන කියාගෙන ගියේ හරියට බල්ලෙක් බුරන්නා වගේ'' ලුසී ඈන් කොක් හඬලා සිනාසෙමින් පැවසුවාය. ''ඒ වයසක මනුස්සයා කොච්චර බය වුණාද කීවොත් වෙඩිල්ලක් වැදුණා වගේ පැත්තකට විසි වුණා''

''බැන්ග්...... බැන්ග්'' කිකී කෑ ගැසුවේය. ''පොප් - පොප්. කකුල් පිහගන්න. දොර වහන්න''

''ඔහ්..... කිකී ඔන්න ඔයාගේ තරච්චලේ ආයෙමත්'' කනිංහැම් මහත්මිය සිනාසෙමින් පැවසුවාය. ඇය වෙත පියඹා ආ ඌ තම හිස ඇගේ සුරත මත ඇතිල්ලුවේ බළලකු පරිද්දෙනි.

''ඔයා ඔහොම කරන හැම වෙලාවකම මට හිතෙන්නේ කිකී ඔයා කවදා හරි ඥාව් කියාවි කියලා'' ගිරවාගේ හිස පිරිමදිමින් කනිංහැම් මහත්මිය කීවාය.

ට්‍රන්ක පෙට්ටි අස්පස් කිරීම ඉක්මනින්ම අවසන් විය. එය කිසිසේත්ම අසීරු කාර්යයක් වූයේ නැත. කිලිටි ඇඳුම් සියල්ල ඒවා සඳහා වෙන් වූ බාල්දියක් ඇතුළට ගුලි කර දැමිණි. ඉතිරිවා අල්මාරිවල රාක්ක මත තැන්පත් කෙරිණි.

''හිතන්න බැරිද ඇයි මිනිස්සු ඇඳුම් පැළඳුම් අස්පස් කරන්න. මෙච්චර කරදර වෙන්නේ මොකටද කියලා?'' ජැක් විමසුවේය. ''කිකී... මගේ සාක්කුවෙන් ඔයාගේ ඔළුව අහකට ගන්නවා. කතා කරන්න බැරි විදියට ඔයාගේ හොට එකට ඇලෙනවාට ඔයා කැමති ද?''

කිකී ජැක්ගේ සාක්කුවෙන් හිස පිටතට ගෙන ජයග්‍රාහී හඬක් නඟමින් ඉවතට පියඹා ගියේය. ඌට ටොෆියක් හමු වී තිබිණි. ඌ එතැන් සිට මඳ වේලාවක් තමාටම කතා කරමින් වෙහෙස ගනු ඇත්තේ ටොෆිය වටා ඇති දවටනය ගලවා ගන්නටය.

''ටික වෙලාවක් කනක් ඇහිලා ඉන්න පුළුවන් වේවි'' ඩිනා සතුටින් පැවසුවාය. ''වෙලාවකට කිකී හරිම කරච්චලයක්''

''ඔයාත් ඒ වගේ තමයි'' පිලිප් එකවර පැවසුවේය. ඩිනා රවා ඔහු දෙස බැලුවාය.

''දැන් ඔය දෙන්නා රණ්ඩු අල්ලන්න ලෑස්ති වෙන්න එපා'' ජැක් පැවසුවේ අවවාදාත්මක ස්වරයකිනි. ''අද අපේ නිවාඩුවේ පළවෙනි දවස. හාහ්... අර බලන්න. ලූසී ඈන් උඩ තට්ටුවට යන්නෙ හැම පඩියකම මේස් කුට්ටම ගානෙ හල හලා''

දුරකථනය නාද වනු ඇසිණි. ''ඒ බිල් වෙන්නැති'' කනිංහැම් මහත්මිය දුරකථනය වෙත දිව ගියාය.

ඒ බිල්ය. දෙදෙනා අතර සංවාදය කෙටි වචන වලින් පිරී තිබිණි. ''ඔව්. නැහැ. හරි. මං බලන්නං. මම හිතනවා. නැහැ. කොහෙත්ම නැහැ. ඔව්. ඔව්. නැහැ. බිල් හරි. ඔව්. මං තේරුම් කරලා දෙන්නම්. හරි. රෑට එනවනේ. හරි. බායි''

''බිල් මොනවාද කීවේ?'' ලූසී ඈන් විමසුවාය. ''එයා ඉක්මනට එනවාද? මම එයාව ඉක්මනින්ම දකින්න ආසයි''



''ඔව්. හැන්දෑවෙ පනමාරට විතර බිල් ගෙදර ඒවි'' කනිංහැම් මහත්මිය පැවසුවාය. ඇගේ මුහුණේ එතරම් සතුටක් නොතිබිණි. යමක් පවසන්නට මුව විවර කළ ඇය දෙගිඩියාවෙන් මෙන් යළි මුව වසා ගත්තාය.

''අම්මේ... මොනවාද ඔයා කියන්න ගියේ? ''පිලිප් වහා විමසුවේය. ''මං තේරුම් කරලා දෙන්නම් කියලා ඔයා කියනවා අපට ඇහුණා. ඒ කාරණාව ද ඔයා අපට කියන්න ගියේ? මොකක් ද ඒ?''

''අනේ හිත රිදෙන දෙයක් නං කියන්න එපා'' ලූසී ඈන් කීවාය. ''බිල් අපි එක්ක යන්න එනවා. එහෙම නේද?''

''අපොයි ඔව්'' කනිංහැම් මහත්මිය පැවසුවාය. ''මං හිතන්නේ ඔයාලට ඒක ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. මෙහෙමයි. අපි එක්ක විනෝද ගමනට තවත් එක්කෙනෙක්ව එකතු කරගන්න බිල්ට ඕනෙ වෙලා තියෙනවා''

''කාවද?'' සියල්ලන්ම එකවර විමසූ අතර ඔවුන් ඇය දෙස බලා සිටියේ භීතියෙන් යුතුවය.

'' බිල්ගේ වයසක නැන්දා නෙවෙයිනේ?'' ඩිනා විමසුවාය. ''අනේ අම්මේ, ඔන්න නිතරම අපට හොඳට හැසිරෙන්න කියලා අවවාද දෙන කෙනෙක් එනවා කියලා විතරක් නම් කියන්නෙපා''

''නැහැ..... එහෙම කෙනෙක් නං නෙවෙයි'' ඇගේ මව කීවාය. ''මේ පුංචි පිරිමි ළමයෙක්. බිල්ගේ යාළුවෙකුගේ ඥාති පුතෙක්''

''අපි එයාව මීට කලින් අඳුනනවාද? මොකක්ද එයාගෙ නම?'' ජැක් විමසුවේය.

''ඒ ළමයාගෙ නම මට බිල් කීවේ නැහැ'' කනිංහැම් මහත්මිය පිළිතුරු දුන්නාය.

''ඉතිං ඇයි ඒ ළමයාට නිවාඩුවට එයාගේ ගෙදර යන්න බැරි?'' ඩිනා විමසුවේ නුරුස්නා සුලු ස්වභාවයකින් යුතුවය. ''පුංචි

පිරිමි ළමයින්ට මම කැමතිම නැහැ. මොනවටද අපේ විනෝද ගමනට අපි එයාව එකතු කරගන්නේ? සමහර විට එයා අපට මහ කරදරයක් වේවි. අපේ වැඩකටයුතු සේරම අවුල් කරාවි''

''නැහැ. නැහැ. එහෙම වෙන්නෙ නැහැ'' පිලිප් වහා පැවසුවේය. ''පුංචි පිරිමි ළමයි අපට ඉක්මනටම කීකරු වෙනවා. නැද්ද ජැක්? අපට ඉස්කෝලෙදි එයාලයි එයාලගේ ඉදිමිච්ච ඔළුයි එක්ක සැහෙන්න ගනුදෙනු කරන්න සිද්ධ වෙනවා. එයාලාව මට්ටු කරන්න. අපට කීකරු කරගන්න අපි හොඳට දන්නවා''

''ඒත් ඇයි එයා අපි එක්ක එන්නේ? ''ඩිනා නැවත වතාවක් විමසුවාය. ''එයාට ගෙයක් දොරක් නැද්ද?''

''ගෙයක් දොරක් තියෙනවා.... ඒත් එයා විදේශිකයෙක්'' ඩිනාගේ මව පිළිතුරු දුන්නාය. ''එයාව එංගලන්තයේ ඉස්කෝලෙකට එවලා තියෙන්නේ මෙහෙදි හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ගන්න. මම හිතන්නේ එයාගේ පවුලේ අයට වුවමනා වෙන්න ඇති එයා බ්‍රිතාන්‍යයේ පවුලක් එක්ක සති කිහිපයක් ජීවත් වෙලා අපේ ගෘහස්ථ ජීවිත ගැන අත්දැකීම් ලබා ගන්නවා දකින්න. ඒ වගේම මට හිතෙනවා බෝවෙන රෝගයක් වගේ මොකක් හරි කරදරකාරී වාතාවරණයක් දැනට ඒ දරුවාගේ ගෙදර ඇති කියලා''

''හරි....... එහෙම නං ඉතිං අපි එයාව සාදරයෙන් පිළිගනිමුකෝ'' සිය නිවසට යා ගත නොහැකිව දුකින් පසුවන කුඩා පිරිමි ළමයෙකු සිතින් මවා ගනිමින් තමන් ඔහු සනසවා රාත්‍රියේ නින්දට යවන ආකාරය ගැන ද සිතමින් ලුසී ඈන් පැවසුවාය. සමහර ගැහැනු ළමයින් මෙන් ඩිනාද කුඩා පිරිමි ළමයින්ට කිසිම කැමැත්තක් නොදැක්වූවාය. ''ළදරු කරත්තේ එයාව තියලා තල්ලු කරන්න. තෙමා ගත්ත රෙදි මාරු කරන්න. රෑට එයාව නලවලා නිදි කරවන්න. ඒ සේරම ඔයාම කරන්න.''

''මෝඩ කතා කියන්නෙපා ඩිනා. ඒ ළමයා ඔයා හිතන තරං පුංචි නැහැ'' ඇගේ මව කතිංහැම් මහත්මිය පැවසුවාය. ''අස්පස් කරලා ඉවරද? දැන් දවල් කෑම වෙලාව. යන්න ගිහිං මූණ අත පය හෝදාගෙන කොණ්ඩෙ පීරගෙන එන්න''



''අත් හෝදාගන්න. කොණ්ඩ පීරා ගන්න. කකුල් පිහදා ගන්න. නාහෙ සුද්ද කරගන්න'' කිකී කෑගැසුවේය. ''අත් පීරාගන්න. කොණ්ඩෙ සුද්ද කරගන්න. කකුල් හෝදාගන්න..... පීරාගන්න. හෝදා ගන්න.....''

''හ්ම්... මහේ කියවාගෙන යන්නෙපා කිකී. එක අතකට තිකංයැ ගිරවා වගේ කියවනවා කියන්නෙ'' ජැක් පැවසුවේ සිනාසෙමිනි. කිකී පියඹා විත් ජැක්ගේ උරහිස මත වසා මහත් ආදරයෙන් ඔහුගේ කන සිය හොටෙන් අදින්නට පටන් ගත්තේය.

හදිසියේම සිහින් සීනු නාදයක් මුළුතැන් ගෙය දෙසින් ඇසිණි. එය විදුලි ලිපෙන් නැඟුණු හඬකි. එම හඬේ අරුත දන සිටි කිකී හඬ නඟමින් පියඹා ගියේ මුළුතැන්ගෙය දෙසටය.

''ජැක්..... කිකී තැම්බුණු අර්තාපල් සේරටම හොට ගහාවි'' කතිංහැම් මහත්මිය කෑගැසුවාය. ''ඉක්මන් කරලා යන්න''

එහෙත් එසේ පවසන්නට අවශ්‍ය වූයේ නැත. සිහින් සීනු නාදය නැඟෙනු ඇසූ වහා සියලු දෙනා දිවගොස් තිබුණේ මුළුතැන්ගෙය වෙතටය.

# 2. ගුස්ටාව් ගේ පැමිණීම

නිවසේ කිසියම් වෙනස්කමක් කර ඇත්දැයි දැනගනු සඳහා ද, ගෙළයනේ ඒ කෙළවරේ සිට මේ කෙළවර දක්වා ගවේෂණය කරමින් කුමන මල් වර්ග ඉවත් කර ඇත් ද, ආහාරයට සුදුසු යම් යම් දෑ වවා ඇත් ද (හොඳ වේලාවට ආහාරයට සුදුසු යමකට වූයේ සලාද කොළ පමණකි) යන්න දැක ගනු පිණිස ද කිකීට අලුත් කිකිළියන් සය දෙනා හඳුන්වා දෙනු පිණිස ද පස්වරුව ගත විය.

''අමුත්තන්ගේ කාමරයට අලුත් කාපට් එකක් දාලා'' ලූසී ඈන් පැවසුවාය. ''ඒ කාමරේ සිද්ධ වෙලා තියෙන එකම වෙනස්කම ඒකයි. මට නං සතුටුයි. ගෙදරට ආවාම ගෙදර වෙනස්වෙලා තියෙනවා දකින්න මම කැමති නැහැ. මං හිතන්නේ අර පුංචි ළමයාට නිදාගන්න දෙන්නේ අමුත්තන්ගේ කාමරය. එහෙම නේද ඇලී නැන්දේ?''

''ඔව්'' කනිංහැම් මහත්මිය පිළිතුරු දුන්නාය. ''මට ඒ කාමරය සූදානම් කරන්න මිනිත්තුවකට දෙකකට වඩා යන්නේ නැහැ. අනික් අය මිදුලේ. යන්න ගිහින් ඔයා කැමතිනං ඩැෆොඩිල් මල් කීපයක් කඩාගෙන එන්න. සාලෙ වාස් එකට ඒවා දාන්න අපට පුළුවන්''



ලූසී ඈන් එතැනින් පිටව ගියේ මහත් සතුටින් යුතුවය. පාසල් නිවාඩුවේ ඉදිරි දවස් හා ඒවායේ දී කරන කියන කටයුතු ගැන සිතන්නට වැය කෙරෙන පළමු දවස් කිහිපය ගෙවී යන්නේ ඉතාමත් සෙමිනි.

''ලූසී ඈන්. මෙහේ එන්න. බලන්න කිකී දිහාව'' ජැක් කෑ ගැසුවේය. ''බලන්න කිකී අලුත් කිකිළියන් ඉස්සරහා හැසිරෙන විදිය''

කිකිළියන් අසල වූ කණුවක් මත කිකී සිටගෙන සිටි අතර ඌ වටා කිකිළියන් රොක්ව සිටියේ මහත් ගෞරවයෙන් යුතුවය. ''කොක්....... කොක්... කොක්..'' කිකිළියෝ එකිනෙකාට පැවසූහ. එක් කිකිළියක සිය දෙපාවල හිරි ඇර තටු ගැසුවේ පියාඹන්නට සැරසෙනවා සේය. කිකී හිස ඇල කර එදෙස බලා සිට දෙපා හිරි ඇර අත්තටු ගසා ඉහළට නැඟී යළි බැස්සේ විස්මයට පත්ව සිටි කිකිළියන් අතරටය.

''ක්ලක්...... ක්ලක්..... ලක්..... අර්ර්ර්ර්ක්'' කිකී කිකිළියන් නැඟූ හඬ අනුකරණය කරන්නට තැත් කළේය. ''ක්ලක්..... ලක්... ලක්... ලක්.... අර්ර්ර්ර්ර්ක්''

''කොක්.... කොක්... කොක්....'' කිකිළියෝ සිය හඬ නංවමින් කිකීට ගෞරව දක්වමින් ඌ අසලටම රොක් වූහ. එක් කිකිළියක් සෙමෙන් කිකීගේ පසුපස පෙදයට කෙටුවාය.

එය කිකී ප්‍රකෝප කරවීමක් විය. බියපත් වූ කිකිළියන් වටා යමින් කිකී හඬ නැගුවේ අනතුරට පත් ගුවන් යානයක් පරිද්දෙනි. වහා දුවන්නට පටන් ගත් කිකිළියන් සිය කුඩුවට රිංගා ගත්තේ එකකුට පමණක් ඇතුළුවන්නට ඉඩ ඇති පටු දොරටුව අසල එක පොදියට පොරකමිනි. කිකී උන් පසුපස පියෑඹුවේ ද පෙර පරිදිම අමුතු හඬක් නංවමිනි. ජනේලයෙන් පිටතට හිස යොමු කළ කනිංහැම් මහත්මිය කෑ ගැසුවාය.

''ළමයිනේ ! කිකී ඔය විදියට කිකිළියන්ව බය කළොත් උන් කවදාවත් බිත්තර දමන එකක් නැහැ''

''කිකී කුඩුවට රිංගලා. ඌ දැනටමත් කිකිළියෝ බිත්තර දාන පෙට්ටිය උඩ ඉඳගෙන කිකිළියෝ වගේ බිත්තර දාන්න හදනවා'' ජැක් උස් හඬින් පැවසුවේය. ''කිකී එනවා එළියට''

කුඩුවෙන් පිටතට. ආ කිකී. දොර අසලට වී විමසිලිමත්ව යළි කුඩුව ඇතුළට එබී බැලුවේය. ''ක්ලක් ..... ක්ලක්.... ලක්.... ලක්... අර්ර්ර්ක්''

ඌ එතැනින් පියඹා විත් ජැක්ගේ උර මත වැසූ විට කිකිළියෝ මහත් සහනයක් ලැබුවා සේ එකිනෙකා දෙස බැලූහ. කුඩුවෙන් පිටතට ගොස් රවුමක් යන්නට තවමත් ආරක්ෂාව නැති ද?

''ආං අල්ලපු ගෙදර පූසා මේ වත්තට ඇවිත්'' ඩීනා පැවසුවේ අනතුරු අඟවන ස්වරයකිනි. ''යං බලන්න. ඌ මොකටද මෙහාට ඇවිත් තියෙන්නේ කියලා. ජැක්. මම හිතන්නේ කිකීව අල්ලාගන්න''

''බයවෙන්න එපා. පූසෙක් ළඟ පාතකට ආවොත් කිකී කෑගහනවා. හරියට බල්ලෙක් උඩබුරලන්නා වගේ'' ජැක් පිළිතුරු දුන්නේය. ''අපි ගිහිං බලමු. හරිතාගාරයට මොනවද අලුතෙන් එකතුවෙලා තියෙන්නේ කියලා''

එය හොඳින් හිරු පැයූ සුන්දර සන්ධ්‍යාවක් විය. ළමයින් සිවුදෙනා හොඳින් විනෝද වූ අතර, බිල් පැමිණෙන තුරු ඔවුහු මඟ බලා සිටියහ. බිල් පැමිණි විට පවුල සම්පූර්ණය. එහෙත්...... ඔව්. බිල් තමා සමඟ විදේශික පිරිමි දරුවා කැටුව පැමිණියහොත් පවුලට එක් අයකු වැඩිවනු ඇත.

''බිල් එනවාද කියලා බලන්න මම යනවා ගේට්ටුව ළඟට'' සවස තේ පානය කිරීමෙන් අනතුරුව ලුසී ඇන් දැනුම් දුන්නාය.

''අපිත් එනවා'' පිලිප් පැවසුවේය. ''හොඳ බිල්. අපේම වාසනාවට එයාට මේ දවස්වල රාජකාරියක් එහෙම නැත්තං හදිසි වැඩක් බාර වුණේ නැත්තේ. ඒ හන්දානෙ එයාට අපි එක්ක යන්න පුළුවන් වෙන්නෙ''



ඔවුහු ගේට්ටුව වෙත ගොස් මඟ බලා සිටියහ. කිකී මහත් උද්යෝගයෙන් යුතුව හිස ඉහළ පහළ වනමින් සිටියේය. බිල් පැමිණෙමින් සිටින බව ඌ හොඳින් දැන සිටියේය.

''බිල්..... බිල් ගෙවන්න'' කිකී කියැවිය. ''කෝ බිල්? බිල්. බිල් ගෙවන්න''

''ඔයා හරිම කරච්චලයක්'' ලුසී ඇන් ගිරවා ගේ හිසට ආදරයෙන් පහරක් දෙමින් පැවසුවාය. ''ඇත්තටම කරච්චලයක්''

''ඔයා වැඩ වරද්දාගත්තා'' ඩීනා කීවාය. ''අපි බිල් එනකං බලා ඉන්නවා. කිකී අලුත් වචනයක් අල්ලා ගන්නවා ඔයාගේ කතාවෙන්. ඕනෙ ඔට්ටුවක්''

''කරච්චලයක්.... බිල්. කරච්චල් බිල්'' කිකී කියවන්නට පටන් ගත්තේය. ජැක් උගේ හිසට තට්ටු කළේය.

''කිකී දැං ඕක නවත්තමු. අර කාරෙකක් එනවා. ඒ සමහරවිට බිල් වෙන්නැති''

එහෙත් එය බිල්ගේ මෝටර් රථය නොවීය. එම රථය ගේට්ටුව පසුකර මාර්ගයේ ඉදිරියට ඇදෙද්දී කිකී මෝටර් රථයක් මෙන් හඬ නගන්නට පටන් ගත්තේ. ''බ්රූම්...... බ්රූම්.... ප්‍රැප්.... ප්‍රැප්.... ප්‍රැප්''

ලුසී ඇන් යමක් දුටුවාය. ''ඈං..... බිල්'' ඇය කෑගැසුවාය. ''ලොකු කළු පාට කාරෙක. දිළිසෙන.... අලුත් කාරෙක.... බිල්..... බිල්''

ඇය නිවැරදි විය. ඒ බිල්ගේ මෝටර් රථයයි. එය ගේට්ටුව අසලට ළඟා වෙද්දී බිල්ගේ සිනාමුසු මුහුණ කවුළුවෙන් පිටතට ඇදිණි. ඔහු අසල අසුනේ කිසිවකු හිඳගෙන සිටියේය. ඒ විදේශික පිරිමි ළමයා ද?

රථය නවතා එහි දොර විවෘත කොට බිල් පිටතට බැස්සේය. ළමෝ සිවුදෙනා ඔහු වෙත දිව ගියහ. ''බිල්... හොඳ බිල්. කොහොමද ඔයාගේ සැප සනීප?''

''කරච්චල් බිල්'' තවත් හඬක් නැඟිණි.

''ඔහ්...... සුබ සන්ධ්‍යාවක් කිකී'' බිල් පවසද්දී ගිරවා පැමිණ ඔහුගේ උර මත වැසුවේය. ''නරකම නරක ගිරවෙක්. අහා.... ඔයාට හොඳ සිරිත් විරිත් ටිකක් ඉක්මනට උගන්නන්න වේවි''

මහත් ප්‍රීතියට පත් කිකිළියක මෙන් කිකී කෙකර ගෑවේය.

''දැන් මගේ උරිස්ස උඩ ඉඳගෙන බිත්තර දාන්න ලෑස්ති වෙන්න එපා. මොකද ඔයා කෙකර ගාන්නේ?'' බිල් විමසුවේය. ''ඩිනා කෝ අම්මා?''

''අර එන්නේ'' ඩිනා පිළිතුරු දුන් අතර කනිංහැම් මහත්මිය ගේට්ටුව වෙත දිව එමින් සිටියාය. බිල් ඇය අමතන්නට සූදානම් වන විටම අවධානය ලබා ගැනීමේ වුවමනාවෙන් මෙන් උස් හඬින් කිසිවකු කහිනු මෝටර් රථය ඇතුළතින් ඇසිණි.

''ඔහ්..... මට සම්පූර්ණයෙන්ම අමතක වුණා'' බිල් පැවසුවේය. ''මා එක්ක අමුත්තෙක් ආවා. මෙයාලාට කිව්වාද ඇලී?''

''ඔව්. මම කිව්වා'' කනිංහැම් මහත්මිය පිළිතුරු දුන්නාය. ''කෝ එයා? ඔහ්. කාරෙක ඇතුළේ. එයාට කතා කරන්න බිල්''

''එන්න මෙහාට'' බිල් පැවසුවේය. මදකට පෙර ඇසුණ කැස්සේ හිමිකරුවා පැවැති දැඩි නිහැඬියාව මධ්‍යයේ තමාට හැකි තරම් ආචාරශීලීව රථයෙන් බැස්සේය.

සියල්ලෝම ඔහු දෙස බැලූහ. විදේශික පෙනුමක් සහිත ඔහුගේ වයස අවුරුදු එකොළහක් පමණ වන බව පෙනිණි. තද කළු පැහැ ඔහුගේ හිසකේ පමණට වඩා දිගුව තිබිණි. හිසකේ මෙන්ම ඔහුගේ දෑස ද කළු පැහැ වූ අතර ගැහැනු ළමයින් සතු ඒවාට වඩා ගන ඇහි පිය ඔහු සතුව තිබිණි. එමෙන්ම ඔහු තව දුරටත් හැසිරුණේ ආචාරශීලී ආකාරයටය.

කනිංහැම් මහත්මිය වෙත ගිය ඔහු ඇය ඉදිරියට දිගු කළ සුරත අල්ලා ගත්තේය. සාමාන්‍ය සිරිත ලෙස එම සුරත අල්ලා සොලවනු වෙනුවට ඔහු හිස නමා ඒ සුරත සිපගත්තේය. කනිංහැම්



මහත්මියට සිනා නැඟිය නොහැකි වූ අතර ළමයි තිදෙනා ද විමතියෙන් බලා සිටියහ.

''දයාබර මහත්මිය. ඔබට මගේ ස්තූතිය'' විදේශීය උච්චාරණයක් සහිතව ඔහු පැවසුවේය.

''හ්ම්..... හරි'' කනිංහැම් මහත්මියගේ හඬෙහි වූයේ විමතිය මුසු වූ ස්වරයකි. අපි තේ එකක් බොමුද?''

ඊට පිළිතුරු දීමට පෙර තව දුරටත් තම ආචාරශීලීභාවය පෙන්වීමට පිරිමි ළමයා සූදානම් විය. ඩිනා වෙත ගිය ඔහු සිදුවෙන්නට යන්නේ කුමක්දැයි ඇය සිතාගන්නටත් පෙර ඇගේ සුරත ගෙන සිපගත්තේය. ගිරිය යටින් හඬක් නැගූ ඇය සිය සුරත වහා පසෙකට ඇද ගත්තාය.

''එපා.. එපා.'' ලූසි ඈන් කෑ ගසමින් තම සුරත පසුපසට කොට සඟවා ගත්තාය. ඔහු තම සුරත සිප ගන්නවාට ඇය අකමැති වූවාය. කෙතරම් පුදුම හැසිරීම් රටාවක් සහිත පිරිමි ළමයෙක් ද?

''ගුස්..... අපි අතට අත දෙනවා විතරයි. ඔයා දන්නවානේ'' ගැහැනු ළමයින් දෙදෙනාගේ මුහුණුවල වූ පෙනුම දැක තමාගේ සිතෙහි ඇති වූ කලබලය යටපත් කර ගන්නට තැත් කරමින් බිල් පැවසුවේය. ''ම්.. ම්... මේ ගුස්ටාව්ස් බැම්ලෙවෝ. ඇලී.. ගුස්ටාව් සති කිහිපයක් අපිත් එක්ක ඉන්නවා. ඔහුගේ මාමා මට කිව්වා ඔහු ගැන ඇහැගහගෙන ඉන්න කියලා''

ගුස්ටාව් බැම්ලෙවෝ යළි හිස නමා ආචාර කළ නමුත් කිසිවකුගේ හෝ අත් සිප ගන්නට උත්සාහ කළේ නැත. බිල් ළමයින් සිව් දෙනා ඔහුට හඳුන්වා දුන්නේය.

''ඩිනා...... ලූසි ඈන්... ජැක් සහ පිලිප්..... ම්... ම්... මම බලාපොරොත්තු වෙනවා ඔයාලා ඉක්මනටම හොඳ යාළුවන් වේවි කියලා''

ජැක් හා පිලිප් ගුස්ටාව්ට අතට අත දුන්හ. එසේ වුව ජැක් හා පිලිප්ගේ ඇස්වල වූයේ ගුස්ටාව් පිළිබඳ නොකැමැත්තකි. නුරුස්සනා සුලු බවකි. තමන් නිවාඩුව ගත කළ යුත්තේ මේ පුංචි විදේශිකයා සමඟද?

අතට අත දෙන හැම අවස්ථාවකම ගුස්ටාව් සිය සිරුර මඳක් නැමුවේය. ''අඳුනාගන්න...... ල්.. ලැබ්බීම ස් සතුටක්'' ඔහු කීවේය. ''මොකක්ද? ..... ම්... මේ කුරුල්ලාගේ නම්ම? ඔයියාලා උඹට... කියයන්නේ ....... මොක්කක්ද?''

''මේ.. කිකී... ගිරවා.'' ජැක් ආඩම්බරයෙන් යුතුව පැවසුවේය.

''ගුස් .... මේ කිකී, කිකී.. මේ ගුස්''

කිකී සුපුරුදු පරිදි අතට අත දෙන්නට තම වම් පය ඉදිරියට දිගු කළේය. ගුස්ටාව් විමතියට පත් වූ බවක් පෙනුණ ද ඔහුගේ ආචාරශීලී භාවය යාන්තමට හෝ වෙනස් වූයේ නැත. ඔහු තම සුරත කිකීගේ පාදය වෙත දිගු කළේය. කිකී වහා ඔහුගේ ඇඟිල්ලකට කෙටූ අතර ඔහු උස් හඬින් කෑ ගැසුවේය.

''කෑගහනවා.... කෑගහනවා'' කිකී පැවසුවේය. ''කකුල් දෙක පිහිගන්න.... නාසය පිරිසිදු කරගන්න..... දොස්තර මුණගැහෙන්න''

''ම්.... මගේ ඇඟිල්ලෙන් ලේ..... එ..... න්නවා'' හැඬුම් ස්වරයෙන් පිරිමි ළමයා පැවසුවේය. ''ලේ ..... එ..... න්නවා... බලන්න''

''දොස්තර මුණ ගැහෙන්න. උණ ගැනෙයි. දොස්තර මුණගැහෙන්න'' මහත් සන්තෝෂයෙන් මෙන් කිකී එක දිගට කියවූයේය. ගුස්ටාව් හදිසියේ වටහා ගත්තේ ඒ කතා කරන්නේ ගිරවා කියා ය. ලේ ගැලීම ගැන අමතක කර ඔහු ගිරවා දෙස පුදුමයෙන් බලා සිටියේය.

''එ.... ඒකා... ක්...... කතා කරනවා'' ඔහු විමතියෙන් යුතුව පැවසුවේය. ''ඒ... ඒකා කතා කරනවා... ගිරවා ම්... මගේ තුවාලෙ දැකලා.. ද්... දොස්තර..... ගාවට යන්නලු. මං මීට ක්.... කලින් කතා කරන ක් කුරුල්ලෙක් දැකලා න්... නැහැ''

''එන්න..... අපි යමු ගෙට. අපි ඔය ඇඟිල්ලට බේත් ටිකක් දාමු'' සිදු වූ සියල්ලෙන්ම වෙහෙසට පත්ව සිටි කතිංහැම් මහත්මිය පැවසුවාය.



''ඇඟිල්ල..... න් තුවාලයි'' ගුස් තම ඇඟිල්ලෙන් ගලන ලේ දෙස බලමින් පැවසුවේය. ඔහු හඬන්නට සැරසෙන බවක් පෙනිණි. ඉන්පසු ඔහු පැවසුවේ වඩාත් අමුතු කතාවකි.

''ම.. මේ කුරුල්ලා'' කිකී දෙස රවා බලමින් ඔහු පැවසුවේය. ''මෙකා..... ම් මෙකා ඉන්න ඕනෙ....... ක් කූඩුවක... ම්.... ම අණ කරනවා''

''ලොකු ඔළුවෙක් වෙන්න හදන්නෙපා'' විමතියට පත්ව මොහොතක් නිහඬව සිට ජැක් පැවසුවේය. ''යමු... ඇලි නැන්දේ... අපි ගේ ඇතුළට යමු. ගුස් ලේ ගලලා මැරිලා ගියාවේ''

එම බිහිසුණු සිතුවිල්ල සිතට ඇතුළු වූ වහා ගුස්ටාව් ගෙතුළට දිව ගියේය. අනෙක් අය සෙමෙන් ඔහු පසුපස ගමන් කළහ. කෙතරම් පුදුමාකාර පිරිමි ළමයෙක් ද?

''පිස්සු කොල්ලෙක්'' ඩිනා පහත් ස්වරයෙන් පැවසූ අතර අනෙක් ළමයි තිදෙන හිස් සලමින් ඒ අනුමත කළහ. ඒ සමඟම පසුපසින් නැගුණේ බිල්ගේ හඬය.

''හේ.... කවුරුවත් මට මේ බඩු මුට්ටු බාගන්න උදව් කරන්නේ නැද්ද?''

''ඔහ්.. බිල් සමාවෙන්න. අපට ඒ ගැන මතක් වුණේ නැහැ'' ජැක් ආපසු මෝටර් රථය වෙත දිව ආවේය. ''ගුස් හින්දා සේරම අමතක වුණා. ඇත්තටම එයා මොන ජාතිකයෙක් ද?''

''මිශ්‍ර ජාතිකයෙක් කියලායි මට හිතෙන්නේ. ''බිල් පැවසුවේය. ''එයාගේ පවුලේ අය ගැනවත් ගෙදර ගැනවත් කතා කළොත් එයාට දුක හිතිලා අඬන්න පුළුවන්. ඒ නිසා ඒවා ගැන එයා එක්ක කතා නොකර ඉන්න එක තමා හොඳ. මෙහේ පාසලක ඔහු ඉගෙන ගන්න එක හොඳා.... කොහොම වෙතත් මම පුළුවන් තරම් එයාව ඔයාලගෙන් ඈත් කරලා මා ළඟ තියාගන්න උත්සාහ කරන්නම්. මගේ මිත්‍රයාටත් මම පොරොන්දු වුණේ ගුස්ටාව් ගැන නිතරම ඇහැගහගෙන ඉන්නවා. එයාව පරෙස්සම් කරනවා කියලා''

''අපි ඔයාට උදව් කරන්නම් බිල්'' ලුසි ඇන් කීවාය. ''මං හිතන්නේ එයා ලැජ්ජාකාරයෙක්..... අපොයි එයා මගේ අත ඉඹිව් කියලා මං බය වුණා. ඉස්කෝලෙ ගැනු ළමයි මොනවා කියාවිද?''

''ඒගොල්ල ඒ ගැන දැනගන්න එකක් නැහැනෙ'' බිල් පැවසුවේය. ''ජැක් මේ බෑග් එක ගන්න. පිලිප් ඔයා මේ පෙට්ටිය ගන්න. ඔයාලව මෙහේදි ආයෙම දැකගන්න ලැබීම සතුටක්. හ්ම්.... කිකී..... දඩබ්බරයා. ඔයා කොහොමද කිවේ බිල් කරච්චලයක් කියලා''

''කරච්චලයක්. බිල් කරච්චලයක්'' සතුටින් කෑ ගැසූ කිකී පියඹා ගොස් බිල්ගේ උර මත වැසුවේය. ''බිල් හොඳයි..... හොඳයි.. හොඳයි...''

# 3. ගුස්ටාව් සහ කිකී

ගුස්ටාව් බැමිලෙවෝ ගැන වැඩි විස්තර දැන කියා ගන්නට එම සන්ධ්‍යාවේ කිසිවෙකුටත් අවසර ලැබුණේ නැත. පසුදා යාමට නියමිත විනෝද ගමනට අවශ්‍ය බඩු මුට්ටු අසුරා ලීමේ කාර්යයේ ඔවුහු නිරතව සිටියහ. ගෙන යන්නේ මොනවා ද ගෙන නොයන්නේ මොනවා ද යන්න පිළිබඳ ඔවුන් අතර විවිධ තර්ක විතර්ක ඇති විය.

කිහිප දෙනකු එකවර කතා කිරීම නිසා ඇති වූ ඝෝෂාව මධ්‍යයේ ගුස්ටාව් වික්ෂිප්තව බලා සිටියේය. ඔහුගේ අතක ඇඟිල්ලකට වෙලුම් පටි යොදා තිබිණි. කිකී ගුස්ටාව් ගැන මහත් උනන්දුවෙන් යුතුව සිටියේය. ඔහු නිතරම ඌ දෙස ඇස ගසාගෙන සිටි අතර ඌට තමා අසලටවත් එන්නට ඉඩ නොදෙන්නට ඔහු වග බලා ගත්තේය.

ඌ තමා අසලට ආ වහා අත්පොළසන් දෙමින් ඔහු කෑ ගැසුවේ කිකිළියක එළවා දමන්නට මෙනි. ''යනවා.... යනවා එහාට''

''මෙයාත් කිකී වගේම සමහර වෙලාවට සේරම අවුල් කරගන්නවා'' ජැක් පැවසුවේ සිනාසෙමිනි. ''කිකීත් ගුස්ට ලේසියෙන් අතාරින එකක් නැහැ. දැන් මම කොහේද මේ පොත් තියන්නේ? ඇලී නැද්දේ මං අර ලොකු බෑග් එකට පොත් ටික දාන්නද?''

''ඉස්සෙල්ලාත් ඔයා ඒකට පොත් දූම්මා'' ඇලී නැන්දා පැවසුවාය. ''මම ඒවා තුන්වෙනි පාරටත් පැත්තකට කළා. ජැක්... ඔයා යන්නේ කුරුල්ලෝ ගැන පොත් කන්දරාවක් කියවන්න නෙවෙයි. පොත් දෙකක් හොඳටෝම ඇති. හ්ම්. පොත් දෙකක් තෝරාගන්න''

''ඔයාට නං තද හිතක් තියෙන්නේ... නැන්දේ'' ජැක් මැසිවිලි නැඟුවේය. ''අඩුගානෙ මට දුර බලන කණ්ණාඩිය ගෙනියන්න දෙනවද? ඒකටත් ඉඩ නැත්නං... මම ගෙදරට වෙලාම ඉන්නං''

''ඔයාට ඒක ඔයාගේ බෙල්ලේ එල්ලාගෙන යන්න පුළුවනි'' කනිංහැම් මහත්මිය පැවසුවාය. ''මතක තියාගන්න කාරෙකේ අපි හත් දෙනෙක් යන්නෝනෙ. බඩුත් පටවාගෙන යන්න ඕනෙ. අපි පුළුවන් තරං අඩුවෙනුයි බඩු මුට්ටු ගෙනියන්න ඕනෙ. කිකී මොනවද ඔය කරන්නේ? කී.... කී.. ජැක් කිකීගේ දඟ වැඩ නතර නොකළොත් මට පිස්සු හැදේවි''

''කෝ...? කොහේද කුඩුව?'' හදිසියේම ගුස්ටාව් විමසුවේ ගාම්භීර ස්වරයකිනි. ඒකා කුඩුවට දානවා''

''කුඩු ගැන කතාව නවත්තන්න'' ජැක් කීවේය. ''ඒ වගේම කරුණාකරලා අපට අණ දෙන්න ලැස්ති වෙන්නත් එපා''

ජැක් පැවසූ දෙය නුරුස්නා බව පළකරමින් ඔහු දඩබ්බර ලීලාවෙන් නැඟී සිටියේය.

''ම... මේ කුරුල්ලා... ද්... දුෂ්ටයි'' ඔහු පැවසුවේය. ''හොඳ නෑ.. දුෂ්ටයි. ඒක්කාව කුඩුවට ද්.. දාන්නම ඕනේ''

''ජැක්.... ජැක්.'' කනිංහැම් මහත්මිය අනතුරු අඟවන ස්වරයෙන් කතා කළේ ජැක්ගේ මුහුණ කෝපයෙන් අඳුරු වී යනු දකිමිනි. ''එයා තවම කිකීව හරියට අඳුනාගෙන නැහැ. අපිව හඳුනාගෙන අපේ ක්‍රමයට හැඩ ගැහිලාත් නැහැ. එයාට අවස්ථාව දෙන්න මේවාට හුරුවෙන්න. එයා ගැන වැඩියෙ හිතන්න එපා. ගුස්ටාව්. ගිරවා කිකී දුෂ්ට නැහැ. ඌ හොඳයි. ඔයා නිස්සද්දව ඉඳගෙන ඉන්න''



''කෝ කුඩුව?'' පෙරටත් වඩා උස් හඬින් නපුරකුගේ විලාසයෙන් ගුස්ටාව් විමසුවේය. ''ල් ලොකු....... ල්ලොකු.. ක් කුඩුවක්. මේ ද් දුෂ්ට කුරුල්ලාට ලොකු ක් කුඩුවක්''

ජැක් ගුස්ටාව් වෙත ගොස් ඔහුගේ මුහුණට මුහුණලා සිට ගත්තේය. ''මගේ ළඟ තියෙනවා ලොකුම ලොකු කුඩුවක්'' ඔහු පැවසුවේය. ''ඒක මං තියාගෙන ඉන්නෙ අකීකරු පිරිමි ළමයින්ව දාන්න. මං ඒක අරගෙන එන්නම් ගුස්ටාව්. තමුසෙට ලොකුම ලොකු කුඩුවක් ඕනෙම නං ඒක ඇතුළට රිංගලා අර දුෂ්ටයි කියන ගිරවාගෙන් බේරිලා ඉන්න පුළුවනි.''

ජැක් විමතියට පත්කරවමින් ගුස්ටාව් හඬන්නට පටන් ගත්තේය. ළමයි සිව්දෙනා විමතියෙන් ඔහු දෙස බලා සිටියහ. වයස අවුරුදු එකොළහක පිරිමි දරුවකු එතරම් සුළු කාරණයකට හඬන්නේ කෙසේද? ලූසී ඈන් පවා විමතියට පත්ව සිටියදී කනිංහැම් මහත්මිය ගුස්ටාව් වෙත දිව ආවාය.

''මෙයාට මහන්සියි'' ඇය ළමයින්ට පැවසුවාය. ''මෙතැන හැමදෙයක්ම මෙයාට නුහුරුයි. අනික මෙයා මීට කලින් කිකී වගේ ගිරවෙක් දැකලා නැතුව ඇති. අඬන්නෙපා ගුස්ටාව්. ජැක් එහෙම කීවේ ඇත්තට නෙවෙයි. බොරුවට''

''කවුද එහෙම කියන්නේ?'' ජැක් විමසුවේය. ''කිකී ගේ පරණ කුඩුව වුණත්..''

ඔහු එම වැකිය අවසන් කරන්නට පෙර කනිංහැම් මහත්මිය ගුස්ටාව් කාමරයෙන් පිටතට කැඳවාගෙන ගිය අතර ළමයි සිව්දෙන විස්මිතව එකිනෙකා දෙස බැලූහ.

''මෙක නියම නිවාඩුවක් වේවි'' ජැක් පැවසුවේය. ''මම කියන්නේ... මං මුළු නිවාඩුව පුරාම මිනිහාව අල්ලා ගන්නවා. මිනිහා ඒකට කියටවත් කැමති වෙන එකක් නැහැ''

''මමත් එයාව අල්ලා ගන්නවා'' ඩිනා ද පැවසුවාය. ''එයා හිතාන ඉන්නේ එයා කවුරු කියලා ද? කිකී කුඩුවකට දාන්න කියලා. එයා අපට අණ කරන්න එන්නේ. ජැක්... කිකීගේ පරණ

කුඩුව අරගෙන එන්න. ඒක දැක්කාම ගුස්ටාව් ගේ මුහුණ පුංචි වෙනවා බලන්න මම ආසයි''

''දුප්පත් අසරණ ගුසී'' ලූසී දූන් කීවාය. ''පොඩ්ඩක් ඇත්තං අඬනවා. අසරණ ගුසී''

''ගුසී'' කිකී එකවර පැවසුවේය. ''අඬන ගුසී, අඬන ගුසී'' සියල්ලෝම සිනා නැගූහ.

''හරියටම හරි කිකී'' පිලිප් පැවසුවේය. ''අඬන ගුසී..... හොඳට ගැළපෙන නම. ඇයි එයාගේ දෙමව්පියන් එයාව හරියට හදලා නැත්තේ? ඉක්මනට කලබල වෙනවා බොළඳ ළමයෙක් වගේ. අඬන ගුසී. එයාගෙන් අපට හොඳ විනෝදයක් ලබාගන්න පුළුවන් වේවි''

''අඬන ගුසී'' ඒ මේ අතට පනිමින් නටමින් කිකී කෑ ගැසුවේය. ''කකුල් පිහදාගන්න ගුසී''

''ඇස් පිහිදාගන්න. ඒක ද ඔයා කියන්නේ කිකී? ''පිලිප් විමසුවේය. ''ගුසී නිතරම අඬන්නෙ නැත්නං හොඳයි. අඬනවා නං මම අම්මාගෙන් ලේන්සු දෙක තුනක් ඉල්ලාගෙන යනවා අඬන හැම වතාවකම එයාගෙ අතට දෙන්න.''

ආපසු එමින් සිටි කනිංහැම් මහත්මියට පිලිප් පැවසූ දෙය පැහැදිලිව ඇසිණි. ''මම හිතන්නේ ඔයාලා එයාට අකාරුණික වෙනවා වැඩියි. එයා ටිකක් අමුතු විත්තිය මම පිළිගන්නවා. අපේ භාෂාව හරියට කතා කරගන්න බැරි එයා තමන්ට හිනාවෙන පිරිසක් ඉදිරියේ හරියට හැසිරේවි කියලා අපට හිතා ගන්න බැහැ. මම හිතන්නේ ඔයාලා එයාට කාරුණිකව සලකලා අවස්ථාවක් දෙන එක තමා වැඩියෙ හොඳ''

''හරි.... අම්මේ'' පිලිප් කීවේය. ''ඒත් මේ අහන්න... නිවාඩුව පටන් ගනිද්දිම ගුස්ටාව් වගේ කෙනෙක්ව හදිස්සි දැනුම්දීමක් එක්ක අපේ විනෝද ගමනට එකතු කරගන්න එක හරිද?''



''එහෙම නෙවෙයි පිලිප්'' ඔහුගේ මව කීවාය. ''සිද්ධ වුණේ මෙන්න මේ දේ. බිල්ට නිවාඩුවේදි මේ ළමයාව බලාගන්නම සිද්ධ වුණා. එයා දැනගෙන හිටියා ඔයාලා මේ ළමයාට කැමති වෙන එකක් නැහැ කියලා. බිල් මට කිවා එයා මේ විනෝද ගමනට එක්කරගන්න එක තමා හොඳම දේ කියලා. අපි ගුස්ටාව් එක්කරගෙන යන්න ඕනෙ. එහෙම නැත්නං ගුස්ටාව් හා බිල් දෙන්නාම නැතුව යන්න ඕනෙ''

''හ්ම්.... එහෙමත් එකක්'' පිලිප් මිමිණුවේය. ''බිල් නැතුව ගමන යනවාට වඩා හොඳයි ගුස්ටාව් එක්කරගෙන යන එක''

''මාත් හිතුවේ එහෙමයි'' ඔහුගේ මව පැවසුවාය. ''එහෙම නං බිල්ගේ හිත නරක් කරන්න එපා. ඔයාලා එහෙම කරන්නෙ නැහැ නේද? ඔයාලා කරදර කළොත් බිල් ගුස්ටාව් එක්ක මුළු නිවාඩු කාලය පුරාම අතුරුදහන් වෙලා ඉදිවි. මම හිතන විදියට හොඳම දේ තමා ගුස්ටාව් ට කාරුණිකව සලකන එක. ඒකෙන් එයාට හානියක් වෙන්නෙ නැහැ. මට පේන විදියට එයා බය වෙලා. ඒ වගේම එයා ටිකක් ලැජ්ජාකාරයෙක්''

''එයා ඉන්නෙ කොහේද? කා එක්කද? කියලා අපි ඉක්මනටම එයාට තේරුම් කරලා දෙන්නම්'' ජැක් පැවසුවේය. ''ඒත් ගුස්ටාව් මෙහාට එක්කරගෙන එන්න බිල් තීරණය කළේ මොකද කියලා නං මට හිතාගන්න බැහැ. දූන් කෝ ගුස්ටාව්?''

''මම එයාට පොතක් කියවන්න දීලා ඇඳට යැව්වා'' කනිංහැම් මහත්මිය පැවසුවාය. ''දූන් මට හුඟාක් වැඩ තියෙනවා. ඔයාලා ගෙදරට ආව පළවෙනි දවසෙම මට ඔයාලගේ රණ්ඩු බේර බේරා ඉන්න බැහැනෙ. මං හිතුවා එයා එහෙම ඉන්න එක ඔයාලට එයාට වගේම මටත් හොඳා කියලා''

''මව් ඔයා කළ දේ හරි'' ජැක් පැවසුවේය. ''ගුසී පාඩුවේ හිටපුවාවෙ ඇලී නැන්දේ. මම හිතන්නෙ ඊ උයන පිහන කටයුතුවලට ඔයාට අපේ උදව් ඕනෙ නැහැ''

''ඔයා වෙන විදිහකට මට ඇඟෙව්වේ දූන් බඩගිනියි කියලා නේද?'' ඇලී නැන්දා විමසුවාය. ''ගෑනු ළමයින් ඊ කෑම ලැස්ති කළාවේ. ඔය දෙන්නා ඇවිත් මට මේ බඩු මුට්ටු අහුරාගන්න උදව්

කරන්න. මං හදන්නේ ගෙනියන බඩු මුට්ටු ප්‍රමාණය පුළුවන් තරම් අඩු කර ගන්න. ඔනෙවට වඩා බඩු මුට්ටු තියෙන්නේ ගුස්ටාව් ට. නියම සේද රෙදිවලින් මැසුව පිජාමා සූට්. ඒ හැම එකකම එයාගේ නමේ මුල් අකුර ගෙත්තම් කරලා''

''අපෝ, එහෙම නං එයා ඉස්කෝලෙදිත් අනික් ළමයින්ගේ විහිළුවට ලක් වෙනවා ඇති'' පිලිප් පැවසුවේය. ''ඒ ළමයි ගුස්ටාව්ගේ කොණ්ඩෙත් නොකපුව නං ඒක පුදුමයක්. එයාගේ බොකුටු ගැහිච්ච දිග කොණ්ඩෙට ගෑනු ළමයිනුත් කැමති නැතිව ඇති. අම්මේ අපට බැරිද එයාගේ කොණ්ඩේ කප්පවන්න?''

පුළුවන් වේවි'' ඔහුගේ මව කීවාය. ''ඒත් එයා එක්ක ඒ ගැන කතා කරන්න එහෙම එපා''

''රාත්‍රි ආහාර ගන්නා වේලාව වන විට බඩු මුට්ටු ඇසිරීම ද අවසන් විය. අසුරාගත් දෑ නැවත වෙනස් නොකරන්නට ඇය ඉටා ගෙන සිටියාය. නැවත වරක් ඇයට හසුවූයේ ජැක් කුරුල්ලන් ගැන ලියැවුණු පොත් ගොන්න කමිස ගොඩක් යට සඟවා ඇති ආකාරයයි. ඇය ඔහු දෙස රවා බැලුවාය.

ජැක් සිනාසුණේ සමාව ඉල්ලන්නට මෙනි. ''ඔහ්. සමාවෙන්න ඇලී නැන්දේ. ඔයා ඒ පොත් එළියට ඇදලා දාලා ආයෙමත් සූට්කේස් එක මුල ඉඳං අහුරාවි කියලා මම හිතන්නෙ නැහැ''

''මම දැන් සූට් කේස් ටික ලොක් කරනවා'' ඇලී නැන්දා පැවසුවේ තද ස්වරයකිනි. ''ඇත්තටම ජැක්, මට වෙලාවකට හිතෙනවා ඔයාගේ පස්සට හොඳ පාරවල් දෙක තුනක් දෙන්න''

රාත්‍රි ආහාර වේල ඉතා රසවත් එකක් විය. ගුස්ටාව් ආහාර බන්දේසිය යහන මත තබාගෙන පහළ මාලයෙන් නැඟෙන ශබ්දවලට ඇහුම්කන් දුන්නේය. වෙහෙසට පත්ව සිටි නිසා ඔහු යහනටම වී සිටින්නට කැමති විය. එහෙත් පහළ මාලයෙන් ඇසුණු ශබ්දයන්හි පිරී තිබුණේ සතුට හා විනෝදයයි. තමන් වැරදි ආකාරයට හැසිරුණේයැයි ගුස්ටාව්ට මොහොතකටවත් සිතුණේ නැත. අර



ගිරවා.. දුෂ්ට ගිරවා සියල්ල අවුල් කරදැමුවේ යැයි ඔහු සිතුවේය. ගිරවා තනිව හමු වූ විට ඌට පහර දිය යුතු යැයි ඔහු තීරණය කළේය.

එසේ පහර දෙන ආකාරය පිළිබඳ පෙර පුහුණුවක යෙදෙන්නට මෙන් ඔහු වේගයෙන් අතක් වැනුවේය. බන්දේසිය ගැස්සුණු අතර ඒ මත වූ දෙහි යුෂ විදුරුව පෙරළී ගියේය. විදුරුව යළි බන්දේසිය මත සිටුවා හැලුණු දෙහි යුෂ අත් පිස්නාවෙන් පිස දමද්දී ඉතා කුඩා අයෙක් දොර අස්සෙන් රිංගා කාමරයට පිවිසි බව ඔහු දුටුවේ නැත.

ඒ ගුස්ටාව් කොහේදැයි සොයා ආ ගිරවාය. රාත්‍රි කෑම මේසයේ ගුස්ටාව් නැති බව කිකීගේ තියුණු දෙනෙතට හසුවිය. කෑම මේසයේ නොමැති නම් ඔහු කොහේද? උඩු මහලේ අමුත්තන් සඳහා වෙන් වූ කාමරයේ ද?

කාමරයට පිවිස ඇඳ යටට රිංගාගත් කිකී එහි වූ පාවහන් හා පෙට්ටි කිහිපයක් සොයා ගත්තේය. ඌ එක පෙට්ටියකට කෙටුවේ එහි පියන විවෘත කරන අපේක්ෂාවෙනි. වසා තිබෙන පෙට්ටිවල පියන් විවෘත කිරීම කිකීගේ විනෝදාංශයක් විය.

ගුස්ටාව් ට ශබ්දයක් ඇසිණි. ඒ හඬ කුමක්ද? ඔහු කාමරය පුරා දෙනෙත් යැවිය.

''පෙක්.. පෙක්... පෙක්'' පියන විවෘත කිරීම අපහසුය.

''කවුද ඒ? කවුරු හරි ඉන්නවාද?'' ගුස්ටාව් තැතිගත් ස්වරයෙන් විමසුවේය.

කුමන ශබ්දය නඟන්නදැයි කිකී කල්පනා කළේය. ඕනෑම ආකාරයක ශබ්ද නැඟීමේ හැකියාව කිකී සතුවිය. බිම් ගෙයක් හරහා ධාවනය වන දුම්රියක හඬ කනිංහැම් මහත්මිය කෝපයට පත් කොට උඩු මහලට කැඳවනු ඇත. තණකොළ කපන යන්ත්‍රයක හඬ....? හොඳින් නැඟිය හැකි වුවත් නිවසක් ඇතුළට එය ගැළපෙන්නේ නැතැයි කිකී සිතුවේය. තමාට කිහිප ආකාරයකට කහින්නට පුළුවන. ඉතා කෙටි කැස්සක්... දීර්ඝ හා ගැඹුරු කැස්සක්... කිවිසුමක්. ඔව්. කිවිසුමක් ගැළපෙන්නේ නැතිද?

කිකී ඉතා හොඳින් කිව්සුමක හඬ නැගුවේය. ''හා... හා... හා... චි... චිං'' කිව්සුමක හඬ යහන යටින් නැගිණි.

ගුස්ටාව් බියට පත් විය. කිසියම් විශාල පුද්ගලයකු හෝ සතකු යහන යට සිටිතැයි ඔහුට සිතිණි. ඇඳ යට සිටින්නේ කවුරුන්ද? තමා අල්ලාගන්නා අරමුණෙන් යමකු ඇඳ යටට වී සිටියි. ඔහු වෙව්ලන්නට පටන් ගත් අතර දෙහි යුෂ විදුරුව නැවතත් පෙරළිණි.

කිකී කහින්නට පටන් ගත්තේය. දිගු ගැඹුරු ශෝචනීය කැස්සක් ඇඳ යටින් ඇසුණේය. තමාගේ ඇඳ යට සිට කහින්නේ කවුරුන්ද? ඇඳෙන් බිමට බැස ඇඳ යටට එබී බලන්නට ඔහු බිය විය. යහනෙන් බිමට පය තැබූ වහා ඇඳ යට සැඟව සිටින්නා තම වළලුකරෙන් තදින් අල්ලා ගනු ඇත යන බිය ඔහුගේ සිත්හි තිබිණි.

කිකී ඊළඟට ගෙරවූයේය. අසරණ ගුසී වෙව්ලූ අතර ඔහු කොතරම් බියට පත්විද යත් ඔහුගේ උකුල මත තිබූ ආහාර බන්දේසිය ලෙස්සා ගියේය. ඇඳෙන් බිමට වැටෙන්නට පෙර ඔහු බන්දේසිය අල්ලා ගත්ත ද, බිමට වැටුණ පිඟාන අසල වූ සපත්තුවක වැදී යහන යටට රෝල් වී ගියේය.

එවර විමතියට පත් වූයේ කිකීය. පිඟාන රෝල් වී එන මාර්ගයෙන් ඌ අහකට පැනගත්තේය. යහන යටදී පෙරළුණු පිඟාන තිසල විය.

''අනේ... අනේ.. මාව බේරගන්න'' හදිසියේම ගුස්ටාව් කෑ ගසන්නට පටන් ගත්තේය. ඊට බොහෝ වේලාවකට පෙර පටන් කෑගසන්නට උත්සාහ කළ ද ඔහුට කටහඬ පිටකරගත හැකි වූයේ ඒ මොහොතේය. ''කවුදෝ මගේ ඇඳ යට ඉන්නවා. මාව බේරාගන්න''

උඩුමහලට වහා දිව ආ බිල් ගුස්ටාව් අසලට ගියේය. ''මොකද වුණේ? ඉක්මනට මට කියන්න''



''ඇඳ යට'' ගුසී දුර්වල හඬකින් පවසද්දී බිල් ඇඳ යටට එබී බැලුවේය. එහි කිසිවකු සිටියේ නැත. විහිළු කිරීම අවසන් යැයි තීරණය කළා. කිකී ඊට මඳකට පෙර කාමරයේ බාගෙට දොර ඇරී තිබූ අල්මාරියක් ඇතුළට රිංගාගෙන හොඳින් ඇහුම්කන්දීගෙන සිටියේය.

''ඔයා බොරුවට බයවෙලා'' බිල් කාරුණික ස්වරයෙන් පැවසුවේය. ''ඇඳ යට කවුරුවත් නැහැ. කවුරුවත්ම නැහැ. මම මේ හැලිච්ච කෑම ටික අස්කරලා දාන්නං. ඔයා නිදා ගන්න''

## 4. බ්‍රොක්ලෙටන් බලා

එය හොඳින් හිරු පායා ආලෝකවත් වූ දිනයකි. සුදු පැහැ වලාකුළු අප්‍රේල් අහස හරහා පාවී ගියේය.

''හරියට කපු පුළුන් ගොඩවල් වගේ'' ඩිනා කීවාය. ''මුළු නිවාඩු කාලය පුරා අහස ඔය විදියටම තියෙනවා නං හොඳයි''

''මම කාරෙකට නඟින්නයි යන්නේ'' බිල් පැවසුවේය. ''කාරෙක මම ස්ටාර්ට් කරන කොට සේරම ඒකට නඟින්න ලෑස්ති වෙලා ඉන්නෝනෙ. ඇලී ඔයා ඉස්සරහ සීට් එකෙන් ඉඳගන්න. ලූසි ඈන්, ඔයාටත් පුළුවනි ඒ සීට් එකේම ඉඳගන්න. අනෙක් හතර දෙනා පිටිපස්සෙ සීට් එකේ හිටියාවේ. බඩු මුට්ටු ඩිකියේ. දඟකරන ඕනෙම එක්කෙනෙක් මම කාරෙකෙන් බිමට බස්සනවා. එයාට ගමනේ ඉතුරුහරිය පයින් ඇවිදගෙන එන්න පුළුවනි''

''ඔයා ඒ විදියටම වැඩ කරාවි කියලා මං හිතනවා බිල්'' ලූසී ඈන් පැවසුවාය.

''ඒ ගැන කිසිම සැකයක් ඇතිකරන්න එපා.'' සිනහවක් මුවගට නඟාගත් බිල් පැවසුවේය. ඒ ඇසූ ගුස්ටාව් සැබවින්ම බියට පත් වූ වග ඔහුගේ මුහුණෙන් පෙනිණි. ඊළඟ මොහොතේ ඔහු තදින් අදිටන් කර ගත්තේ ගමන පුරා ඉතා සංවරව හැසිරෙනවා කියාය. ඒ සමඟම ඔහු සිරිත් විරිත් අකුරටම පිළිපදිමින් හැම



කෙනාම වෙනුවෙන් රථයේ දොරවල් විවෘත කළේය. රියට නැගෙන අයට හිස නමා ආචාර කළේය. කනිංහැම් මහත්මිය අරගෙන ආ බෑගය ඔසවාගෙන එමින් ඇයට උපකාර කළේය. අවසානයේ රියට නැගී හිඳගන්නට ඉඩ පතමින් ඔහු සිහින් ස්වරයෙන් මෙසේ පැවසුවේය. ''කරුණාකරලා සමාවෙලා මට ඉඩ දෙන්න''

''ඉඩ දෙන්න... ඉඩ දෙන්න'' කිකී කෑ ගසන්නට පටන් ගත්තේය. ''ගුසී..... ගුසී. පිස්සු ගුසී'' ඉන්පසු ඌ සිනාසුණේය.

''ඔයාගේ ඇඟිල්ල කොහොමද ගුස්?'' ජැක් විමසුවේ කාරුණික ස්වරයකිනි.

''ල්.... ලේ... ග් ගැලීම නැවතිලා'' ගුස් පිළිතුරු දුන්නේය.

''හ්ම්.. මම ඔයාට අවවාද කරන්නෙ කිකී එක්ක සෙල්ලං දාන්න ලෑස්ති වෙන්න එපා කියලයි'' ජැක් පැවසුවේය. ''ඌට රිද්දන්න ගියොත් ඌ ආයෙත් ඔයාට තුවාල කරාවි. ඔව් ලොකු තුවාලයක්''

''දුෂ්ට නපුරු කුරුල්ලෙක්'' ගුස්ටාව් පැවසුවේය. ''ඔව්. ඌ හුඟාක් නරක ගිරවෙක්''

''ඔට්ටුයි. කිකී ඔයා ගැන හිතන්නෙත් ඔය විදියටමයි''ජැක් පැවසුවේය.

අවසානයේ සියල්ල සූදානම්ව තිබිණි. රිය පණ ගැන්වූ බිල් ඉතා වේගයෙන් එය මහා මාර්ගයට ප්‍රවිෂ්ට කළේය. ගුස්ටාව් තදින් ඉදිරි අසුන අල්ලා ගත්තේ එම වේගයට බියෙන් මෙනි.

බිල්, කනිංහැම් මහත්මිය හා ලූසී ඈන් රථයේ ඉදිරිපස දිගු අසුනේ සිටි අතර අනෙක් සිව් දෙනා පසුපස ආසනයේ හිඳගෙන සිටියහ. ගුසීගේ සිරුර කිළිපොළා ගියේ තමා අසලම අසුන්ගෙන සිටි ජැක්ගේ උර මත කිකී සිටිනු දුටුමෙනි.

බෝතලයකින් පොරොප්පයක් ගලවන විට නැගෙනවාට සමාන 'පොප්' හඬක් කිකී එකවර නැඟුවේය. ගුසී බියෙන් උඩ පැන්නේය. සිනාසුණු කිකී නැවත වතාවක් පොරොප්පයක් ගැලවීය. 'පොප්' එවරද ගුස්ටාව් ගැස්සුණේය. 'පොප්. පොප්. ගුසී. පිස්සු ගුසී''

''ඔයා ඔය මොනවාද කරන්නේ ගුස්ටාව්?'' කුඩා පිරිමි ළමයා ආසනයෙන් බිමට ලෙස්සා බිම වාඩිවනු දුටු ජැක් විමසුවේය.

''කරුණාකල්ලා.... ස්... සමාවෙන්න.. කිකී... ගිරවා.. ඒකා ම මගේ කන් බීරි කරනවා'' බිම හිඳගෙනම ගුස්ටාව් පැවසුවේය.

සියල්ලෝම ගෙරවූහ.

''බූරුවෙක් වෙන්න එපා ගුස්'' ජැක් කෑගැසුවේය. ''සීට් එක උඩට ඇවිත් වාඩිවෙනවා. කැමති නං සීට් එකේ අර කෙරෝලට ඩීනා ළඟට යනවා. ඒත් මං අනතුරු ඇඟවීමක් කරන්නං. මගේ උරිස්ස උඩ වාඩිවෙලා ඉඳලා ඇති වුණාම කිකී මේ කාරෙක පුරා ඇවිදීවි''

''ඔයාගෙ නාහෙ පිහගන්න'' විමතියට පත්ව සිටි ගුස්ටාව් දෙස බලමින් කිකී පැවසුවේය.

''සෑහෙන බරක්'' බිල් පැවසුවේ ඇක්සලේටරය පාගමිනි. ''කඳු දූක්කාම බර නිසාම මේ කාරෙක කෙඳිරි ගානවා''

කෙසේ වෙතත් තැනිතලා මාර්ගවල එම රථය වේගයෙන් ගමන් කළේය. අඳුර වැටෙන්නට පෙර ගමනාන්තයට ළඟාවන්නට ලැබෙතැයි සිතීම කනිංහැම් මහත්මියට සතුටක්ම විය.

''අපි මේ යන තැන නම මොකක්ද ඇලී නැන්දේ?'' ලූසී ඈන් විමසුවාය. ''ආ.. හරි... මට මතකයි. බ්‍රොක්ලෙටන්. එහේ අපට නවතින්න පුංචි ගෙයක් තියෙනවද? නැත්නං අපි නවතින්නෙ කොහේද?''



''පුංචි ගෙයක්.... කොටේජ් එකක් තියෙනවා'' කනිංහැම් මහත්මිය පිළිතුරු දුන්නාය. ''ගල් වළ ළඟ නිවහන කියලායි ඒකට කියන්නේ. ඒ ළඟ පරණ ගල් වළක් තියෙනවා. ඒ ගේ තියෙන්නේ ගමට හැතැප්මක් විතර එහායින්. ළඟපාත ගොවිපොළක් ඇති මගේ හිතේ. අපි වාසනාවන්ත නං අපට පාන්, කිරි, බටර්, බිත්තර එහෙම එහෙන් ගන්න පුළුවන් වේවි''

''මම නං එහේ ගිය ගමන් විස්තර හොයන්නේ බැජර්ලා ගැන'' පිලිප් පසුපස ආසනයේ සිට පැවසුවේය. ''මට හිතෙනවා පුංචි බැජර් පැටියෙක් හොයාගන්න මට පුළුවන් වේවි කියලා. උන් හුරතලේට හදන්න හොඳ සතුන් කියලා මං අහලා තියෙනවා''

''ඔයා එහේ ගිය ගමන් සතුන් හොයන්න පටන් ගනීවි කියලා මම හිතුවා'' ඩීනා කීවාය. ''කොහොමටත් ඔයා මීයෙක් කුරුල්ලෙක් අඩුම තරමින් කුරුමිණියෙක්වත් නොගෙනාව නිවාඩුවක් අපි තවම ගත කරලා නැහැනෙ''

''මේ නිවාඩුවෙදි මකුළුවන් ගැන ටිකක් ඉගෙන ගන්නත් මම හිතාගෙන ඉන්නවා'' පිලිප් පැවසුවේ බැරෑරුම් ස්වරයෙනි. ''මකුළුවෝ කියන්නේ පුදුම සතුන් ජාතියක්. ලොකු ශරීර තියෙන උනුත් ඉන්නවා. රෝම පිරුණු පාද... තව...''

ඩීනා වෙව්ලුවාය. ''අපි වෙන මොනවාහරි කතා කරමු.'' ඇය කෑගැසුවාය. ''මං දන්නෙ නැහැ හේතුව. ඒත් කවුරුහරි මකුළුවන් ගැන කතා කරනකොට මට දැනෙන්නේ මකුළුවෙක් පිට දිගේ යනවා වාගේ''

''අපොයි.... දෙවියනේ... මගේ මකුළුවා කෝ?'' තම සාක්කු පිරික්සමින් පිලිප් විමසුවේය. ගුස්ටාව් මකුළුවන් ප්‍රිය නොකළ අතර ඔහු ද දැඩි අවධානයකින් යුතුව පිලිප් දෙස බලා සිටියේය.

ඩීනා යටිගිරියෙන් කෑ ගැසුවාය. ''අනේ පිලිප්. බොරු කියන්නෙපා. ඔයා ඇත්තමද ඒ කීවේ? ලොකු මකුළුවෙක් ඔයාගේ සාක්කුවක හිටියාද?''

''පිලිප්'' ඔහුගේ මව පසුපස හැරී කෝපයෙන් පැවසුවාය. ''මතකනේ බිල් කීව දේ. ඔයාව කාරෙකෙන් බිමට බස්සනවා''

''හරි. හරි. මගේ ළඟ මකුළුවෙක් නැහැ'' පිලිප් පැවසුවේ වරද පිළිගන්න ආකාරයෙනි. ''ඔයා බය නැතිව ඉඳගෙන ඉන්න ඩිනා.''

අයිසේ ගුස්, අපේ කකුල් අස්සට වෙලා ඔහොම බිම ඉඳගෙන ඉන්න තමුසෙට අමාරු නැද්ද? ඔයා ඔතැන ඉන්නවා කියලා අමතක වෙලා මම ඔයාගේ ඔළුව උඩින් කකුල් කියාවිද දන්නෙ නැහැ''

''චිහ්.... ඒක ක්...... කියන්නවත් හොඳ දෙයක් නෙවෙයි'' ගුස්ටාව් පැවසුවේ උදාරම් බවකින් යුතුවය. ''ඔයා මගේ ඔළුව උඩ කකුල් තිබ්බොත් මට හොඳටම කේන්ති යාවි''

'අපි පුංචි සෙල්ලමක් කරමු'' පිලිප් හා ගුස්ටාව් අතර විවාදය දුර දිග යනු ඇතැයි බිය වූ ජැක් පැවසුවේය. ''අපි කළු බල්ලො, සුදු පූසෝ, පුල්ලි තියෙන අස්සයෝ, රතුපාට බයිසිකල්, අයිස්ක්‍රීම් වෑන්, මෙතන ඉඳං ගණන් කරන්න පටන් ගනිමු. ඒවා සියයක් මුලින්ම ගණන් කරලා ඉවර කරන අය දිනුම්. අන්තිමටම ගැණලා ඉවර කරන කෙනා පරාදයි. එයා ඊළඟට අපට හම්බ වෙන අයිස්ක්‍රීම් වෑන් එකෙන් අපි සේරටම අයිස්ක්‍රීම් අරං දෙන්න ඕනෙ''

එම යෝජනාවෙන් වඩාත් සතුටට පත් වූයේ ගුස්ටාව්ය. ඔහු වහා නැඟිට ආසනයේ හරි බරි ගැසුණේය. බිල්ටත් කනිංහැම් මහත්මියටත් මහත් සැහැල්ලුවක් දැනිණි. රථය ඇතුළත පැතිර ගියේ සාමකාමී නිහැඬියාවකි. ළමයි සියලු දෙනා රථයෙන් පිටත බලාගෙන ගණන් කිරීමට පෙළඹී සිටියහ.

ගුස්ටාව් එම ක්‍රීඩාවට එතරම් දක්ෂයකු වූයේ නැත. ඔහුට කළු බල්ලන් හා සුදු බළලුන් සැහෙන ප්‍රමාණයක් මඟහැරුණු අතර පුල්ලි තිබෙන අශ්වයන් ලෙස සාමාන්‍ය අශ්වයන් ද ගණන් කිරීමට පෙළඹුණේය. පාට දෙකකින් යුත් සෑම අසකුම පුල්ලි සහිත අසුන් ලෙස ගිණිය නොහැකි බව පැවසුණු විට ගුස්ටාව්ගේ මුහුණ කළු පැහැ ගැන්විණි.

''එයා අඬන්න වගේ'' පිලිප් පැවසුවේය. ''ඉන්න ගුස්. ඉන්න. මගේ ලේන්සුව අරගන්න''



ගමන ආරම්භ කිරීමට පෙර සිය මවගේ විරෝධය නොතකා සාක්කුවේ දමාගත් අත් පිස්නාව පිටතට ගත් ඔහු එය ගුස්ටාව් වෙත දිගු කළේය. අත් පිස්නාව අතට ගත් ගුස්ටාව් වික්ෂිප්තව මොහොතක් එදෙස බලා සිට ඊළඟට සිනාසෙන්නට පටන් ගත්තේය.

''හා..... හහ් හා... හෝ... මේ රෙදි කෑල්ල ලේන්සුවක් නෙවෙයි. මේක දැක්කාම මට අඬන්න නෙවෙයි හිනාවෙන්නයි හිතෙන්නෙ''

''ඒක නං හොඳයි ගුස්'' ජැක් පැවසුවේ ඔහුගේ පිටට තට්ටු කරමිනි. ''හිනාවෙන්න. අපි ඒකට කැමතියි''

ගුස්ටාව් හට සිනාසෙන්නට හා විහිළු අවබෝධ කරගන්නට හැකි බව අවබෝධ කරගත් සියල්ලෝම පුදුමයට පත් වූහ. ඔහු එතරම් නරක පිරිමි ළමයකු නොවේය යන්න ඔවුන් සියලු දෙනාගේම අදහස විය. ඔහු එතැන් සිට ගණන් කිරීම අතැර දැමූ නමුත් එම ක්‍රීඩාව අවසන, සියලුදෙනා විමතියට පත් කරවන ක්‍රියාවක යෙදුණේය.

සියයක් ගණන් කිරීමේ ක්‍රීඩාවේ අන්තිමයා වූයේ ලුසි ඈන් ය. ඇය ඇගේ පසුම්බිය පරීක්ෂා කර බැලුවේ ක්‍රීඩාවෙන් පරාජයට පත් වූ බැවින් තමා අනෙක් සියලු දෙනාට අයිස්ක්‍රීම් මිලට ගෙන දිය යුතු බව සිතමිනි.

''බිල්, කරුණාකරලා මුලින්ම මුණ ගැහෙන අයිස්ක්‍රීම් වෑන් එක ළඟ කාරෙක නතර කරනවාද?'' ඇය විමසුවාය.

ඒ ඉල්ලීමට අනුව බිල් මෝටර් රථය නතර කළේය.

එහෙත් ලුසී ඈන් රියෙන් බැස ගන්නට පෙර දොර විවෘත කොට බිමට පැනගත් ගුස්ටාව් අයිස්ක්‍රීම් වෑන් රිය වෙත දිව ගියේය. ''අයිස් කිරිම් හතක්'' ඔහු කීවේය.

''ඉන්න. ඔයා නෙවෙයි මායි පරාද වුණේ'' කෑ ගැසූ ලුසී ඈන් ගුස්ටාව් දෙස බලා සිටියාය. ගුසී තම මුදල් පසුම්බිය සාක්කුවෙන් පිටතට ගත්තේය. එම පසුම්බියෙන් ඔහු අතට ගත්තේ

නෝට්ටු මිටියකි. ඔහු අත කොතරම් විශාල මුදලක් තිබේද? නෝට්ටු මිටියෙන් නෝට්ටුවක් ගත් ඔහු එය අයිස් ක්‍රීම් වෙළෙන්දා වෙත දිගු කළ අතර අනෙක් අය මෙන්ම වෙළෙන්දාද විමතියට පත්ව සිටියේය.

''ඔයා නං පෝසත් පවුලක ළමයෙක් වගේ'' වෙළෙන්දා පැවසුවේය. ''ඔයාගේ තාත්තා කෝටිපතියෙක් ද?''

ගුස්ටාව්ට එම පැනය වැටහුණේ නැත. ඉතිරි මුදල් අතට ගත් ඔහු ඒවා සිය කලිසම් සාක්කුවට ඔබා ගත්තේය. ඉන්පසු ඔහු අයිස්ක්‍රීම් රැගෙන රථය වෙත විත් ඒවා තමා දෙස විමතියෙන් බලා සිටි සියලු දෙනාට බෙදා දුන්නේය.

''ස්තූතියි ගුස්'' බිල් කීවේ ගුස්ටාව් දුන් අයිස්ක්‍රීමය පිළිගනිමිනි. ''ඒත් මතක තියාගන්න. ඔයාට ඔය සල්ලි සේරම ඔහොම අරං යන්න බැහැ. මං කියන දේ තේරෙනවානේ''

''මට මේවා තියාගන්න පුළුවනි'' ගුස්ටාව් ගණනකට නැතිව පැවසුවේය. ''මේවා මුළු වාරය පුරාම තිබුණේ පර්ස් එකේ. පර්ස් එක තිබුණේ මගේ සාක්කුවේ. මට හිතෙන විදියට එයාලා මට කීවා මා ළඟ මගේ වියදමට සල්ලි තියාගන්න පුළුවනි කියලා''

''හ්ම්.... ඔව්. ඒත් පවුම් සීයක් නැත්තං ඊට වැඩි මුදලක් පොකට් මනි වෙන්නෙ නැහැනෙ'' බිල් පැවසුවේය. ''ඔව්... ඔව්... ඔයාට ඒවා සාක්කුවේ තියා ගන්න පුළුවනි. ඒත් සුළු... සුළු වියදම්වලට දෙන සල්ලි... පොකට් මනි කියන්නේ ඔච්චර.. හ්ම්... හරි ළමයිනේ ඔයාලා ගුස්ටාව්ට තේරුම් කරලා දෙන්න''

ගුස්ටාව් සිය පසුම්බියේ තබාගෙන සිටිනා තරම් විශාල මුදලක් සුළු වියදම් සඳහා නොවන බව ඔහුට වටහා දීම කිසිවකුටත් පහසු කාර්යයක් නොවීය.

''ඉස්කෝලෙදි නං ඔච්චර ලොකු සල්ලියක් ගුරුවරුන් බාරයේ තියන්න වෙනවා'' පිලිප් පැවසුවේය.

''එයාලා කීවා මා ළඟ සල්ලි තියාගන්න පුළුවනි කියලා'' ගුස්ටාව් අකීකරු ලෙස පැවසුවේය. ''ඒ සල්ලි මගේ බාප්පායි මට දුන්නේ. ඒවා මගේ''



''ඔයාගේ පවුලේ අය හුඟාක් පෝසත් වගේ'' ජැක් පැවසුවේය. ''බිල් අතේවත් ඔය තරං සල්ලි කන්දරාවක් ගැවසෙන්නෙ නැති වග සහතිකයි. බිල් ඇත්තටම ගුස්ටාව් කෝටිපති පවුලක දරුවෙක් ද?''

''මෙහෙමයි.... එයාගෙ පවුලේ අයට සල්ලි තියෙනවා. බිල් පැවසුවේ රථයේ වේගය වැඩිකරන අතරතුරය. ''එයා ළඟ තියෙන සල්ලි එයා මට බාරදෙන්න වේවි. එහෙම නොකළොත් ඉක්මනින්ම හරි පහුවෙලා හරි එයාගේ සල්ලි කවුරුන් හෝ හොරා ගන්නවා''

''මෙයා අඬන්නයි ලෑස්ති වෙන්නෙ'' ඩිනා අනතුරු ඇඟවූවාය. ''පිලිප් ඉක්මන් කරන්න. කෝ අත්පිස්නාව?''

''මං ලෑස්තිවෙන්නේ අඬන්න නෙවෙයි'' ගුසි උදාරම් බවකින් යුතුව පැවසීය. ''මට අසනීපයි වගේ. කාරෙකක යනකොට මට මෙහෙම වෙනවා. ඊයෙත් එහෙමයි''

''දෙයියන්ටම ඔප්පු වෙච්චාවේ'' බිල් තිරිංග තදකර රථය නැවැත්වූයේය. ''ඉක්මනට කාරෙකෙන් බහින්න. ඩිනා එයාව බස්සන්න දෙයියනේ මම මොකටද එයාට අයිස්ක්‍රීම් කන්න ඉඩ දුන්නේ? ඊයේ එයා මට කිවා කාරෙකේ යනකොට එයාට වමනෙ යනවා කියලා''

කතිංහැම් මහත්මිය රථයෙන් බැස, වමනය දමමින් සිටි ගුස්ටාව් ගේ පිට අතගෑවාය.

''එයාට කාරෙකක යන්නත් බැහැ'' ඩිනා පැවසුවාය.

''ඒකට එයාට කරන්න දෙයක් නැහැ'' ලුසී ඈන් කිවේ ගුස්ටාව් දෙස බලමිනි. ''කොහොම වුණත් දූන් සේරම හරි. දූන් එයාට සනීපයි වගේ''

''දූන් සේරම හරි'' යළි රියට නැගෙමින් ගුස්ටාව් පැවසුවේය.

''මෙ අත්පිස්නාව තියාගන්න'' පිලිප් අත් පිස්නාව ගුස්ටාව් වෙත දිගු කරමින් පැවසුවේය. ''ආයෙත් වමනය යන්න ආවොත් ඕක ප්‍රයෝජනවත් වේවි. ආයෙ ඔයාට අසනීප වෙන එකක් නැහැ කියලා මම හිතනවා''

''මට අසනීප වෙන්නෙ එක වතාවයි'' ගුස්ටාව් පැවසුවේය.

''මට අයිස්ක්‍රීම් එක හරියට කන්න බැරි වුණා. ආයෙත් අයිස්ක්‍රීම් වෑන් එකක් ළඟ නවත්තනවාද?''

''නැහැ. නැහැ'' බිල් පැවසුවේ ස්ථිරසාර හඬකිනි. ''කාරෙකේ යද්දී ඔයාට අයිස්ක්‍රීම් කන්න දෙන්න බැහැ. කාටවත් ටිකක් නිදාගන්න වුවමනා නැද්ද? නිදාගත්තොත් මට නිවීහැනහිල්ලෙ කාරෙක එළවන්න පුළුවනි. ආයෙ නවත්තන්නෙ දවල් කෑමට''

# 5. ගල් වළ ළඟ නිවහන

බ්‍රොක්ලෙටන් සුන්දර පුංචි ගම්මානයකි. රථය ඒ හරහා ගමන් කරද්දී පටු මාවතේ සිටි කිකිළියෝ හා තාරාවෝ ඒ මේ අත දිව ගියහ. ගම්මානයේ කුඩා තැපැල් කන්තෝරුව අසල බිල් මෝටර් රථය නැවැත්වූයේය.

''පණිවිඩයක් යවන්න තියෙනවා'' බිල් පැවසුවේය. ''මිනිත්තුවකට වඩා යන්නෙ නැහැ. ඊළඟට අපි ගොවිපොළට ගිහිං ගල් වළ ළඟ නිවහනට යන පාර අහගනිමු. බිත්තරයි අනෙක් වුවමනා කරන දේවලුයි මිලට අරගෙන කිරි ඇණවුම් කරමු''

මිනිත්තු දෙකකට පමණ පසු ඔහු ආපසු පැමිණියේය. තමන් සිටින තැන ගැන බිල් දිනපතා වාර්තා කළ යුතු බව දරුවෝ දැන සිටියහ. ඒ ඔහුට හදිසි රාජකාරි පැවරෙන බැවිනි. ඒවා ඔහුටම පමණක් ඉටුකළ හැකි අතිශය රහස්‍ය රාජකාරි කටයුතු ද වෙයි.

ඔවුහු ගොවිපොළ වෙත ගියහ. එහි සිටි ගෙවිලිය ඔවුන් දැක මහත් සතුටට පත් වූවාය. ''එන්න එන්න ඇතුළට එන්න.'' ඇය කීවාය. ''ගෙවුණු පැය බාගෙ පුරා ඔයාලා දැන් එයි දැන් එයි කියලා හිත හිතා මං මඟ බලාන හිටියා. මම ඔයාලට තේ වත් කරන්නම්. ගල් වළ ළඟ නිවහනේ කිසිම දෙයක් ඔයාලා වෙනුවෙන් ලෑස්ති වෙලා නැහැ. ගිහින් ඔයාලටම තමයි සේරම සූදානම් කර ගන්න වෙන්නේ. ඒ නිසා තේ එකක් බීලා යන එක හොඳයි''

''ඔයා හරිම කරුණාවන්තයි'' කනිංහැම් මහත්මිය පැවසුවේ කෘතඥතාපූර්වකවය. ''මගෙ දෙවියනේ... බොහොම ඉහළ සංග්‍රහයක්නේ''

ඇත්තෙන්ම එය සාමාන්‍ය තේ පානයක් නොව ඉහළ මට්ටමේ සංග්‍රහයක් විය. අලුත්ම අලුත් හැම්, කොළ පැහැති පාර්සලේ, හොඳම තත්වයේ බටර්, පැණි, ගොවිපොළේ තැනූ ස්ට්‍රෝබෙරි ජෑම්, බිත්තර සැන්ඩ්විච්, රසවත් පලතුරු මිශ්‍ර විශාල කේක් ගෙඩියක්, කොකෝවා සහ කිරි මේසය මත තිබිණි.

''ලොකු වුණාට පස්සෙ මම ගොවිපොළක ජීවත් වෙන්න කැමතියි'' විශාල රවුම් මේසය මත වූ අහාර වර්ග දෙස පරික්ෂාකාරීව බලමින් ජැක් පැවසුවේය. ''ගොවිපොළක තියෙන නිවහනක මේ තරම් කෑම වර්ග තියෙනවා කියලා මම නං කවදාවත් හිතුවේ නැහැ''

දිවා ආහාර වේලාවේදී කෑම ටිකක් පමණක් කන්නැයි කනිංහැම් මහත්මිය තමාට බලකිරීම ගැන ගුස්ටාව් ඇයට නිහඬව ස්තුති කළේය. එතැන සිටි ඕනෑම කෙනෙකු සතුව ඇති ආහාර රුචිය මෙන් තුන් ගුණයක ආහාර රුචියක් තමාට ඇති බව ඔහුට වැටහී තිබිණි.

''මම ගන්නවා ඌරු මස් ටිකක්'' ගුසී පැවසුවේය. ''එතකොට පාර්සලේ.... ඔව්..... බටර්, කිරි... තව''

''මෙයා පුංචි විහිළුකාරයෙක් වගේ'' ගෙවිලිය පැවසුවේ සිනාසෙමිනි. ''ඌරු මස්? මෙයා එහෙම කියන්නේ හැම් වලටද?''

''ඔව්, ඔයා කැමති නම් එයාට හැම් කැල්ලක් කපලා දෙන්න'' කනිංහැම් මහත්මිය පැවසුවාය.

''මට ඕනෙ කෑම ජාති මම ඇණවුම් කරන්නම්'' ගුස්ටාව් ඉතා උස් හඬින් ආඩම්බරයෙන් යුතුව පැවසුවේ ඔහු දෙස බලා සිටි ගෙවිලිය ද විමතියට පත් කරවමිනි.



''කටවහගන්නවා ගුස්'' බිල් කිවේය. ''ඔයාට අවශ්‍ය දේවල් ඔයා බෙදාගන්න. මෙතැන ඔයාට කෑම බෙදාදෙන්න කවුරුවත් නැහැ. ඔයා කවුද කියන එක අමතක කරන්නෙපා''

''මං කවුද කියන එක මම මොහොතකටවත් අමතක කරන්නෙ නැහැ'' ගුස්ටාව් පැවසුවේය. ''මං කවුද කියලා මං දන්න නිසා තමයි මම කිවේ''

''කට වහගන්නවා'' බිල් කෑ ගැසූ අතර ගුස්ටව් වහා නිහඬ විය. අනෙක් අය සිනාසුණහ. ගුස්ටාව් බිල්ගේ අණට කීකරු වීම ඔවුනට සතුටු වන්නට කාරණයක් විය. ගුස් කෝපයට පත්ව සිටියේය. ඔහු යමක් පවසන්නට මෙන් බිල් දෙස බලද්දී බිල් රවා ඔහු දෙස බැලුවේය. ඔහු කීමට ආ දෙය ගිලගෙන බිම බලා ගත්තේය. බිල් අනෙක් අය දෙස බලා ඉඟි මැරුවේය.

''පිස්සු ගුසී'' ජැක්ගේ උරමත සිට කිකී පැවසුවේය. ''ඩිං ඩොං බෙල්.... ගුසී ඉන් ද වෙල්''

ගුසී නෙවෙයි පුසී'' ජැක් කිකීගේ ගායනය නිවැරදි කළේය. ''පුසිස් ඉන් ද වෙල්''

ගෙවිලිය ගිරවා තම අතට ගත්තාය. ඒ විමතියට කලබලයට හෝ වික්ෂිප්තභාවයට පත් නොවෙමිනි. ''මගේ මහලු නැන්දාටත් ගිරවෙක් හිටියා'' ඇය කීවාය. ''මේ වගේම එකෙක්. ඒත් ඌ ඔයාලගේ මේ ගිරවා වගේ කතාවට නං දක්ෂ නැහැ''

''එයා ජීවතුන් අතරද?'' ජැක් විමසුවේ මුහුණට මුහුණලා. ගිරවුන් දෙදෙනා හැඹීමට සිතාගෙනය. එසේ තැබූ විට ගිරවුන් දෙදෙනා මොනවා කතා බස් කරනු ඇත්ද?

''කවුද ජීවතුන් අතර ද කියලා ඇහුවෙ? ගිරවාද මගේ නැන්දා ද?'' ගෙවිලිය වීදුරුවකට කිරි පුරවමින් විමසුවාය. ''ගිරවා මැරුණා. මැරෙනකොට මම හිතන්නේ ඌට අවුරුදු සීයක් විතර වයසයි. මගේ නැන්දා නං තවම ජීවතුන් අතර. අර අතන ගිනි උඳුන ළඟ ඉඳගෙන ඉන්නේ නැන්දා. එයා තව අවුරුදු දහයක් ජීවත් වුණොත් එයාගේ වයසත් අවුරුදු සීය පනිනවා''

ළමයි පස්දෙනා හිති උදුන අසල හිඳගෙන සිටි මහලු කාන්තාව දෙස බැලූහ. ඔවුනට ඇය පෙනුණේ මහලු මායාකාරියක මෙනි. එහෙත් ඇගේ දෙනෙත් දිලිසුණේ කොළ පැහැයෙන් නොව ලා නිල් පැහැයෙනි. සිනාසි හිස පහත් කොට ඔවුනට ආචාර කළ මහලු කාන්තාව නැවත සිය ගෙත්තම වෙත දෙනෙත් යොමු කළාය.

"සමහර වෙලාවට එයා නිසා මට හරි කරදරයි" ගෙවිලිය මැසිවිලි නැගුවාය. "කියන දේ නාහා එහෙ මෙහෙ ඇවිදිනවා. ඊළඟට වැටෙනවා. ළඟදිම ගමේ දොස්තර මහත්තයා සුමානයකට නිවාඩු යනවා. ඒ දවස්වල නැන්දා වැටිලා තුවාල වුණොත් මොකද කරන්නේ? "අනේ මම දන්නෙ නැහැ... ඔයාලා මිස ළඟපාත වෙන අසල්වැසියොත් නැහැ. ඔයාලා ඉන්න තැනටත් සෑහෙන දුරයි."

"අපේ උදව් අවශ්‍ය වෙන ඕනෑම වෙලාවක අපට පණිවිඩයක් එවන්න" කතිංහැම් මහත්මිය වහා පැවසුවාය. "මම එන්නම්. ප්‍රථමාධාර ගැන වගේම තුවාල වලට බෙහෙත් හේත් කරන්නත් මම ටිකක් දන්නවා. දොස්තර මහත්තයා නිවාඩු යනවා කියලා හිත කරදර කරගන්න එපා. උදව්වක් ඕනෙ නම් පණිවිඩයක් එවන්න"

"ඔව්... මට එහෙම කරන්න පුළුවන්" ගෙවිලිය පැවසුවේ සතුටින් සිනාසෙමිනි. "ඔබේ කරුණාවන්තභාවයට මම ස්තුතිවන්ත වෙනවා දූන්.... කාටද ඕනෙ පලතුරු කේක් කෑල්ලක්? මේ කේක් රසයි. මම හැදූ නිසාම කියනවා නෙවෙයි. ඔයාලා කාලා බලන්න"

"මම තව මොනවා හරි කෑවොත් මට නැඟිට ගන්නත් බැරි වේවි" බිල් පැවසුවේය. "එහෙම නං අපි ආහාර ගැනීම ඉවර කරමුද ළමයිනේ? අපි කෙළින්ම ගල් වළ ළඟ නිවහනට ගිහිං විවේක ගනිමු. එලිස් මහත්මිය ඒ නිවහන පිරිසිදු කරන්න කාවහරි එවන්න පුළුවනි ද?"



"හොඳයි" ගෙවිලිය පිළිතුරු දුන්නාය. "ඒ එන කෙනා අත මම ඔයාලට බිත්තර, කිරි, මෙහේ හැදූව චීස්, හැම්, බටර්, අලුත් පාන් වගේම බේකන් එවන්නම්. ඔයාලට මොනවා හරි අවශ්‍ය නම් මට දන්වන්න. ඔයාලට නිවාඩුව විවේකීව ගත කරන්න ලැබේවි කියා මම හිතනවා"

ඔවුහු ගොවි නිවසෙන් පිටතට ආහ. ජැක් සැකයෙන් මෙන් ගුස් දෙස බැලුවේ රථයට නැගෙන අතරතුරය. "ඔයා නිකං අසනීප වෙලා වගේ" ඔහු පැවසුවේය. "ඔයාට කාරෙකේදි ආයෙමත් අසනීප වේවිද?"

"නෑ.... නෑ... එහෙම වෙන එකක් නැහැ" කතිංහැම් මහත්මිය ඉක්මනින්ම පැවසුවාය. "මෙතැන ඉඳං වැඩි දුරක් නැහැ. ඔහුට අසනීප වෙන එකක් නැහැ"

"හොඳ සිතුවිල්ලක් ඇලි නැන්දේ. ඒ විදියටම අපි ප්‍රාර්ථනා කරමු" ජැක් පැවසුවේය. "කිකී නිස්සද්දයි. ඔයා කැවෙ ඌරෙක් වගේ කිකී"

කිකී රාම තෙල් හැරියේය. ඌ ඇත්තෙන්ම එසේ කළේද නැතිනම් ඒ හඬ අනුකරණය කළේ ද යන්න කිසිවකු නිවැරදිව දැන සිටියේ නැත.

"කිකී" ජැක් කෑ ගැසුවේය. "සිරිත් විරිත්..... සිරිත් විරිත්"

"සමාවෙන්න" කිකී කීවේය. ගුස්ටාව් ගිරවා දෙස පුදුමයෙන් බලා සිටියේය. ගිරවකු රාමතෙල් හැරීම පුදුමයකි. ඌ සමාව ඉල්ලා සිටීම ඊටත් වඩා විමතියට කාරණයකි. කිකී ගැන විමතියට පත්ව සිටීම නිසාම ඔහුට මෝටර් රථයක ගමන් කරද්දී තමාට ඇතිවන අපහසුතා ගැන ද අමතකව ගියේය.

ඒ මේ අතට හැරුණු වංගු සහිත මඟ කෙළවර වූයේ කුඩා කන්දකිනි. ඒ කන්ද නැඟ බැස ගත් පසු තිබුණේ දෙපස උස්ව පඳුරු වැවුණු පටු මාවතකි. ළමයින්ට දැනුණේ තමන් කොළ පැහැති බිම්ගෙයක් මැදින් ගමන් කරනවාක් මෙනි. එම මඟ වූ වංගුවක් පසුවෙද්දී ඔවුනට හමුවූයේ ගල් වළ ළඟ නිවහනය. එය මාවතෙන් මඳක් ඈතට වන්නට පිහිටා තිබිණි.

සුන්දර නිවහනක් වූ එහි මිදුලේ ඩැෆොඩිල් හා ප්‍රිම් රෝසස් වැනි මල් වර්ග රැසක් වැවී තිබිණි. එම නිවහන අයත් පුද්ගලයන් දකුණු ප්‍රදේශයේ චාරිකාවක නිරත වෙමින් සිටි අතර නිවාඩුව ගත කිරීම සඳහා නිවහන බිල් ට පවරන්නට ඔවුහු කැමති වී සිටියහ.

පැරණි නිවහන්වල මෙන්ම එහි ද වූයේ කුඩා කවුළුය. දොර ඕක් ලීයෙන් තනා තිබිණි. කුඩා පැල්පතක මෙන් එහි වහලය පිදුරුවලින් සෙවිලි කර තිබිණි.

''පිදුරු සෙවිලි කළ ගෙයක්...... කොච්චර හොඳද?'' ලූසී ඇන් ප්‍රීතියෙන් උඩ පැන්නාය. ''මොකද කියලා මම දන්නේ නැහැ. හැබැයි පිදුරු සෙවිලි කළ ගෙවල් නිතරම මට පේන්නෙ හැබෑ ජීවිතයට නෙවෙයි සුරංගනා කතා වලට අයිති ඒවා වගේ. මෙතැන නං හරිම ලස්සන සුන්දර තැනක්''

බිල් අත එහි යතුර තිබූ අතර ඔහු දූවැන්ත ඕක් දොර විවෘත කළේය. සියල්ලෝම නිවහන ඇතුළට පිවිස හොඳින් වටපිට බැලූහ.

''මේ ගේ වගේම මේ බඩු මුට්ටුත් අපේ නෙවෙයි අනුන්ගේ කියලා මම ඔයාලට මතක් කරලා දෙන්න ඕනෙ.'' කතිංහැම් මහත්මිය පැවසුවාය. ''ඒ නිසා අපි මේ බඩු මුට්ටු පාවිච්චි කරන්න ඕනෙ හුඟාක් පරෙස්සමෙන්. කොහොම වුණත් දවල් කාලේ ඔයාලා වැඩිපුර ගෙදර ඉන්න එකක් නැහැනේ''

නිවහන පිටත මෙන්ම ඇතුළත ද ඉතා සුන්දර හා සුවපහසු එකක් බව පෙනිණි.

පිරිමි ළමයින් තිදෙනා වෙනුවෙන් නිවහනේ ඉහළ විශාල අට්ටාලය ද, ගැහැනු ළමයින් දෙදෙනා වෙනුවෙන් කුඩා නිදන කාමරයක් ද, බිල් හා ඔහුගේ බිරිය වෙනුවෙන් ඒ නිදන කාමරයට යාබදව විශාල කාමරයක් ද තිබිණි.

ගෙවිලිය එලිස් මහත්මිය ආහාර ද්‍රව්‍ය රැසක් එවනු ඇත. කතිංහැම් මහත්මිය එලිස් මහත්මියගේ පරිත්‍යාගශීලීභාවයට නිහඬව තුති පුදන අතර සිතුවේ නිවහනේ කටයුතු පවත්වාගෙන යාම සිතූ තරම් අසීරු වන්නේ නැත කියාය.



''ගැනු ළමයින් දෙන්නාට පුළුවනි අපි ගෙනාව බඩු මුට්ටු ටික අස්පස් කරන්න. අපි හුඟාක් බඩුමුට්ටු නොගෙනාව නිසා ඒකට වැඩි වෙලාවක් යන එකක් නැහැ. උඩ කාමරයේ තියෙන කබඩ් එකේ පිරිමි ළමයින්ගේ ඇඳුම් තියන්න. තුන්දෙනාගෙම ඇඳුම් පැළඳුම් තියන්න තරම් ඒකෙ ඉඩකඩ තියෙනවා''

''මී.... මට අනික් කවුරුවත් එක්ක නිදිගන්න බැහැ'' අට්ටාලයේ සිට පහළට බසිමින් ගුස්ටාව් නිවේදනය කළේය. ''කවදාවත් මම වෙන අය එක්ක නිදි අරං නැහැ''

''නිදි අරං.....?'' ඩිනා විමසුවාය. ''මොනවද මෙයා කියන්නේ?''

''එයා කියන්නේ නිදාගෙන නැහැ කියලයි'' ලූසී ඇන් කීවාය. ''එහෙම නේද ගුස්ටාව්?''

''මං කිව්වෙ ඒක තමා. මං වෙන කවුරුවත් එක්ක නිදි යන්නෙ නැහැ. ඉස්කෝලෙදි මං නිදි ගත්තෙත් තනියම. මෙහේදිත් තනියම. ඒක මගේ පවුලේ නීතියක්''

''ඒ වුණාට එහෙම නීතියක් මෙහේ නැහැ'' ඩිනා පැවසුවාය. ''මය කමිස ටික පොඩි කරන්න එපා. බූරුවෙක් වෙන්න එපා ගුස්. මෙහේ කොහොමටත් තියෙන්නේ නිදන කාමර තුනයි''

''මොකද..... මොකද මේ කැගැහිල්ල?'' මෝටර් රථය ගරාජය ඇතුළට දමා නිවසට පිවිසෙමින් බිල් විමසුවේ බෙරි වී තිබූ ගුස්ටාව්ගේ මුහුණ දෙස ද බලමිනි.

''මේ ගුස්ටාව්'' ඔහු අත කමිස ගොන්නක් තබමින් ඩිනා පැවසුවාය. ''එයාට අනික් අය එක්ක නිදාගන්න බැරිලු. තනියම නිදාගැනීම එයාගේ පවුලේ නීතියක්ලු. එයා කවුරු කියලද එයා හිතාන ඉන්නේ? කුමාරයෙක් ද?''

ගුස්ටාව් පිළිතුරු දෙන්නට මුව විවර කළ නමුත් බිල් වහා ඊට බාධා කළේය. ''ගුස් කතා ඉවරයි. ඔයා අනෙක් පිරිමි ළමයින් දෙන්නා එක්ක නිදා ගන්නවා. තේරුණාද?''

''මම නිදි ගන්නේ තනියම'' අකීකරු දරුවකු මෙන් ගුස් පැවසුවේය. ''කවදාවත් මම...''

''එයාට තනියම නිදාගන්න පුළුවන් පුංචි කාමරයක් තියෙනවා'' ඩිනා හදිසියේ පැවසුවාය. ''මේ දනුයි මං ඒක දක්කේ උඩ තට්ටුවට ගියාම. එයාට ඒකෙ නිදිය ගන්න පුළුවන්. හැබැයි විශාල මකුළුවෝ ඒකෙ පිරිලා. මට මීයෙක් කෑගහන සද්දෙත් ඇහුණා''

ගුස්ටාව්ගේ මුහුණ බියෙන් අඳුරු විය. ''නෑ.... නෑ. මම මකුළුවොයි මීයොයි එක්ක නිදියන්නෙ නැහැ. ඒත් පිලිප් හා ජැක් එක්ක නිදියන්නත් බැහැ. අර දුෂ්ට ගිරවා එක්ක නිදියන්නත් බැහැ''

''ගුස් මෙහාට එමු ටිකකට'' පිරිමි ළමයාගේ කරට අතර දමාගත් බිල් ඔහු තම නිදන කාමරයට කැඳවාගෙන ගොස් දොර වසා දැමීය. දෙදෙනා මොන මොනවාදෝ මුමුණන අයුරු අසා ගැහැනු ළමයි දෙදෙන විමතියෙන් මුහුණට මුහුණ බලාගත්හ.

''අම්මේ මොනවාද මේවායේ තේරුම?'' ඩිනා විමසුවාය. ''බිල්, ඇයි ගුස්ටාව්ව තියන්න ඕනෙ තැන තියන්නෙ නැත්තේ? හැම වෙලාවකම එයා නිකං රාජ කුමාරයෙක් වගේ බොහොම ඉහළ විදියට හැසිරෙන්නයි අපට අණ දෙන්නයි ලැස්ති වුණොත් අපි සේරටම එයාව එපා වේවි''

''බිල් ඒක බලාගනීවි'' කනිංහැම් මහත්මිය වහා කතාවේ මාතෘකාව වෙනස් කළාය. ''මේ ටික උඩට ගෙනියන්න ඩිනා. ලූසී ඈන් මේවා මගේ කාමරයෙන් තියන්න''

ගැහැනු ළමයි ඉහළ මාලයට ගියහ. ''බිල් වගේම අම්මත් ගුස් ගැන මොකක් හරි රහසක් දන්නවා වගේ'' ඩිනා පැවසුවාය. ''ඇත්තටම එයාගේ රහසක් තියෙනවාද? එයා වෙස්වලා ගත්ත රාජ කුමාරයෙක් හරි ඒ වගේ කවුරුහරි වෙන්න පුළුවනිද?''

''මොකක්? ඒ වගේ පිස්සු පොඩි එකෙක් රජ කුමාරයෙක්?'' ලූසී ඈන් විමසුවාය. ''කොහෙත්ම වෙන්න බැහැ''

# 6. ගුස්ටාව්ට සෙම්ප්‍රතිශ්‍යාව

ගල් වළ ළඟ නිවහනේ සියලු කටයුතු සතුටුදායක ආකාරයෙන් සිදුවෙමින් පැවතිණි. කනිංහැම් මහත්මිය ද සතුටෙන් පසුවූවාය. සත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සමඟ නිවාඩුවක් ගත කිරීම පහසු වන්නේ නැතැයි ගමන පටන් ගන්නට පෙර ඇය සිතමින් සිටියාය. සත් දෙනාගෙන් පස් දෙනෙක්ම ළමයි වෙති. ඔවුන්ගේ කටයුතු සියල්ල සිදු කරනවාට අමතරව ඉවුම් පිහුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සොයා ගැනීම වඩාත් අසීරු වනු ඇතැයි ඇය සිතා සිටියාය.

එහෙත් දැන් සියල්ල පහසුය. ගම්මානයේ ගොවිපොළ පිහිටියේ දුර ඈතක නොව ඇවිද යා හැකි තරම් දුරකය. ගොවිපොළෙන් ඕනෑම ආහාර ද්‍රව්‍යයක් ලබා ගත හැකිව තිබිණි. කුඩා සිරුරැති ගෘහ සේවිකාව ගම්ප් මහත්මිය දිනපතා ගල් වළ ළඟ නිවහනට පැමිණ එහි සියලු කටයුතු කඩිසරව ඉටු කළාය. එමෙන්ම ඇය කුඩා දරුවන්ට ද බෙහෙවින් කැමති වූවාය.

එසේ වුව ඇය ගුස්ටාව් කෙරේ පළ කළේ නොකැමැත්තකි. ''එයා මට අණ දෙන්න එනවා'' ඇය පැමිණිලි කළාය. ''සමහර වෙලාවට උඩු මහලට ගිහින් එයාගේ ලේන්සුව අරගෙන එන්න කියලාත් එයා මට අණ කරනවා නෝනා. එයාත් නෝනලා එක්කම නේද ඉන්නේ? කොහොම වෙතත් කවුරුවත් මට අණකරනවාට මම කැමති නැහැ. විශේෂයෙන්ම පොඩි ළමයින්''

නිවාඩුවේ පළමු දින කිහිපයේ ගුස්ටාව් නිසා මහත් අසීරුතාවන් ඇති විය. ඔහු බොහෝ දේවලට අකමැත්ත පළ කළේය. යාන්තමට හීරුණු පිඟානක් ඔහුට ලැබුණත් ඔහු ඒ ගැන මැසිවිලි නැගුවේය. තම තමන් තම තමන්ගේ යහන් සකසා ගත යුතුය යන්න නිවාඩුව ගත කළ නිවහනේ පොදු නීතිය වුවද ගුස්ටාව් තම යහන සකසා ගැනීම ප්‍රතික්ෂේප කළේය.

''මම මොකටද මගේ ඇඳ හදාගන්නේ?'' ඔහු වාරයක් නැති අයෙකු මෙන් ප්‍රශ්න කළේය. ''ගම්ප් මහත්මියයි මගේ ඇඳ හදන්නෝනෙ''

''නැහැ... එයා හදන්නෙ නැහැ'' ඩිනා පැවසුවාය. ''ඔයා ගිහින් ඔයාගෙ ඇඳ හදාගන්න. දෙයියන්ගේ නාමෙට මෙතැන අනවශ්‍ය කරදර ඇති කරන්න එපා ගුසී''

''පිස්සු ගුසී. පිස්සු ගුසී'' කිකී කෑ ගැසුවේය.

අතට හසු වූ පොතකින් ගුස්ටාව් කිකීට දමා ගැසුවේය. හිස පහත් කර එම පහරෙන් බේරිගත් ගිරවා උපහාසාත්මක සිනහවක් නැගුවේය. ඔහු තවත් පොතක් අතට ගන්නට නැගී සිටිය ද ඒ වහා ඇඳ වැටුණු ඔහුගේ තට්ටම් බිම ඇනිණි.

ගුසී ගැන කෝපයෙන් පසු වූ ඩිනා ඔහු තල්ලු කර දැමුවාය. ඇය කෝපයට පත්ව සිටි අතර ඔහුගේ පිට මත හිඳගත් ඇය ඔහුගේ හිස බිම අනින්නට සූදානම් වූවාය. ඔහු මරහඬ තැලුවේය.

කනිංහැම් මහත්මිය එතැනට දිව ආවාය. ''ඩිනා මොනවද ඔය කරන්න යන්නේ? නැඟිටලා යනවා උඩ තට්ටුවට. ගිහිං ඉන්නවා මං එනකං''

''මෙයා කිකීට පොතකින් ගැහැව්වා'' කෝපයෙන් රතු වූ මුහුණින් යුතුව නැගී සිටිමින් ඩිනා පැවසුවාය. ගුස්ටාව් තව දුරටත් බිම වැතිර සිටි අතර ඔහුගේ කම්මුල් කඳුළෙන් තෙමී ගියේය.

''නැගිටිනවා ගුසී'' කනිංහැම් මහත්මිය අණ කළාය. ''ඩිනාට වගේම ඔයාටත් මම වරද පටවනවා. යන්න ඔයාගේ කාමරේට. ගිහිං එහාට වෙලා ඉන්න''



''ඔබට බෑ මට අණ කරන්න'' හැඬීම පාලනය කර ගනිමින් මහත් උදාරම් බවකින් යුතුව ගුස්ටාව් පැවසුවේය. ''මේ කෙල්ල අර දුෂ්ට කුරුල්ලත් එක්ක ආපහු ගෙදර යවන්න''

''යනවා ඔයාගේ කාමරයට'' කනිංහැම් මහත්මිය උස් හඬින් කෑගසද්දී වහා නැගී සිටි ගුස්ටාව් පඩිපෙළ දිගේ ඉහළට දිව ගියේය. කාමරයට ඇතුළු වූ ඔහු මහ හඬින් එහි දොර වසා ඊට අගුළු දැමුවේය.

බිල් එතැනට පැමිණියේය.

''ආයෙමත් ගුස්ටාව්'' ඔහුගේ බිරිය පැවසුවාය. ''ඇත්තටම එයානං ඔළුව ඉදිමවාගෙන ඉන්නේ. මේ විදිහට හරියන්නේ නැහැ බිල්. අපි වෙන මොකක් හරි විදියක් ගැන හිතන්න ඕනෙ. අනික් අයට තේරෙන්නෙ නැහැ. අපිට බැරිද එයාලට ඇත්ත කියන්න?''

මම ආපහු ගුස්ටාව් එක්ක කතා කරන්නම්'' බිල් පැවසුවේය. ''එයා මම කියන දේ අහන්නෙ නැත්නං, මම එයාව වෙන කොහාට හරි එක්කරගෙන යනවා..... හ්ම්... මෙතැන සේරම එක්ක ඉන්නවාට වඩා එයාව එක්කරගෙන යන එක ආරක්ෂිතයි කියලා මට හිතෙනවා'' බිල් උඩුමහලේ වූ ගුස්ටාව්ගේ කාමරයට ගිය අතර, කනිංහැම් මහත්මිය ඩිනා වෙත ගියාය. ලුසී ඈත් ඇය සමඟ එක්ව ඇඳුම් පැළඳුම් නමමින් අල්මාරියේ අසුරමින් සිටි අතර ඩිනා වඩාත් නිහඬව සිටියාය.

''ඇයි මට විතරක් දොස් පවරන්නේ?' තම මව තමාට බැණ වදිනු අසා සිටි ඩිනා විමසුවාය. ''හැම වෙලාවකම ගුසී ඇයි අපට ප්‍රශ්න ඇති කරන්නේ? හැම වෙලාවෙම අපට බාධා කරනවා. අණ කරනවා. හොඳම දේවල් එයා අයිතිකරගන්න හදනවා. කිකීට හිරිහැර කරන්න හදනවා''

''ඔය දේවල් මට නොතේරෙනවා නෙවෙයි'' ඇගේ මව පැවසුවාය. ''බිල්ටත් ඔය සේරම තේරෙනවා. ඒත් ඊළඟ සති කිහිපය පුරා ගුස්ටාව් බලා ගන්න බිල් පොරොන්දුවෙලා ඉවරයි. එයා ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න ඕනෙ. මට වෙලාවකට හිතෙනවා අපට අපේ පාඩුවේ ඉන්න ඉඩ ඇරලා ගුස්ටාව් එක්ක බිල් වෙන කොහාට හරි යනවා නම් හොඳයි කියලා''

''ත්නෑ.. නෑ... බිල් වෙන කොහෙවත් යන්න ඕනෙ නෑ.. අපට ගුස්ටාව් එක්ක ඉන්න පුළුවනි'' ඩිනා කීවාය. ''ඒත්.. ඒත්.. අපොයි දෙවියනේ.... ගුස්ටාව් කරන වැඩ දක දක එයා එක්ක රණ්ඩු නොවී ඉන්නේ කොහොමද? එයා එක්ක රණ්ඩු නොවී ඉන්න පුළුවන් වේවි කියලා මං හිතන්නේ නැහැ. ඒ වුණත් බිල්ට යන්න ඉඩ දෙන්නත් බැහැ''

''එහෙම නෑ. පැයක් මෙතැන ඉඳලා ඔයාගේ හිත හදාගන්න ඩිනා'' ඇගේ මව ඉවසීමෙන් තොරව පැවසුවාය. ''ලුසී ඇන් යමු මා එක්ක පල්ලෙහාට''

ගුස්ටාව් පොතකින් කිකිට පහර දුන් බව කිසිවකු ජැක්ට හෝ පිලිප්ට හෝ පැවසුවේ නැත. කිකිට ද එය අමතක වූයේ නැත. තමන්ට අවස්ථාව ලැබෙන සෑම විටෙකම අසරණ ගුසීට රිදවන්නට කිකී ඉටාගෙන සිටියේය. තම පාදයේ මහපටැඟිල්ලට කොටන තුරු කිකී මෙසය යටට රිංගා ඇතැයි ගුස්ටාව් දැන සිටියේ නැත. කිකී තම නිදන කාමරයට රිංගා යහන යටට වී සැඟවී තමන් පැමිණෙන තුරු බලා සිටින බව ද ගුස්ටාව් නොදැන සිටියේය. ඇඳ යටට වී කිකී විවිධ ශබ්ද නඟන්නට පටන්ගත් වහා බිය වූ ගුස්ටාව් මහත් කලබලයෙන් පහළ මාලයට දිව ගියේය.

''බිල් ගුස්ටාව්ට දඬුවම් කරන්නේ නැහැ. ඉතිං එහෙම දඬුවම් නොකරනවා නං කිකී කරන දේවල් වැරදියි කියලා කියන්නත් මට බැහැ'' ඩිනා ලුසී ඇන්ට පැවසුවාය. ''අද අපි එක්ක සීනි පාන් කන්දට යන්න ගුස්ටාව් නොඑනවා නම් හොඳයි''

විනෝද සවාරියක් සූදානම් කර තිබුණේ සීනි පාන් කන්දට යනු පිණිසය. සීනි - පාන් කන්ද යනු ළමයින්ගේ දැඩි අවධානය දිනා ගත් නමකි. එය කෙතරම් අමුතු නමක් ද?

ඔවුහු එක්ව ගමන් ඇරඹූහ. බිල් හා පිරිමි ළමයි ආහාර සහිත බෑග පිටෙහි එල්ලාගෙන සිටියහ. ගුස්ටාව් කන්කෙඳිරි ගෑවේය. බෑගයක් පිටේ එල්ලා ගෙන යාම සිය ආත්ම ගරුත්වයට හානියකැයි ඔහු සිතන බව පැහැදිලිව පෙනිණි.



''ඒක.... මං කවදාවත් කරලා නැති වැඩක්'' ඔහු විරෝධය පෑවේය. ''මගේ රටේදී ඒක....... හ්ම්...... කොහොමද මං ඒක කියන්නේ? බූරුවනුයි අපේ බඩු උස්සාගෙන යන්නේ. ඇයි මයගොල්ලන්ට බූරුවන් නැත්තේ? මං බූරුවෙක් නෙවෙයි''

එම කතාවට සියල්ලන්ම සිනාසෙනු අසා ඔහු විමතියට පත් විය.

''ඔයා දන් කිවේ. ඔයා බූරුවෙක් වග ඔයා දන්නෙ නැහැ කියලාද?'' ජැක් උපහාසාත්මක ස්වරයෙන් විමසුවේය.

''ඒ විදියට මට කතා කරන එක වැරදියි'' ගුස්ටාව් පැවසුවේ කෝපයෙනි. ''මගේ රටේදි නං ඔයාලා මට......''

''කන් කෙඳිරිය නවත්තමු බූරුවෝ'' පිලිප් කීවේය. ''ඕනෙ නං ඔයාගේ බෑග් එක තියලා යමු. ඒ ගැන කවුරුවත් මොකුත් කියන්නෙ නෑ. ඒ බෑග් එකේ තියෙන්නෙ ඔයාගේ දහවල් කෑම මිස වෙන මොකවත් නෙවෙයි. අපි ගෑනු ළමයින්ගේ කෑමත් උස්සාගෙන යනවා. බිල්ගේ බෑග් එකේ අම්මාගේ කෑම. ඔයාගේ බෑග් එකේ තියෙන්නේ ඔයාගේ කෑම විතරයි''

''මොනවද බලාන ඉන්නේ? ඔය බෑග් එක පඳුරක් අස්සට විසි කරලා දාන්න. එතකොට ඔයාට බූරුවෙක් වගේ බෑග් උස්සගෙන යන්න වෙන්නෙ නැහැනේ'' ඩිනා පැවසුවේ අනෙක් අයගේ ද සිනා හඬ මධ්‍යයේය. ''ඉතින් විසි කරන්න ගුස්''

නමුත් ගුස්ටාව් එසේ කළේ නැත.

සීනි පාන් කන්ද එම නමටම ගැළපෙන්නක් විය. සීනි පාන් ගෙඩියක හැඩ ගත් එම කන්ද මුදුනේ විවිධ අලංකාර මල් වර්ග පිපී තිබිණි.

''කන්ද මුදුනට නැඟ ගත්තාම අපට හුඟාක් දුර පෙනේවි'' කන්ද නගිමින් ජැක් කීවේය. ඉහළට නැඟීම එතරම් පහසු කාර්යයක් නොවූව ද අවසානයේ ඔවුහු පාන් ගෙඩියක මුදුන මෙන් සමතල වූ කඳු මුදුනට ළඟා වූහ. දැඩි හිරු රැසින් කඳු මුදුන රත් වී තිබුණ ද සුළඟ වේගයෙන් හැමූ හෙයින් ඔවුනට අපහසුවක් දැනුණේ නැත.

''හප්පා..... ගුස්ටාව් එයාගේ දවල් කෑම ටික විසි කරලා නැහැනෙ'' ජැක් විමතියක් මවා ගනිමින් පැවසුවේය. ''මට නං බඩගිනියි''

ඔවුන් සියලුදෙනාටම කුසගිනි දැනෙමින් තිබිණි. තමන් අරගෙන ආ සරල ආහාරයන්ගෙන් ඔවුහු කුසගිනි නිවාගත්හ. තම ආහාරවලින් කොටසක් කිකීට ද දීමට ඔවුන් මැළි නොවූ අතර ගිරවා වැඩිපුර ගිල දැමුවේ කෙසෙල්ය. එක පාදයකින් කෙසෙල් ගෙඩිය තදින් අල්ලා ගත් ඌ හොටයෙන් එහි විශාල කැබලි කඩාගෙන ගිල දැමුවේය.

ගුසී කිවිසුමක් හැරියේය. ඒ වහා කිකී ද ඊට වඩා ඉහළ ශබ්දයකින් යුතුව කිවිසියේය. ඉන්පසු ගුසී නාසය ඉහළට ඉරූ අතර එය කනිංහැම් මහත්මිය එතරම් ප්‍රිය නොකළ දෙයක් විය.

කිකී ද නාසය ඉහළට උරනවා වැනි හඬක් ඇති කළේය. ''නවත්තනවා කිකී'' කනිංහැම් මහත්මිය කෑ ගැසුවාය. ''එක්කෙනෙක් එහෙම කළාම හොඳටෝම ඇති''

''කිකීට හෙම්බරිස්සාව'' පැවසූ කිකී නැවතත් ගුස්ටාව් මෙන්ම කිවිසියේය. ගුස්ටාව් ඒ ගැන උනන්දුවක් නොදැක්වූ නමුත් මොහොතකට පසු ඔහු නැවතත් කිවිසියේය.

''නාහෙ පිහදාගන්න'' කිකී කෑ ගැසුවේය. ''කෝ ලේන්සුව. ගුසීට හෙම්බිරිස්සාව. දොස්තර......''

''කට වහගන්නවා කිකී'' ජැක් පැවසුවේය. ''ගුස් ඔය විදියට ඔයා දිගටම කිඹුහුම් යැව්වොත් කිකීත් දිගටම එහෙම කරයි''

''මම කිඹුහුම් ඇරියෙ නෑ'' ගුසී පැවසුවේය. ''කිකී නරක ගිරවෙක්. ඌ කූඩුවට දාන්න ඕනෙ''

''කට වහගන්නවා ගුස්'' බිල් අණ කළේය. ඔහු සිටියේ කඳු මුදුනේ වැතිර දුම් පයිප්පයක් උරමිනි. ''මම කීව දේවල් මතක් කර ගන්නවා''



බිල්ගේ මවදන් යළි සිහියට නඟාගත්තා සේ ගුස්ටාව් නිහඬ විය. ඔහු ද ගල් තලාවේ වැතිර දෑස් පියා ගත්තේය. අනෙක් අය එතැන සිට ඈත බැලූහ. එය සුන්දර දර්ශනයක් වූ අතර ඔවුනට බොහෝ දුර ඈත දැකගන්නට ද හැකි විය.

''අර පෙනෙන්නේ ගම්මානය'' ඈතට ඇඟිල්ල දිගු කරමින් පිලිප් පැවසුවේය. ''ආං.. අර අතන පෙනෙන්නේ ගොවිපොළ. ඊට මෙහායින් ඔයාලාට පේනවා නේද ගල් වළ ළඟ නිවහනේ දුම් කවුළුවයි, පිදුරු සෙවිලි කළ වහළයයි. අර ගස්වලට උඩින්. අර.... අර.....''

''අර පෙනෙන්නේ අපි ඒ ගමට ආව මහා මාර්ගය'' ජැක් පැවසුවේය. ''කෝ මගේ දුර බලන කණ්ණාඩි? ඕනා..... ඕක මට දෙන්න... ෂාහ්.... මේකෙන් හැතැප්ම ගාණක් ඈත බලන්න පුළුවනි. මහා මාර්ගයේ සැහෙන දුරක් මේකෙන් පෙනෙනවා. ඒකෙ ගමන් කරන වාහනත් පෙනෙනවා. ඒ වාහන හරියට අපේ සෙල්ලම් කාර් වගේ. පිලිප් මේ බලන්න''

පිලිප් දුර බලන කණ්ණාඩිය අතට ගත්තේය. ජැක් පැවසුවාසේම ඔහුට ද සැතපුම් ගණනාවක් දුර ඈත පැහැදිලිව දැකගත හැකිවිය. ''පාර හරියට රිබන් පටියක් වගේ. කාර් ලොරි සෙල්ලම් බඩු වගේ තමයි පෙනෙන්නේ.'' පිලිප් කීවේය. ''හා.. අර කළු පාට කාරෙක.... හරියට බිල්ගේ කාරෙක වගේ. බලමු ඒක කොහාට ද යන්නෙ කියලා....''

අනෙක් අය ගල් තලාව මත වැතිර අඩ නින්දකට පිවිසියහ. හිරු මුදුන් වී තිබිණි. දැඩි උණුසුමක් පැතිර තිබූ අතර එවන් කාලගුණයක තවත් ඇවිද යනවාට වඩා විවේකීව සිටින්නට ඔවුහු ප්‍රිය කළහ.

''ඔව්.... තවමත් කළු පාට කාරෙක එන්නේ මහා මාර්ගය දිගේ'' පිලිප් පැවසුවේය. ''බොහොම වේගයෙන් ඒක එන්නේ. ඒක පොලිස් කාරෙකක්ද?''

''ඔව්.... තරමක් දුර ඉඳන්, ඔය එන්නේ පොලිස් කාරෙකක්ම ද කියලා කියන්න බැහැ'' ජැක් පැවසුවේය.

බිල් පුවත්පත කියවමින් සිටියේය. පොලිස් රථ පිළිබඳ ඔහු නම් බොහෝ කරුණු දැන සිටියේය.

''ඒ කාරෙකේ නොම්මරේ කියන්න. එතකොට මම කියන්නම් ඒක පොලිස් කාරෙකක්ද නැද්ද කියලා'' බිල් පැවසුවේය. පිරිමි ළමෝ සිනාසුණහ.

''ඔයා නං දක්ෂයි බිල්'' ජැක් පැවසුවේය. ''ඒත් ඔයා හොඳටම දන්නවා ඔයා අමාරුවේ වැටෙන්නෙ නැහැ කියලා. මෙ තරම් දුර ඉඳන් මෝටර් රථයක නොම්මරය කියවන්න බැරි බව ඔයා දන්නවා. තවමත් කාරෙක පේනවාද පිලිප්?''

''නොපෙනී ගියා'' පිලිප් පිළිතුරු දුන්නේය. ''ගොඩනැගිලි වගයකට වැහුණා.ආ.. හරි ආපහු පේනවා. අතුරු පාරකට හැරුණා. අන්න ඒක නතර වුණා.''

ගුස්ටාව් නින්දෙන් ගෙරවූ අතර කිකී එම හඬ අනුකරණය කළේය. පිලිප් නැවතත් තමන්ට පෙනෙන දෑ විස්තර කළේය.

''කවුදෝ කාරෙකෙන් බැස්සා. මං හිතන්නේ එයා මාර්ග විස්තර සහිත පුවරුව බලනවා. එයා අයෙම කාරෙකට ගොඩ වුණා. ඔව් එයාලාට පාර වැරදිලා. එයාලා පස්සට එනවා. ඔව් මම හිතුවා හරි. ඒ අය අපි ඉන්න ගමට හැරෙන පාරට ආවා''

''ඊළඟට ඔයා කියයි එයාලා ගල් වළ ළඟ නිවහන ළඟට ආවා කියලා'' ජැක් නිදිමතෙන් යුතුව පැවසුවේය.

''ආයෙත් නොපනී ගියා... නෑ... ආයෙත් පේනවා. පිලිප් පැවසුවේය. ඒ කාරෙක ගම හරහා එනවා. නතර වුණා. කාගෙන් හරි පාර අහනවා. ආයෙත් ඉස්සරහට එනවා. ආන්න ගොවිපොළට හැරුණා. මං හිතන්නේ එලිස් මහත්මියගේ පෝසත් ඥාතියෙක්''

පුවත්පත පසෙක දමූ බිල් නැඟිට දුර බලන කණ්ණාඩිය ගත්තේය. ගොවිපොළ දෙස ඒ හරහා බැලූ ඔහුට රථය පැහැදිළිව දැක ගත හැකි විය. එය විශාල හා වටිනා මෝටර් රථයකි. කෙටි කාලයක් ඇතුළත රථය ගැන අධ්‍යයනය කළ ඔහු කිසිවක් නොකියා යළි දුර දක්නය පිලිප් අත තැබුවේය.



''ඔයා ඒ කාරෙක දන්නවාද බිල්?'' බිල්ගේ මුහුණ වෙනස්ව ඇති බව දුටු ජැක් කුතුහලයෙන් යුතුව විමසුවේය.

''නැහැ'' බිල් පිළිතුරු දුන්නේය. ''මම දන්නෙ නැහැ. ඒත් ඒ කාරෙක ගැන මම ටිකක් හිතන්න ඕනෙ. කනගාටුයි. මට ඊට වඩා මොකුත් කියන්න බැහැ. අද හවසට ගොවිපොළට ගිහින් ප්‍රශ්න ටිකක් අහන්න වෙනවා. එතකොට මට තව තොරතුරු දැනගන්න පුළුවන් වේවි''

# 7. පුදුම සිතෙන නිවේදනය

බිල් පැවසූ දෑ ඇසූ ජැක් හා පිලිප් මෝටර් රථය ගැන පෙරටත් වඩා උනන්දුව දැක්වූහ. එතැන මිනිත්තු විස්සක් පමණ වේලාවක් නතර වී තිබූ මෝටර් රථය ඉනික්බිති එය පැමිණි මාර්ගය ඔස්සේම යළි පිටව ගියේය.

''ඒක ආපහු ගියා බිල්'' පිලිප් කීවේය. ''මං හිතන්නේ ඒකෙන් අමුත්තන් කවුරු හරි එන්නැති. හේ... අර බලන්න. ගුසී කට ඇරගෙන නිදි. දාමුද කටට මොනවා හරි''

''එයා ඔහොම උන්නාවේ'' ජැක් කීවේය. ''ඒ වගේම කිකීගේ ඔළුවට එක එක අදහස් දාන්නත් එපා. නැත්නං කිකී වටේ කැරකිලා මොනවා හරි හොයාන ඇවිත් ගුසීගේ කටට ඔබයි''

පිලිප් අවට බැලුවේය. අවදිව සිටින්නේ බිල්, ජැක් හා තමා පමණක් බව ඔහුට වැටහිණි. ඔහු තම කලිසම් සාක්කුවට අත දමා යමක් පිටතට ගත්තේය. කුඩා සහ දුඹුරු පැහැ ලස්සන එය ඔහුගේ අත මත හිඳගෙන සිටියේය. ඩෝමවුස් යනුවෙන් හඳුන්වන සීත කාලයේ පමණක් නිදාගන්නා මී වර්ගයට අයත් සතෙකි.

''ෂාහ්... ඩෝමවුස්.... කොච්චර හුරතල් සතෙක් ද?'' ජැක් පැවසුවේය.

''ඔය සතාව ඩිනාට නං පෙන්නන්න එපා. එයා බයවෙයි''



''මෙහාට එන අතරෙදියි මට මෙයාව හම්බ වුණේ'' පිලිප් පැවසීය.

''මූ අත්තක් උඩ ඉන්නවා දැක්ක ගමන් මම අල්ල ගත්තා''

''ඔයා නං හරි පුදුම කෙනෙක් පිලිප්. ඔයාගේ අවධානයට අහුනොවුණු සතෙක් තවම මම දැකලා නැහැ. ඩෝමවුස් ලස්සන පුංචි සතෙක් නේද?''

''මම මූට ස්නූසි කියලා නම දානවා'' පුංචි සත්වයා පිරිමදිමින් පිලිප් පැවසුවේය. කුඩා මීයාගේ කළු පැහැති දෑස කණ්ණාඩියක් මෙන් දිලිසිණි. ''ඩෝමවුස් අලස - ඔහේ පාඩුවේ පැත්තකට වෙලා ඉන්නා සතෙක්. ආයෙ ගම්මානයට ගිය වෙලාවට මෙයාට කන්න දෙන්න මොනවා හරි ගන්න ඕනෙ. ස්නූසි ඇට වර්ගවලට කැමති වේවි. අපි ඔයා ගැන ඩිනාට කියන්නෙ නෑ ස්නූසි. ඔයාට පුළුවනි මගේ සාක්කුවට වෙලා සුව පහසුව ඉන්න. මීට කලිනුත් මා ළඟ ඩෝමවුස් සතෙක් හිටියා. උන් හරිම හීලෑයි''

''මට කාගෙ හරි කටහඬක් ඇහුණාද?'' ජැක් විමසුවේය.

පිරිමි ළමයි දෙදෙන හඬ ආ දෙස බැලූහ. ඔවුනට පෙනුණේ ගොවිපොළක කම්කරුවන් යැයි සිතිය හැකි දෙදෙනකු එකිනෙකා හා කතා බහ කරමින් කඳු මුදුනට යාබදව තිබූ අඩිපාරක් දිගේ ගමන් කරන ආකාරයයි.

''මට හිතෙනවා එයාලා ළඟට ගිහිං මේ පළාතේ බැජර් වලස්සු ඉන්නේ කොයි හරියේ ද කියලා අහන්න'' පිලිප් කීවේය. ''යමු ජැක්''

දෙදෙනා අඩි පාරට දිව ගියහ. ඔවුන් දිව එන හඬ අසා නතර වූ කම්කරුවෝ හැරී බැලූහ.

''සුබ සන්ධ්‍යාවක්. අපි ඔයාලාගෙන් ප්‍රශ්නයක් දෙකක් ඇහුවාට කමක් නැද්ද?'' පිලිප් විමසුවේය. ''බැජර් වලස්සු ගැන''

''බැජර්.... ඒ මොක්කුද?'' තරුණ කම්කරුවා විමසීය.

"මොනවද මනුස්සයෝ...... බැජර්ලා ගැන දන්නෙ නැද්ද? බ්‍රොකස්... බ්‍රොක්ස්" අනෙකා පැවසුවේ සිනාසෙමිනි.

"ආ... බ්‍රොක්ස් වලස්සු" තරුණයා ද සිනාසුණේය. "නෑ.. මම උන් ගැන මොකුත්ම දන්නෙ නැහැ. ජීවිතේටම එකෙක්ව දැකලා නැහැ"

"ඒ ඔයා හැම රයකම ගොරවා ගොරවා නිදාගන්න නිසා" අනෙක් කම්කරුවා පැවසුවේය. "ඒ සත්තු එළියට එන්නේ රෑට. මම නං කීපවතාවක්ම උන්ව දැකලා තියෙනවා"

"තමුසේ. අවංක ගම්මු නින්දේ ඉන්දැද්දි දඩයමේ යනවානෙ ජෙබ්. එතකොට තමයි තමුසෙට උන්ව දකින්න ලැබෙන්න ඇත්තෙ"

"ඔව්. සමහර විට" වැඩිමහලු කම්කරුවාගේ දෑස් ප්‍රීතියෙන් දිලිසුණේ තමා ප්‍රියකරන මාතෘකාවක් කතා කරන්නට ලැබුණාක් මෙනි. ඔහු පිරිමි ළමයින් දෙසට හැරුණේය. "ඉතිං මොනවද ඔයාලට ඒ සතුන් ගැන දැනගන්න අවශ්‍ය?"

"අහ්... අපටත් ආසයි උන්ව බලන්න" පිලිප් පැවසුවේය. "මම හැම වර්ගයකම සතුන් ගැන උනන්දුයි. ඒත් මම කවදාවත් බැජර් වලහෙක් දැකලා නැහැ. අපි නතර වෙලා ඉන්නේ ගල් වළ ළඟ නිවහනේ. ඒ කිට්ටුව කොහේදිද අපට බැජර් සතෙක් දැකගන්න පුළුවන් වෙන්නෙ"

"ආ.. එහේද ඔයාලා නතර වෙලා ඉන්නේ? එහෙම නං පුංචි මහත්තයෝ ඔයාලාට වැඩි කරදරයක් නැතුව උන්ව බලාගන්න පුළුවනි. ඒ නිවහනට නැගෙනහිරින් වනාන්තරය. එහෙදි තමයි උන්ව දැක ගන්න පුළුවන්. විශේෂයෙන්ම පරණ ගල් වළ තියෙන හරියේ. පහුගිය අවුරුද්දේ මං දැක්කා ඒ හරියේ බැජර්ලාගේ බෙනයක් තියෙනවා. උන්ගේ බෙන තියෙන තැන්වල පිටත විශාල පස් ගොඩක් තියෙනවා"

"ඔව්. ඒක ඇත්ත. උන් හැම වෙලාවෙම බෙන හාරලා ඒ උඩ පස් ටික තියන්න ඉඩ අරිනවා" පිලිප් පැවසුවේ මේ වැඩිමහලු කම්කරුවා තමාට නැවත මුණගැසේවා යි යටි සිතින් ප්‍රාර්ථනා



කරමිනි. එම කම්කරුවාගෙන් බොහෝ සතුන් ගැන විවිධ කතාන්දර අසා දැනගත හැකි බව පිලිප් වටහාගෙන සිටියේය. "බොහෝම ස්තුතියි. අපි ඒ හරියේ බලන්නම්"

"ඒ ගල් වළේ බකමූණන් ඉන්නවා" වැඩිමහලු කම්කරුවා පැවසුවේය. "එක එක ජාතියේ බකමූණෝ. පුංචි උන්, විශාල උන්. ගල් වළේ ඉන්න මීයන් අල්ලාගන්න තමයි උන් නිතරම බලාගෙන ඉන්නෙ. ඒ බකමූණෝ කෑගහනකොට හුඟාක් බය හිතෙනවා"

"මම දන්නවා" පිලිප් පැවසුවේ හැකිතරම් ඉක්මනින් පැරණි ගල් වළට යන්නට තීරණය කරමිනි. ඔහු බකමූණන්ට ද බෙහෙවින් ප්‍රිය කළේය. බකමූණු පැටවකු අල්ලාගෙන හීලෑ කරන්නට ඔහු ඉටා ගත්තේය. එසේ වුව තමා ළඟ ඉන්නා ඩෝමවුස් බකමූණකුගේ ඇස නොගැසෙන පරිදි තබා ගන්නට ඔහු පරෙස්සම් විය යුතුය. බකමූණකු ස්නූසි දුටුවොත් ඒ ස්නූසිගේ අවසානය වනු ඇත.

කම්කරුවන්ගෙන් සමුගත් පිරිමි ළමයි දෙදෙනා කඳු මුදුනේ ඒ මේ අත ඇවිද්දාහ.

"ජැක් ! පිලිප් !" බිල්ගේ කටහඬ ඇසිණි. "අපි ආපහු යන්නයි ලෑස්තිය. ඔයාලා අපි එක්ක එනවාද? එහෙම නැත්නං පස්සෙ එනවාද?"

"අපි දැන් එනවා" ජැක් කෑගැසුවේය. ඉන්පසු ඔහු පිලිප් සමග අනෙක් අය සිටි තැනට දිව ගියේය. ගුසී අවදිව උගුර පාදමින් සිටින බව ද තමන් එතැනට ළං වෙද්දී ඔහු සිය මුවින් යමක් පිටතට ගත් බව ද ඔවුන්ට පෙනිණි.

"කවුදෝ එයාගේ කටට තණකොළ කැල්ලක් දාලාලු" ඩිනා කීවේ සිනාසෙමිනි. "මෙච්චර වෙලා එයා උත්සාහ කළේ ඒක පිටට ගන්න. ජැක් ඔයා ද ඒක දැම්මෙ?"

"නෑ" ජැක් කීවේය. "පිලිප් දැම්මෙත් නැහැ"

"හරිද මං කිව්වා" ඩිනා පැවසුවේ මහත් කෝපයෙන් ගුස්ටාව් වෙත හැරෙමිනි. "ඔයා නිදාගෙන ඉද්දි කවුරුවත් මොකවත් ඔයාගේ කටට දමලා නැහැ. ඔයා සේරම හිතින් මවාගෙන. මං ඔට්ටුවක් අල්ලන්නම්. තණකොළ කැල්ලක් කටට දාගන්න ඇත්තේ ඔයාමයි"

"මම දාගත්තෙ නැහැ" ගුසී පැවසුවේය. "මොනවා වුණත් ඒක මහ නපුරු වැඩක්. තව පොඩ්ඩෙන් ඒක හිරවෙලා මම මැරෙනවා"

"කවුරුවත් ඒක කරලා නැහැ" ලුසී ඇන් පැවසුවේය. "පුදුම වැඩක්නේ ඒක..... මේ... තව කෙළ ගහන්න එපා... දූන් ඒක එළියට ආවානේ"

ජැක් හා පිලිප් එකිනෙකා දෙස බලාගත්හ. අසරණ ගුසීගේ මුවට තණකොළ කැබැල්ල දමන්නට ඇත්තේ කවුරුන්දැයි ඔවුනට සිතා ගන්නට පුළුවන. ගුස්ටාව් ඔවුන්ගේ බැල්ම දුටුවේය. "කවුද ඒක කළේ කියලා ඔයාලා දන්නවා. ඒක ඔයාලාගේ ඇස්වලින් පෙනෙනවා"

"හරි... හරි..... ඒක කළේ කවුද කියලා අපි දන්නවා" ජැක් පැවසුවේය. "ඒක හොඳ විහිළුවක්. ඔයා කට ඇරගෙන ගොරව ගොරවා ඉන්නකොට ඒ වගේ දෙයක් කරන්න අපටත් හිතුණා"

"මං ගොරවන්නෙ නෑ" ගුසී පැවසුවේය. "කියන්න කවුද ඒක කළේ?"

"මම හිතන්නෙ කිකී වෙන්නැති" බිල් කීවේය. "කිකී වතාවක් මටත් ඔහොම කළා. ඒක පුංචි විහිළුවක්. ඔයාට විහිළු තේරෙන්නෙ නැද්ද ගුස්?"

ගුස්ටාව් හදිසියේ තම භාෂාවෙන් මොන මොනවාදෝ කියාගෙන කියාගෙන ගියේය. ඔහුගේ මුහුණ දම් පැහැ වූ අතර ජල දහරාවක් සේ ඔහුගේ මුවින් ගලා ආ ඒ වචන වලින් එකක හෝ අරුත එතැන සිටි කිසිවකු දූන සිටියේ නැත.



තමාට නොවැටහුණ ද කිකී ඒ වචනවලට හොඳින් ඇහුම්කන් දී ගෙන සිටියේය. කෝපයට පත් ගුස් අසලම සිටි ජැක්ගේ උර මත කිකී වසා සිටි අතර ඔහු නිහඬ වූ වහා කිකී කතාව ඇරඹුවේය.

"ගිබෙරොලිඩොකෙරි බිලෝවිකෙට්ල් ෆුසි..... පිස්සු ගුසි" තමා දන්නා හා නොදන්නා වචන කලවම් කරමින් කිකී කියාගෙන ගිය අතර ගුස් හැර අනෙක් අය මහ හඬින් සිනාසුණාහ. ඌ කතා කළේ මොහොතකට පෙර ගුස්ටාව් කතා කළ ආකාරයටමය.

ගුස් නිහඬව විමතියෙන් යුතුව කිකී දෙස බලා සිටියේය. "දූන් මේ ගිරවා ඉංග්‍රීසි කතා කරන්නේ නැද්ද?" ඔහු විමසුවේය. "මොකක්ද ඒ භාෂාව?"

"මෙකා කනට ඇහෙන හැම දෙයක්ම කතා කරනවා" ජැක් කීවේය.

"නිස්සද්ද වෙනවා කිකී.. තරකට හැසිරෙන්න එපා"

බිල් හා කනිංහැම් මහත්මිය ඒ වන විට ද කන්ද බසින්නට පටන් ගෙන සිටි අතර ගැහැනු ළමයි සිනාසෙමින් ඔවුන් පසුපස ගමන් කළහ. ජැක් හා පිලිප් ද පහළ බසින්නට පටන් ගත්තේ ගුස්ටාව් ගැන නොතකමිනි.

අවසානයේ ගුස් ද කෝපයෙන් මොන මොනවාදෝ මුමුණමින් ඔවුන් පසුපස ගමන් ඇරඹුවේය. වරින් වර ඔහු කාරා කෙළ ගැසුවේ තවත් තණ කොළ තම මුවේ රැඳී ඇතැයි සිතමිනි. ඒ හැම වරකම කිකී ද ඔහු අනුකරණය කරමින් සිනාසුණේය.

ඔවුන් නැවත ගල් වළ ළඟ නිවහනට එනවිට සන්ධ්‍යාවේ පහ පසු වී විනාඩි තිහක් පමණ ඉක්ම වී ගොස් තිබිණි.

"දූන් ඔය කාට හරි තේ ඕනෙද? එහෙම නැත්නම් බිස්කට් එක්ක කිරි වීදුරුවක් බොනවද?" කනිංහැම් මහත්මිය විමසුවාය. "බඩගිනි නං පලතුරු කේක් කෑල්ලක් කමු"

ළමයි සියලු දෙනා පලතුරු කේක් කන්නට ද කිරි බොන්නට ද කැමැත්ත පළ කළහ.

''අද රට වගේම හෙට උදේටත් කොකෝවා නැහැ. ඔන්න කොකෝවා ඉල්ලන්න එපා කවුරුවත්'' කතිංහැම් මහත්මිය කීවාය.

''එහෙම නං මම ගොවිපොළට ගිහිං කොකෝවා අරගෙන එන්නම්'' බිල් පැවසුවේය. ''එහාට ගිහින් ප්‍රශ්න කීපයකට උත්තර හොයාගන්නත් තියෙනවා. කොකෝවා එහාට යන්න මට හොඳ හේතුවක්''

''අභිරහසක්ද?'' ඩිනා විමසුවාය. ''මට නං ඔයාව තේරුම් ගන්න අමාරුයි බිල්. නිවාඩුව මැද්දෙත් ඔයා මොකක් හරි රාජකාරියකට පැටලුණොත් මට නං පුදුමයක් නැහැ''

''අභිරහසක් තිබුණත් නැතත් බිල් හැම වෙලාවෙම ඉන්නෙ පරීක්ෂාවෙන්'' පිලිප් පැවසුවේය. ''ඒක ඔයාගේ රාජකාරියේ කොටසක් එහෙම නේද බිල්?''

''අපි කාඩ් සෙල්ලම් කරමු'' ඩිනා අලුත් යෝජනාවක් ගෙන ආවාය.

''කෝ කාඩ් කුට්ටම?ඔයා කාඩ් සෙල්ලම් කරන්න දන්නවාද ගුස්?''

''මම දන්නවා'' ගුස් කීවේ ආඩම්බරයෙනි. ''මං කාඩ් ක්‍රීඩාවට දක්ෂයි. මාව පරද්දන්න ලේසි නැහැ''

ඔවුහු ගෙබිම හිඳගත්හ. ගුස් කාඩ් ක්‍රීඩාවේ දක්ෂයකු බව ඉක්මනින්ම පෙනී ගියේය. කාඩ් ක්‍රීඩාවේ නියැළෙන අතර තුර වරින් වර ගුස්ටාව්ගේ දිගු හිසකේ ඔහුගේ මුහුණ වසාගෙන ඉදිරියට පැමිණියේය. ඒ හැම වතාවකම ඔහු සිය සුරතින් ඒ හිසකේ පසුපසට කළේය.

''මොකටද ඔච්චර දිග කොණ්ඩයක්?'' ඩිනා විමසුවාය. ''ඕක මහ කරදරයක් නේ. ඇයි ඔය කොණ්ඩෙ කපා ගන්නේ නැත්තේ?''

''ඒක හොඳ අදහසක්'' පිලිප් කීවේය. ''හෙට ගම්මානයට ගිහින් බලමු එහේ කරණවෑමියෙක් ඉන්නවාද කියලා. හිටියොත් එයා ඔයාගෙ කොණ්ඩෙ කොටට කපාවි''



''ඔව්. හෙට මෙයාව එක්කරගෙන ගිහිං කොණ්ඩෙ කප්පමු'' ජැක් ද කතා බහට හවුල් වූයේය.

ගුස්ටාව් ඔවුන් සියලු දෙනා විමතියට පත් කරවමින් කාඩ් පත් විසි කර දමා එක වර නැඟී සිටියේය. ''කොට කොණ්ඩා ඔයාලා වගේ අයට'' ඔහු කෝපයෙන් කෑ ගැසුවේය. ''මට නෙවෙයි. මම කවදාවත් කොණ්ඩෙ කොටට කපලා නැහැ. කපන්නෙත් නැහැ. මගේ රටේ මං වගේ පිරිමි ළමයි දිගට කොණ්ඩෙ වවන එක තමා චාරිත්‍රය.''

''ඔයා වගේ පිරිමි ළමයින්?'' ජැක් ද කෑ ගැසුවේ කෝපයෙනි. ''මොකක්ද ඒකෙ තේරුම? මට පේන විදියට තමුසේ ඕනැවට වඩා තමුසෙ ගැන හිතාගෙන ඉන්නවා. මිත්‍රයා තමුසේ පෝසත් පවුලක කෙනෙක් වෙන්න පුළුවනි. ඒත් තමුසේ හැසිරෙන්නේ රජ පවුලක කෙනෙක් වගේ. තමුසෙ කුමාරයෙක් නෙවෙයිනෙ. ඒ නිසා රජ කුමාරයෙක් වගේ හැසිරෙන එක නවත්වනවා''

හිසකේ පසුපසට දමා පපුව ඉදිරියට දමාගෙන ගුස්ටාව් කෙළින් සිටගත්තේ මහත් උදාරම් ලීලාවෙනි. ''මම රජ කුමාරයෙක්'' ඔහු උස් හඬින් පැවසුවේය. ''මම ටෞරි-හේසියාවල අලොයිසියස් ග්‍රැමොන්ඩි රේස්මොලි ටොර්කුයිනෙල් කුමාරයා''

# 8. බිල් කරුණු පැහැදිලි කරයි

එම විමතිය ඇති කරවන ප්‍රකාශයත් සමඟ පැතිර ගියේ දැඩි නිහැඬියාවකි. කිසිවකු කිසිවක් කීවේ නැත. කිකී පවා නිහඬව සිටියේය. ඔවුන් සියලු දෙනා විමතියෙන් යුතුව බලා සිටියේ ගුස්ටාව් දෙසය. ඔහු පැවසූ වචන පිළිගත්තේ ද නොගත්තේ ද යන්න ඒ කිසිවකු නිවැරදිව දැන සිටියේ නැත.

මඳකින් ගුස්ටාව්ගේ දෙතොල් වෙව්ලන්නට පටන් ගත්තේය. ඔහු ඒවා සපා ගත් නමුත් ඔහුට නැවත හඬන්නට අවශ්‍ය වී ඇති බව ලූසී ඈන් අවබෝධ කර ගත්තාය.

''මම මගේ පොරොන්දුව කැඩුවා'' හදිසියේම ගුස්ටාව් පැවසුවේය. ''මම රජ කුමාරයෙක්. ඒත් මම මගේ වචනය කැඩුවා''

''ඔව් ඔයා ඔයාගේ ප්‍රතිඥාව කැඩුවා'' පසුපසින් උස්ව නැගුණේ බිල් ගේ කටහඬය. ''අලොයිසියස් ග්‍රැමොන්ඩ් රේස්මොලි ටෝර්කුයිනෙල්..... ඔයාගේ බාප්පා මට කීවේ කවදාවත් කොහොමටවත් ඔයා පොරොන්දුව කඩන එකක් නැහැ කියලා. ඒත් ඔයා ඔයාගේ වචන කඩනවා නං මම කොහොමද ඔයාව ආරක්ෂා කර ගන්නේ?'' බිල් එතැනට පැමිණියේය. ඔහුගේ මුහුණ කෝපයෙන් දම් පැහැ ගැන් වී තිබිණි. සියල්ලෝම ඔහු දෙස බලා සිටියහ.

''බිල් ඇත්තටම එයා රාජ කුමාරයෙක්ද? නැහැ නේද?'' ජැක් විමසුවේය.



''විශ්වාස කළත් නොකළත් මෙයා රාජ කුමාරයෙක්'' බිල් පිළිතුරු දුන්නේය. ''මෙයාගේ බාප්පා ටෞරි - හේසියාවල රජතුමා''

''එහෙම නං මෙයා අමුතු විදිහට හැසිරෙන්නේ ඒකයි'' ඩිනා පැවසුවේය. ''ඒ රටේ අපේ රටේ වගේ රජ කුමාරවරු කොණ්ඩේ කොටට කපන්නේ නැතිලු. ඒ කුමාරවරු කොණ්ඩය ටිකක් දිගට වවනවා. ඒත් මෙහේ ඔහොම දිගට කොණ්ඩෙ වැවිල්ල විහිළුවට කාරණාවක්. හොඳ වෙලාවට ඉස්කෝලයේ ළමයි මෙයා කවුද කියලාත් දිගට හිසකේ වැවීම මෙයාලාගේ චාරිත්‍රයක් කියලාත් දන්නවා. ඒ නිසා ඉස්කෝලෙ ළමයි මෙයාට විහිළු කරන්නේ නැහැ''

ළමයි සිවු දෙනා නිහඬව අලොයිසියස් කුමරු දෙස බලා සිටිද්දී ඔහු උදාරම් ආකරයෙන් තම හිසකේ අත ගෑවේය.

''මේ...... මේ.... ඔහොම කරන්න එපා ගුසී'' ඩිනා කෑගැසුවාය. ''ඔය විදියට හැසිරුණා කියලා මට නං බෑ ඔයාට ඇලොයි.... හරි වෙන නමක් කියලා හරි කතාකරන්න. මට පුළුවන් ඔයාට ගුසී හරි.... ගුස් හරි..... ගුස්ටාව් හරි කියන්න විතරයි''

''ඔහ්..... ඒක එහෙම වෙන්නම ඕනෙ'' බිල් වහා පැවසුවේය. ''මම මෙයාට ගුස්ටාව් බැම්ලෙවෝ කියලා නම තිබ්බෙ විශේෂ හේතුවක් නිසා.... මෙහෙමයි.... මේ මොහොතේ මෙයාගේ රටේ බොහෝම දේවල්... භයානක දේවල් සිද්ධ වෙන නිසා. ඔහු වෙනත් නමකින් හැඳින්වීම අත්‍යවශ්‍යයි''

''භයානක දේවල්. විප්ලව වගේ මොනවා හරිද?'' ජැක් විමසුවේය.

''හ්ම.... මම කියන්නම්'' බිල් කීවේය. ''මෙයාගේ බාප්පා ඒ රටේ රජතුමා. ඔහුට දරුවන් නැහැ. ඊළඟට කිරුළ හිමිවන්නේ ගුස්ටාව්ට. ඒ රටේ එක කොටසක් ගුස්ගේ බාප්පා රට පාලනය කරන ආකාරයට කැමති නැහැ. ඒත් ඔහු යහපත් පාලනයක් ගෙන යනවා. අපේ රජය පවා කියන්නේ ඔහු ඉතා හොඳ පාලකයෙක් කියායි''

''සිද්ධ වෙන්න යන්නේ මොනවාද කියලා මට හිතාගන්න පුළුවනි.'' ජැක් පැවසුවේය. ''ශක්තිමත්ව පාලනය ගෙන යන බාප්පාට අකමැති අය කැමතියි දුර්වල බාල ගුසීට කිරුළ හිමි කර දීලා ඔහු ලවා ඔවුනට අවශ්‍ය ආකාරයට පාලනය පවත්වා ගෙන යන්න''

''හරියට හරි'' බිල් පැවසුවේය. ''ඒ නිසා ඔවුන් මෙහාට ඇවිත් ගුසී හොයනවා. ගුසී අල්ලාගෙන ගුසී රජ කෙරෙව්වොත් ඔහු ඔවුන් කියන ආකාරයට හැමදේම කරාවි. ඔහුගේ බාප්පා මරා දමාවි. නැතිනම් බන්ධනාගාරගත කරාවි''

''ගුසී හැමදෙයක්ම දන්නවා. එහෙම නේද?'' පිලිප් විමසුවේය.

''ඔව්. එයා දන්නවා'' බිල් පිළිතුරු දුන්නේය. ''හැම කාරණාවක්ම එයාට පැහැදිලි කර දීලායි තියෙන්නේ. ගුසී තමන්ගේ බාප්පාට ආදරෙයි. බාප්පාට එරෙහිව හතුරන් පාවිච්චි කරන ආයුධයක් බවට පත් වන්න ගුසී කැමති නැහැ. ඒ නිසා ඔහු මගේ ආරක්ෂාව යටතට ආවෙ ගුස්ටාව් කියන විදේශීය පාසල් ශිෂ්‍යයා හැටියට. මේ තමයි ඔහු''

''මම ඔයාට දුන්න පොරොන්දුව කැඩුවා'' මහත් ශෝකයෙන් යුතුව ගුස්ටාව් පැවසුවේය. ''බිල් මහත්මයා මට සමාවෙන්න''

''හොඳයි ආයෙත් එහෙම කරන්න එපා. ඒක එතැනින් ඉවරයි.'' බිල් පැවසුවේය. ''මෙතැන ඉන්න කවුරුවත් ඔයාව පාවලා දෙන අය නෙවෙයි. අපි හැමෝම ඔයාගේ මිත්‍රයෝ... ඒත් අපි හැමෝම කැමතියි ඔයා මීට වඩා වෙනස් විදියට මිත්‍රයෙක් වගේ හැසිරෙනවා දකින්නත්''

''මං එහෙම හැසිරෙන්න මේ වෙලාවෙ ඉඳලාම උත්සාහ කරන්නම්'' ගුසී අධිෂ්ඨාන පූර්වකව පැවසුවේය.

''හ්ම්.... හොඳයි... අපි බලමු'' බිල් පැවසුවේය. ''අනෙක් අය වගේ සාමාන්‍ය විදියට ඔයා හැසිරෙන එක හොඳයි. එතකොට මෙහාට කවුරු හරි අමුත්තෙක් ආවත් හිතන්නේ ඔයා යාළුවොත්



එක්ක නිවාඩුව ගත කරන සාමාන්‍ය පාසල් ශිෂ්‍යයෙක් කියලා. ඒත් දැනට මම හිතන්නෙ ඔයා හැසිරෙන්නේ රාජ කුමාරයෙකුට කොහෙත්ම නොගැළපෙන මෝඩ තාලෙකට කියලායි. මම ටෞරි හේසියාවල වැසියෙක් වුණා නං ඔයා ලොකු මහත් වෙලා අපේ රජතුමා වෙනවා කියලා හිතන්නත් මම අකමැති වෙනවා''

''බිල් අපේ රජය ද ටෞරි හේසියා රජය ද ඔයාට ගුසි ආරක්ෂා කරන්න බාර දුන්නේ?'' ඩිනා විමසුවාය.

''දෙගොල්ලම'' බිල් පිළිතුරු ලෙස පැවසුවේය. ''ශක්තිමත් පාලනයක් ටෞරි හේසියාවල තිබෙනවාට අපේ රජයත් කැමතියි'' ඒ ඇයි කියා මේ මොහොතේ ඔයාලාට කියන්න මට බැහැ. මේ සේරම කරදර සති කිහිපයකින් ඉවර වේවි. ඊට පස්සේ ගුසිටත් බය නැතිව ඉස්කෝලෙට යන්න පුළුවන් වේවි. කොහොම වුණත් මේ නිවාඩුවේ අපි ගුසිව ආරක්ෂා කරන්න ඕනෙ''

''ඔව්. මට දැන් හැමදෙයක්ම තේරෙනවා'' ඩිනා කීවාය. ''මේ සේරම ඔයා අපට මුලදිම කිව්වා නං ඉවරයිනේ බිල්''

''මට අණ ලැබුණේ මේ ගැන ඔයාගේ අම්මාට ඇර වෙන කාටවත් කියන්නෙපා කියලායි. ඇය සේරම දන්නවා. ඒ වගේම මම මේ නිවහන තෝරා ගත්තෙත් මේක හුඟාක් පිටිසරට වෙන්න පිහිටලා තියෙන නිසා. ඔයාලා අතරේ ගුසි ඉන්නකොට කොහොමටවත් කවුරුවත් සැක කරන්නේ නැහැ කියලායි මම හිතුවේ''

''ඔයා දක්ෂයි බිල්'' ලුසී ඈන් බිල්ගේ පුරත අල්ලාගනිමින් පැවසුවාය. ''අපි ගුසිව බලාගන්නම්. අපෙන් ටිකක් හරි ඈත් වෙන්න අපි එයාට ඉඩ දෙන්නේ නැහැ. ගුස් අපි ඔයාගේ යාළුවෝ''

''බොහොම ස්තූතියි'' ගුස්ටාව් හිස නමා ආචාර කරමින් පැවසුවේය. ''ඒක මට ගෞරවයක්''

''සාමාන්‍ය විදියට කතා කරන්න'' ගුස්ටාව්ගේ තට්ටමට සෙමෙන් පහරක් දෙමින් බිල් පැවසුවේය. ''එහෙම නං.... දැන් හැමෝම මේ මොහොතේ ඉඳන් අලොයිසියස් ග්‍රාමොන්ඩ් ගැන වගේම ටෞරි හේසියාව ගැනත් අමතක කරනවා. හරි නේද?''

''ඔව් බිල්'' සැවොම එකවර පැවසූහ. ඉතා බරපතළ ප්‍රශ්නයක් ඒ ආකාරයෙන් විසඳීම සියල්ලන්ගේ සතුටට හේතු වූ අතර ඔවුහු යළි සැහැල්ලු සිත්වලින් යුතුව කාඩ් ක්‍රීඩාවට යොමු වූහ. බිල් එතැනින් පිටව ගියේ සිදු වූ සියල්ල තම බිරිය කනිංහැම් මහත්මියට පවසන අදහසිනි.

''මේ බලන්න අපි කතා කර කර ඉන්න අතරේ කිකී කරලා තියෙන දේ'' ජැක් කෝපයෙන් මෙන් පැවසුවේය. ''හැමෝගෙම කාඩ් ගොඩවල් අවුල් කරලා. මිශ්‍ර කරලා. කිකී... දානවා ඔය කාඩ් එක බිමට''

''එයා තනියම කාඩ් සෙල්ලම් කරලා'' ලුසී ඈන් පැවසුවේ සිනාසෙමිනි. ''හරියට කාඩ් සෙල්ලම් කරන කොට අපි කරනවා වගේ එයාත් කාඩ් ටික එක කකුලකින් අල්ලලා උස්සාගෙන. ඕවා බිමට දානවා කිකී''

ඒ සමඟම කාමරයට එබුණේ කනිංහැම් මහත්මියයි. ''බිල් ගොවිපොළට යනවා කිරියි, කොකෝවයි ගේන්න. කවුරු හරි එයා එක්ක යනවාද? ගුසී ඔයාට යන්න බැහැ''

''මම යනවා'' ලුසී ඈන් පැවසුවාය. ''මං ආසයි ඇවිදින්න. ඔයාලා ඇලී නැන්දත් එක්ක ඉඳලා එයාව බලාගන්න''

''හරි'' ජැක් පපුව ඉදිරියට දමා පැවසුවේ ඈත ටෞරිහේසියා රාජ්‍යයේ සිටින විප්ලවකරුවන්, පැහැර ගෙනයන්නන් ඉතා ආසන්නයේම සිටිනවා වැනි හැඟීමකින් යුතුවය.

''මාත් නවතිනවා. මගේ කකුලක දිය බුබුළක් ඇවිත්'' ඩිනා කං කෙඳිරි ගෑවාය.

ලූසී ඈන් මහත් සතුටින් බිල් සමඟ ගමන් ඇරඹුවාය. ඔහු හා තනිවන්නට ඇය මහත් කැමැත්තක් දක්වූවාය. ඔහුගේ අත අල්ලාගෙන ඇය ගොම්මන් අඳුරේ ඉදිරියට පිය නැඟුවාය.

''ඔයාට ගුසී ගැන එහෙදි මොනවා හරි කියන්න හිතුනත් ඒවා ගිල ගන්නවා මිස කිසිම දෙයක් කියන්නෙපා'' බිල් පහත් ස්වරයෙන් ඇයට අවවාද කළේය. ''ගුසී ගැන එයාලාට කිසිම



සැකයක් ඇති වෙනවා දකින්න මම කැමති නැහැ. මේ වයසේදි එයාව බලෙන් රජ කරවන එක එයාට කොහෙත්ම හොඳ වෙන්නේ නැහැ''

''මම මොකුත්ම කියන්නේ නැහැ'' ලුසී ඈන් කෙඳිරුවාය. ''අපි ජැක් ගැන කතා කරමු''

''ඔයා ජැක් ගැන කතා කරන්න ඕනෙ වෙලාවක ලෑස්තියි නේද?'' බිල් සිනාසෙමින් විමසුවේය. ''ඇත්ත කියනවා නං මාත් ජැක්ට කැමතියි. එයා ළඟ විශේෂ දෙයක් තියෙනවා''

''මොකක්ද කිකීද?

''නැහැ..... ලස්සන පුංචි සහෝදරියක්'' බිල් පැවසුවේය. ''සහෝදරයෙකුයි සහෝදරියකුයි ඒ වගේ එක එක්කෙනාට ආදරෙන් එකට ඉන්නවා දකින එකත් සතුටක් - වාසනාවක්''

''අපේ අම්මයි තාත්තයි මැරුණේ අපි හුගාක් පුංචි කාලෙදී'' ලුසී ඈන් පැවසුවාය. ''එදා ඉඳන් අපට හිටියේ අපි දෙන්නා විතරයි. ඒත් දැන් අපට ඔයාවයි ඇලී නැන්දායි ලැබිලා තියෙනවා. ඒ වගේම පිලිප්, ඩිනා දෙන්නාත් අපට ලැබිලා. අපි වාසනාවන්තයි''

''මාත් වාසනාවන්තයි'' බිල් පැවසුවේය. ''මට දූන් ළමයි හතර දෙනෙක් ඉන්න හොඳ පවුලක් ඉන්නවා. මේ හරියේ බකමූණෝ ඉන්නවා වගේ. ඔය ඇහෙන්නෙ උන්ගේ කෑගැහිල්ල''

''ඒ පුංචි බකමූණෙක්'' පක්ෂීන්ගේ කෑ ගැසීම් ගැන ජැක් වෙතින් හොඳින් දැන සිටි ලුසී ඈන් කීවාය. ''ටිවිට්..... ටිවිට්..... එක දිගට ලස්සනට කෑගහන්නේ ටවෝනි බකමූණා''

''හපොයි මේ මොන ලෝකයක්ද? ''හදිසියේ බිල් කෑගැසුවේ තම හිස අසලින්ම උස් හඬින් නැඟුණු විලාපයක් නිසාවෙනි. ලූසී ඈන් සිනාසුණාය.

''ඒ යටිගිරියෙන් මොර දෙන බකමූණෙක්. ඌ එහෙම කරන්නේ මීයන්ව බය කරවලා උන්ගේ ගුල්වලින් එළියට ගන්න''

''මාත් බයවුණා'' බිල් කීවේය. ''ආ අර තියෙන්නේ ගොවිපොළ. ඔයා මාත් එක්ක ඇතුළට යන්න එනවානෙ ලුසී ඈන්. මම එලිස් මහත්මිය එක්ක කතා කරන කොට නිකමටවත් පුදුම හිතුන වගක් එහෙම පෙන්නන්න එපා''

ඔහු දොරට තට්ටු කොට නිවසේ විශාල මුළුතැන්ගෙට ඇතුළු වූහ. එය උණුසුම් රාත්‍රියක් වුවද මහලු නැන්දා උදුන අසලට වී ගෙත්තම් කරමින් හුන්නාය.

එලිස් මහත්මිය ඔවුන් වෙත දිව ආවාය. ''ඔබලා දකින්න ලැබීම සතුටක්. කොහොමද තොරතුරු? නිවහන හොඳයි නේද? මොනවද මගෙන් අවශ්‍ය? ඉඳගන්න''

ඔවුහු අසුන් ගත්හ. පැද්දෙන පුටුවක හිඳගත් ලුසී ඈන් එය ඉදිරියටත් පසුපසටත් පැද්දුවාය. විශාල බැළලිය පැමිණ ඇගේ උකුලට පැන නින්දට වැටුණාය. එලිස් මහත්මිය ඇයට කේක් කැබැල්ලක් පිළිගැන්වූ අතර එය කමින් ඇය අලස ලෙස ඔවුන්ගේ කතා බහට ඇහුම්කන් දුන්නාය. අනං මනං මුලින් කතා කළ බිල් ඊළඟට ගල් වළ ළඟ නිවහන ගැන කතා බහ ඇරඹුවේය.

''ඒක ලස්සන සාමකාමී තැනක්'' ඔහු පැවසුවේය. ''මං හිතන්නේ මේ පළාතට වැඩිපුර අමුත්තන් එන්නෙ නැහැ. එහෙම නේද එලිස් මහත්මිය? ආවොත් පිටිසරට කැමති අපි වගේ අය තමයි''

''එහෙම්මමත් නෙවෙයි. දන් බලන්න අද'' එලිස් මහත්මිය කීවාය. ''අද හැන්දෑවෙ අමුත්තන් දෙන්නෙක් මෙහෙට ආවා. ලස්සන කළු කාරෙකක. හරියට ඔබේ කාරෙක වගේ කතිංහැම් මහත්මයා''

''පාර වැරදිලා ආ අය වෙන්නැති'' බිල් ගණනකට නැතිව පැවසුවේය. එසේ වුව ඔහු මේ කතාබහ මහත් උනන්දුවකින් යුතුව කරන බව ලුසී ඈන් දන සිටියාය.

''නෑ.. නෑ.. පාර වැරදිලා නෙවෙයි'' එලිස් මහත්මිය කීවාය. ''හොඳ සාමකාමී ආහාර පාන තියෙන ගොවිපොළක් ඒ ගොල්ල පහුගිය දවස් ටිකේම හොයලා. කවුදෝ එයාලාට මේ ගොවිපොළ



ගැන කියලා. ඒ එක මහත්මයකුගේ බිරියට අසනීපයිලු. ඒ හන්දා ටික දවසක් විවේකීව මේ වගේ පළාතක ඉන්න ඕනෙලු''

''හ්ම්...... හොඳයි'' බිල් කීවේය. ''ඉතින් එයාලාට නවාතැන් දෙනවාද?''

''මම කැමති වුණා'' එලිස් මහත්මිය කිවාය. ''ඒත් මගේ මහත්තයා නං ඒකට දොස් කිව්වා. මගේ හිත හොඳ වැඩිලු. එයාලා හෙට ඒවි. නම ජෝන්ස් කිව්වා. ඒ වුණාට මට හිතෙන්නේ එයාලා විදේශිකයන්''

''විදේශිකයන්?'' බිල් සෙමෙන් මිමිණුවේය.

# 9. අමුත්තන් දෙදෙනා

ලූසී ඇන් වහා පුටුව පැද්දවීම නතර කළ අතර ඇගේ තොල කට වියළී ගියේය. විදේශිකයන්! එහි අරුත ඔවුන් පැමිණ ඇත්තේ හේසියාවේ සිට බවද? කුමන රටක සිට ආවත් ඔවුන් පැමිණ ඇත්තේ ගුස්ටාව් ලුහුබඳිමින් බව නිසැකය. ඉතා සාමකාමී නිවාඩුවක් ලෙස පෙනුණ ද මෙය වික්‍රමාන්විත ක්‍රියා රසක ආරම්භය විය නොහැකිද?

''විපතක්'' තම උකුළේ හුන් බළලා ගේ කනට ලූසී ඇන් කෙඳිරුවාය. ''ගුසීට විපතක්! එයාගේ බාප්පාටත් විපතක්''

බිල් තවත් ප්‍රශ්න කිහිපයක් සාමාන්‍ය ආකාරයට විමසුව ද වැදගත් යමක් එලිස් මහත්මිය ඒවාට දුන් පිළිතුරුවලින් ලැබුණේ නැත. නැඟී සිටි ඔහු ඇය ගෙනැවිත් දුන් කිරි හා කොකෝවාවලට මුදල් ගෙවා ඇයට ස්තුති කොට සුබ රාත්‍රියක් පතා ලූසී ඇන් සමඟ මඟට බැස්සේය.

''මට බයයි... මට හුඟාක් බයයි. කවුරු හරි ගුසී පස්සෙන් එනවා'' බිල් කෙඳිරුවේය. ''කොහොමද උන් දන්නේ එයා ඉන්නේ අපිත් එක්ක කියලා? ෂිහ්.... ගුස් අපට වඩා වෙනස් වග නිකංම පේනවා. ලේසියෙන් අඳුනාගන්න පුළුවනි. ගුස් මා එක්ක එනවා



කවුරු හරි දකින්න ඇති. ඊළඟට උන් මා ගැන හොයන්න ඇති. මං කවුද කියලා දැනගත්තාම උන්ට ඉතුරු ටික පහසුයි. හ්ම්... මේ තත්ත්වය හොඳ නැහැ''

''ඔයා හදන්නේ ගුසී එක්ක මෙහෙන් අතුරුදහන් වෙන්නද?'' ලූසී ඇන් පහත් ස්වරයෙන් විමසුවාය. ''අනේ එහෙම කරන්නෙපා බිල්''

''මම මේ ගැන ඔයාගේ නැන්දා එක්ක කතා කරන්න ඕනෙ'' බිල් පැවසුවේය. ''මේ ගැන වචනයක්වත් ගුස්ට කියන්න එපා. එයා කලබල වේවි. ඒ වගේම මොහොතකටවත් එයාව තනිකරන්න එපා. ඔයාලා මැද්දෙම තියාගන්න''

''හොඳයි බිල්'' ලූසී ඇන් කිවාය. ''අනේ දෙවියනේ ඒ මිනිස්සු ගොවිපොළට නොඑනවා නම්. බිල් ඒ අය සාමාන්‍ය මිනිස්සු වෙන්නත් පුළුවනි. එහෙම නේද? ඒ අය හතුරෝ නොවෙන්නත් පුළුවනි නේද?''

බිල් ලූසිගේ අත තදින් අල්ලා ගත්තේය. ''සමහර විට මම වැරදි වෙන්න පුළුවන්. ඒත් මේ වගේ දේවල් මට හොඳට පුරුදුයි ලූසී ඇන්. මට ඉවෙන් වගේ දැනෙනවා. උන් හතුරෝ. ඔයා බය වෙන්න එපා. මං සේරම බලා ගන්නං''

''ඔයා අපි ළඟ ඉන්න තාක් කල් අපි කාටවත් බය වෙන්නෙ නැහැ'' ලූසී ඇන් කීවාය. ''ඒත්..... අපිව දාලා කොහේවත් යන්න එපා බිල්''

''නෑ.... මම යන්නෙ නැහැ. ගුසී අරගෙන කොහාට හරි යන එක වඩා ආරක්ෂා සහිත වුණත් මම එහෙම කරන්නේ නැහැ''

ඔවුහු ගල් වළ ළඟ නිවහනට පැමිණියහ. ඒ වන විට ගුසී හා ඩිනා නින්දට වැටී සිටියහ. ඇලී නැන්දා ජැක් හා පිලිප් සමඟ අවදිව පොත් කියවමින් සිටියහ. අරගෙන ආ කිරි හා කොකෝවා මුළුතැන් ගෙයි තබා ආලින්දයට පැමිණි බිල් සියලු තොරතුරු තිදෙනාට දැන්විය. කනිංහැම් මහත්මියගේ මුහුණ අඳුරු විය.

''ඔහු මෙහේ කියලා ඔවුන් කොහොමද දන්නේ?'' ඇය විමතියෙන් යුතුව ප්‍රශ්න කළාය. ''අනේ... බිල්, දැන් අපි මොනවාද කරන්නේ? අපි හැමෝම දැන්ම මෙහෙන් පිටවෙලා යමුද?''

''නැහැ..... එහෙම කළොත් ඒකෙන් හතුරන් තමන්ගේ සැකය තහවුරු කරගන්නවා'' බිල් පැවසුවේය. ''පිරිමියෙක් හා ගැහැනියක්... ඒ අයට මෙහාට ඇවිත් වැඩි යමක් කරන්න පුළුවන් වේවි කියලා මම හිතන්නේ නැහැ. මං කියන්නේ අපි මැද්දට පැනලා අපි එක්ක පොර බදලා ගුසී පැහැරගෙන යන්න බැහැ කියලායි. මම ඒ අයව තවම දැක්කෙ නැහැ. එතැන දෙන්නෙක් විතරක් ඉන්න තුරු අපට බය වෙන්න දෙයක් නැහැ. තව කවුරුවත් ආවොත් එලිස් මහත්මිය ඒ වග අපට කියාවිනෙ. එක පිරිමි ළමයෙක් හැමදාම එහාට ගිහිං අලුත් ආරංචි අරගෙන එනවා''

''හරි... එහෙම නං අපි සාමාන්‍ය විදියට නිවාඩුව ගත කරමු'' බිල්ගේ බිරිය පවසද්දී ලුසී ඈන් සැනසුම් සුසුමක් හෙළුවාය.

''ගුසීටත් මේ ගැන කියන්න. ජැක්ට කියන්න නිතරම එයා ළඟ එයාගේ ආරක්ෂාවට ඉන්න කියලා. දැන් මේ පිරිමි ළමයිත් ඉන්නේ පමණට වඩා බය වෙලා. යාන්තං සද්දයක් ඇහුණත් මෙයාලා රෑට ජනෙල් කඩාගෙන පිටට පනීවි ද කියලා මට බයයි''

රාත්‍රියේදී කවුළු වසාගෙන නින්දට යාම ජැක් ප්‍රිය කළේ නැත. ''කවුළු වහන්න ඕනෙ නෑ. කිකී ඉන්නවනේ. කවුරු හරි ආවොත් එයා ගේ දෙවනත් වෙන්න කෑ ගහාවි''

''ජනෙල් වහන එක කෝකටත් හොඳයි ජැක්'' ඇලී නැන්දා පැවසුවාය. ''මම දන්නවා කිකී කෑ ගහවි. ඒත්.... අවදානමක් ගන්න මට අවශ්‍ය නැහැ''

මේ තොරතුරු පසුදා උදෑසනම ගුස්ටාව්ට හා ඩිනාට පැවසිණි. පිලිප් ගොවිපොළ හොඳින් පෙනෙන තැනකට වී එම පුද්ගලයන් පැමිණෙන්නේ ද යන්න ගැන විමසිලිමත් වූයේය. ඊට පෙර දා පිලිප් දුර බලනයෙන් දුටු කළු පැහැති මෝටර් රථයෙන්ම ඔවුහු එදින ද පැමිණියහ. දිගු හා විශාල එම මෝටර් රථය ඉතා වටිනා එකක් සේ ද පෙනිණි.



එම රථයෙන් දෙදෙනෙක් පැමිණියහ. පිරිමියා සිහින්, උස කඩවසම්, හොඳින් මැසූ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි අතර හිසකේ පසුපසට පීරා උපැස් යුගලක් පැළඳ සිටියේය. ගැහැනිය තරුණ රූමත් එකියක වූ අතර හැඩරුවින්ම ඇය විදේශීය කාන්තාවක බව පෙනිණි. පිරිමියා ඉංග්‍රීසි බස කතා කළ නමුත් ඔහුගේ උච්චාරණයෙන් පැහැදිලි වූයේ ඔහු ද විදේශිකයකු බවය.

ඔහු ඇගේ අතින් අල්ලා ගත්තේය. ඒ වහා ඇය ඔහුට වාරු වී ඉතා සෙමින් ගොවිපොළේ නිවහන වෙත පියමැන්නාය.

''එයාට අසනීපයි. එහෙම නැත්තං අසනීප වගක් මවා පෙන්වනවා'' පිලිප් සිතුවේය. ''ගිහිං මේ විස්තර බිල්ට වගේම ගුසීටත් කියන එක හොඳා. සමහර විට මේ විස්තර ඇහුවාම එයාලට ඒ ආව අය අඳුනාගන්න පුළුවන් වේවි''

විස්තර ඇසූ ගුස් හිස දෙපසට සෙලවිය. ''ම්හු... මම එයාලාව දන්නේ නැහැ''

''එයාලා අදම මෙහාට ආවත් මම පුදුම වෙන්නෙ නැහැ'' බිල් පැවසුවේය. ''වටපිටාවේ ඇවිදින්න ආවා වගේ මෙහාට ගොඩවේවි. මට විශ්වාසයි මම මෙහේ ඉන්න වග එයාලා දන්නවා කියලා. ඒ වගේම නිවාඩු කාලයේ ගුසී මා එක්ක මෙහේ ඉන්නවා කියලත්''

බිල් පැවසූ දෙය නිවැරදි වූයේය. අපරභාගයේ ජැක් නිවහන ආසන්නයට වී කුරුල්ලන් ගැන පරීක්ෂාකාරීව සිටියදී ඔහුට කට හඬ දෙකක් ඇසිණි. ඔහු පඳුරු මැත් කර බැලුවේය. ඒ ගොවිපොළට ආ අමුත්තන් විය යුතුය. පිරිමියා අව් කණ්ණාඩි පැළඳ සිටියේ පිලිප් කළ විස්තරයට අනුවය. කාන්තාව ඔහුගේ සිරුරට වාරු වී සෙමෙන් පිය මැන්නාය.

ජැක් වහා පඳුරුවලට මුවා වෙමින් ගොස් පසුපස දොරෙන් නිවහනට ඇතුළු වූයේය. ''බිල්'' ඔහු පැවසුවේය. ''ඔවුන් එනවා, කෝ ගුසී? ඔවුන් ගේ පනුකරලා යනකොට හොරෙන් බලා හිටියොත් ඔහුට ඔවුන් අඳුනනවාද කියා දැනගන්න පුළුවනි''

ගුසී වහා ජනෙල් තිරයකට මුවා වී මාවත දෙස බලා සිටියේය. එහෙත් ඔවුහු නිවහන පසුකොට යතු වෙනුවට නිවහන දෙසට හැරී පැමිණියහ. ගේට්ටුව පසු කර ආ ඔවුහු නිවහනේ දොරට ළං වූහ. අපරභාගයේ නිහැඬියාව බිඳිමින් හඬක් නැඟිණි.

''ටොක්... ටොක්.. ටොක්''

විවේකීව යහනේ වැතිර සිටි කනිංහැම් මහත්මිය යහනෙන් බිමට පැන්නාය. දොර විවෘත කළ බිල් කාමරය ඇතුළට ගියේය.

''ඇලී. ඒ අර ගොවිපොළට ආව ජෝඩුව. කෙළින්ම මෙහාට එන්න තරම් උන්ට හයියක්. උන් හිතාන ඉන්නවා ඇත්තේ අපට උන් ගැන හෝඩුවාවක් නෑ. සැකයක් නෑ කියලායි. ඉස්සරහට ගිහිං දොර අරිනවාද? මමවත් ගුසීවත් ඉස්සරහට එන්නෙ නැහැ. අනෙක් අයට එන්න පුළුවනි''

බිල් ගියේ ගුසීට සැඟව සිටින්නැයි පවසන්නටය. කනිංහැම් මහත්මිය අවුල් වූ හිසකේ සකසා ගනිමින් ඉදිරි දොර වෙත ගොස් එය විවෘත කළාය.

පිරිමියකු හා ගැහැනියක පඩිය මත සිටගෙන සිටි අතර පිරිමියා සිය හිස් වැස්ම මඳක් ඔසවා ආචාර කළේය. ''හදිසියේ මෙහෙම කරදර කළාට සමාවෙන්න'' ඔහු කීවේය. ''මාත් මගේ බිරියත් ටිකක් ඇවිදින්න එළියට ආවා. මෙයාට ටිකක් කලන්තෙ වගේලු. වතුර වීදුරුවක් බිව්වොත් ඇයගේ ඒ තත්ත්වෙ මඟ හැරේවි. කරුණාකරලා..''

''ඔහ්... එන්න ඇතුළට'' කනිංහැම් මහත්මිය පැවසුවේ ගුස්ටාව් ඉදිරියට පැමිණෙනු නැතැයි සිතමිනි. ''මම වතුර ටිකක් අරගෙන එන්නම්''

ඔවුහු ආලින්දයේ අසුන් ගත්හ. කාන්තාව අසුනට බර වූ වහා දෑස පියා ගත්තාය.

''මගේ බිරියට අසනීපයි'' පිරිමියා පැවසුවේය. ''මම ඇයව ගොවිපොළට ටික දවසකට එක්කරගෙන ආවා. හොඳ වාතාශ්‍රය



හොඳ ආහාර.... ඔබ දන්නවානෙ.... හෝටලයකට වඩා හොඳයි. ඒත් මෙහාට ආව පළවෙනි දවසෙම මෙයාව වැඩිදුර ඇවිද්ද වන්නේ නැතිව ඉන්නයි මට තිබුණේ''

''මට කනගාටුයි'' හැකි තරම් හොඳින් තම කොටස ඉටු කරමින් කනිංහැම් මහත්මිය පැවසුවාය. ''ඩිනා! මයා කොහේද? වතුර ජෝගුවකුයි වතුර වීදුරුවකුයි ඉක්මනට අරගෙන එනවද?''

වහා මුළුතැන්ගෙට ගිය ඩිනා සීතල වතුර පිරවූ ජෝගුවක් හා වීදුරුවක් බන්දේසියක් මත තබාගෙන පැමිණියාය. ඒවා ටීපෝව මත තැබූ ඇය කුතුහලයෙන් යුතුව යුවල දෙස බැලුවාය. ඔවුහු ද ඇය දෙස හොඳින් බැලූහ.

''මේ මයාගේ දුව වෙන්නැති? ''කාන්තාව විමසුවාය. ''කොච්චර ලස්සන දූරිවියක්ද? මයාට තව දරුවන් ඉන්නවාද?''

''ආ.... ඔව්'' කනිංහැම් මහත්මිය පිළිතුරු දුන්නාය. ''මගේ පුතා. ඒ එක්කම අපේ භාරයේ හැදෙන දරුවන් දෙන්නෙක්''

ඩිනා අනෙක් අය කැඳවාගෙන එන්නට ගියාය. ලුසී ඈන්, පිලිප් හා ජැක් සෙමෙන් ආලින්දයට පිවිසියහ. ජැක්ගේ උරහිස මත කිකී සිටිනු දුටු කාන්තාව විලාප දුන්නාය.

''ගිරවෙක්....! අනේ.... අනේ ඌට මා ළඟට එන්න දෙන්න එපා''

''කකුල් පිහදාගන්න'' කිකී අණ කළේය. ''දොර වහන්න. ගර්ර්ර්ර්ර්ර්''

කාන්තාව විමතියෙන් යුතුව විදෙස් බසකින් මොනවාදෝ පැවසුවාය. පිරිමියා සිනාසුණේය.

''මගේ බිරිය කියනවා මෙහාට එන අමුත්තන් හොඳ සිරිත් විරිත් ඉගෙන නාවොත් මේ ගිරවා ඒවා උගන්නාවිලු.'' ඔහු පැවසුවේය. ''එතකොට දරුවන් හතර දෙනෙක්. පස්වැනියෙක් නැද්ද?''

''නැහැ'' කතිංහැම් මහත්මිය කීවාය. ''මට ඉන්නේ මේ හතර දෙනා විතරයි''

''එලිස් මහත්මිය කීවානෙ දරුවන් පස් දෙනෙක් කියලා'' වතුර වීදුරුව පානය කරමින් කාන්තාව පැවසුවාය.

කතිංහැම් මහත්මිය ජෝගුව අතට ගෙන කාන්තාව අත තිබූ වීදුරුවට නැවත වතුර පිරවූයේ අනෙක් දරුවා ගැන මාතෘකාවෙන් ඇය බැහැර වනු ඇතැයි සිතමිනි. එහෙත් කාන්තාව එම මාතෘකාවටම යළි බැස ගත්තාය. ''මං හිතන්නේ ඒ පිරිමි ළමයා ඔයාලා එක්ක නිවාඩුව ගත කරන්න ආ කෙනෙක් වෙන්නැති'' ඇය පැවසුවේ පියකරු සිනහවක් මුවට නගා ගනිමිනි.

''ඔහ්. මං හිතන්නේ එලිස් මහත්මිය කියන්න ඇත්තේ ගුසී ගැන'' කතිංහැම් මහත්මිය පැවසුවාය. ''එයාගෙ පවුලේ අය එයාව ගෙදර එක්කරගෙන යනතුරු ගුසී ඉන්නේ අපිත් එක්ක''

''ඇයි පුංචි ගුසී පෙනෙන්න නැත්තේ?''කාන්තාව විමසුවාය. ''මම පුංචි දරුවන්ට හරි ආදරෙයි. ගුසී එළියට ගිහින්ද?''

''එයා කොහේද කියලා කවුරුවත් දන්නවාද?'' තම දරුවන් පිළිතුරු නොදෙන බව දුන දුනම කතිංහැම් මහත්මිය විමසුවාය. අනෙක් අතට ගුසී ඒ මොහොතේ සිටි තැන කිසිවකු දුන සිටියේ ද නැත. දොරට තට්ටු කරනු ඇසුණු වහා ඔහු අල්මාරියක් ඇතුළත සැඟව ගත් අතර ඔහු එසේම සිටීම සුදුසු යැයි බිල් සිතුවේය.

''ගුස් කොහේද කියලා මම නං දන්නෙ නැහැ'' ජැක් පැවසීය. ''එයා පාඩුවේ එයාගෙ වැඩක් කරනවා ඇති මගේ හිතේ. පිලිප් එයා කොහේද කියලා ඔයා දන්නවාද?''

''මම දන්නෙ නැහැ.'' පිලිප් පිළිතුරු දුන්නේය.''කොහාට හරි වෙලා ඇති. මං හිතන්නේ ළඟු කැලෑවේ''

''අහ්.... එයා රවුම් ගහන්න කැමති කෙනෙක් වගෙයි පෙනෙන්නේ'' පිරිමියා පැවසුවේය. ''සමහර විට අපි ආපහු



යනකොට අපට එයාව මුණගැසේවි. අපට කාරුණිකව සැලකුවාට බොහෝම ස්තුතියි මැඩම්. ඔබේ දරුවන්ට අයිස්ක්‍රීම් ගන්න මම යමක් දෙන්නද? ඒ වගේම පෙනෙන්න නැති ගුස්ටත්''

දරුවන් විමතියට පත් කරවමින් ඔහු පවුම් පහේ නෝට්ටුවක් ටීපෝව මත තැබුවේය. කතිංහැම් මහත්මිය වහා එම නෝට්ටුව ඔහු වෙත තල්ලු කොට සැර පරුෂ ලෙස මෙසේ පැවසුවාය. ''නැහැ. එපා. මට ඕක ආපහු ගන්න. දරුවන්ට ඔය සල්ලි බාර ගන්න ඉඩ දෙන්නත් මට බැහැ''

පිරිමියා ඇය දෙස බැලුවේ අපහසුවට වඩා විමතියට පත් වූ බවක් පළ කරමිනි. ඔහු නෝට්ටුව ගෙන නැවත එය තම පසුම්බියේ ලා ගත්තේය.

''ඒක ඔබේ කැමැත්ත'' ඔහු පැවසුවේය. ''මගේ රටේ නම් ඒක කරුණාවන්තභාවය වෙනුවෙන් දක්වන අනුග්‍රහයක්''

''මොකක්ද මහත්මයා ඔබේ රට? ''ජැක් වහා විමසුවේය. ''අහා'' ඔහු සිතුවේය. ''දැන්..... තමුසේ අපට අහුවෙනවා''

පිරිමියා මඳක් පසුබසිද්දී කාන්තාව ඔහු දෙස බැලුවාය.

''ම... ම.... මගේ රට......? මම ආවේ ඉතාලියේ ඉඳං'' ඔහු කීවේය. ''ලස්සන රටක්. අපි යමු නේද?''

තම බිරියගේ අතගෙන ඔහු දොර දෙසට පිය මැන්නේය. ඒ අතරතුර ගුසී සොයමින් ඔහුගේ දෑස සෑම අතටම දිව ගියේය. කතිංහැම් මහත්මියට හිස නමා ආචාර කළ ඔහු පටු මාවතට පා තැබුවේය.

කතිංහැම් මහත්මිය අමුතු බසකින් යමක් පැවසූ අතර ඔහු ආපසු හැරුණේය.

''මොකක්ද ඔබ කීවේ? ඔහු විමසීය. ''මට තේරුණේ නැහැ''

කතිංහැම් මහත්මිය යළිත් ඒ අමුතු භාෂාවෙන් පෙර කී දෙයම පැවසුවාය. කිසිත් නොකියා හිස නමා යළි ආචාර කළ ඔහු ගේට්ටුව වෙත සිය බිරිය සමඟ පිය මැන්නේය. ඉක්මනින් ම ඔවුන් දෙදෙන නොපෙනී ගියේය.

''එයා ඉතාලියෙන් ආ කෙනෙක් නෙවෙයි'' කතිංහැම් මහත්මිය පැවසුවාය. ''මම එයාට ඉතාලි භාෂාවෙන් කීවේ මගේ සුබ පැතුම් එලිස් මහත්මියට දෙන්න කියලායි. ඒත් ඒක එයාට තේරුණේ නැහැ''

# 10. හදිසි පණිවිඩයක්

ජ්‍රැක් අමුත්තන් දෙදෙනා පසුපස ඔවුනට හොරෙන් ගියේ ඔවුන් යළි ගොවිපොළට යත්තේදැයි දැක ගන්නටය. ඔහු ආපසු පැමිණ ඔවුන් ගොවිපොළට ගිය බව දන්වූ අතර බිල් වහා සියලු දෙනා තමන් ඉදිරියට කැඳවීය. ගුසී අල්මාරියෙන් පිටතට රිංගා ආවේ මහත් අපහසුවෙනි.

ඔහු කාන්තාව හඳුනාගත්ත ද පිරිමියා හඳුනාගෙන සිටියේ නැත. ''ඒ මැඩම් ටැටිඕසා'' ඔහු කීවේය. ''අගමැතිවරයා ගේ බිරිය. මට එයාව පෙන්නන්න බෑ. ඇය දක්ෂයි. තීක්ෂණයි. ඒ වගේම කෲරයි''

''මොකක්? එච්චර ලස්සන කාන්තාවක්? ''කතිංහැම් මහත්මිය විමසුවේ මහත් විමතියෙන් යුතුවය.

''ඔව්'' ගුස් පැවසුවේ වේගයෙන් සිය හිස ඉහළ පහළ වනමිනි.

''වතාවක් එයා අපේ රටේ ඔත්තුකාරියක් හැටියට කටයුතු කළා. මගේ බාප්පා තමයි මට ඒක කීවේ. දක්ෂ ඔත්තුකාරියක්ලු. පස්සෙ අගමැතිවරයා එක්ක විවාහ වුණා. ඔහු වැඩ කරන්නේ ඇය කියන විදියට''

''හ්ම්. එතකොට ඔයා ඒ පිරිමියා ගැන දන්නේ නැහැ? ඒකට කමක් නැහැ. ඔයා ඒ අයගෙන් එක්කෙනෙක් අඳුනා ගත්තා. දැන් අපි හරියටම දන්නවා එයාලා හොයන්නේ ඔයාව වග'' බිල් පැවසුවේය. ''අපි මේ කරදරෙන් ගැලවෙන්න ඕනෙ. කරන්න ඕනෙ හොඳම දේ මොකක්ද කියලා තවම මට කල්පනා වුණේ නැහැ. වෙලාවකට හිතෙනවා ලන්ඩනයේ ඉන්න ආරක්ෂකයන්ට ඔයාව බාර දෙන්න. එතකොට අඩුම තරමින් ඔයාගේ ආරක්ෂාව සහතිකයි''

''ඒත් බිල් ඔයා කිව්වා එතැන ඉන්නේ දෙන්නෙක් විතරක් නිසා ගුස්ට මොකුත් කරන්න එයාලට බැරිවේවි කියලා'' ජැක් පැවසුවේය. ''ඇයි අපෙන් එක්කෙනෙකුට තව කාර් ගොවිපොළට එනවාද කියා බලන්න ඇහැ ගහගෙන ඉන්න බැරි? කාර් එහෙම නැත්නං අමුත්තන් එනවාද කියලා මාරුවෙන් මාරුවට දිනපතා බලන්න පිලිප්ටයි මටයි පුළුවනි''

''ඔව්..... බොහොම දුරට ඔයා හරි'' බිල් පැවසුවේ සිය පයිප්පයෙන් දුම් වලාවක් ඉහළට යවමිනි. ''කොහොම වුණත් අපි ඊළඟ දවස් දෙකේ බොහොම පරෙස්සමෙන් හතුරන් ඊළඟට මොනවද කරන්නෙ යන්න ගැන විමසිල්ලෙන් ඉන්න ඕනෙ. එයාලට අවශ්‍ය පිරිමි ළමයා ගුසීමයි කියලා එයාලා හිතන බවට කිසිම සැකයක් නැහැ. එලිස් මහත්මිය එයාලට ගුස්ටාව්ගේ හැඩරුව හොඳින් විස්තර කරලා කියන්න ඇති''

''ඔව්..... දිග හිසකේ එක ලක්ෂණයක්'' ජැක් සිනාසුණේය. ''බිල් මම දැන්මම ගොවිපොළට යන්නද? ගිහිං දවසේ ඉතුරු පැය ගානෙ පරීක්ෂාවෙන් ඉන්නම්. ගිහිං බටර් ටිකක් ඉල්ලන්න, ඔය සුළු සුළු වැඩ කර කර ඒ අවට හැසිරෙන්න මට පුළුවනි.

''හරි..... ඔයා යන්න'' බිල් අවසර දුන් වහා ජැක් පිටවූයේ කිකී ද තම උර මත තබාගෙනය. අනෙක් අය නැඟිට ගොවිපොළෙන් ඈතක ඇවිදින්නට සූදානම් වූහ.

''තේ ටිකකුත් අරගෙනම යන්න'' කනිංහැම් මහත්මිය ඔවුනට කීවාය. ''ඔයාලා කොහේද කියලා කවුරුවත් දන්නේ නැහැ. ඇවිදින්න ගියාම ඔයාලාව හොයාගන්න කාටවත් ලේසි වෙන්නෙත් නැහැ. එතකොට ඔයා ආරක්ෂා සහිතයි, ගුසී''



ඒ අනුව ගුසී පිලිප් සහ ගැහැනු ළමයි දෙදෙන ගල් වළ ළඟ නිවහනේ සිට සැතපුම් දෙකක් පමණ දුර ඇවිද ගියහ. එළිමහනක නතර වූ ඔවුන් දුටුවේ පොපි මලට නෑකම් කියන කහ පැහැති සෙලන්ඩයින් මල්, යායට පිපී ඇති තැනකි. ඔවුහු වෙහෙස නිවා ගනු පිණිස මල් යාය ආසන්නයේ නතර වූහ.

''හරිම ලස්සනයි'' ලුසී ඈන් පැවසුවාය. ''මම මේ මල් ජාතියට හරිම කැමතියි. හැම උදෑසනකම කවුරුන් හෝ එක පෙත්තක් නෑ ඔක්කොම ඔප දැම්මා වගේ සෙලන්ඩයින් මල් දිළිසෙනවා''

ඩිනා හදිස්සියේ ගිරිය යටින් කෑ ගැසුවාය. ''ඔහ්.... පිලිප් මොකෙක්ද ඔය උරිස්සේ.... අපොයි ඒ මීයෙක්''

සාක්කුව ඇතුළත උණුසුම වැඩි බැවින් මදක් පිටතට එන්නට ඩෝමවුස් තීරණය කර තිබිණි. සාක්කුවෙන් පිටතට ආ ඌ නතර වී සිටියේ පිලිප් ගේ උරහිස මතය.

''හා.... නේ.... ඩෝමවුස්'' ලුසී ඈන් කීවේ ප්‍රීතියෙනි. ''පිලිප් මොකක්ද මෙයාගේ නම? අනේ මගේ අතටත් පොඩ්ඩක් දෙන්නකෝ''

''මෙයාගේ නම ස්නූසි. ඒ නම මෙයාට ගැළපෙනවා'' පිලිප් පැවසුවේය. සාක්කුවට අත දැමූ ඔහු රටකජු ඇටයක් ගෙන ලුසී ඈන් වෙත දිගු කළේය. ''මෙන්න මේක අරං ඔයාගේ අල්ලෙ තියලා එයාට දෙන්න. එයා ඔයාගේ අල්ල උඩට ඒවි''

ලුසී ඈන් සිය අල්ල මත රටකජු ඇටය තබා දිගු කළ ද ඩෝමවුස් ඇය වෙත එන්නට ඉක්මන් වූයේ නැත. මදක් දුරක් ආ ඌ ලුසී ඈන්ගේ අල්ල දෙස පරීක්ෂාකාරීව බලා හුන්නේය. නාසය, හකුළුවමින් ඉව කළේය.

''ඌට රටකජු ඇටයේ සුවඳ දැනෙනවා'' පිලිප් කීවේය. ''ඔහොමම අත හොල්ලන්නෙ නැතිව ඉන්න. ඔන්න ඌ එනවා. බලන්න උගේ කකුල් කොච්චර පුංචිද?''

''අනේ.. ස්වීට්'' ලූසී ප්‍රීතියෙන් තෙපලුවාය. ''පිලිප් මටත් එකෙක් හොයලා දෙනවාද?''

''උත්සාහ කරලා බලන්නම්''

නමුත් ඩිනා වහා ඊට විරෝධය පළ කළාය. ''නෑ... නෑ... මෙයා නිදා ගන්නෙ මා එක්ක. මීයෙක් මගේ නිදන කාමරයේ ඉන්නවාට මම කැමති නෑ''

''මේ ගෙවල්වල ඉන්න මීයෙක් නෙවෙයි. ඊට වඩා හුඟාක් පුංචි ඩෝමවුස් කෙනෙක්'' ලූසී ඈන් කීවාය. ''මූ ගඳ නැහැ. ආදරේ හිතෙනවා''

ස්නූසි රටකජු ඇටය සපා කුඩා කැබැල්ලක් කඩා ගත්තේය. එම කැබැල්ල සිය ඉදිරි ගාත්වලින් අල්ලා ගත් ඌ පසුපස පාදවලින් සිට ගත්තේ ලේනකු මෙනි. සිය පැහැපත් දෑසින් ඌ ලූසී ඈන් දෙස බැලුවේය.

''බලන්නකො මෙයාගෙ කළු පාට ලොකු ඇස්. හරියට කණ්ණාඩි දෙකක් වගේ'' ලූසී පැවසුවාය. ''ඒ ඇස් දෙකෙන් මගේ මූණ හුඟාක් පුංචියට පෙනෙනවා''

''ඇත්තටම?'' විමතියෙන් යුතුව පැවසූ ගුසී තම මුහුණ ලූසී ඈන් ගේ මුහුණට ළං කළේ ඩෝ මවුස්ගේ දෑසින් එය දක ගන්නා අපේක්ෂාවෙනි. එහෙත් වහා පලා ගිය ඩෝමවුස් යළි නතර වූයේ පිලිප් ගේ සාක්කුවට රිංගාගෙනය.

''ඔයා ඉක්මන් වුණා වැඩියි ගුසී'' ලූසී ඈන් කීවාය. ''හෙමිහිට මා ළඟට ආවා නං ඌ බයවෙන්නෙ නැහැ''

''සමාවෙන්න'' ගුසී පැවසුවේය. ''මං ඔයාගෙන් සමාව ඉල්ලනවා ලූසී ඈන්''

''හරි. මං හිතන්නෙ ස්නූසි ආපහු සාක්කුවෙන් පිටතට ඒවි''

ඌ සාක්කුවෙන් පිටතට හිස යොමා දෙතුන් වතාවක් බැලූ නමුත් පිටතට ආවේ නැත. ''තවම ස්නූසි හරියට හීලෑ වෙලා අපට පුරුදු වෙලා නැහැ'' පිලිප් කරුණු පැහැදිලි කර දෙන්නට



උත්සාහ ගත්තේය'' මට ස්නූසි හම්බ වෙලත් තවම වැඩි කාලයක් නැහැනෙ. ඉක්මනටම ඌ අපට හුරුවේවි. ඊළඟට කෑම වෙලාවට සාක්කුවෙන් පිටට ඇවිත් මගේ පිඟානෙන්ම කෑම කාවි''

''කවුරු හරි එනවා'' හදිසියේ ලූසි ඈන් කීවාය. ඇගේ තියුණු දෙසවනට කාගෙදෝ කටහඬක් ඇසී තිබිණි.

''පඳුරක් අස්සට රිංගන්න ගුස්'' පිලිප් අණ කළේය. ''ඉක්මනට''

ගුසී වහා පඳුරක් අස්සට රිංගාගෙන මුවා වූයේය. එය කටු සහිත පඳුරක් වූ නමුත් කටු ඇනීම නිසා ඇතිවන වේදනාව ගැන සිතන්නට ගුස්ට වේලාවක් තිබුණේ නැත.

පිටිසරබද උච්චාරණයන් සහිතව කතා බහ කරමින් මිනිස්සු දෙදෙනෙක් පැමිණියහ. ඉන් එක් අයෙක් කඳු මුදුනේදී බැජර් වලසුන් ගැන පිලිප්ට කරුණු කියූ වැඩිමහලු කම්කරුවා විය. ඔහු පිලිප්ට අත වැනුවේය. ''හඳ එළිය... උන් හඳ එළියට හරි කැමතියි''

''එළියට එන්න'' මිනිසුන් දෙදෙනා ඈතට පියමං කරද්දී පිලිප් ගුස්ට පැවසුවේය. ''බයවෙන්න දෙයක් නෑ''

ගුසී පඳුරෙන් පිටතට බඩගා ගෙන ආ අතර ඔහුගේ මුහුණ සහ අත පය කටු වලට සීරී තිබිණි. ඔහු මහත් බියට පත්ව සිටියේය.

''එයාට තුවාල වෙලා.'' ඩිනා අකාරුණික අන්දමින් කෑගැසුවාය. ''ගුසී ඔයාගෙ ඇඟ පුරාම ලේ''

''නෑ.. නෑ.... වැඩියෙ තුවාල වෙලා නෑ'' තම ලේන්සුව ගෙන ගුස්ගේ සිරුරේ තැන තැන වූ සීරුම් තුවාල වලින් ගලා ආ ලේ පිස දමමින් පිලිප් පැවසුවේය. ''මේවා හීරුම් තුවාල. හිනාවෙලා ඉන්නවා ගුස්. දෙයියන්ගෙ නාමෙට කං කෙඳිරි ගාන්න නං එපා''

''ලේ ගලනවාට මම කැමති නෑ'' අසරණ ගුස් දුක්මුසු ස්වරයකින් පැවසුවේය. ''ලේ දැක්කාම මම අසනීප වෙනවා''

"එහෙනං අසනීප වෙන්න" තද හිතැති ඩිනා පැවසුවාය. "හැබැයි ඕං අඬන්න, කත් කෙඳිරිගාන්න එපා"

ගුසී ආයාසයෙන් හැඬුම වළකා ගත්තේය. ඔහු කත්කෙඳිරි ගෑවේ ද නැත. මොනතරම් ජයග්‍රහණයක් ද?

විස්කෝතු කා තේ පානය කිරීමෙන් අනතුරුව ආපසු ඒමට ඔවුහු තීරණය කළහ. ආපසු එන අතර තුර පැරණි ගල් වළ ප්‍රදේශය ද පිරික්සන්නට පිලිප් තීරණය කළේ අහම්බෙන් හෝ බැජර් වලසුන් දැකගත හැකි වනු ඇත යන අපේක්ෂාවෙනි.

එම පාලු ප්‍රදේශයේ පඳුරු අතර ඔහු සොයා බැලුවේ බැජර් වලසුන් සිටිය හැකි බෙනයන්ය. ගැහැනු ළමයි දෙදෙනා හා ගුසී ගල් වළ හා නිවහන අතර වූ යාර සියයක දෙසීයක දුර දිව ගියහ.

"මොනවද අලුත් ආරංචි?" නිවහනට ගොඩවෙමින් ලූසී ඇත් විමසුවාය. "ජැක් තවම ගොවිපොළේ ඉඳන් ආපහු ආවේ නැද්ද?"

ඔහු පැමිණ සිටියේ නැත. කිසිවකු අත අලුත් ආරංචි තිබුණේ ද නැත. ආපසු පැමිණි ජැක් අත ද අලුත් ආරංචි නොතිබිණි.

"ගොවිපොළට අලුතෙන් කවුරුවත්ම ආවෙ නැහැ" ඔහු පැවසුවේය. "මං අර දෙන්නව දැක්කෙත් නැහැ. මං හිතන්නේ එයාලා කාමරේටම වෙලා ඉන්න ඇති. වතාවක් මට 'ටිං' කියලා සද්දයක් ඇහුණා. කවුරුහරි දුරකථනය පාවිච්චි කළා වගේ. එහෙම කළේ ඒදෙන්නාගෙන් කවුරුහරි වෙන්නත් පුළුවන්."

"හරියටම කියන්න බැහැනේ" බිල් පැවසුවේය. "මට නං අද මහ කම්මැලි දවසක්. පත්තර කියෙව්වා. කෑම කෑවා. එච්චරයි. අද රෑට හොඳට හඳ පායාවි වගේ"

"හඳ එළියට බැජර්ලා ආසයි" පිලිප් ජැක්ට කොඳුරා කීවේය. "රෑට එළියට ගිහිං බලමුද?"



"තියමයි" ජැක් පැවසුවේය. "අනෙක් අය නින්දට ගියාම අපි හොරෙන් එළියට යමු. ගුසී නිදාගත්තාම ලේසියෙන් අවදි වෙන්නෙ නැති එකත් අපට හොඳා"

රාත්‍රී ආහාර ගන්න වෙලාව පැමිණියේය. හැම්, සලාද, බටර් ආදිය කෑම මේසය මත තිබිණි. "මෙන්න තියම කෑම" පිලිප් පැවසුවේය. "ඇයි ඉස්කෝලෙ හොස්ටල් එකේදි අපට මේවා නොදෙන්නේ?"

"ආයෙත් ඉස්කෝලෙදි ලැබෙන කෑම ගැන කතා කරන්න පටන් ගන්න එපා" පිලිප්ගේ මව පැවසුවාය. "මයා ඇනුම් අරිනවා. ඇඳට යන්න"

"ඔව්.... නිදිමතයි" පිලිප් පැවසුවේය. "ජැක් ඔයාත් එනවාද?

සඳ එළියේ බැජර් වලසුන් බලනු පිණිස යන්නට කතාබහ කර ගත් බව සිහි වූ ජැක් හිස ඉහළ පහළ වැනුවේය. එසේ යන්නට පෙර දෙදෙනා මඳ නින්දක් ලබා ගත යුතුය. ගුසී ද ඔවුන් සමඟ පැමිණියේය. ගැහැනු ළමයින් පහළ මාලයේ සිට පොත් කියවා ඉන්පසු ඉහළ මාලයට නැඟුණේ නින්දට යනු පිණිසය.

"මම එලාම් ඔරලෝසුවේ සීනුව රෑ එකොළහට වදින්න හරි ගැස්සුවා" ගුස්ටාව් ට නොඇසෙන පරිදි පිලිප් සෙමෙන් ජැක්ට කොඳුරා කීවේය. "ඔරලෝසුව කොට්ටෙ යටින් තියා ගත්තා. එතකොට සද්දෙ මට මිස වෙන කාටවත් ඇහෙන්නෙ නැහැ"

යහනට පැමිණ මිනිත්තු දහයක ඇතුළත ළමයි පස්දෙනාම නින්දට වැටුණාහ. බිල් සිය බිරිය සමඟ හිඳගෙන ගුවන් විදුලි යන්ත්‍රයට ඇහුම්කන් දෙමින් සිටියේය. "රෑ දහයේ ප්‍රවෘත්ති අහලාම අපි නිදාගන්න යමු" බිල් පැවසුවේය

එහෙත් රාත්‍රී දහයේ ප්‍රවෘත්ති ඇරඹෙන්නට පෙර ඔවුනට ඇසුණේ කිසිවකු ඉදිරිපස දොරට තට්ටු කරන හඬය. බිල් ගල් ගැසුණේය. ඒ කවුරුන් විය හැකිද? ඔහු තම බිරිය දෙස බැලුවේය. ඇය ඇහි බැම උස් කළාය. රාත්‍රියේ මෙවන් වේලාවක පැමිණ සිටින අමුත්තන් කවුරුන් විය හැකිද? වහා දොර අසලට ගිය බිල් එය විවෘත නොකොට සිය හඬ අවදි කළේය. "කවුද ඔය?"

''මහත්මයා, එලිස් මහත්මිය මාව එව්වේ ඔබව ගොවිපොළට ඉක්මනින්ම එක්කරගෙන එන්න කියලා'' වෙව්ලන ස්වරයකින් පැවසිණි. ''ඇගේ නැන්දා වැටිලා උකුල් ඇටය බිඳගෙන. දොස්තර මහත්මයා නිවාඩු ගිහින් නිසා ඔබව එක්කරගෙන එන්න කීවා''

බිල් දොර විවෘත කළේය. සාටකයක් හිස පොරවා ගත් කුදු ගැසුණු අයකු එතැන සිටින බව ඔහුට පෙනිණි. ඒ එලිස් මහත්මියගේ සේවිකාවක වූ ඇලිස් විය හැකි යැයි ඔහු සිතුවේය. ''එන්න ඇතුළට''

''නැහැ. මහත්මයා මම ආපහු යනවා'' මහලු කාන්තාව කීවාය. ''මහත්මයලා එනවා නේද?''

''ඔව්. එනවා'' බිල් පැවසුවේය. දොර වැසූ ඔහු තම බිරිය වෙත ගියේය. ''එලිස් මහත්මියගේ මහලු නැන්දා ගැනයි පණිවිඩය. මම ඔයාව එහාට ඇරලලා ආපහු එන්නම්. ගුසී ගැන බලාගන්න මම මෙහේ ඉන්න ඕනෙ. එලිස් මහත්මා ඔයාව ආපහු ඇරලවාවි''

''ඔව් ඉක්මනට යන එක හොඳයි'' කතිංහැම් මහත්මිය කීවාය. ''අසරණ එලිස් මහත්මිය ඈ බයෙන් හිටියෙත් ඔය වගේ දෙයක් වේවි කියලායි''

ඈය අවශ්‍ය කළමනා එකතු කරගෙන දොර අසල සිටි බිල්ට එකතු වූවාය.

''දරුවො ඇහැරවන්න ඕනෙ නෑ. එයාලා හොඳටම නිදි'' බිල් කීවේය. ''අනික මම ඉක්මනට ආපහු එනවානේ''

සෙමෙන් දොර වසා අගුළු දැමූ ඔහු යතුර සාක්කුවේ දමා ගත්තේය. සඳ එළිය අවට පැතිර තිබිණි. එය එළිමහනේ ඇවිදින්නට සුදුසු සුන්දර රැයක් විය.

# 11. රාත්‍රියේ සිදුවීම්

සඳ එළියෙන් නැහැවුණු මාවත දිගේ බිල් සිය බිරිය සමග ඉදිරියට පිය මැන්නේය. ''මොන තරම් සුන්දර රාත්‍රියක් ද?'' බිල් පැවසුවේය. ''දහවල වගේ එළියයි''

ඔවුහු පටු මාවත දිගේ හැකි තරම් වේගයෙන් ඉදිරියට පිය මැන්නාහ. ''ගොවිපොළේදී මම එලිස් මහත්මයාගෙන් අහන්නම් ඔයාව ආපහු ඇරලවන්න පුළුවනිද කියලා'' බිල් පැවසුවේය. ''ඔයාව ඇරලලා ආපහු එනවා මිස මං මිනිත්තුවක්වත් එහෙ රැඳෙන්නෙ නැහැ. මම ගුසී ගැන බලන්න ඕනෙ. මම මැඩම් ටැට්ඕසා යි එයාගෙ සහායකයාවයි යාන්තමට දක්කා. ඒත් එයාලා මාව යාන්තමට හරි දකින්න අවශ්‍ය නැහැ''

මාවත දෙපස වැවී තිබූ උස ගස්වල සෙවණැල්ල මාවතට වැටී මාවත අඳුරු වී තිබිණි. එම සෙවණැල්ලේ කිසිම චලනයක් සිදුවන බවක් බිල් දුටුවේ නැත.

ඒ සමගම සියල්ල ඉතා ඉක්මනින් සිදුවිය. ගස්වලට මුවා වී සිටි සිව් දෙනෙක් ඉදිරියට පැන්නාහ. පිහින් හඬක් ඇසී බිල් හැරී බැලුව ද ඒ වන විට ප්‍රමාද වැඩි වී තිබිණි. කිසිවකු ඔහු මතට පැන්න අතර එම පුද්ගලයා ද සමග බිල් ඇද වැටිණි.

තම බඳ වටා අතක් යැවෙන අතරතුර තව අතකින් තම මුව තදවන අයුරු කතිංහැම් මහත්මියට දැනිණි. ඈය විලාප තබන්නට උත්සාහ කළ ද මුවින් හඬක් පිටවූයේ නැත.

''බොරුවට දඟලන්න එපා. අපි ඔහේට විපතක් කරන්නේ නැහැ. අපට අවශ්‍ය ඔහේලාව ටික වේලාවකට පැත්තකට කරලා තියන්න විතරයි''

බිල් පොර බැදුවේය. මේ මිනිසුන් පැමිණ සිටින්නේ ගුස්ටාව් පැහැරගෙන යාමට බව ඔහු වටහාගෙන සිටියේය. ඔහු තමාටම දොස් පවරා ගත්තේය. මෙය රැවටීමකි. ඔවුන්ගේ උපක්‍රමයට තමා හසු වී සිටියි. එලිස් මහත්මියගේ නැන්දා වැටී උකුළු ඇටය බිඳගෙන නැත. ගොවිපොළෙන් පණිවිඩයක් එවා ද නැත. තමන් රඳවා ගෙන නිවසට ගොස් ගුස්ටාව් පැහැර ගැනීම ඔවුන්ගේ අරමුණ වී ඇත.

කිසිවකු ඔහුගේ මුහුණ හා මුව වසා රෙදි කැබැල්ලක් බැඳ දැමූ අතර තමාට හුස්ම ගැනීම පවා අපහසු බව ඔහුට වැටහිණි. තම බිරිය කුමක් වී ද යන ගැටළුව ඔහුගේ සිතේ ඇති වූ නමුත් ඔහුට කිසිවක් පෙනුණේ හෝ ඇසුණේ නැත. ඔහු දඟලීම නතර කළේ සිය දැත් සිරුර පසුපසට කොට තදින් බැඳ දැමුණු පසුවය.

ඔහුට කිසිවක්ම කිරීමට ඉතිරි වී නැත. දෙදෙනකුට එරෙහිව සිව් දෙනෙක් සිටිති. ඔවුන් හදිසියේම කඩා පැනීමේ අවාසිය ද බිල්ටමය. තමා බැඳ දැමීමෙන් අනතුරුව මේ දාමරිකයන් ගුසී සොයා යන බව බිල්ට නිසැකය. තව දුරටත් මේ පැහැර ගැනීම වැළැක්වීමේ හැකියාව ඔහුට තිබේ.

බියපත්ව සිටි කතිංහැම් මහත්මිය ගැලවෙන්නට උත්සාහ දැරූ නමුත් ඇය අල්ලා ඇගේ දැත් හා දෙපා බැඳ දමන්නට එක් දාමරිකයකු පමණක් සෑහිනි. ඇයට ද තව දුරටත් කිසිවක් ඇසුණේ හෝ පෙනුණේ නැත.

''මේ ගැන අපට කනගාටුයි'' ඉතා කාරුණික ස්වරයෙන් පිරිමියකු පවසනු ඇයට ඇසිණි. ''ඔයාලා වෙතින් අර පුංචි කුමාරයාව පැහැර ගන්න අපට මේක කරන්නම සිද්ධ වුණා. ඔහුගේ රටට ඔහු අවශ්‍යයි. අපි කුමාරයාට කිසිම හිරිහැරයක් කරන්නේ නැහැ... ඒ වගේම අපි ඔයාලාට හානියක් කරන්නෙත් නැහැ. මේ වෙලාවෙ අපට ඔහේලාව පැත්තකට කරලා තියන්න වෙනවා.



අපට කුමාරයා ලැබුණු ගමන් හැකියාවක් තිබුණොත් අපෙන් කෙනෙක් ඇවිත් ඔහේලාගේ බැමි ලෙහා දමාවි. එහෙම නැත්නම් හෙට උදේට ගොවියන්ට ඔයාලා හමුවේවි''

පිරිස ඔවුන් දෙදෙනා පිදුරු ගොඩක් අසලට ඇද දැමූහ. එක් අයෙක් බිල්ගේ සාක්කු පිරික්සා නිවහනේ යතුර සොයා ගත්තේය. ඔවුන් එතැනින් පිටව යන අයුරු බිල්ට ඇසිණි. ඔහු තම හිස පොළොවේ ඇතිල්ලුවේ මුහුණේ බැඳ ඇති රෙදි කැබැල්ල ගලවා ගන්නා අදහසිනි.

ඔහු තමා ගැනම කෝපයට පත්ව සිටියේය. තමා මෝඩයෙකු මෙන් ඇවිදගෙන ආවේ උගුලකට හසුවන්න නොවේදැයි ඔහු සිතුවේය. පණිවිඩය ගෙන එන්නට ඇත්තේ මේ කල්ලියේම එකියකි. ගෙය ඇතුළට ඇය නොපැමිණියේ එනිසාය. තමාට ඒ ගැන සැක උපදවා ගන්නට තිබිණැයි ඔහු සිතුවේය. ඇය නියම පණිවිඩකාරියක වූවා නම් තමන් පැමිණෙන තුරු එතැන රැඳී සිට තමන් සමඟ ගොවිපොළට පැමිණෙනවා නොවේදැයි ඔහු සිතුවේය.

දුරකථනයක 'ටිං' ශබ්දය තමාට ඇසුණු බවක් ජැක් සන්ධ්‍යාවේදී පැවසූ ආකරය බිල්ගේ මතකයේ අලුත් විය. මැඩම් ටැටිඕසා හෝ ඇගේ සහායකයා දුරකථනයෙන් මූලස්ථානය අමතා කුමරු සිටිනා තැන දන්නා බව දන්වා සහායට පිරිස ඉල්ලා සිටින්නට ඇත. රෑ බෝ වන විට අනෙක් අය ද රැගෙන තවත් මෝටර් රථයක් පැමිණෙන්නට ඇත. බිල්ට දැන් සියල්ල පැහැදිළි නමුත් ඒ වන විට ප්‍රමාද වැඩිය.

ගල් වළ ළඟ නිවහනේ මොනවා සිදුවනු ඇත්දැයි ඔහු කල්පනා කළේය. කුමරුට කිසිදු හානියක් සිදු නොවෙනු ඇතැයි ඔහු විශ්වාස කළේය. ඔවුනට අවශ්‍ය වන්නේ ගුස්ගේ බාප්පා සිහසුනෙන් පහ කොට ගුස්ට රජකම පැවරීම පමණි. අසරණ ගුස්! මේ දාමරික කල්ලියට අවශ්‍ය ආකාරයට රට පාලනය කරන්නට ගුස්ට සිදුවනු ඇත. ඔහුගේ ජීවිතය ඉතා දුක්ඛිත එකක් වනු නිසැකය.

ඒ ඉක්මනින් ගල් වළ ළඟ නිවහනේ කිසිවක් සිදුවූයේ නැත. ළමයි පස්දෙනා සහ කිකී තද නින්දකට වැටී සිටියහ. බිල්ගේ අණ පරිදි පිරිමි ළමයින් සිටි කාමරයේ සියලු කවුළු වසා දමා තිබිණි. කවුළු විවෘතව නැතත් සතුරන් සතුව දොරේ යතුර තිබේ.

එහෙයින් නිවහනට ඇතුළුවීම ඔවුනට ගැටලුවක් නොවේ. කාලය ගෙවී ගියේය. එකොළහේ කණිසම ද එළැඹිණි. පිලිප් ගේ එලාම් ඔර්ලෝසුව ඔහුගේ කොට්ටය යට තිබිණි. එය නාද වෙද්දී අවදි වූ පිලිප් සිය සුරත කොට්ටය යටට යවා එලාමය ක්‍රියා විරහිත කළේය. සඳ එළිය කාමරයට වැටී රිදී පැහැයෙන් දිලිසිණි. බැජර් වලසුන්ටම ඔබින රාත්‍රියකි.

ඔහු ජැක් අසලට ගියේය. ''ජැක්..... නැඟිටිමු. වෙලාව එකොළහයි'' පිලිප් ජැක්ගේ සවනට කෙඳිරුවේ ඔහුගේ සිරුරට ද තට්ටු කරන අතරතුරය. ගුසී අවදි නොකරන්නට ඔහු පරෙස්සම් විය. ගුසී තද නින්දක සිටි අතර සඳ එළිය ඔහුගේ මුහුණට වැටිණි. සඳ එළියෙන් පෙනුණේ සුපුරුදු පරිදි ඔහු මුව විවර කරගෙනම නිදන බවකි.

කිකී ද අවදි වූයේය. ඇනුමක් ඇරිය උඃ තම අත්තටු දිග හැර හිරි ඇර ගත්තේය. පිරිමි ළමයින් කොහේ හෝ යනවා නම් ඔවුන් හා යාමට උඃ සූදානම්ය. වේලාව අවේලාව පිළිබඳ ප්‍රශ්නයක් කිකීට නොතිබිණි.

කොට කලිසම්වලින් සැරසුණු ජැක් හා පිලිප් ජැකට්ටු ඇඟලා ගෙන රබර් අඩි සහිත සපත්තු පැළඳගත්හ. ඔවුහු අවසන් වතාවට ගුස්ටාව් දෙස බැලූහ. ඒ වන විට ද ඔහු සිටියේ මුව විවර කරගෙනය. සීනි පාන් කන්දෙද්දී කිකී ඔහුගේ මුවට තණ කොළ කැබැල්ලක් දැමූ සිද්ධිය ජැක්ට සිහි විය.

ඉහළ මාලයේ බිල්ගේ නිදන කාමරයේ දොරට කන තබාගෙන ඔවුහු සවන් දුන්හ. කිසිම හඬක් නොහැඟෙන්නේ ඔවුන් තද නින්දට වැටී ඇති නිසා යැයි ජැක් හා පිලිප් සිතූහ.

''කිසිම සද්දයක් නැහැ'' ජැක් මිමිණුවේය. ''තද නින්දක වගේ අඩුගානෙ බිල් ගොරවන සද්දෙවත් ඇහෙන්නෙ නැහැ''

එය පුදුමයට කරුණක් නොවේ. එවෙලේ බිල් හා ඔහුගේ බිරිය සිටියේ පිදුරු ගොඩක් අසල බැමි ලෙහා ගන්නට වෙර දරමිනි.



''අපි පිටිපස්සෙ දොරෙන් යමු'' පිලිප් මිමිණුවේය. ''ඉස්සරහා දොර අරින කොට සද්ද වෙනවා. ''ඔය අතරමඟ තියෙන දේවල හැප්පෙන්න නම් එපා''

පිලිප්ගේ සාක්කුවට වී ඩෝමවුස් නිහඬව සිටියා සේම කිකී ද ජැක්ගේ උරහිස මත වසා සිටියේය. අවශ්‍ය වෙලාවට නිහඬව සිටින්නට ද කිකී දත සිටියේය. ළමයි දෙදෙනා පසුපස දොරෙන් පිටතට බැස යන්නේ කොයි අතට දැයි තීරණය කරගන්නට කතා බස් කළහ.

''මම මුලින්ම ඔයා එක්ක බැජර්ලා බලන්න කැලේට එන්නං'' ජැක් පැවසුවේය. ''ඊට පස්සෙ මම හෙමිහිට ගල් වළට බහිනවා. ඒ බකමූණන් කෑ ගහනකොට මීයන් ඒ මේ අත දුවනවා බලන්න''

ඔවුහු පළමුව නිවහනට නැඟෙනහිරින් වූ ලඳු කැළෑව දෙසට ගමන් කළහ. රබර් අඩි සහිත සපත්තු පැළඳ සිටි නිසාවෙන් ඔවුන්ගේ පියවර හඬ නැසිණි. ඔවුන් පඳුරුවලට හා සෙවණැලිවලට මුවා වෙමින් ඉදිරියට ගමන් කළේ කිසිවකුට තමන් දකින්නට ඇති ඉඩ අහුරමිනි. සඳ එළිය ඉතා හොඳින් පැතිර තිබූ අතර ඔවුහු ලන්දට ළඟා වූහ. බැජර් වලසුන් හැසිරිය හැකි ස්ථාන ගැන පිලිප්ට හොඳ දැනුමක් තිබිණි. ඔහු ජැක් ද සමඟ ගමන් කළේ නොඋස් ඉවුරක් වෙතය.

''මේ වගේ තැනකට මුවා වෙලා තමයි අපි බලාගෙන ඉන්නෝනෙ'' පිලිප් පැවසුවේය. ''ඉවුරේ හෙවණැල්ලට වෙලා ඉමු''

ඔවුන් අඳුරු සෙවණැල්ලේ දිගා වී සිටියදී බකමූණෙක් අසලක සිට හඬ නැඟුවේය. ඒ වහා කිකී එම හඬ අනුකරණය කරමින් හඬ නැඟුවේ ජැක් කෝපයට පත් කරවමිනි.

''කට වහගන්නවා කිකී'' ඔහු මිමිණුවේය. ''ඔය විදියට කෑ ගැහුවොත් පලාතෙම ඉන්න බකමූණන් ටික මෙතැනට ඒවි. අර... අර... කියන කොටම එකෙක් එනවා''

බකමූණෙක් එදෙසට පියඹා ආවේය. ජැක් හිස පහතට යොමු කරගෙන සිටියේය. කිකී ද එසේ කළේ සතුටිනි. අනෙක් පක්ෂීන් රැවටීමෙන් ද කිකී ලැබුවේ ඉමහත් සතුටකි. සියලු දෙනා නිහඬව කුඩා ශබ්දයකට පවා ඇහුම්කන් දෙමින් සිටියහ. හදිස්සියේ ජැක් පිලිප්ගේ ඉලයට ඇන යමක් සන් කළේය. සර්පයෙකු බඳු දිගු සිරුරැති සත්වයෙක් පඳුරු අතරින් බඩ ගා ආවේය.

''මුගටියෙක්'' පිලිප් ජැක්ගේ කනට කොඳුරා කීවේය. ''අර මොකෙක් ද? ඉත්තෑවෙක්''

ඉවුරේ සෙවණැල්ල දෙස ඉත්තෑවා කුතුහලයෙන් යුතුව බැලුවේය. ඌ බිය නැතිව ඉදිරියට පැමිණෙද්දී පිලිප් සෙමෙන් අත දිගු කළේය. ඉත්තෑවා ඔහුගේ අත ඉව කළේය. පිලිප් කිසිම සතෙකුට බිය නැති බව ජැක් දැන සිටියේය. ආපසු හැරුණු ඉත්තෑවා ආපසු ගියේ දුනුණු කුසගින්න නිවා ගන්නට සුදුසු අහරක් සොයා ගන්නා අරමුණෙන් විය හැක. පිරිමි ළමයි දෙදෙනා ඊළඟ නිශාචර සත්වයා එහි පැමිණෙන තුරු බලා සිටියහ.

එවර පැමිණියේ බැජර් වලසෙකි. පිලිප් ඉහළට ඇදගත් හුස්ම පහළ හෙළුවේ නැත. මෙතරම් ඉක්මනින් බැජර් වලසෙකු දැක ගන්නට ඔහු බලාපොරොත්තු වූයේ නැත. එම සත්වයාගේ සුදු පැහැති මුහුණේ කළු පැහැ ඉරි තිබිණි. සඳ එළියේ සිටගෙන ඒ මේ අතට හැරෙමින් ඌ ඉව කළේය. ඌට අනතුරක ඉව, මිනිස් ඉව දැනී ඇත්ද?

පුළඟ හැමුවේ බැජර් වලසා සිටි දෙස සිට ජැක් හා පිලිප් සිටි දෙසටය. එහෙයින් ඌට ඔවුන්ගේ ඉව දැනෙන්නේ නැත. සඳ එළියේ සිටිය ද ඌ දැක ගත හැකි වූයේ අපහසුවෙනි.

ඒ උගේ කළු හා සුදු පැහැ ඉරි සහිත මුහුණ සඳ එළිය හා සෙවණැලි සහිත පරිසරයට මනාව ගැළපුණු හෙයිනි. ජැක් පිලිප්ට සන් කළේය. තවත් සත්තු පැමිණෙමින් සිටිති.

''බැජර් පැටවුන්'' පිලිප් මහත් සතුටින් යුතුව සිතුවේය. ''මුළු පවුලම... ඔව් අර පිටිපස්සෙන්ම එන්නේ බැජර් අම්මා. ෂාහ්... මුන් දැක ගන්න ලැබීම මොන තරම් වාසනාවක්ද?''



බැජර් පැටවු ක්‍රීඩා කරන්නට පටන් ගත්හ. උන් උඩ පැන්නාහ. කරණම් ගැසූහ. ජිම්නාස්ටික් ක්‍රීඩකයන් මෙන් උන් පිනුම් ගැසූහ. හදිසියේ උන්ගේ මව්පියන් කළ අඬගැමකට අනුව පැටවු උන් පසුපස කැලෑවට දිව ගියහ.

ජැක් සිනාසුණේය. ''ෂාහ්.... මොන තරම් ලස්සන දර්ශනයක්ද? කිසිම සතෙක් ඔය විදියට ක්‍රීඩා කරනවා. මම මීට කලින් දැකලා නැහැ. හැම බැජර් වලසෙක්ම ඔය වගේ ජිම්නාස්ටික් කාරයෝද?

''මම අහලා තියෙන විදියට උන් ඒ වගේ'' පිලිප් කීවේය. ''වතාවක් මට සතුන් ගැන හොඳින් දන්නා කෙනෙක් කීවා. උගුලකට අහුවුණොත් උන් සිරුර නමලා ඒ අතට මේ අතට හැරිලා උගුලෙන් ගැලවෙන්නේ උගුලේ තමන්ගේ ලෝමයක් දෙකක් විතරක් ඉතිරි කරලාලු''

ඈතකින් යළි ඇසුණේ බකමූණකුගේ හඬය. ජැක්ගේ උර මත වාඩි වී සිටි කිකී වටපිට බැලුවේ යළි ඒ හඬ අනුකරණය කරන්නට මෙනි.

''දැන් ආපහු ගියොත් හොඳා'' පිලිප් කීවේ නැගී සිටිමිනි. ''තව සතුන් දෙතුන් දෙනෙක් එනතුරු ඉන්න ආසයි. ඒත් මෙතැනදීම නින්ද යාවි කියලා මට බයයි. ඔයා එනවාද ජැක්?''

''ම්.. ම්... ම්... මම කැමතියි ගල් වළ පැත්තේ රවුමක් ගහලා බලලා එන්න'' ජැක් පැවසුවේය. ''එහේ ඉන්න බකමූණන් බලන්න වගේම උන් වගේ කෑගහන්න කිකීට අවස්ථාවක් ලබා දෙන්නත් මම කැමතියි. එතකොට බලාගන්න පුළුවනි කිකීට බකමූණන් තමන් ළඟට කැඳවන්න පුළුවනි ද කියලා. කිකී ඒකට උත්සාහ කරාවි. එහෙම නේද කිකී?''

මහ හඬින් කතා කරන්නට බියෙන් මෙන් කිකී යමක් ජැක්ගේ සවනට කොඳුරා කීවේය. ජැක් නැගී සිට අත් පාවල හිරි ඇරියේය. ''හරි ඔයා ගිහින් නිදාගන්න පිලිප්. මම පස්සෙ එන්නම්'' ඔහු

කීවේය. ''මම පැය බාගෙකට වඩා වැඩි වෙලාවක් ඉන්නේ නැහැ. තව ටිකකින් බකමූණන් සිය ගාණක් එක සැරේ කෑගහනවා ඇහුණත් පුදුම වෙන්න එපා. එහෙම නේද කිකී?''

පිලිප් ආපසු නිවහන වෙත පැමිණි අතර ජැක් පැරණි ගල් වළ බලා ගමන් ගත්තේය. ඊළඟ මිනිත්තු දහය පහළොව ඇතුළත තමන්ට මුහුණ දෙන්නට සිදුවන කම්පනය ගැන දෙදෙනාගෙන් කිසිවකු හෝ යාන්තමින්වත් දැන සිටියේ නැත.

## 12. හසුවීම

පිලිප් නිවහනේ පසුපස දොර වෙත පැමිණි නමුත් නිවහනට ඇතුළු නොවී නතර විය. ඒ ශබ්දය කුමක් ද? එය හරියට ඉදිරි දොර වෙත කිසිවකු ඇවිද එන හඬකි. පිලිප් මදක් කල්පනා කළේය. කිසිවකු ගුසී සොයා ගෙන පැමිණ සිටින්නේ ද? එසේ නම් කළ යුතු හොඳම දෙය බිල් අවදි කරවා අනතුරු ඇඟවීමයි. ඔහු හඬ නොනැගෙන සේ පසුපස දොර විවෘත කර ඇඟිලි තුඩු වලින් ආලින්දය හරහා ඇවිද ආ ඔහු ඉහළ මාලයට නැගී නතර වී බැලුවේ යළිත් ශබ්දයක් ඇසුණු නිසාවෙනි.

සැම විටකම නැගෙන පරිදි සිහින් 'ක්‍රීත්' ශබ්දයක් නගමින් ඉදිරිපස දොර සෙමෙන් විවෘත විය. විදුලි පන්දමක් දැල් වී ඒ වහා නිවී ගියේය. ඔව්. කිසිවෙක් නිවසට ඇතුළු වී සිටියි.

පිලිප් මහ හඬින් කෑ ගැසුවේය. ''බිල්... බිල්.... ඉක්මනට නැගිටින්න. බිල්... බිල්... කවුදෝ ගෙට ඇතුළු වුණා...''

ඔහු කෑ ගසමින් සිටියේ ගැහැනු ළමයින්ගේ කාමරය ඉදිරිපිට සිටය. ඔවුහු වහා අවදි වූහ. දෙවියනි, මේ මහ රෑ බෙරිහන් දෙන්නේ කවුරුන්ද?

''කවුරු හරි ගෙට ආවා. ඉක්මන් කරන්න. බිල් නැගිටින්න'' අසල ඇති බිල්ගේ කාමරයෙන් ප්‍රතිචාරයක් නැත්තේ මන්දැයි සිතමින් පිලිප් නැවත වතාවක් කෑ ගැසුවේය.

ගැහැනු ළමයින්ගේ කාමරයේ දොර විවෘත වූ අතර ඩිනා බියෙන් යුතුව පිටතට එබී බැලුවාය. ''මොකද මේ? කවුද මේ? කෝ බිල්?''

''ඔය ඉන්න තැන්වලම ඉන්නවා'' උස් හඬකින් පැවසුණු අතර පිලිප් හා ඩිනා වෙත මෙන්ම එවෙලේ එතැනට වෙව්ලමින් පැමිණි ලූසී ඇන් වෙත ද විදුලි පන්දම් එළියක් වැටිණි.

පිලිප් ගැහැනු ළමයින් දෙදෙනා ඔවුන්ගේ කාමරය ඇතුළට තල්ලුකර දමා බිල්ගේ කාමරයට පැන්නේ මහ හඬින් කෑ ගසමිනි. ''බිල්.... අවදිවෙන්න''

සඳ එළියෙන් පෙනුණේ සම්පූර්ණයෙන්ම හිස් වූ යහනකි. බිල් කොහේ ගොසින්ද? තමන්ගේ මව... ඇය කොහි ගොසින්ද? පිලිප් ගල් ගැසුණේය.

ගුස්ටාව් අවදි වූයේය. යහන මත හිඳගෙන ඔහු කල්පනා කළේ මේ ඇසෙන කෑ ගැසීම් මොනවාද කියාය. හදිසියේ ඔහු වටහා ගත්තේ යාබද ඇඳන් මත ජැක් හා පිලිප් නැති බවය. බියට පත් ඔහු සිය ඇඳෙන් බිමට පැන්නේය.

බිල්ගේ නිදන කාමරයේ සිට පිලිප් තව දුරටත් කෑ ගැසුවේය. බිල් කොහේ හෝ සිටිය යුතුය. ඒ කොහිද? ''බිල්... බිල්'' විදුලි පන්දමක එළිය කාමරයට වැටුණ අතර දෙදෙනෙක් දොර අසල සිට ගත්හ.

''ඔයාට බිල් හොයාගන්න ලැබෙන්නෙ නැහැ'' එක් අයෙක් පැවසුවේය. ''එයාගේ බිරිය වුණත්. අපි ඒ දෙන්නාව අල්ලා ගත්තා. දූන් අපට ඕනේ අලොයිසියස් රජ කුමාරයා. අපි ඔහුට හානියක් විපතක් කරන්නෙ නැහැ. ඒත් ඔහු අප සමඟ පැමිණිය යුතුයි. ඔහුගේ රටට ඔහු අවශ්‍යයි.''

''ඔහේලා මගේ අම්මාට මොකද කළේ?'' පිලිප් උස් හඬින් විමසුවේය. ''මම පොලිසියට දන්වනවා. මිනිස්සුන්ව අල්ලාගෙන කුමාරයෙක් පස්සේ එළවමින් මොනවා කරනවා කියලා ද ඔහේලා හිතාන ඉන්නේ? මේ වගේ දේවල් ඔහේලාට බ්‍රිතාන්‍යයේ කරන්න බැහැ''



''ඔහ්... ඔව්.. අපට පුළුවනි'' එතැනට පැමිණි තවත් අයෙක් විදෙස් උච්චාරණය සහිතව මෘදු හඬින් පැවසුවේය. ඒ පස්වරුවේ කාන්තාව සමඟ එහි ආ පිරිමියා බව පිලිප් වහා හඳුනාගත්තේය. ඔහු පසුපස තවත් අය සිටියහ. කී දෙනෙක්ද? ජැක් තමා සමඟ සිටියා නම් මැනවැයි පිලිප් කල්පනා කළේය. එක පිරිමි ළමයෙකුට තනිව මේ පිරිස හා සටන් කිරීමට නුපුළුවන. ඔහු ගුසී පිරිමි ළමයකු ලෙස ගණන් තැබුවේ නැත.

පසුපස සිටි මිනිසෙක් පිලිප්ට නොවැටහෙන බසකින් උස් හඬින් මොනවාදෝ කීවේය. ඊට පිළිතුරු ලෙස එම බසින්ම අණ කිරීමක් ඇසිණි. ඒ කටහඬ ඇසුණේ අට්ටාලයේ වූ නිදන කාමරයෙනි. ගුසී කළේ බරපතළ වරදකි. මේ පිරිස පැමිණ ඇත්තේ ද ඔහු සොයාගෙනය. දූන් පිරිස ඔහු සිටින තැන දන සිටියි.

ගුසී වහා නිදන කාමරයේ දොර වසා අගුළු දැමුවේය. ඉන් පසු වෙව්ලමින් ඒ දොරටම හේත්තු වී සිටියේය. ඊළඟට ඔහු කවුළුව වෙත දිව ගිය නමුත් ඒ හරහා පලා යන්නට ඔහුට හැකිද?

නැත. ගුසී දක්ෂ උස නඟින්නෙකු නොවේ. ජැක්ට හෝ පිලිප්ට පවා එතරම් උසක සිට පහළට බඩ ගෑම පහසුවන්නේ නැත. තමා බිම ඇද වැටෙනු ඇත යන බිය ගුස්ගේ සිත්හි ඇති විය.

''මේ අගුළු අරින්න'' කිසිවෙක් කෑගැසුවේය. එහෙත් ගුසී ඊට කීකරු වූයේ නැත. දෙදෙනකු එක්ව දොරට පහර දුන් අතර එය පහසුවෙන්ම බිඳ වැටිණි. බිම ඇද වැටුණු දොර මතින් ඔවුහු ගුසී වෙත ඇවිද ආහ. ගුසී මරහඬ තැලුවේය.

එක් අයෙක් හිස නමා ඔහුට ආචාර කළේය. ''උතුමාණෙනි, අප පැමිණියේ ඔබතුමාට විපතක් කරන්නට නෙවෙයි. අප පැමිණියේ ඔබතුමා නැවත ටෞරි හේසියා වෙත කැඳවා ගෙන ගොස් ඔබතුමාගේ බාප්පා දරන කිරුළ ඔබතුමාට ලබාදෙන්නයි. ඔබතුමාගේ බාප්පාට රටවැසියන් කැමති නැහැ. ඔවුන්ට අවශ්‍ය ඔබතුමා රජවනු දකින්නයි''

''ඒක බොරුවක්'' බියෙන් වෙව්ලමින් ගුසී කෑගැසුවේය. ''මම ඔය හැම දෙයක්ම දන්නවා. මගේ බාප්පා උඹලාට නැමෙන්නේ නැති ශක්තිමත් පාලකයෙක්. උඹලාට අවශ්‍ය වෙලා තියෙන්නේ උඹලා කියන විදියට වැඩ කරන ළා බාල මාව රජ කරවන්න. මම එන්නෙ නැහැ''

ගුස්ටාව් මේ සියල්ල පැවසුවේ තමාගේ භාෂාවෙනි. තම කාමරයට වී බියෙන් සියල්ලට ඇහුම්කන් දීගෙන සිටි ගැහැනු ළමයින්ට ඒ කිසිවක් වැටහුණේ නැත. දොර අසල සිටි පුද්ගලයා තල්ලු කර දැමූ පිලිප් ගුසී සිටි කාමරයට දිවගියේය.

''මේ බලන්න'' පිලිප් එහි සිටි දෙදෙනාට උස් හඬින් පැවසුවේය. ''බ්‍රිතාන්‍ය රජයත් ඔහේලාගේ රජයත් ගුසී රජ කරවන්න ඉඩ දෙන්නේ නැහැ කියලා ඔහේලා දන්නවා. අපේ රජය ඔහේලාට දඬුවම් කරාවි. ඔහේලාට මේ රටේ හරි ඔහේලාගේ රටේ හරි හිර ගේක තපින්නයි වෙන්නේ''

පිරිස වහා එක්ව යම් කතා බහක නියැලුණහ. පිලිප්ට ඔවුන් කතා කළ එක වචනයක් හෝ වැටහුණේ නැත. ඉන්පසු උස සිරුරැති උපැස් පැළඳ සිටි මිනිසා පිලිප් වෙත නැමුණේය.

''ඔයාලා දෙන්නා වගේම අනෙක් ළමයිනුත් අපි එක්ක යනවා'' ඔහු කීවේය. ''ඔයාලා අපේ පුංචි කුමාරයාගේ සහායකයන් වෙන්නේ නැතෑ. ඔයාලා අපි ළඟ වග දැනගත්තාම ඔයාලගේ රජය වුණත් අපි එක්ක වැඩිය හැප්පෙන්න එන එකක් නැහැ''

''ඔහ්... ඔහේලා හිතාන ඉන්නේ අපිව ප්‍රාණ ඇපකාරයන් හැටියට ගෙනියන්නද?'' පිලිප් විමසුවේ මහත් කෝපයෙන් යුතුවය. ''අපිව හිරකාරයන් හැටියට තියාගෙන අපේ රජය එක්ක කේවල් කරන්නද ඔහේලා උත්සාහ කරන්නේ? මම එකක් කියන්නං... තමුසෙලා බ්‍රිතාන්‍ය ජනතාව ගැන දන්නෙ නැහැ. තමුසෙලාට මේ ගැන කනගාටුවෙන්න වේවි. කප්පම් ගන්න අපිව තියාගන්න? ඔය වගේ පිස්සු අදහසක් මම මගේ ජීවිතේට අහලා නැහැ. තමුසෙලා ජීවත් වෙන්නේ මධ්‍යකාලීන යුගයේද?''



එම පුද්ගලයා පිලිප් කී සියල්ල අවසානය දක්වාම මහත් ඉවසීමෙන් යුතුව අසා සිටියේය. ඉන්පසු ඔහු අත වනා යම් සංඥාවක් කළේය. මිනිසුන් දෙදෙනකු වහා ඉදිරියට පැන පිලිප් හා ගුසී අල්ලා ගත් අතර ළමයින් දෙදෙනාට වැඩුණු මිනිසුන්ගේ ග්‍රහණයෙන් බේරෙන්නට පහසු වූයේ නැත.

''දුවන්න... ඔය දෙන්නා පැනලා දුවන්න'' පිලිප් උස් හඬින් කෑ ගැසුවේ ඒ අසා ඩිනා සහ ලුසී ඈන් නිවසෙන් පිටතට දිව ගොස් ළඟු කැළෑවේ හෝ සැඟව ගනු ඇතැයි සිතමිනි. පිලිප්ගේ කෑ ගැසීම ඇසුණු වහා ඩිනා සහ ලුසී පහළ මාලයට දිව ගිය නමුත් එහි ඔවුන් අල්ලා ගන්නට ශක්තිමත් පුද්ගලයෙක් සිටියේය. ඔවුන් දෑත් දෙපා වනමින් කෑ ගසමින් ඔහුගේ ග්‍රහණයෙන් මිදී ගන්නට තැත් කළ ද, තවත් අයකු සහායට පැමිණෙන තුරු දැරියන් අල්ලාගෙන සිටින්නට ඔහු සමත් විය.

උපැස් පැළඳ සිටි පුද්ගලයා උස් හඬින් අණ දුන් අතර පිරිස ඔහුගේ අණ යටතේ ක්‍රියාත්මක වන බව ඉතා පැහැදිලිව පෙනිණි. ඔහුගේ අණ පරිදි අයෙක් කාමරයට ඇතුළු වූයේය. ඔහු නැවත පැමිණියේ ඒ වන විට රාත්‍රී ඇඳුම් වලින් සැරසී සිටි ගැහැනු ළමයින් දෙදෙනාට හා ගුසීට හොඳ ඇඳුම් අරගෙනය. ඒ තිදෙනාම සෙරෙප්පු පැළඳ සිටියේ නැත. නායකයා මෙන් පෙනුණු තැනැත්තා තවත් අයෙකු යවා තිදෙනාට සපත්තු ගෙන්වා ගත්තේය.

''කෝ බිල්?'' ලුසී ඈන් වෙව්ලමින් විමසුවේය. ''මට බිල් ඕනේ. මේ අය බිල්ට මොනවා කරලාද? කෝ ඇලී නැන්දා?''

''බය වෙන්න එපා'' උපැස් යුවළ පැළඳ සිටි මිනිසා ඇයට පැවසුවේ ඉතා කාරුණික ස්වරයෙනි. අපි ඔයාලාට හොඳින් සැලකනවා. ඔයාලාට කරදරයක් කරන්නේ නැහැ. අලොයිසියස් කුමාරයාට එයාගේ මිතුරු මිතුරියන් එයා ළඟින්ම සිටීම සතුටට කාරණාවක් වේවි. ටෞරි හේසියාවලදී ඔයාලාට බොහොම සතුටින් කාලය ගත කරන්න පුළුවන් වේවි''

ලුසී ඈන් හදිසියේ වටහා ගත්තේ ජැක් එහි නොමැති බවය. ඇය වටපිට බලමින් ඔහු සෙව්වාය. ''කෝ ජැක්? ඔයාලා ජැක්ට මොනවා ද කළේ?''

''ආ.... ඔව්... තව පිරිමි ළමයෙක් හිටියා. දැන් මට මතකයි'' පිරිසේ නායකයා කීවේය. ''කෝ එයා?''

''කුරුල්ලන් බලන්න ගිහින්'' පිලිප් ගණනකට නැතිව කීවේය. ඔහුගේ එකම බලාපොරොත්තුව වූයේ නිවහනට ආපසු එන ජැක් නිවහන ඇතුළත කලබලය වටහාගෙන පලා ගොස් උදව්වට පිරිස කැඳවාගෙන විත් ළමයින් පැහැරගෙන යාම වළකාලනු ඇත යන්නයි. පිලිප් පොර බැදීම හා දඟලීම නතර කළේය. දඟලීමෙන් කුමන ඵලයක්ද? නිකරුණේ වෙහෙසට පත්වනවා පමණකි. ගැහැනු ළමයින් දෙදෙනා ද හසුවී ඇති නිසා කළ යුතු හොඳම දෙය ඔවුන් හා රැඳී සිට ඔවුනට ආරක්ෂාව සැලසීම පමණකි.

''කුරුල්ලන් බලන්න...? මේ රෑ....?'' පිරිසේ නායකයා විමසුවේය. ''මේ බ්‍රිතාන්‍ය ජාතිකයන්ට තියෙන්නේ හරිම අමුතු පුරුදු. අපට ඒ පිරිමි ළමයා එනතුරු ඉන්න බැහැ. අපට එයා අවශ්‍ය නැහැ''

ඔවුහු යළි ඉදිරිපස දොර විවෘත කළහ. ළමයින් සිව්දෙනා පෙරටු කොට ගෙන ඔවුන් තදින් අල්ලාගෙන පිරිස මාවතට පිවිසියහ.

''කෑගැහුවාය කියලා නං ඵලක් වෙන්නෙ නැහැ'' නායකයා ඉතා කාරුණිකව පැවසුවේය. ''කවුරුවත් ඔයාලා කෑගහනවා අහන්න වටපිට නැහැ. අනික කෑගැහුවොත් අපි ඔයාලාගේ කටවල් ඇතුළට රෙදි කෑලි ඔබනවා''

''පිලිප් මොනවද අපි කරන්නේ?'' ඩිනා විමසුවේ දාමරික කල්ලියේ අත් අඩංගුවට පත්වන්නට සිදුවීම පිළිබඳ කෝපයෙන් මුහුණු දම් පැහැ කරගෙනය.

''මොකුත් නැහැ'' පිලිප් පිළිතුරු ලෙස කීවේය. ''අපි... කලබල කරන්න හොඳ නැහැ... බලාපොරොත්තු නැති කරගන්නෙ නැතිව ඉන්න එක තමා හොඳ''

ඔහු පැවසුවේ කුමක්දැයි ඩිනා අනුමාන කළාය. අවසන් තත්පරයේ හෝ ජැක් උපකාර අරගෙන එන්නට ඉඩ තිබේ.



ලූසී ඈන්, බිල් හා ඇලී නැන්දා ගැන ද, ඊටත් වඩා ජැක් ගැන ද සිත කරදර කරගත්තාය. තමා ටෞරිහේසියා වෙත රැගෙන ගියහොත් මාස ගණනක් සමහර විට වසර ගණනක් ජැක්ගෙන් වෙන්ව සිටින්නට සිදුවනු ඇත. ජැක් කොහිද?

ජැක් කිකී සමඟ ගල් වළ පහළට බැස සිටියේය. එහිදී ඔහුට බකමූණන් රාශියක් දැකගත හැකි විය. සෑම වර්ගයකටම අයත් බකමූණෝ එහි සිටියහ. කිකී ද එහිදී ජීවිතයේ අන් කිසිම දවසක නොලැබූ ආශ්වාදයක් ලැබුවේ බකමූණන්ගේ හඬ අනුකරණය කරමින් උන් රවටමිනි. කිකී වතාවක් එසේ හඬ නගද්දී ජැක් අසලටම බකමූණෙක් පියඹා ආවේ කිකී ඔහුගේ උරහිස මත සිට හඬ නැගූ නිසාවෙනි. බකමූණාගේ පියාපත් ජැක්ගේ මුහුණේ වැදිණි.

තමා සිටින්නේ නිවැරදි තැන නොවේ යැයි ජැක් සිතුවේය. පඳුරක් අස්සට හෝ වෙනත් ආවරණයකට නොගියහොත් ඊළඟ වතාවේ බකමූණකුගේ නියපොතු වැදී තම මුහුණට තුවාල සිදුවන්නට පවා ඉඩ ඇතැයි ඔහු සිතුවේය.

ගල් වළේ අනෙක් පසට ගිය ඔහු පඳුරක් වෙත ගමන් කළේය. පඳුරට ආසන්න වෙද්දී ඔහු දුටුවේ සඳ එළියෙන් දිළිසෙන යමක් පඳුර යට ඇති බවය. ජැක් වහා නතර වී කල්පනා කළේ එය කුමක් විය හැකි ද කියාය. කුතුහලයෙන් යුතුව තවත් මඳක් ඉදිරියට ගිය ඔහු දුටුවේ එය අඳුරු පැහැ දිගු හා විශාල යමක් බවය. සඳ එළියෙන් එහි ඔපවත් මතුපිට දිළිසිණි.

''ආහ්... ඒ කාරෙකක්'' ජැක් මහත් විමතියෙන් යුතුව මිමිණුවේය.

''අර ගොවිපොළේ නතර වෙලා ඉන්න ජෝඩු වගේ කාරෙක වගේම කාරෙකක්.... හ්ම්... මේ ඒකම වෙන්නත් පුළුවනි. ඒක මෙතැනට ආවේ මොකටද?''

ඔහු රථය අසලට ගියේය. එය හිස්ව තිබිණි. කිසිවකු එහි නොසිටි අතර දොර හතර වසා අගුළු දමා තිබුණේ කිසිවකුට එය එතැනින් ඉවතට ගෙන යා නොහැකි පරිද්දෙනි.

''කවුරු හරි කාරෙක මෙතැන නවත්වලා අපි නතර වෙලා ඉන්න ගේ පැත්තට ඔත්තු බලන්න යන්න ඇති'' ජැක් සිතුවේය. ''එහෙම නං දැන් මටත් ඔත්තු බලන්න වෙනවා. ඒ පැත්තට ගිහිං බලමු කවුද ඒ පැත්තේ කරක් ගහන්නෙ කියලා''

ඔහු රථය පසුපසට ගොස් ඩිකිය විවෘත කර ඒ ඇතුළට එබී බැලුවේය. අතිරේක ටයරය හා ආයුධ කිහිපයක් හැර වෙනත් කිසිවක් ඒ විශාල ඩිකියේ නොතිබිණි.

තව එක පියවරක් හෝ ඉදිරියට තබන්නට පෙර ඔහුට ඇසුණේ ගල් වළ දෙසට ඇදෙන පියවර හඬ කිහිපයකි. ඔහු වහා අසල වූ පඳුරකට මුවා වූයේය.

පියවර හඬ මහා ඝෝෂාවක් සේ නැගුණේ එතැන පුද්ගලයන් අට දෙනකු සිටි නිසාවෙනි. පාළු ගල් වළ හරහා ඔවුන් ඇවිද ආවේ මෝටර් රථය දෙසටය. පඳුරට මුවා වී සිටි ජැක් හිස මඳක් පිටතට යොමු කළ විට දුටුවේ පිලිප්, ඩිනා, ලූසී ඈන් හා ගුසී දාමරිකයන්ගේ අත් අඩංගුවට පත්ව ඇති බවය. ඔහු වහා සිතන්නට පටන් ගත්තේ ඊළඟට කුමක් කළ යුතු ද කියාය.

කිකී හදිසියේ කෑ ගැසුවේය. ඒ බකමූණකුගේ හඬ අනුකරණය කරමින් නොවේ. ගිරවකුගේ නියම හඬිනි. පිලිප් වහා ඒ හඬ හඳුනාගත්තේය. ඒ කිකීය. එසේ නම් ජැක් ද ගල් වළේ කොතැනක හෝ තවමත් සිටිනවා විය යුතුය.

පිලිප් කෑ ගැසුවේය. ''අපිව අරගෙන යනවා. බිල්ට කියන්න''

පිලිප් අල්ලාගෙන සිටි මිනිසා පිලිප්ව තල්ලු කළේය. ''කෑ ගහන්න එපා කියලා කිව්වා නේද? මෙතැනදි කෑ ගැහුවාය කියලා ඇති එලේ මොකක්ද? ඔය කෑගැහිල්ල අහන්න කවුරුවත්ම මෙතැන නැහැ''

එතැන එක් අයෙක් එම කෑ ගැසීම අසන්නට සිටියේය. ඒ ජැක් ය. එහෙත් ජැක් කුමක් කරන්නද?

# 13. අතිරේක මඟියා

ළමයින් සිවුදෙනා බලෙන් මෙන් රථය ඇතුළට නංවද්දී ජැක් එදෙස මහත් කම්පාවෙන් යුතුව බලා සිටියේය. කල්ලියේ තිදෙනකු සමඟ පිලිප් හා ඩිනා පසුපස අසුනට නැංවිණි. ගුසී හා ලූසී ඈන් රියැදුරා සමඟ ඉදිරිපස අසුනට නංවා ගැනිණි. රථයේ සැහෙන පිරිසකි. වැඩි මඟී සංඛ්‍යාවක් සමඟ රථය ගමන් කරනු කිසිවකු දුටුවහොත්, විශේෂයෙන්ම පොලිසිය දුටුවහොත් රථය නතර කරවනු ඇත්ද?

''ඔව්.... නතර කරවාවි'' ජැක් සිතුවේය. ''ඒ කියන්නේ ඔවුන්ට වැඩි දුරක් යන්න බැහැ..... මේ අය යන්නෙත් ඒ තරම් දුරක් නෙවෙයි. හිරු එළිය වැටෙන්නට පෙර ගමනාන්තයට යන්න ඔවුන් බලාපොරොත්තු වෙනවා වගේ. ඇත්තටම ඔවුන් යන්නේ මේ ආසන්නයේම පිහිටි රහසිගත තැනකට ද? අනෙක ගුසී හැර පිලිප් හා ගැහැනු ළමයින් දෙදෙනාවත් මේ අය පැහැරගෙන යන්නේ මොකටද?''

සියලු දෙනා රථයට නැග අවසන්ය. දොරවල් හඬ නොනැඟෙන සේ වැසිණි. රථය පණ ගැන්විණි. ඒ මොහොතේම ජැක්ගේ සිතෙහි අදහසක් පහළ විය.

ඔහු දෙකට නැමී රථය පසුපසට දිව ගියේය. ඊට පෙර ඩිකිය ඇර ඒ ඇතුළත පිරික්සූ අවස්ථාවේ ඔහු ඩිකිය වසා තිබුණේ යාන්තමටය. රථය එතැනින් ඈත් වන්නට පෙර ඔහුට ඩිකියට රිංගා ගත නොහැකි ද? එය විශාල, ඉඩකඩ සහිත ඩිකියකි.

ගල් මුල් මතින් රථය ඉදිරියට ගමන් කළේ ඉතා සෙමිනි. රිය පසුපස මඳ දුරක් දිව ගිය ඔහු සෙමෙන් ඩිකියට නැගගත්තේය. බියපත් වූ කිකි ඔහුගේ උරහිසින් ඉවතට පියාඹා ගිය අතර ජැක් විෂ්ජිත්තව ඌ දෙස බලා සිටියේය. ඌට තමා වෙත අඬ නොගසන්නට ජැක් සිතුවේය.

එහෙත් ජැක් ඩිකිය ඇතුළත හරි බරි ගැසී සිටිනු දුටු වහා ඌ නැවත පහළට පියාඹා විත් ඔහුගේ උරහිස මත වැසුවේය. ඉන් පසු ඌ සිහින් හඬින් ජැක්ගේ කනට කොඳුරා ගිරා බසින් පැවසුවේ මේ සිදුවන සියල්ල අසාමාන්‍ය දෑ වුවත් ජැක් සමඟ තමා දිගින් දිගටම සිටින බව විය හැක.

කිකි නැවත තමා වෙත ඒම ජැක්ට සතුටට කාරණයක් විය. ඔහුට සියල්ලක්ම ගැටලු වැලක් සේ පෙනිණි. බිල් කොහිද? මෙ කල්ලිය ඉතා පහසුවෙන් ගල් වළ ළඟ නිවහනට රිංගා සියලු දෙනා ඔවුන්ගේ ග්‍රහණයට ගත්තේ කෙසේද? ඔවුන් බිල්ට කළේ මොනවාද? ඔවුන්ගෙන් පහර කෑ බිල් නිවහනේ සිහිසුන්ව වැටී සිටිනවාද? රථයේ ඩිකියට නැගීම නොව කළ යුතුව තිබුණේ නිවහනට ගොස් බිල් හා ඇලි නැන්දා ගැන සොයා බැලීමද?

ඒ වන විට පිටිසර බද පළාතේ පටු මාවත් දිගේ රථය වේගයෙන් ඉදිරියට ගමන් කරමින් තිබිණි. හදිසියේම එය කුඩා නිවසක් ඉදිරිපිට නතර විය. නිවසෙන් පිටතට පැමිණි පුද්ගලයෙක් එතැන නවතා තිබූ තවත් මෝටර් රථයකට නැගගෙන එය පණ ගැන්වූයේය. ජැක් හා අනෙක් ළමයින් සිටි රථයෙන් බැස ගත් අයෙක් ගොස් එම රථයට නැගුණේය. ඒ රථය ළමයින් ගෙන යන රථයට මඟ පෙන්වන්නට මෙන් ඉදිරියෙන්ම ගමන් කළේය. ජැක් දෙවියන්ට ස්තුති කළේ එම රථය තමන් සිටි රියට පසුපසින් නොපැමිණීම වෙනුවෙනි. එසේ පැමිණියා නම් එහි විදුලි ලාම්පු එළියෙන් ඩිකියට වී යාත්තමට ඩිකිය වසාගෙන ගිය ජැක් ඔවුනට පෙනෙන්නට ඉඩ තිබිණි.

''මට ඩිකිය වහගෙන යන්න පුළුවනි. ඒත් බැරිවෙලාවත් අගුළු වැටුණොත් මට ආයෙ මෙක ඇරගන්න බැරිවේවි'' ජැක් සිතුවේය. ''මට බලාගන්න ඕනෙ මුන් අපේ කට්ටිය කොහාට ද



ගෙනියන්නේ කියලා. මට එහෙම බලාගන්න පුළුවන් වුණොත් පොලිසියට දන්වලා ඒ තැන වටකරලා හැමෝම බේරා ගන්න පුළුවන් වේවි. මම මෙතැන ඉන්නවා කියලා කවුරුවත් දන්නෙ නැහැ''

තවත් පැයක පමණ කාලයක් තිස්සේ ධාවනය වූ රථය නතර විණි. එතැනදී උස් හඬින් වචන හුවමාරුවක් සිදු වූ අතර අවසානයේ ගේට්ටුවක් ක්‍රීක් හඬ නංවමින් විවෘත වන අයුරු ඇසිණි.

''මේ තැන මොකක්ද?'' ජැක් සිතුවේය. ''තැන මොකක් වුණත් මම දූන්ම බැහැගන්න එක හොඳයි. අපොයි... මෙන්න ආයෙමත් කාරෙක ඉස්සරහට යනවා''

මෝටර් රථය පිවිසියේ අන්ධකාර විශාල හිස් භූමියකටය. ඒ සමඟම ඉදිරියෙන් උස් හඬක් ද ඇසෙන්නට විය. ජැක් ඒ හඬට හොඳින් ඇහුම්කන් දෙද්දී කිකි බියෙන් මෙන් කෑ ගැසුවේය. කිකිගේ හඬ රථයේ සිටි අයට නෑසුණේ අනෙක් හඬ කිකිගේ හඬ යටපත් කරගෙන නැඟුණු නිසාවෙනි.

''ගුවන් යානයක්''ජැක් තමාටම කියා ගත්තේය. ''එහෙම නම් මේකයි මුන්ගේ සැලැස්ම. උන් දූන්මම ටෞරිහේසියා බලා යනවා. සියලු කටයුතු සූදානම් වන තුරු මුන් ගුසී ඒ රටේ කොතැනක හරි හංගාගෙන තියා ගනීවි. පිලිප්, ඩිනා හා ලුසී ඈන් පවා ඒ එක්කම තියා ගනීවි. එතකොට ඒ හතර දෙනාම කොහේ ද කියලා කවුරුවත් දන්නෙ නැහැ''

මෝටර් රථය තිරිංග තද කර නතර කෙරිණි. වහා ඩිකියෙන් බිමට පැනගත් ජැක් අසල තිබූ ලොරියක් වෙත දිව ගොස් ලොරියට මුවා වී බලා සිටියේය. ගුවන් යානය තිබුණේ ඔහු සිටි තැනට ඈතින් නොව නුදුරෙනි. එහි අවර පෙති කැරකෙමින් තිබූ නමුත් යානයේ විදුලි පහන් දල් වී නොතිබිණි. නමුත් විදුලි පන්දම් අතින් ගත් මිනිසුන් කිහිප දෙනකුම ගුවන් යානය වටා සිටි අතර යානය පිටත් වීමට සූදානමින් තිබෙන බව පැහැදිළි විය.

මේ ස්ථානය කුමක් ද? පෞද්ගලික ගුවන් තොටුපළක් ද? ජැක් එම ගැටළුවලට පිළිතුරු දන සිටියේ නැත. මෝටර් රථයේ සිටි සියලු දෙනා ඉන් බිමට බසින අයුරු ජැක් දුටුවේය. ලුසී ඈන්

හඬන බව දුටු ඔහුගේ සිත ශෝකයෙන් බර විය. ඇය මේ සිදුවන සියල්ල ගැන බියෙන් සිටිනවා නිසැකය. ඇයට ඇත්තේ ඩිනාට බඳු තද සිතක් නොවේ. ලුසී ඈන් හෙට දවසේ කොතැනක සිටීවිද?

සැවොම ගුවන් යානය වෙත ඇවිද ආහ. ජැක් ද මුවා වී සිටි තැනින් තවත් ඉදිරියට පිය මැන්නේය. ඔහුගේ සිතේ තවත් අදහසක් ඇති විය. ගුවන් යානයට නැඟී එය ඇතුළත සැඟව ගන්නට ඔහුට නොහැකිද? ඔහු මෝටර් රථයේ සැඟව සිටි බව පිරිසේ කිසිවකු තවම දන්නේ නැත. ගුවන් යානයේ ද එසේ අනෙක් අයට නොපෙනී සැඟව සිටින්නට ස්ථානයක් තිබේද?

ගුවන් යානය ඇතුළත සැඟවෙන්නට ඇති එකම ස්ථානය බඩු භාණ්ඩ ආදිය ගබඩා කර තබන ස්ථානයයි. එතැනට වැඩි දෙනා වැඩිපුර පැමිණෙන්නේ නැත. එය අවදානමක් වුවත් ඔහු එම අවදානම ගත යුතුව තිබිණි. ඔවුන්ට ඔහු හසුවුවහොත්? එවිට අඩුම තරමින් ඔහුට අනෙක් ළමයින් සමඟ සිටින්නට ඉඩ ලැබෙනු ඇත.

''ඒත් මම එයාලාට අහුවෙලා බැහැ'' ජැක් සිතුවේය. ''මට ඒ අයගෙන් වසං වෙලා ඉඳලා ඒ අය යන්නේ කොහාට ද කියලා බලා ගත්තොත් ඒ තැන ගැන බිල්ට දන්වන්න පුළුවනි''

නොසිතූ ආකාරයට කිකී ජැක්ට උපකාර කරන්නට ඉදිරිපත් විය. තමාට අනෙක් ළමයින්ට කතා කළ නොහැක්කේ මන්දැයි කිකී සිතන්නට ඇත. ගුවන් යානය වෙත එද්දී ළමයින් කතා කරනු අසා කිකී ඒ කටහඬ හඳුනාගත්තේය. ජැක්ගේ උරහිසින් ඉවත්ව ඌ පියඹා ගියේ ලුසී ඈන් දෙසටය. ''කොහේද මේ යන්නේ?'' ඌ කෑ ගැසුවේය. ''දෙවියෝ රජතුමා රැක දෙත්වා. දොස්තර ළඟට යන්න''

ළමයි සිව්දෙනා වහා ගමන නතර කර හඬ ආ දෙසට හැරුණේ මහත් විමතියෙනි. ''කිකී... කිකී ඔයා කොහොමද මෙහාට ආවේ?''

ළමයින් පසුපස ආ පිරිස ද නතර වූහ. කිකී ගිරවෙකු පමණක් ය යන අදහස ඔවුන්ගේ සිත්හි නොතිබිණි. අඳුර නිසා ඔවුන් ගිරවා දුටුවේ ද නැත. ඔවුන් සිතුවේ ළමයින් පසු පස ආ කිසිවකු ගුවන් තොටුපළට ද පැමිණ ඇත කියාය.



උස් හඬින් අණ නිකුත් විණි. විදුලි පන්දම් එළි ඒ මේ අතට යොමුවෙද්දී බියට පත් කිකී යළි ජැක් වෙත පියඹා ගියේය.

''කකුල් පිහදාගන්න'' යළිත් කිකී කෑ ගැසුවේ හතර අත පිරික්සන පිරිස නැවතත් අන්දමන්ද කරවමිනි. පිරිස තමන් සිටි දෙසට එමින් සිටි නිසා ජැක් ලොරියේ අනෙක් පසට ගියේය. ඒ සමගම තමාට උදා වී ඇති අවස්ථාව ඔහුට වැටහිණි. සියලු දෙනාගේ අවධානය යොමු වී තිබුණේ විදුලි පන්දම් ඇනැතිව හතර අත පිරික්සමින් සිටි අය වෙතය. කිසිවකු ගුවන් යානය දෙස බලා සිටියේ නැත.

ජැක් ගුවන් යානයට නැඟුණේය. කිසිවකු එහි ඇතුළත සිටියේ නැත. ඔහු යානයේ පසුපසට ගියේ බඩු භාණ්ඩ අසුරන කොටස සොයාගන්නා අපේක්ෂාවෙනි. එහි විශාල පෙට්ටියක් බඳු යමක් තිබෙනු ජැක්ට පෙනිණි. ආලෝකයක් එහි නොතිබූ නිසාවෙන් ජැක් අතපත ගා එහි පියන විවෘත කළේය. ඔහු සිතුවේ එය හිස් ය කියාය. අත පත ගා බැලූ ජැක්ට දැනුණේ සේද රෙදි වැනි මෘදු යම් යම් දේවලින් පෙට්ටිය පිරී ඇති බවය. ජැක් ඒවායින් කොටසක් පෙට්ටියෙන් බිමට ඇද දමා එය ඇතුළට බැස පියන ද වසා ගත්තේය. කිකී ද බියෙන් යුතුව නිහඬව ඔහු වෙත පැමිණ සිටියේය. ජැක් උගේ හොටයට තට්ටු කර ඇඟවූයේ ඌ දැඩිව නිශ්ශබ්දතාව රැකගෙන සිටිය යුතු බවය.

යළිත් පිරිසේ අයගේ කටහඬ හා ඔවුන් ගුවන් යානයට ගොඩවදින පියවර හඬ ජැක්ට ඇසිණි. අණ දීමක්, දොර වසා දැමීම හා අවර පෙති වේගයෙන් කැරකෙන හඬ ද ඔහුට ඇසුණි ඒ මේ අතර ක්‍රමයෙන් යානය චලනය වන අයුරු ද ඔහුට දැනිණි. ඒ මේ අතට පැද්දෙමින් ඉදිරියට ඇදුණු යානයේ පැද්දීම නතර විය.

''යානය ඉහළට නැඟුණා'' ජැක් සිතුවේය. ''මම දන් අනෙක් අයත් සමඟ. ඒත් ඔවුන් ඒ ගැන දන්නේ නැහැ. මට තව දුරටත් වාසනාව තියේවිද? උන්ට හසු නොවී මට ගමනාන්තය දක්වාම යන්නට ඉඩ ලැබේවිද? එහෙම අහුනොවී ගිහින් මේ අයව රඳවා තියාගන්නා තැන දැනගන්න ලැබුණොත් ඉතිරි ටික පහසුයි.''

කිකී පෙට්ටිය ඇතුළට වී සිටීමට කැමති වූයේ නැත. ජැක් ගේ කනට මොන මොනවාදෝ කෙඳිරූ උඟ අවසානයේ කිවිසුමක් හැරියේය. ජැක්ට එය ඇසුණේ විශාල ශබ්දයක් ලෙසිනි. මීයකු මෙන් නිහඬව ඔහු පමා වූයේ කිසිවකු එහි පැමිණ පෙට්ටිය ඇර ඇතුළට එබී බලනු ඇත කියාය. එහෙත් කිසිවකු පැමිණියේ නැත. කිකීගේ කිවිසුම යටපත් කරගෙන එන්ජින්වල හඬ යානය ඇතුළට ඇසෙමින් තිබිණි.

යානයේ ඉදිරිපසම අසුන්වල සිටි ළමයි එකිනෙකා සමඟ පහත් හඬින් කතා කළහ. එන්ජින්වල ශබ්දය නිසා ඔවුන්ගේ කතා බහ ද කල්ලියේ අයට නැසිණි.

''අපට ගුවන් තොටුපොළේදී ඇහුණේ කිකී කෑ ගහන සද්දෙ නේද?'' ලුසී ඈන් විමසුවාය. ''ඔව්... කිකීම තමයි. දොස්තර ළඟට යන්න කියලා කිකී කියනවා මට හොඳටම ඇහුණා''

''ඒ කිකී කියලා මාත් විශ්වාස කරනවා'' පිලිප් පැවසුවේය. ''ජැක් කොහොම හරි ඒ කාරෙකට නැඟ ගන්න ඇති කියලාත් මං හිතනවා. මොනවා වුණත් ජැක් ගල් වළේ හිටියා කියලා අපි හොඳටම දන්නවා. වෙච්ච හැම දෙයක්ම බලා ඉඳලා ජැක් කොහොම හරි කාරෙකට නැඟගන්න ඇති''

''අනේ මම හිතන්නේ දැනුත් ජැක් අපි එක්කමයි කියලායි'' ලුසී ඈන් සුසුමක් හෙළුවාය. ''එයා නැතුව තනිවෙන්න මම කැමති නැහැ. කොහාටද අපිව මේ ගෙනියන්නේ? පරණ මාලිගාවකට ද? ගුසී ඔයාට මාලිගාවක් තියෙනවාද?''

''ඔව්'' ගුසී පිළිතුරු දුන්නේය. ''ඒත් ඒක පුංචි එකක්. මං හිතන්නේ අපි මේ යන්නේ එහාට නෙවෙයි. එහේ ජනතාව මාව අඳුනනවා. ඔවුන් මාව දකීවි. දැන්ම මිනිස්සුන්ට පෙනෙන්න මාව ගෙනියන්න මුන් කැමති නැති විත්තිය මුන්ගේ කතා වලින් මට තේරුණා. උන් හදන්නේ ඉස්සෙල්ලා මගේ බාප්පා එක්ක කේවල් කරන්න. උන් බාප්පාව මරණ එකක් නැහැ කියලා මම හිතනවා. මගේ බාප්පා හුඟාක් හොඳ කෙනෙක්''

''ඇයි ඔයාගේ තාත්තා රටේ රජතුමා නොවුණේ?'' ඩීනා විමසුවාය. ''ඔයා කොහොමද කිරුළ හිමි කුමාරයා වුණේ?''



''මගේ තාත්තා මිය ගිහිං'' ගුසී පැවසුවේය. ''මට ඉන්නේ අම්මා විතරයි. ඒත් අපේ රටේ කාන්තාවන්ට කිරුළ දරන්න ඉඩක් නැහැ. තාත්තාට පස්සේ බාප්පා. බාප්පාට පස්සෙ මට යම් දවසක රජකම හිමි වේවි. ඒකට මම කැමතියි''

''හ්ම්... ඔයා අනෙක් අයට අණ දෙන්න දැන්ම ඉඳන්ම කැමතියිනේ'' ඇනුම් පදයක ස්වරයෙන් ඩීනා පැවසුවාය. ''ඒ වුණාට ඔයා මගේ අදහස්වලට ගැළපෙන රජ කෙනෙක් නෙවෙයි... අපොයි මොනවද අපට මේ වුණේ....? අපේ පාස්කු නිවාඩුව ඉවරෙටම ඉවරයි''

''ඒක ඇත්ත'' ලුසී ඈන් ශෝකයෙන් යුතුව පැවසුවේය. ''මට සීතලයි. ඒ වගේම දැන් මට නිදිමතයි''

''දැන් රෑ මැදියමත් පහුවෙලා'' ඩීනා කීවාය. ''නිදිමත නොදැනී තියේවියැ. මටත් නිදිමතයි. එහෙනං නිදා ගනිමු''

''ඇලී නැන්දා ගැනයි බිල් ගැනයි මතක් නොවෙනවා නම් මට ඉක්මනටම නින්ද යාවි'' ලුසී ඈන් දෑස් පියා ගනිමින් පැවසුවාය. ''ඒ දෙන්නට මොනවාද වුණේ? ඒ දෙන්නා.....''

නින්දට වැටුණු ලුසී ඈන් දෙස බලා පිලිප් සිනාසුණේය. බිල් හා කනිංහැම් මහත්මිය ගැන කල්පනා කරමින්ම ඇය නින්දට වැටිණි.

පෙට්ටිය ඇතුළත සුවපහසු නොවූවත් එහි වූ සේද රෙදි මැදට වී ජැක් ද නින්දට වැටී සිටියේය. තම හිස පියාපතක් අතර රඳවාගෙන කිකී ද නිදා ගත්තේය. රාත්‍රිය පුරා වර්ෂා සහිත කාලගුණයක් මධ්‍යයේ ගුවන් යානය පියාසර කළේය. ඉන්පසු යානය හොඳ කාලගුණයක් සහ පැහැදිලි අහසක් සහිත ප්‍රදේශයකට පිවිසිණි. අහසේ තව දුරටත් හොඳින් හඳ පායා තිබිණි.

සඳ එළියෙන් දිලිසෙන සාගරය මතින් යානය පියාසර කරනු දකින්නට කිසිම ළමයෙකු අවදිව සිටියේ නැත. ඉතා කුඩා ගම්මාන මෙන් පහළින් දිස් වූ නගර දැක ගන්නට ද ඔවුන් අවදිව සිටියේ නැත. යානය එක දිගට සැතපුම් සිය ගණනක් පියාසර කළේය.

අවසානයේ යානය කුඩා ගුවන් තොටුපොළක් ඉහළින් අහසේ රවුමට පියාසර කරන්නට විය. ගමන නිමවෙමින් තිබේ. පිලිප් තිත්දෙන් අවදි විය. ඔහු ගැහැනු ළමයින් දෙදෙනාගේ සිරුරු සොලවා ඔවුන් ද අවදි කරවීය. අවදි වූ ගුස් කවුළුවකින් පහත බැලුවේය.

''ටෞරි-හේසියා'' ඔහු ආඩම්බරයෙන් පැවසුවේය. ''මගේ රට ටෞරි-හේසියා''

# 14. ජැක් තනිවෙයි

ක්ෂිතිජයෙන් මඳක් ඉහළට හිරු නැගී තිබියදී ගුවන් යානය සෙමෙන් ධාවන පථයට පහත් විය. අහස රන් පැහැයෙන් දිලිසුණු අතර දුර ඈත සුදු හුණු පිරියම් කළ කුඩා නිවස ඉතා පැහැදිලිව දැකගත හැකි විය.

එන්ජින් නතර වෙද්දී ජැක් අවදි වූයේය. ඔහු සෙමෙන් පෙට්ටියේ පියන මඳක් ඉහළට ඔසවා හොඳින් සවන්දුන්නේය. ගමන නිමා වී තිබේද? ඒ සමගම ඔහුට ඇසුණේ ගුසීගේ කෑ ගැසීමය. ''ටෞරි-හේසියා''

''එහෙම නං අපි මෙහාට ඇවිත්'' ජැක් සිතුවේය. ''දැන් ඊළඟට මම මොකද කරන්නේ? මේ අලුත් දවසක්. මට පෙනෙන්නේ උදෑසන හිරු එළිය''

යානයේ ඉදිරිපස සිටි ළමයින් සිව්දෙනා බිමට බස්සවා ගැනිණි. ගුවන් තොටුපොළේ කාර්මිකයන් කිහිප දෙනකු හැරෙන්නට වෙනත් කිසිවකු සිටියේ නැත. මඳක් එපිටින් විශාල මෝටර් රථයක් නතර කර තිබෙන ආකාරය පෙනිණි. ළමයින් සිවුදෙන නංවා ගැනුණේ එම රථයටය. ඔවුන්ගේ සූදානම කිසියම් රහස්‍ය ස්ථානයකට හැකි තරම් ඉක්මනින් ළමයින් අරගෙන යාම බව පැහැදිලිව පෙනිණි.

පෙට්ටියෙන් බිමට බැස ගත් ජැක් වහා ගියේ කවුළුවක් අසලටය. ළමයින් සිවුදෙනා රථයට නංවන ආකාරය ඔහු දුටුවේය. පිරිසේ නායකයා ලෙස කටයුතු කළ උපැස් යුවළ පැළඳ සිටි තැනැත්තා රථයට ගොඩනැගෙන අතරතුර රියැදුරාට යමක් පැවසුවේය. ඔහු නැගෙන තුරු දොර විවෘත කරගෙන සිටි රියැදුරා ඔහුට ආචාර කොට ඔහු පැවසූ වචනයම නැවත උච්චාරණය කළේය. 'බෝර්නෙත්'

දොර වසා දමා තම අසුනට නැගුණු රියැදුරා රථය පණ ගන්වාගෙන ගුවන් තොටුපොළ කෙළවර තිබූ විශාල ගේට්ටුව දෙසට රිය සෙමෙන් පැදවිය.

''බෝර්නෙත්'' ජැක් තමාටම කියා ගත්තේය. ''ඒක සමහර විට යම් ස්ථානයක නමක් වෙන්න පුළුවනි. එහෙම නැත්නං ස්තුතියි යන්නට ඇති හේසියානු වචනය වෙන්නත් පුළුවනි. හ්ම්.... ඒ අය ගියා. කිකී දැන් උඹයි මායි අපි නොදන්නා බාසාවක් කතා කරන නොදන්නා රටක තනිවෙලා. මගේ සාක්කුවේ තියෙන්නේ බ්‍රිතාන්‍යයේ පාවිච්චි කරන කාසි කිහිපයක් විතරයි. අපට කරන්න තියෙන හොඳම වැඩේ මොකක් කියලා ද කිකී උඹ හිතන්නේ?''

කිසිත් නොකියූ කිකී බුද්ධිමතකු සේ හිස සලමින් වටපිට බැලුවේය. ජැක් නැවතත් කවුළුවෙන් පිටත බැලුවේය. ගුවන් තොටුපොළේ සිටි සියලු දෙනා එහි කෙළවරක වූ ගොඩනැඟිල්ල ඇතුළට පිවිස ඇති බව ඔහුට පෙනිණි. සමහර විට ඔවුන් යන්නට ඇත්තේ උදෑසන ආහාර ගන්නටය. තමාටත් කන්නට බොන්නට මොනවා හෝ තිබුණේ නම් හොඳ යැයි ජැක් ට සිතිණි.

ඔහු ගුවන් යානයේ ඉදිරි කොටසට ගමන් කළේය. කිසිවකු එහි සිටියේ නැත. ගුවන් තොටුපොළේ ද එළිමහනේ කිසිවකු සිටියේ නැත.

''දැන් අපට මෙතැනින් පිටතට යන්න වෙලාව ඇවිත් කිකී'' ජැක් පැවසුවේය. ''දුවන්න ලැස්තිද? කාටවත් නොපෙනී අපට මෙතැනින් යන්න ලැබේවි කියලා හිතන්න අමාරුයි. කොහොම



වුණත් අපි මුලින් දුවලා ගියොත් අර ඈත ගොඩනැගිල්ලේ ඉන්න අය කොච්චර හයියෙන් දුවලා ආවත් අපිව අල්ලා ගන්න හම්බ වෙන්නේ නැහැ''

යානයෙන් පහළට බැසගත් ඔහු ගේට්ටුව දෙසට වේගයෙන් දිව ගියේය. මිනිත්තුවක් දෙකක් ගතවන තුරු කිසිවක් සිදුවූයේ නැත. ඉන්පසු ඈත තිබූ ගොඩනැගිල්ලේ දොර අසලට මිනිස්සු දෙදෙනෙක් ආහ. මහ හඬින් කෑ ගැසූ ඔවුහු ජැක් පසුපස ලුහු බඳින්නට පටන් ගත්හ. එහෙත් මුලින් දිවීම අරඹා තිබූ ජැක් සෑහෙන දුරක් දිව ගොස් සිටි නිසා දෙදෙනා ඉක්මනින්ම ලුහුබැඳීම නතර කළහ. ''ගුවන් යානයකට ළං වෙලා බලන්න ආසාවෙන් සිටිය කොල්ලෙක් වෙන්නැති'' දෙදෙනාගෙන් අයෙක් අනෙකාට කීවේය.

ගේට්ටුවෙන් පිට වූ ජැක් ගමන් කළේ පාළු පුළුල් මාවතක් දිගේ ඉදිරියටය. කිසිවකු පෙනෙන තෙක් මානයක නොසිටි අතර පෙනෙන තෙක් මානයක නිවසක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ද දක්නට නොලැබිණි. එය ඉතා පාළු ප්‍රදේශයක පිහිටි ගුවන් තොටුපොළකි. ජැක් මාවත දිගේ තවත් ඉදිරියට ගමන් කළ අතර කිකී ඔහුගේ උරහිස මත වසා සිටියේය. ජැක්ට කුසගින්නක් දැනිණි.

''ඇයි කවුරුවත්ම පාරේ නැත්තේ?'' ඔහු සිතුවේය. ''මේ පාරෙත් කාරෙකක් ආවොත් ඒක නවත්තාගෙන මට ඒකෙන් කොහාට හරි යා ගන්න පුළුවන් වේවි. ඇත්තටම ලුසි-ඈන්ලා මේ වෙනකොට කොහේ ඇද්ද? මටත් එයාලා එක්කම ඉන්න තිබුණා නං....''

හදිසියේම ඔහුට සිහිපත් වූයේ තවමත් හිමිදිරිය බවය. හිරු උදා වූවා පමණකි. තවමත් කිසිවකු මාවතට බැස නැතත් ඉක්මනින්ම කම්කරුවකු දෙදෙනකු මුණගැසෙන්නට ඉඩ ඇත. මඳ වේලාවකට පසු ඔහුට දැක ගන්නට ලැබුණේ පා පැදියක් පැදගෙන එන්නෙකි. ඔහු අත ඔසවා පා පැදිකරුවාට සන් කළේය. පාපැදියෙන් ආ තැනැත්තා සිය පාදයක් පොළොවට තබා නතර වූයේය.

''එග්ලිනූටා?'' ඔහු කීවේය. ජැක්ට ඒ කී දෙය වැටහුණේ නැත. කිකී දැකීමෙන් පාපැදිකරුවා විමතියට පත්ව සිටින බවක් දිස්විය.

''මම කතා කරන්නේ ඉංග්‍රීසි බස'' ජැක් සෙමෙන් හා පැහැදිලිව කතා කළේය. ''පොලිස් ස්ථානය කොහේද?''

''එග්ලිනුටා?'' ඒ මිනිසා නැවත පැවසුවේ වික්ෂිප්ත වූ බවක් පෙන්වමිනි. ''ඔටා? ඔටා?''

''පාර්ප්, පාර්ප්'' කිකී හදිසියේ පැවසුවේය. ''පාර්ප්, පාර්ප්'' ඒ හඬ සමාන වූයේ මෝටර් රථයක නලාවටය. ජැක් සිනාසුණේය.

''ඔයා හිතුවේ මේ මනුස්සයා කියන්නේ කාරෙකක නලාවක් ගැන කියලාද?'' ජැක් කිකීගෙන් විමසුවේය. ''නෑ.. එහෙම නෙවෙයි. එයා මොනවාද කියන්නේ කියලා දන්නෙ දෙවියෝ විතරයි. හේසියානු භාෂාවෙන් කැමවලට කියන වචනය දැනගන්න පුළුවනි නං දැනට මට ඒ ඇති''

''පොවිකෙපොටොප්ලිත්ක්?'' මිනිසා නැවතත් පැවසුවේය. ඔහු ගිරවා දෙසට ඇඟිල්ල දිගු කළේය. ''පොවිකෙපොටොප්ලිත්ක්? අයි! අයි!''

හදිසියේම ඔහු සාක්කුවෙන් සටහන් පොතක් ගෙන එහි පිටුවක පැන්සලකින් යමක් අඳින්නට පටන් ගත්තේය. ජැක් සිතුවේ ඔහු කුමක් අඳින්නේ ද කියාය. පිටුව ඉරූ ඔහු එය ජැක් වෙත දිගු කළේය.

එම සිතුවම මාර්ග රැසක් සහිත සිතියමකට සමාන විය. එහි පොකුණක් වැනි යමක් හා දේවස්ථානයක් වැන්නක් ද සටහන් වී තිබිණි. එම සිතියම කෙළවර ඇඳී තිබුණේ කුඩාරමක් වැන්නකි. මිනිසා තමා අත වූ පැන්සලෙන් කුඩාරම වැනි සිතුවමට තට්ටු කළේය.

''පොවිකෙපොටොප්ලිත්ක්'' නැවත ඔහු උස් හඬින් කීවේ තමා පවසන දෙය ජැක්ට හොඳින් වටහා දෙන්නට මෙනි.

''ප්ලින්ක්-ප්ලොන්ක්, ප්ලින්ක්-ප්ලොන්ක්'' යැයි පැවසූ කිකී සිනාසෙන්නට පටන් ගත්තේය. මිනිසා ඌ දෙස බැලුවේ මහත් ගෞරවයෙන් යුතුවය. තම බෑගයට අත දැමූ ඔහු ජීනි තැවරූ



කේක් කැබැල්ලක් අතට ගෙන දිගුකළේ කිකී වෙතය. කිකී එය තම දකුණු පාදයෙන් අල්ලාගෙන කිකිළියක මෙන් කෙකර ගෑවේය.

ජැක් කුසගින්න හඟවන දෑසින් එම කේක් කැබැල්ල දෙස බලද්දී පා පැදිකරුවා එම බැල්ම හඳුනාගත්තේය. නැවතත් තම බෑගයට අත දැමූ ඔහු රතු පැහැති මස් වර්ගයක් සහිත ගන සැන්ඩ්විච්චයක් ජැක් අත තැබුවේය. ජැක් ගේ සිත්හි ඇතිවූයේ සතුටකි.

''ස්තුතියි'' ජැක් පැවසීය. ''බොහොම ස්තුතියි''

''වීපලික්ල්'' ජැක් පැවසූ දෙය ගැන අනවබෝධයෙන් මෙන් පැවසූ මිනිසා පා පැදියට නැඟී අත වනමින් පිටව ගියේය. විශාල සැන්ඩ්විච්චය රස විඳිමින් ජැක් ඉදිරියට ගියේය. කිකී තම ගිරා දිවෙන් කේක් කැබැල්ල ලෙව කෑවේය. ඒ රසට නොකැමතිව ඌ එය ජැක්ට දුන්නේය. කිකී සූරියකාන්ත ඇට ගිල දැමීමට රුචි බව දන්නා ජැක් නිතර තම සාක්කුවේ බහා ගෙන සිටි සූරියකාන්ත ඇට කිහිපයක් ඔහු ඌට දුන්නේය. ඌ ජැක්ගේ උරහිස මත සිට සතුටින් ඒවා සැපුවේය.

ජැක් සිතියම දෙස බැලුවේය. එහි අරුත කුමක්ද? ඒ මිනිසා මේ සිතියම ඇන්දේ කුමකටද? එම සිතියමේ ඇතුළත් විශේෂ ස්ථානයකට ජැක් යා යුතුව ඇතැයි එම පුද්ගලයා සිතුවේද? ටෞරි-හේසියාවේ එම ස්ථානය ගැන නොදන්නා ජැක්ට එතැන සොයා ගන්නට පහසු වන පරිද්දෙන් ඔහු එම සිතියම ඇඳ දුන්නා විය හැක. සමහර විට අනෙක් ළමයින් ගෙන ගියේ ද එතැනටම වන්නට ද පුළුවන. එතැන හැඳින්වෙන්නේ බෝර්කෙන් යන නමින් වන්නට ද පුළුවන. තමන්ට නොවැටහෙන මේ හේසියා භෝ නොවන්නට ද පුළුවන. තමන්ට නොවැටහෙන මේ හේසියා බසෙහි බෝර්කෙන් යන වචනයට කිසියම් නිශ්චිත අරුතක් තිබිය හැකි යැයි ජැක් සිතුවේය.

සැන්ඩ්විච්චයෙන් කුස පුරවා ගත් ජැක් නව දිරියක් සහිතව සැතපුම් කිහිපයක් ඉදිරියට ගමන් කළේය. එම පාළු පළල් මාර්ගය කෙළවර දී තමාට පොලිස් ස්ථානයක් හමුවනු ඇතැයි ඔහු සිතුවේය.

එම මාවත ගුවන් තොටුපොළට යාමට ඒමට පමණක් තැනී ඇති මාර්ගයක් සේ පෙනිණි. පාපැදිකරුවා මිස අන් කිසිවකු ජැක්ට අතරමගදී හමුවූයේ නැත.

අවසානයේ නිවාස කිහිපයක් ඈතක ඇති අයුරු ඔහුට පෙනිණි. තමා මේ ළඟාවන්නේ ගම්මානයකට විය හැකි යැයි ජැක්ට සිතිණි. නගරයක් වෙත ද විය හැකි යැයි ඔහුට සිතුණේ ළං වන්නට ළං වන්නට එය ගම්මානයකට වඩා විශාල ස්ථානයක් බව පෙනුණු හෙයිනි.

''එහේදිවත් මට ඉංග්‍රීසි කතා කරන කවුරුහරි හොයාගන්න ලැබුණොත් වාසනාවක්'' ජැක් සිතුවේය. ''පොලිස් ස්ථානය හොයාගෙන ගිහිං බිල්ට විදුලි පණිවිඩයක් හෝ කේබල් පණිවිඩයක් යවන්න ඕනෙ. මම හිතන්නේ බිල් මෙහාට ඇවිත් අපට උපකාර කරාවි. එයාට මොනවා වුණාද මන්දා. මං හිතන්නේ අර කල්ලිය මුලින්ම බිල්ට පහරදීලා පැත්තකට කර තියන්න ඇති''

නගරයට පිවිසි ඔහු මහත් උද්යෝගයෙන් යුතුව වටපිට බැලුවේය. එහි වූ සාප්පු කුඩා හා අඳුරු ඒවා වූ අතර නිවාස සුදු පැහැයෙන් හෝ රෝස පැහැයෙන් පිරියම් කර තිබිණි. එහි ගැවසුණු මිනිසුන් ගොවියන් සේ දිස් වූ අතර ඔවුහු ඉතා සරල පැහැපත් ඇඳුම්වලින් සැරසී සිටියහ. කිසිම කාන්තාවක හිස් වැසුම් පැළඳ නොසිටි අතර වැඩි දෙනා සාලු උරහිස දවටාගෙන සිටියහ. පිරිමි සිරුරට තද වූ කලිසම් ඇඳ සිටි අතර ඔවුහු ඉණ වටා කිසියම් බාපනයක් පැළඳ සිටියහ. ඔවුන් ඇඳ සිටි වේස්ට් කෝට් අලංකාර ලෙස ගෙත්තම් කර තිබිණි. මේ ඇඳුම් ජැක් ගේ සිහියට නැංවූයේ ගොන් පොරවලට සහභාගි වන්නන්ය.

සරල ලෙස හැඳ සිටි දරුවෝ සිහින් සිරුරු ඇත්තෝ වූහ. කුඩා ගැහැනු ළමයින් දිගු සායවලින් සැරසී සිටි අතර පිරිමි ළමයි තම පියවරුන් මෙන්ම සිරුරට තද වූ කලිසම්වලින් සැරසී සිටියහ. ඔවුන්ගේ වේස්ට් කෝට් ගෙත්තම් කර නොතිබිණි. ඒ හැර ඔවුහු තද රතු, නිල් හෝ කහ පැහැ කමිස ඇඳ සිටියහ. ජැක් දුටු වහා ඔවුහු ජැක් වෙත දිව ආහ. ඔහුගේ උර මත සිටි ගිරවා වෙත ඔවුන්ගේ දැඩි අවධානය යොමු වී ඇති බවක් පෙනිණි.



''පෝවික්.... පෝවික්'' කිකී දෙස අත දිගු කරමින් ඔවුහු කෑ ගැසූහ. කිකී හිස බිමට නැඹුරු කරගෙන ඒ මේ අතට වැනෙමින් කිසියම් නර්තනයක නියැලුණේය.

''පෝවික්........ ඒ වචනයේ තේරුම ගිරවා කියන එක වෙන්නැති'' ජැක් සිතුවේය. ''හේයි... පොලිසිය කොහේද කියලා මට කියනවාද?''

ඔවුනට ජැක් කී එක වචනයක් හෝ නොවැටහුණු බව පැහැදිලිව පෙනිණි. ඔවුහු එකිනෙකා හා කතාබස් කරමින් කිකී දෙස ආසාවෙන් බලමින් ජැක් පසුපස ආහ. හදිසියේ සෙල්ලම් තුවක්කුවක් අතැතිව කුඩා පිරිමි ළමයෙක් ජැක් ඉදිරියට දිව ආවේය. ඔහු තුවක්කුව ජැක් වෙත යොමු කොට හඬ නැගුවේය. ''පොප්... පොප්... පොප්... පොප්''

ඒ හඬ කිකීට හොඳටම සෑහිණි. හිස එස වූ ඌ උස් හඬින් කෑ ගැසුවේය. ''පෝ... පොප්... බැන්ග්... බැන්ග්... පොවික්... පොවික්...''

ළමයි නිහඬව විමතියෙන් මෙන් කිකී හා ජැක් දෙස බලා සිටියහ. හදිසියේම කිකී ඌට හොඳින් පුරුදු සිනහවක් නැගුවේය. ළමයි සියලුදෙනා ඒ සමඟ සිනා නැඟූහ.

''කකුල් පිහගන්න. නාසය පිරිසිදු කරගන්න'' යනුවෙන් කෑ ගැසූ කිකී ඊළඟට බිම් ගෙයක් මැදින් ධාවනය වන දුම්රියක හඬ නැගුවේය.

ඒ හඬ අසා ළමයින් විමතියට පත් වූ බවක් පෙනිණි. ඔවුහු එක අඩියක් පසුපසට තබා කිකී දෙස බලා සිට නැවත ''පොවික්... පොවික්..'' යනුවෙන් හඬනඟන්නට වූහ. ක්‍රමයෙන් ඔහු පසුපස එන පිරිස වැඩි වෙද්දී ජැක්ට සිතුණේ තමා හාමෙලින්හි පයිඩ් පයිපර් හෙවත් හාමෙලින් හි නළාකාරයා හා සමාන තත්ත්වයකට පත්ව ඇති බවකි.

හදිසියේම නිලධාරියකුගේ පෙනුමක් ඇති පුද්ගලයකු අතුරු පාරකින් ජැක් ඉදිරියට පැමිණ ජැක්ට නවතින්නට සන් කොට උස් ස්වරයෙන් යමක් පැවසුවේය. ඔහු පසුපස ආ පිරිස ඔහු හා එම පුද්ගලයා වටා රොක් වූහ. එම පුද්ගලයා පිරිස වෙත අත දිගුකරමින් ජැක්ගෙන් මොන මොනවාදෝ විමසූ මුත් ජැක්ට එක වචනයක් හෝ වැටහුණේ නැත.

''මම ඉංග්‍රිසි ජාතිකයෙක්'' ජැක් පැවසුවේය. ''ඉංග්‍රිසි. ඔබට ඉංග්‍රිසි කතා කරන්න පුළුවනිද? බැරිද?''

''හා... ඉන්ග්ලිර්ර්ර්ෂ්'' එම පුද්ගලයා පැවසුවේය. ඉන්පසු සාක්කුවට අත දමා කළු පැහැ කුඩා සටහන් පොතක් අතට ගෙන එය ජැක්ට පෙන්වූයේ තමා කවුරුන්දැයි අඟවන්නටය. එම පුද්ගලයා ටොරි-හේසියාවේ පොලිස් නිලධාරියෙකි.

''ඔබ ඉංග්‍රිසි බස කතා කරනවාද?'' ජැක් බලාපොරොත්තු සහගතව විමසුවේය. කුඩා සටහන් පොත ඔහුගේ එක අතක තිබිණි. ඔහු පවසන්නේ කුමක්ද යන්න ජැක්ට වැටහුණේ නැත. ජැක් හිස දෙපසට වැනුවේය. පොලිස් නිලධාරියා කෝපයට පත් වූ බවක් පෙනිණි. ඔහු තම අත වූ සටහන් පොතෙන් අනෙක් අතට ගසාගෙන උස් හඬින් කෑ ගැසුවේය.

ජැක් නැවත වතාවක් හිස දෙපසට වනද්දී කිකී ද එසේම හිස වනා සිය හඬ අවදි කළේය. ''නාහෙ පිරිසිදු කර ගන්න. කකුල් පිහදාගන්න''

ළමයි සිනාසුණාහ. ඒ වන විට වැඩිහිටියන් කිහිප දෙනෙකු ද එතැනට රැස්ව සිටි අතර අයෙක් තම සාක්කුවෙන් හැඳුනුම් පතක් වැනි යමක් ගෙන ජැක්ට පෙන්වීය. පොලිස් නිලධාරියා තමාගෙන් විමසන්නේ කුමක් ද යන්න ජැක්ට වැටහිණි. ඔහු නැවත වතාවක් හිස දෙපසට වැනුවේ තමා අත විදෙස් ගමන් බලපත්‍රයක් හෝ හැඳුනුම්පතක් නොමැති නිසාවෙනි.

හේසියන් බසින් සැර පරුෂ ලෙස මොනවාදෝ පැවසූ නිලධාරියා ජැක් ගේ උරහිසින් තල්ලු කර ගෙන ඉදිරියට ගමන් කළේය.



''දැන් කොහේද අපි යන්නේ?'' ජැක් සිතුවේය. ''වෛවර්ණ නිල ඇඳුමක්. නිල් පාට කලිසම. රතුපාට කමිසය. නිල් පාට බාපනය, මල් පෝච්චියක් වගේ උස හෙල්මට් එක....ෂාහ්''

නිලධාරියා ජැක් කැඳවාගෙන ගියේ පොලිස් ස්ථානයටය. එය කුඩා සුදු හුණු පිරියම් කළ හතරැස් ගොඩනැගිල්ලක් විය. එහි තවත් රළු පෙනුමැති නිලධාරීහු සිටියහ.

''මේ බලන්න. ඔබට බෑ මාව කූඩුවට දාන්න'' ජැක් කෑ ගැසුවේය. ''මං වරදක් කරලා නැහැ. මට යන්න දෙන්න''

# 15. සිතියමෙන් ප්‍රයෝජන

පොලිස් ස්ථානයේ වූ එක් හතරැස් කුඩා කාමරයකට ජැක් තල්ලු කෙරිණි. එහි බිත්තියක් ආසන්නයේ තිබුණේ දිග බංකුවකි. ඒ මත හිඳගන්නා ලෙස ජැක්ට සන් කෙරිණි. පොලිස් නිලධාරියා විශාල අවුල් වූ මේසයක් වෙත ගොස් සිද්ධිය වාර්තා කළේය. මහත් වේගයෙන් ඔහු කතා කළ අතර ඒ එක වචනයක් හෝ ජැක්ට වැටහුණේ නැත.

කිකිට ද ඒ වචන කිසිවක් නොවැටහුණු අතර ජැක් ගේ උරහිස මත හිඳගෙන ඌ ද නොවැටහෙන, අරුත් රහිත ශබ්ද මාලාවක් නැගුවේය. එහි සිටි සෑම පොලිස් නිලධාරියකුම ඌ දෙස බැලුවේ මහත් ගෞරවයකින් මෙනි.

ජැක් හා දොර අතර දුරෙහි කිසිවකුත් සිටියේ නැත. එදෙස බැලූ ජැක් සිතුවේ තමාට නිදහස ලබා ගන්නට මාර්ගය විවෘත වී ඇත කියාය. එතැනින් පලා ගොස් මේ අදක්ෂ පොලිස් නිලධාරියාගෙන් ගැලවෙන්නට ඔහු සිතුවේය. තමා සති කිහිපයක් තිස්සේ පොලිස් කුඩුවක රඳවා තබාගනු ඇත යන බිය ඔහුගේ සිතේ ඇති වී තිබිණි. සමහරවිට ඔවුන් ජැක් යාචකයෙකු හෝ ඉබාගාතේ ඇවිද යන්නකු හෝ යයි සිතනවා විය හැක. සමහර විට හැඳුනුම්පතක් හෝ විදෙස් ගමන් බලපත්‍රයක් රහිතව ඇවිදීම මේ රටේ ඉතා බරපතළ වරදක් වන්නට ද ඉඩ ඇත.



ඔහු තමාට ලැබී ඇති අවස්ථාව දුටුවේය. කිසිවකු ඔහු ගැන අවධානය යොමු කර නැත. දොර වෙත ගිය ඔහු පඩි කිහිපය බැස පොලිස් නිලධාරියා ඔහු දකින්නට පෙර මාවතට පිවිසියේය. දිව යන්නට පටන් ගත් ඔහුට පසුපසින් කෑ ගැසීම් කිහිපයක්ම ඇසුණත් ඔහු හැරී බැලුවේ නැත. දූවිලි පිරුණු වීදිය දිගේ ඔහු තමාට හැකි උපරිම වේගයෙන් දිව ගොස් වංගුවකින් හැරී දෙපස නිවාස සහිත පටු මාවතකට පිවිස එක් විශාල දොරක් ඉදිරිපිට නතර වූයේය.

නිවසට ඇතුළු වූ ඔහු වටපිට බැලුවේය. කිසිවකුත් පෙනෙන්නට සිටියේ නැත. පක්ෂියකු නැගූ ක්වැක් හඬට ඔහුගේ ද කිකීගේ ද අවධානය යොමු විය. ජැක් දුටුවේ කුඩුවක සිටින නිල්, කොළ හා කහ පැහැති පිහාටු සහිත ගිරවෙකි. කිකී වහා කුඩුව වෙත පියඹා ගොස් එහි මුදුනේ වැසුවේය. හිස පහළට නමා ඌ එහි සිටි ගිරවා දෙස මහත් කුතුහලයෙන් යුතුව බැලුවේය.

''සැප සනීප කොහොමද? සැප සනීප කොහොමද?'' කිකී කියෙව්වේය. ''සුබ උදෑසනක්. සුබ රාත්‍රියක්''

කුඩුව ඇතුළත සිටි ගිරවා බියට පත්වූවා සේ නැවතත් ක්වැක් හඬ නැගුවේය. ඒ සමඟම ජැක්ට පියවර හඬක් ඇසිණි. ඔහු හැරෙන්නටත් පෙර ඔහුට ඇසුණේ මෘදු කාරුණික කටහඬකි. වයස අවුරුදු දොළහක පමණ දැරිවියක දොරකඩ සිටගෙන සිටියාය. සුන්දර දැරියක වූ ඇය වර්ණවත් සේද රෙද්දකින් මැසූ ගවුමකින් සැරසී සිටි අතර ඇගේ දිගු කළු පැහැ හිසකේ ගොතා රිබන් පටිවලින් බැඳ තිබිණි. ඇය ජැක් දෙස විමතියෙන් යුතුව බලා සිටියාය.

''ඉග්ලිනූටා?'' දැරිය පැවසුවාය ''ඔටා?''

'ඔටා' යන වචනයේ අර්ථය තමා දන සිටියේ නම් මැනවැයි ජැක් සිතුවේය. තමා පැවසිය යුත්තේ මොනවාදැයි ඔහුට සිතා ගත නොහැකි විය. ඔහු ගිරවා දෙස අත දිගු කොට සිනාසුණේය. ''පොව්ක්... පොව්ක්'' ඔහු කීවේය. ගිරවුන් දෙදෙනා දෙස බලා දැරිය ද සිනාසුණාය.

ඉන්පසු ජැක් සතුටට පත් කරවමින් ඇය අසීරුවෙන් ඉංග්‍රීසි වචන දෙක තුනක් ගලපා පැවසුවාය. "යන්නේ.... ඔයා..... කොහේද? ඔයා.... ඉංග්‍රීසි... ඔව්?"

පාපැදිකරුවා තමාට ඇඳ දුන් සිතියම අතට ගත් ජැක් එය ඇයට පෙන්වූයේ එම සිතියමේ සඳහන් ස්ථානයකට තමාට යාමට අවශ්‍යව ඇතුවා සේය. සිතියම පිරික්සූ ඇය සිය හිස ඉහළ පහළ සැලුවාය.

"එන්න" කී ඇය දොර වෙත ඔහු කැඳවාගෙන ගියාය.

"මේ අහන්න.... ඔයා දන්න කවුරු හරි ඉන්නවාද ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්?" ජැක් මහත් වුවමනාවෙන් විමසුවේය. ඇයට එය නොවැටහිණි. එහෙයින් ඔහු කිහිප වතාවක්ම ඇයගෙන් එම ප්‍රශ්නයම විමසුවේය. ඒ සමගම නිවස ඇතුළතින් කිසියම් කටහඬක් ඇසිණි. වහා ඔහු පටු මාවතට කල්ලු කළ ඇය පටු මාවතේ කෙළවරටත් ඉන්පසු දකුණු පසටත් අත දිගු කළාය. ඔහු මාවතේ කෙළවරට ගොස් දකුණු පසට හැරුණේය. එය ද දූවිලි පිරුණු පටු මාවතක් වූ අතර එහි දෙපසම උස තාප්ප තිබිණි.

එම මාවත කෙළවර නතර වූ ඔහු තමා අත වූ සිතියම පිරික්සුවේ තමා මෙතෙක් එය අනුගමනය කරමින් පැමිණියා සේ ය. පා පැදිකරුවා සිතියම ඇඳ දෙන්නට ඇත්තේ කිසියම් හේතුවක් නිසාවෙනි. සිතියම අනුගමනය කරමින් ගමන් කිරීමෙන් තමාට ප්‍රයෝජනවත් තැනකට යා ගත හැකි වෙතැයි ජැක් සිතුවේය.

ඔහු ඉදිරියේ තිබුණේ කොළ පැහැති තණ පිට්ටනියකි. එහි පසෙක පොකුණක් තිබූ අතර ඒ වටා ළමයි කෙළිසෙල්ලමේ යෙදෙමින් සිටියහ. ඔහු නැවතත් සිතියම දෙස බැලුවේය.

"ආන්.... පොකුණ.. මේ තියෙන්නේ. එහෙම නම් මම යන්නේ හරි පාරේ.. යමු තව ඉස්සරහට. බලමු මේ ඇඳලා තියෙන පල්ලිය හොයාගන්න"

ඔහු සැහෙන දුරක් ඇවිද ආ නමුත් දේවස්ථානයක් සමාන හා ගොඩනැගිල්ලක් නම් ඔහුගේ ඇස ගැසුණේ නැත. අවසානයේ



කාරුණික පෙනුමැති මහලු කාන්තාවක අසල නතර වූ ඔහු ඇයට සිතියම දක්වා දේවස්ථානයකට සමානව ඇඳ ඇති තැනට ඇඟිල්ල තබා පෙන්වූයේය.

ඇය වහා හිස සලා ඔහුගේ අතක් අල්ලාගෙන ගොවි බිම හරහා ඈතට තම අනෙක් අත දිගු කළාය. ගොවිබිම මැදින් පාරක් තිබිණි. එය විහිදුණේ කන්දක් දෙසටය. කන්ද මුදුනේ දේවස්ථානයකට සමාන ගොඩනැගිල්ලක් තිබෙනු ජැක්ට පෙනිණි. ඒ ටෞරි හේසියාහි දේවස්ථානයක් වන්නට ඇතැයි ඔහු සිතු නමුත් එය බ්‍රිතාන්‍යයේ දේවස්ථානයකට නම් කිසිසේත් සමාන වූයේ නැත. ඔහු ගොවිබිම හරහා වූ මාවත දිගේ ගොස් කන්ද නැග දේවස්ථානයකට සමාන ස්ථානය ආසන්නයේ සිට නැවත සිතියම පිරික්සුවේය.

එතැන් සිට ඒ මේ අතට යොමුවෙමින් විහිදුණු මාවතක් කෙළවර කුඩාරමක් තිබෙන අයුරු සිතියමේ දක්විණි. ඔහු එම මාවත කන්දේ අනෙක් පසට විහිදී ඇති අයුරු දුටුවේය. එහෙත් එම මාවත කෙළවර කුඩාරමක් ඇඳ ඇත්තේ මන්ද?

අසල ඇති බංකුවක් මත මහලු මිනිසෙකු හිඳගෙන නිදි කිරන අන්දම ඔහුට පෙනිණි. ජැක් එම මහල්ලා අසල හිඳ ගත්තේය. ඇස් ඇර බැලූ මහල්ලා දුටුවේ ජැක් හා ඔහුගේ උර මත සිටින ගිරවාය.

"හ්ම්. හොඳා, මෙයා අවදියෙන්" සිතූ ජැක් සිතියම මහල්ලාට පෙන්වා කුඩාරම දක්වමින් තමාට එතැනට යාමට අවශ්‍ය බව ඇඟවීය.

"අහ්හ්හ්හ්හ්" මහල්ලා බැරෑඩි හඬකින් පැවසුවේය. "පිකාෂෝ... රුටිෆෙර්ග්. අහ්හ්හ්හ්"

"මෙලෝ දෙයක් තේරෙන්නේ නැහැ" ජැක් සිතුවේය. නැගී සිටි මහල්ලා කන්ද පහළට දිවෙන මාවත පෙන්වා ඊළඟට සැරයටිය දිගු කොට ඈත ස්ථානයක් දක්වීය. "සර්කිට්ලාර්" ඔහු කීවේය.

''ස්ර්කි''

''ස්ර්කි'' එම වචනයම තෙපළමින් ජැක් මහල්ලා සැරයටියෙන් දක් වූ දිසාවට නෙත් යොමු කළේය. පාපැදිකරුවා සිතියමේ කුඩාරමක් ඇන්දේ මන්දැයි ඔහුට වැටහිණි. එළිමහනක කුඩාරම් කිහිපයක් හා නවතා ඇති වැන් රථ කිහිපයක් ඔහුට පෙනිණි. එතැන වූයේ සර්කසයකි. සංචාරක සර්කසයකි.

''හ්ම්... ස්ර්කි... ඔහු අදහස් කළේ සර්කස් කියන එක'' ජැක් සිතුවේය. ''ඒක සර්කස් එකක්. ඒකයි බයිසිකලයෙන් ආ පුද්ගලයා මාව එතැනට යොමු කළේ. මා ළඟ ගිරවෙකුත් හිටි නිසා මම සර්කස් එකක රස්සාවක් හොයනවා වෙන්නැති කියා ඒ මනුස්සයා හිතන්න ඇති. හොඳයි... හොඳයි. සිතියමේ ප්‍රහේලිකාව විසඳුණා''

මහලු මිනිසාට ස්තුති කළ ජැක් සිතුවේ සර්කසය වෙත යන්නටය. එහි ඉංග්‍රිසි භාෂාව කතා කළ හැකි අයකු සිටින්නට පුළුවන. සර්කස් කණ්ඩායම්වල පුද්ගලයෝ විවිධ භාෂා දැන සිටිති. අනෙක් අතට ඔවුනු කාරුණික පුද්ගලයෝ ද වෙති. ඔවුන් වෙතින් ආහාර හා යම් උපකාරයක් ලබා ගත හැකි වෙතැයි ඔහු සිතුවේය.

ඒ සමගම ඔහුට යළි කුසගින්නක් දැනිණි. ඔහු ඒ මේ අතට හැරෙමින් ඉදිරියට විහිදුණු මාවත දිගේ සර්කසය වෙත ගමන් කළේය. අඩ පැයක පමණ කාලයකට පසු එතැනට ළඟා වූ ඔහු දුටුවේ ඔවුන් කුඩාරම් ආදිය ගලවා අසුරමින් වෙනත් ස්ථානයකට යාමට සැරසෙන අයුරුය. අශ්වයන් රථවලට නංවමින් හා බඩු මුට්ටු රථවලට පටවමින් සිටි පිරිස වෙතින් නැගුණේ මහත් ඝෝෂාවකි.

ජැක් ගේට්ටුව අසලට ගියේය. මහත් බරැති පෙට්ටි කිහිපයක් ඔසවාගෙන පිරිමි ළමයෙක් එතැනින් යන්නට ආවේය. ජැක් පසුකරගෙන යද්දී ඔහු අත වූ පෙට්ටියක් බිම වැටිණි. වහා ගේට්ටුවෙන් ඉදිරියට පිනූ ජැක් නැමී පෙට්ටිය අහුලා ළමයා අත තැබුවේය.

ඒ ළමයා ජැක්ගේ වයසේම පසුවන්නකු වූ අතර අඳුරු පැහැ සමක් හා කළු පැහැ ඇස් සහිත ඔහු ජැක් හා සිනාසුණේය. ඊළඟට ඔහු යමක් ජැක්ට පැවසූ නමුත් ඒ බස ද ජැක්ට වැටහුණේ



නැත. 'Merci beaucop' එවර එම පිරිමි ළමයා කතා කළේ ප්‍රංශ භාෂාවෙනි. ජැක්ට එම බස වැටහිණි.

'Ce n'est rien' ජැක් පිළිතුරු දුන්නේය. පිරිමි ළමයා කිකි දෙස ද බලා ප්‍රංශ බසින් විමසුවේ එහි පැමිණියේ රැකියාවක් බලාපොරොත්තුවෙන් ද කියාය.

ජැක්ට ප්‍රංශ බස කතා කිරීමේ හැකියාවක් නොතිබූ නමුත් දන්නා වචන එකතු කොට ඔහු කීවේ තමා පැමිණියේ රැකියාවක් බලාපොරොත්තුවෙන් හා ආහාරයක් බලාපොරොත්තුවෙන් බවය.

''එන්න මාත් එක්ක'' පිරිමි ළමයා ප්‍රංශ බසින් පැවසුවේය. ජැක් ඔහු පසුපස වැන් රථයක් වෙත ගමන් කළේය. එතැන කාන්තාවක් අර්තාපල් සුද්ද කරමින් සිටියාය.

''මා'' පිරිමි ළමයා එවර කතා කළේ ඉංග්‍රීසි භාෂාවෙනි. ''මේ බඩගිනි වුණු ළමයෙක්. එයාට මොනවා හරි කන්න දෙමුද?''

ජැක් විමතියෙන් ඔහු දෙස බැලුවේය. ඔහු ඉංග්‍රීසියෙන් කතා කරන්නේ ඇයි?

''හේයි'' ජැක් කීවේය. ''ඇයි ඔයා මුලින්ම ඉංග්‍රීසියෙන් කතා නොකළේ? මම ඉංග්‍රීසි ජාතිකයෙක්''

''මගේ තාත්තා ඉංග්‍රීසි ජාතිකයෙක්'' පිරිමි ළමයා සිනාසෙමින් පැවසුවේය. ''මගේ අම්මා ස්පාඤ්ඤ ජාතික කාන්තාවක්. අපි කතා කරන භාෂාව ගැන ඒ තරම් සැලකිලිමත් නැහැ. මා මෙයාට කන්න මොනවාහරි දෙන්නම්. මෙයාට රස්සාවක් දෙන්න අපට පුළුවන් වේවිද? කොහාටද ඔයාට යන්න අවශ්‍ය?''

''මෙහෙමයි.... මේ කොහේ හරි බෝර්කෙන් කියලා නගරයක් තියෙනවාද?'' ජැක් විමසුවේ බලාපොරොත්තු සහගතවය.

''බෝර්කෙන්! ඔව්. අපි එහේ යන්න තමා මේ සූදානම් වෙන්නේ'' පිරිමි ළමයා පැවසුවේය. ''ඒක ලොකු නගරයක්. ඊට පොඩ්ඩක් එහා කන්දක් මුදුනේ බෝර්කෙන් මාලිගාව තියෙනවා''

ජැක් ඒ සියලු කරුණු සිත තබා ගත්තේය. මාලිගයක්... අනෙක් ළමයින් රැගෙන යන්නට ඇත්තේ එතැනට ද? සියලු

අසීරුතා මධ්‍යයේ මේ උදා වී ඇත්තේ කිසියම් වාසනාවකි. කෙසේ හෝ සර්කස් කණ්ඩායමට ඇතුළුව එහි යා යුතු යැයි ජැක් ඉටා ගත්තේය.

'මා' ඔහුට ආහාර දුන්නාය. මහත් කුසගින්නෙන් පසු වූ ඔහු ඒ ආහාර සියල්ල ගිල දමුවේය. 'මා' යමක් ස්පාඤ්ඤ බසින් පිරිමි ළමයාට පැවසූ අතර ඔහු හිස ඉහළ පහළ වැනුවේය.

''ඔයාව ලොක්කා ළඟට එක්කරගෙන යන්නලු'' ඔහු පැවසුවේය.

''කවුරුහරි ඉන්නවාද ඔයා වෙනුවෙන් කතා කරන්න? එහෙම නැත්නං අඳුනන කවුරු හරි මෙහේ ඉන්නවාද? සැක හිතුණොත් ලොක්කා හිතාවි ඔයා ගෙදරින් පැනලා එන ළමයෙක් කියලා. එහෙම සැකකළොත් ඔයාව පොලිසියට බාර දේවි''

''නැහැ.... මෙහේ මම දන්නා අඳුනන කවුරුවත්ම නැහැ'' ජැක් ශෝකයෙන් මෙන් පැවසුවේය. ''මට කොහොම හරි බෝර්කෙන්වලට යා ගන්න ඕනේ. මගේ යාළුවෝ ඉන්නේ එහේ''

''ඕහ්.... එහෙම නං එහේදි ඒ යාළුවෝ ඔයා වෙනුවෙන් කතා කරාවිනෙ. මගේ නම පෙඩ්රෝ... ඔයා?''

''මම ජැක්''

පෙඩ්රෝ ගමන් කළේ විශාල තවලමක් අසලටය. ජැක් ඔහු පසුපස පියවර මැන්නේය. පෙඩ්රෝ එහි දොරට තට්ටු කළේය. ඇතුළතින් ගොරෝසු කට හඬක් ඇසිණි. ඔවුන් දොර විවෘත කරගෙන ඇතුළට පිවිසි අතර එහි විශාල පුටුවක තර මිනිසෙක් හිඳගෙන සිටියේය. තිල් පැහැති දෑසකට හා අළු පැහැ කැරළි ගැසුණු හිසකෙස්වලට හිමිකම් කියූ ඒ පුද්ගලයාගේ රැවුල ඔහුගේ ඉණ තෙක් දිගට වැවී තිබිණි. ඇත්තෙන්ම ඒ මිනිසා සතු වූයේ බිහිසුණු පෙනුමකි.

''ඔයා මං වෙනුවෙන් කතා කරන්න පෙඩ්රෝ'' ජැක් පැවසුවේය.



''ඔහු ඉංග්‍රීසි කතා නොකරනවා නම් ඔහු කියන එක වචනයක්වත් මට තේරෙන එකක් නැහැ''

''මම ඉංග්‍රීසි කතා කරනවා'' ඒ මිනිසා සිය ගොරෝසු හඬින් පැවසුවේය. ''ඉංග්‍රීසි ජාතික ළමයි හොඳ ළමයි. කොහේ ඉඳන්ද ආවේ?''

''හරියටම තැනක් කියන්න බැහැ'' ජැක් පිළිතුරු දුන්නේය. ''මේ රටට පය තැබූ වෙලාවේ ඉඳන් පහුවුණු කිසිම තැනක් ගැන මම හරියට දන්නේ නැහැ. ඒත් මම හිතාන ඉන්නේ බෝර්කෙන් වලට ගිහින් මගේ මිත්‍රයන් මුණගැහෙන්න''

එම තර මිනිසා තවත් ප්‍රශ්න කිහිපයක් පෙඩ්රෝට යොමු කළේය. පෙඩ්රෝ ජැක් වෙත හැරුණේය. ''ලොක්කා අහනවා ඔයා පොලිසිය එක්ක ගැටුම් ඇතිකරගෙන තියෙනවාද කියලා''

එය අමුතුම ආකාරයක ප්‍රශ්නයකි. ඔහු හේසියානු පොලිසිය හා ගැටුම් ඇතිකරගෙන තිබේද? නැත. ඒ පිළිබඳ ජැක්ට විශ්වාසය. ඔහු සිය හිස දෙපසට වැනුවේය.

''ලොක්කාට දැනගන්න අවශ්‍ය වෙලා තියෙනවා ඔබ මේ සර්කස් කණ්ඩායමට ප්‍රයෝජනවත්ද කියා'' පෙඩ්රෝ පැවසුවේය. ''ඔබ ළඟ කතා කරන ගිරවෙකුත් සිටින නිසා ඔබෙන් යම් ප්‍රයෝජනයක් ඇති කියා ද ඔහු හිතනවා. බෝර්කෙන් බලා යන අතරමඟ තැන තැන අපි නතර වූ විට ඔබට අවශ්‍ය නම් ගිරවාගේ දක්ෂකම් පෙන්වා අමතර මුදලක් උපයාගන්න ඔබට හැකි වේවි කියා ඔහු කියනවා. ගිරවා කතාකරවලා පෙන්වන්න කියාත් ලොක්කා කියනවා''

ජැක් කිකීගේ හිස පිරිමැද්දේය. ''කතා කරන්න කිකී'' ඔහු කීවේය.

ඊනැම මොහොතක කතා කරන්නට කිකී සූදානම්ව සිටියේය. හිස එසවූ ඌ උස් හඬින් ගායනා කරන්නට පටන් ගත්තේය. ''හම්ප්ටි ඩම්ප්ටි සැට් ඔන් අ වෝල්.... හම්ප්ටි ඩම්ප්ටි ෆෙල් ඩවුන් ද වෙල්. ඩිං ඩොං බෙල්.... පුසි ඉන් ද වෙල්. හා.... හා... හා... කකුල්

දෙක පිහින්න... දොර වහන්න... ඔයා නරක ළමයෙක්. පොප් පොප්... පොප්'' එතෙකින් නතර නොවූ කිකී කිවිසුමක් ඇර ඉක්කා ගසද්දී පෙඩ්රෝ මහ හඬින් සිනාසුණේය. සිනාසුණු කිකී ඊළඟට බිම ගෙයක් හරහා දුම්රියක් ගමන් කරන විට නැඟෙන හඬ අනුකරණය කරද්දී අහල පහළ සිටි පිරිස ද එතැනට දිව ආහ.

''හා... මෙයා හොඳයි. හුඟාක් හොඳයි'' තර මිනිසා කීවේය. ''ඔව්, ඔයාලාට අපේ කණ්ඩායමට එකතු වෙන්න පුළුවන්''

''ඔයාගේ ගිරවා හුඟාක් දක්ෂයි'' ආපසු වෑන් රියට ඇවිද එන අතර තුර පෙඩ්රෝ කීවේය. ''අම්මාගේ වෑන් එකට පිටිපස්සෙන් තියෙන පුංචි වෑන් එක මගේ. ඔයාට පුළුවනි මාත් එක්ක ඒකෙ නිදාගන්න''

ජැක්ට ඊට කැමැත්ත පළ කළේය. ඔහුට අවශ්‍ය වූයේ ඉක්මනින්ම බොර්කෙන් බලා යන්නටය. එහි ඇති මාලිගයේදී අනෙක් ළමයින් සොයා ගත හැකි වේද? හැකිවුවහොත් ඒ බව බිල්ට දන්වා ඔවුන් බේරා ගන්නට පුළුවන.

# 16. සර්කස් කණ්ඩායම සමග

ජැක් පෙඩ්රෝට බෙහෙවින් කැමති වූයේය. උපතින්ම සර්කස් කණ්ඩායමකට ගැළපෙන කොලුවකු වූ ඔහු සර්කස්කරුවන් ගේ සිරිත් විරිත් හා ක්‍රම හොඳින් දන සිටියේය. ටෞරි හේසියාවට ගේ කිකී සමඟ කරන්නේ මොනවාද යන්න ගැන හෝ තම වගතුග ගැන හෝ කතා කරන්නට ජැක් අකමැති බව වටහා ගත් පෙඩ්රෝ ඔහුගෙන් ඒ කිසිවක් පිළිබඳ ප්‍රශ්න කළේ නැත. ජැක් ඒ පිළිබඳ නිහඬවම ඔහුට ස්තුති කළේය.

පෙඩ්රෝට සත්‍ය තත්ත්වය පැවසීමේ හැකියාව ජැක්ට නොතිබිණි. පෙඩ්රෝට බොරු කීමේ කැමැත්තක් ද ජැක්ට නොතිබිණි. බොර්කෙන් වෙත යන විට පෙඩ්රෝ තමාට මීට වඩා සමීපව සිටියොත්, ඔහුගේ උපකාර ද අවශ්‍ය වුවහොත් සිදු වී ඇති සියල්ල කෙටියෙන් ඔහුට පවසන්නට ජැක් සිතා සිටියේය.

එදින සන්ධ්‍යාවේ සර්කස් කණ්ඩායම බොර්කෙන් බලා ගමන් ඇරඹුවේය. වෑන් හා ලොරි විශාල ගොවිබිම් මැදින් වැටී තිබුණු මාවත් හරහා ඉදිරියට ඇදිණි. මාවත රළු වූ අතර සෙමෙන් ගමන් කළ වාහන ඒ මේ අතට පැද්දිණි. කූඩුවල දමූ සතුන් රථවල සිටි අතර ජැක් මහත් උනන්දුවෙන් උන් දෙස බලා සිටියේය. රථයක් පෙරළුණහොත් කුමක් වේද? සතුන් කූඩුවලින් ඉවත්ව පැන යා ද? එක් වෑන් රියක වලසකු සිටි අතර තවත් රථයක විම්පන්සීහු දෙදෙනෙක් සිටියහ.

සර්කස් කණ්ඩායමේ සියලු දෙනාගේ අවධානය දිනාගත්තට කිකී සමත්ව සිටියේය. කණ්ඩායමේ සිටි බොහෝ දෙනාට කැඩිච්ච ඉංග්‍රීසි කතා කිරීමේ හැකියාව තිබිණි. කිකී පැවසූ බොහෝ දේ අසා ඔවුහු සතුටින් සිනාසුණහ. ඔවුහු ඌට විවිධ කෑම වර්ග ගෙනැවිත් දුන්හ. ටින් කළ අන්නාසිවලට කිකී කැමති වග වටහා ගත් ඔවුහු අතරමඟ වූ වෙළෙඳ සලකින් අන්නාසි ටින් මිලට ගෙන දුන්හ.

ජැක් පෙඩ්රෝගෙන් බොහෝ ප්‍රශ්න විමසුවේය. බෝර්කෙන් වෙත කෙතරම් දුරද? මාලිගය අයිති කා හටද? එයා ඉපැරණි මාලිගයක්ද? එහි සිටින අය පිටත සිට දකගත හැකිද?

පෙඩ්රෝ සිනාසුණේය. ''බෝර්කෙන් මාලිගාව විතරක් නෙවෙයි. මේ පළාතම අපි මේ පහුකරගෙන යන ගොවිබිම් පවා අයිති පැරිටෝලෙන් සිටුවරයාට. ඔහු ඉන්නෙත් ඒ මාලිගාවේ. පිටතින් මාලිගාවේ ඉන්නා අයව බලන්න බැහැ. අවසර නැතිව මාලිගාවට ඇතුළුවෙන්න හැදුවොත් දොරකින් ඇතුළු වෙන්න කලින් ඒ අයට සිද්ධ වෙන්නේ මාලිගාවේ පොළව යට තියෙන හිර ගෙයක ලගින්න''

''එයා බොහොම නපුරු දුෂ්ට සිටුවරයෙක් වගේ'' මූහුණ අඳුරු කරගෙන ජැක් පැවසුවේය. ඔහු එතරම් නපුරු අයෙකු නම්, තම සොයුරිය හා අනෙක් අය ගෙන ගියේ ද එතැනට නම් ඔවුන් හොඳින් කාලය ගෙවනු ඇතැයි සිතන්නට ජැක්ට අපහසු විය.

''ඔහු ශක්තිමත්. ඒ වගේම අධිෂ්ඨානශීලී පුද්ගලයෙක්'' පෙඩ්රෝ පැවසුවේය. ''ඔහුට එතරම් ගරු සැලකිලි නොදක්වන රජතුමාට ඔහු වෛර කරනවා. පුංචි අලොයිසියස් කුමාරයා රජ් වෙනවාට ඔහු කැමතියි. එතකොට තමන්ට අවශ්‍ය විදියට රට පාලනය කරන්න ඔහුට පුළුවන් වෙන්නේ ඔහු කියන ආකාරයට කටයුතු කරන්න පුංචි කුමාරයාට සිද්ධ වෙන නිසායි''

''මට තේරෙනවා'' ජැක් පැවසුවේ මහත් වේදනාවෙනි. පැරිටෝලෙන් සිටුවරයා වැන්නකු සමඟ ගැටීමෙන් ලැබිය හැකි ප්‍රතිඵල මොනවාද? ''රටේ අගමැතිවරයා ඒ සිටුවරයාද?'' හදිසියේ ජැක් විමසුවේ ගුසී පැවසූවක් සිහි වූ නිසාවෙනි.



''නැහැ. ඔහුගේ ඥාති සහෝදරයා. හාර්ටියස් සිටුවරයා තමයි අගමැති තනතුර දරන්නේ'' පෙඩ්රෝ කීවේය. ''ඒ දෙන්නාම රජතුමා එක්ක තරහයි. ඒත් හාර්ටියස් සිටුවරයා දුර්වලයෙක්. පැරිටෝලෙන් සිටුවරයා බලවත්. අගමැතිවරයා ඔහුගේ බිරියට යටත්. ඇය කියන විදිහටයි ඔහු වැඩ කරන්නේ. ඇය දක්ෂ කාන්තාවක්. ඇයව හඳුන්වන්නේ මැඩම් ටැටිඕසා කියායි''

ඒ විස්තරයට ජැක් මහත් ඕනෑකමින් ඇහුම්කන් දුන්නේය. සියල්ල පිළිබඳ පැහැදිලි අදහසක් ඇති කරගන්නට ජැක්ට එම විස්තර උපකාරී විය. මේ සියලු සිදුවීම්වලට තමාට මැදිවීමට සිදු වූයේ කොතරම් අනපේක්ෂිත ආකාරයෙන්ද? පුංචි කුමාරයා දැන හඳුනාගත් ආකාරය, ටෞරි හේසියාවට පැමිණ බෝර්කෙන් මාලිගය වෙත ගමන් කිරීම, පැරිටෝලෙන් සිටුවරයා ගැන තොරතුරු ලබා ගන්නට හැකිවීම ආදිය ප්‍රබන්ධයක ඇතුළත් සිදුවීම් පෙළක් මෙනි. එහෙත් ප්‍රබන්ධය සත්‍යයක් බවට පරිවර්තනය වෙමින් තිබේ.

''මේ විස්තර සේරම ඔයා දන්නෙ කොහොමද පෙඩ්රෝ?''

''ඔහ්.... ටෞරි-හේසියාවේ හැමෝම ඔය විස්තර දන්නවා'' පෙඩ්රෝ පැවසුවේය. ''මිනිස්සු බයෙන් ඉන්නේ සිවිල් යුද්ධයක් ඇති වේවි කියලායි. රජතුමා සිහසුනෙන් නෙරපා හැරලා පුංචි කුමාරයාව රජ කෙරෙව්වොත් රටේ මිනිස්සු දෙපැත්තට බෙදිලා ගැටුම් ඇති කරගනීවි. එහෙම වුණොත් අපි වගේ සර්කස්කාරයන් ඉක්මනින් රටෙන් පිටවෙලා යන්න ඕනෙ. ඒ නිසා අපි නිතරම රටේ තත්ත්වය ගැන හුඟාක් සෝදිසියෙන් ඉන්නවා''

ටෞරි-හේසියාවේ නවතම තතු දුන් තමා දන්නා බව ජැක් අවබෝධ කරගත්තේය. අලොයිසියස් කුමරා එංගලන්තයේදී පැහැරගෙන බෝර්කෙන් මාලිගයට කැඳවාගෙන විත් එහි සිරකරගෙන සිටින බව තවමත් ඒ රටේ ජනතාව නොදන්නා බව ද ජැක් වටහා ගත්තේය. එහෙත් ඊළඟට කුමක් සිදුවනු ඇත්ද? මෙම කුමන්ත්‍රණය තවත් දුර දිග ගොස් රජතුමා මරා දමා ඇත. නැතහොත් සිරභාරයට ගෙන ඇත යන්න ආරංචි වේවිද?

ජැක් තදින් කල්පනාවට වැටුණේය. ඔහු කොතරම් තදින් කල්පනාවට වැටී සිටියේ ද යත් 'මා' ඔහුට කෑමට පැමිණෙන්නැයි කී බව පවා ඇසුණේ නැත. තමා ද මේ කුමන්ත්‍රණයේ ප්‍රබල

චරිතයක් රඟපාන බව ජැක්ට හදිසියේ වැටහිණි. තමාට කෙසේ හෝ මාලිගයට යා ගත හැකි වුවහොත් මෙම කුමන්ත්‍රණය අවුල් කර දමන්නට පුළුවන.

''බර කල්පනාවක නේද?'' පෙඩ්රෝ ඔහුගේ සිරුරට තට්ටු කරමින් විමසුවේය. ''ජැක්.... ඔයාට මොකක් හරි ප්‍රශ්නයක්ද?''

හිස දෙපසට සෙලවූ ජැක් සිනාසුණේය. කිකී ජැක් වෙතින් ඉවත්ව 'මා' වෙත පියඹා ගොස් ඇය දෙන ආහාර ගිල දමමින් සිටියේය. ''පොලි පුට් ද කෙට්ල් ඔන්' හිස දෙපසට තාලයට වනමින් කිකී පැවසුවේය. 'බොනිටැගිලූටෝ'

'මා' සතුටින් අත්පොලසන් දුන්නාය. ඇය බෙහෙවින් කිකීට ආදරය කළ අතර ඌ වෙත අත දිගුකරමින් ඇය මෙසේ කීවාය. ''කිකී දූන් හේසියානු බස කතා කරනවා''

ජැක් විමතියට පත් විය. කිකී හේසියානු බස මෙතරම් ඉක්මනින් ඉගෙන ගත්තේ කෙසේද? ඌට ඇත්තෙන්ම හොඳ බුද්ධියක් තිබේද? මොකක් ද බොනිටැගිලූටෝ කියන එකේ තේරුම?'' ජැක් විමසුවේය.

''සුබ උදෑසනක් කියන එක'' පෙඩ්රෝ පිළිතුරු දුන්නේය.

විශාල ගම්මානයකට ළඟා වූ කණ්ඩායම දින දෙකක කාලයක් එහි නතර වන්නට කඳවුරු ඉදි කළෝය. ජැක් පෙඩ්රෝට හැකි සෑම සහායක්ම ලබා දුන්නේය.

කණ්ඩායමේ සියල්ලෝ ජැක්ට ප්‍රිය කළහ. ජැක් කඩිසරය. වැඩෙහි දක්ෂය. හොඳ ගතිගුණ සහිතය. ජැක් ද කණ්ඩායමේ බොහෝ දෙනාට ප්‍රිය කළේය. ඔවුහු කරුණාවන්ත හා පරිත්‍යාගශීලී, සතුටින් කාලය ගත කරන, ඉඳහිට වංක බව හා අලස බව ප්‍රකට කරන්නෝ වූහ. ඔවුහු තම පිරිසේම අයකු ලෙස ජැක්ට ද සැලකූහ.

සර්කස් කණ්ඩායමට ඇතුළත්ව සිටි සතුන් ගැන ද ජැක් උනන්දුවක් දැක්විය. ෆ්‍රෑන්ක් නමැත්තා බාරයේ සිටි වලසුන් තිදෙනා වෙත නිතරම මනා ප්‍රේක්ෂක අවධානයක් ලැබිණි. උන් තද දුඹුරු පැහැ විශාල සිරුරු ඇති, ස්වභාවයෙන්ම විකට ස්වරූපයක් පළ



කළ සතුන් වූහ. එකිනෙකා සමඟ නර්තනයේ යෙදුණු, රවුමට ගමන් කළ, බොක්සිං ක්‍රීඩාවේ නියැළුණු උන් තම පුහුණුකරු වූ ෆ්‍රෑන්ක් හට මහත් බියක් හා ගෞරවයක් දැක්වූහ.

''උන් ළඟට වැඩියෙ කිට්ටු වෙන්න එපා'' පෙඩ්රෝ ජැක්ට අනතුරු ඇඟවූයේය. ''උන් ගැන විශ්වාස කරන්න බැහැ. ෆෑන්ක්ට මිස වෙන අයට උන්ව පාලනය කරගන්න බැහැ. වලසුන්ට ඉක්මනට කේන්ති යනවා. උන්ගෙන් පරෙස්සම් වෙන්න ඕනෙ''

චිම්පන්සීහු දෙදෙන අත්වැල් බැඳගෙන උන්ගේ හිමිකාරිය වූ කුඩා සිරුරැති කාන්තාව මැඩම් ෆිෆි පසුපස ගමන් කළහ. ඇය ද චිම්පන්සියකුට වඩා උස් නොවූ අතර උන් ඇයට බෙහෙවින් ආදරය කළහ.

ජැක් උන්ට ප්‍රිය කළ නමුත් ඔහු ඉක්මනින්ම වටහාගත්තේ උන් අති දක්ෂ ගැටකපන්නන් බවය. ඔහුට නොදැනෙන්නට ඔහුගේ සාක්කුවලට අත දමා ඔහුගේ ලේන්සුව, සටහන් පොත හා පැන්සල ගන්නට උන් සමත්ව තිබිණි. මැඩම් ෆිෆි නැවත ඒවා ජැක්ට දුන්නේ සිනාසෙමිනි. ඇය ඉතා ඉක්මනින් වචන උච්චාරණය කළ නිසා ඇය කතා කරන්නේ ප්‍රංශ බස ද, ඉතාලි බස ද නැතිනම් ස්පාඤ්ඤ බස ද යන්න වටහා ගන්නට ජැක්ට අපහසු විය. තමා කී දෑ ජැක්ට නොවැටහුණු බව වටහා ගත් ඇය ඉංග්‍රීසි බසින් වචන දෙක තුනක් පැවසුවාය.

''නරක කොල්ලෝ දෙන්නෙක්'' කුඩා ඇඟිල්ලක් චිම්පන්සීන් වෙත දිගු කරමින් ඇය කීවාය. ''ෆිෆෝ සහ ෆම්''

ටෝනි හා බින්ගෝ සර්කස් කණ්ඩායමේ සිටි සරඹ දක්වන්නෝ වූහ. සර්කස් කූඩාරමේ ඉහළින්ම බැඳුණු කඹය මත ගමන් කිරීමට ටෝනි දැක්වූයේ මහත් දක්ෂතාවකි. ඔහු කඹය මත දිව්වේය. උඩ පැන්නේය. නැටුවේය. ඔළුවෙන් සිට ගත්තේය. ජැක් නිතරම බිය වූයේ ඔහු ඇද වැටේය කියාය.

''ඇයි කිසිම වෙලාවක එයා පහළින් ආරක්ෂක දැලක් දාගන්නෙ නැත්තේ?'' ජැක් පෙඩ්රෝගෙන් විමසුවේය. ''ඒ තරම් උසක ඉඳන් එයා බිම වැටුණොත් මැරේවි''

''ඒ ගැන එයාගෙන්ම අහන්න'' පෙඩ්රෝ කීවේ සිනාසෙමිනි.

එහෙයින් ජැක් ඒ ගැන ටෝනිගෙන් විමසුවේ ඔහු පෙඩ්රෝගේ මව හා කතා බහ කරන්නට පැමිණි අවස්ථාවකය. ස්පාඤ්ඤ ජාතියෙකු වූ ටෝනිට ඉංග්‍රීසි බස වටහා ගැනීමේ හා සෑහෙන දුරට කතා කිරීමේ හැකියාව තිබිණි.

''ඔහ්.... ආරක්ෂක දූලක්'' ටෝනි ආඩම්බරයෙන් කීවේය. ''මට ආරක්ෂක දූලක් දාන්නෙ එංගලන්තයේදී විතරයි. මම වැටෙන්නේ නැහැ. මම... ශ්‍රේෂ්ඨ ටෝනි''

ටොප්ස්, කණ්ඩායමේ විහිළුකාරයා වූ අතර ඔහු බොරු කකුල්වලින් දක්ෂ ලෙස ඇවිද්දේය. යෝධයකු මෙන් උස්ව ඔහු බොරු කකුල්වලින් ඇවිද යන විට නරඹන්නෝ ප්‍රීති ඝෝෂා කළහ. බොරු කකුල්වල පහළ තිබූ විශාල සපත්තු දෙක නිසා පුංචි ළමයින් සිතුවේ ඇත්තෙන්ම යෝධයෙක් කියාය. ඔහුගේ ගැඹුරු හඬ ළමයින්ගේ එම විශ්වාසය තවත් තහවුරු කළේය.

ඔහු වෙනුවෙන්ම තැනුණු උස බයිසිකලයක් තිබූ අතර ඔහු එය පැද්දේ බොරු කකුල් පැළඳගෙනමය. ටොප්ස් නිතරම විහිළුවලට ප්‍රිය කළ කුඩා සිරුරැත්තෙක් වූයේය. ඔහුගේ ගැඹුරු හඬ ඒ කුඩා සිරුරට නොගැළපිණි.

''ඒ නිසායි ටොප්ස් බොරු කකුල් වලින් ඇවිදින්න පුරුදු වෙලා තියෙන්නේ.'' පෙඩ්රෝ ජැක්ට පැවසුවේය. ''එයා හැම වෙලාවෙම කියන්නේ මම බොරු කකුල් දමාගෙන උස් වෙන්නේ මගේ කට හඬට ගැළපෙන්න කියලායි''

සර්කස් කණ්ඩායමේ කඩු ගිලින්නා වූයේ හෝලාය. ඔහු කඩු ගිලීමේ නියැළෙන විට ජැක් එදෙස බලා සිටියේ බියෙන් යුතුවය. ඔහු කඩුවේ මිට දක්වාම කඩුව ගිල්ලේය.

''එයාට බැරියැ කොට පිහි කිනිසි එහෙම ගිලින්න'' ජැක් පැවසුවේය. ''ඒවා උගුරෙන් පහළට යවන්න ඒ තරම් අමාරු නැහැ. ඒත් පෙඩ්රෝ, එයා කොහොමද අර තරම් දිග කඩුවක් ගිලින්නේ? මට නං ඒක බලාගෙන ඉන්නත් අමාරුයි''



පෙඩ්රෝ සිනාසුණේය. ''මම වෙලාවක ඔයාව හෝලා ළඟට එක්කරගෙන යන්නං. එතකොට එයා ඔයාට පෙන්නාවි කොහොමද ඒක කරන්නේ කියලා''

එක් සන්ධ්‍යාවක ජැක් පෙඩ්රෝ සමඟ හෝලාගේ කහ පැහැති වෑන් රථය වෙත ගමන් කළේය. උස සිහින් සිරුරක් සහිත හෝලාට තිබුණේ ශෝකයෙන් බර වූ දෑසකි. පෙඩ්රෝ ඔහුට ජර්මන් භාෂාවෙන් කතා කළේය. හිස සැලූ හෝලා සිහින් සිනහවක් පා ජැක් හට වෑන් රියට ගොඩවන්නට ඇරයුම් කළේය. එහි රාක්කයක විවිධ ප්‍රමාණයේ පිහි, කිනිසි හා කඩු තිබිණි. ජැක් අත දිගු කර පෙන්වූයේ ඉතා දිග කඩුවකි.

හෝලා එය අතට ගෙන හිස පසුපසට නවා කඩුව මුවට දමා උගුර හරහා එහි මිට දක්වා පහළට යැවිය. කඩුවේ දිග ප්‍රමාණය අනුව එය කළ නොහැක්කකි. එහෙත් ඔහු එය කළේ කෙසේද?

හෝලා යළි සෙමෙන් කඩුව ඉහළට ඇද මුවින් පිටතට ගෙන සිනාසුන ද ඔහුගේ දෑසේ තව දුරටත් වූයේ ශෝකයකි. ඔහු කඩුව ජැක් අතට දුන්නේය. කඩුව පිරික්සූ ජැක් එක් රහසක් අනාවරණය කර ගත්තේය. කඩුව ඇකිලිය හැකි එකකි. එහි තලය ක්‍රමයෙන් ඇකිළුණු විට එහි දිග කිනිස්සක දිගට වඩා වැඩි නැත. මේ ඇකිළීම සිදුකෙරුණේ එහි මිටේ තිබූ බොත්තමක ආධාරයෙනි. ගිලින අතරතුර එම බොත්තම වරින් වර තද කරමින් කඩුව අකුළන්නට හෝලාට පුළුවන.

ජැක්ගේ සිතට මහත් සහනයක් දැනිණි. එම රහස්‍ය බොත්තම ඔබා බැලීමේ අවසරය ජැක්ට ලැබිණි. කඩුවේ උල් කෙළවර ක්‍රමයෙන් ඇකිළෙමින් එය කිනිස්සක ප්‍රමාණයට පත්වන අයුරු ඔහුට පෙනිණි.

සර්කස්කරුවෝ නිතරම ප්‍රීතියෙන් හා කෙළි දෙළෙන් පසු වීමට කැමැත්ත දක්වූවෝ වූහ. එහෙත් එසේ ප්‍රීතිවන්නට ජැක්ට හැකියාවක් නොතිබිණි. ඔහු නිතරම කනස්සල්ලෙන් පසු වූයේ ලූසී-ඈන් සහ අනෙක් අය ගැන සිතමිනි. සර්කස් කණ්ඩායම බොර්කෙන් වෙත ළඟාවන තුරු ඔහු පසුවූයේ මහත්

නොඉවසිල්ලකිනි. අතරමඟ නතර වෙමින් ගමන් කළ නිසා මහු සිතුවේ සර්කස් කණ්ඩායම බෝර්කෙන් වෙත ළඟා වන විට තමා ප්‍රමාද වැඩි වන්නට ද පුළුවන කියාය.

''ඒත් මම මේ අය එක්කම ඉන්න ඕනෙ'' ඔහු සිතුවේය.''මට හැංගිලා ඉන්න පුළුවන් හොඳම තැන තමයි මේ. තනියම යන්න ගියොත් කොයි වෙලාවක හරි මාව පොලිසියට කොටු වෙනවා. ඒත් මේ අය මිට ටිකක් ඉක්මනින් ගමන් කරනවා නං හොඳයි. ඉක්මනින් බෝර්කෙන් වෙත ළඟා වුණොත් මම තනියම මාලිගාව පැත්තේ කරක් ගහලා තොරතුරු හොයා ගන්න ඕනෙ''

# 17. බෝර්කෙන් වෙත ළඟා වෙයි

කණ්ඩායමේ අනෙක් අය අතර මෙන්ම සර්කස් නරඹන්නට පැමිණෙන්නන් අතර ද කිකී ඉමහත් ජනප්‍රියත්වයක් ලබා ගත්තේය. සර්කස් කණ්ඩායමේ ලොක්කා තමන් දුන් වචනය රකිමින් ජැක්ට කිකී ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දුන්නේය. දණ්ඩක් මත රන් පැහැය ආලේපිත කුඩා වේදිකාවක් කිකී වෙනුවෙන් තනන්නට ජැක්ට පෙඩ්රෝ ගේ උපකාරය ද ලැබිණි. එම වේදිකාව දුක කිකී මහත් සතුටට පත් විය.

''මම හිතන්නේ, ඔයා ඔතැන ඉන්නකොට හිතන්නේ ඔයා ඉන්නේ සිංහාසනයක කියලා නේද?'' ජැක් කිකීගෙන් විමසුවේය. ''කිකී කුමාරයා. ලෝකයේ හොඳම කතා කරන ගිරවා... දුන්... කොහොමද ගීතයක් ගායනා කළොත්?''

අත්පොළසන්, ප්‍රීති ඝෝෂා හා සිනහවක් ලැබෙනවා නම් ඕනෑම දෙයක් කරන්නට කිකී හැම විටකම සූදානමින් සිටියේය. කිකී ගැන කෝපයෙන් සිටි අයෙකු කණ්ඩායමේ හිටියා නම් ඒ වලසුන්ගේ පුහුණුකරු වූ ෆැන්ක්ය. කිකී වෙත නරඹන්නන්ගේ වැඩි අවධානය යොමු වීම ගැන ඔහු මහත් ඊර්ෂ්‍යාවෙන් පසුවූයේය.

ළමා ගීත හා තමන් දන්නා වචන මිශ්‍ර කරමින් කිකී ගායනා කළ අතර ටෞරි-හේසියා හි ජනයා ඒ බව දුන සිටියේ නැත. ඔවුන් සිතුවේ කිකී නිවැරදිව ගීතයක පද ගායනා කරනවා කියාය.

නරඹන්නන් අතරින් යමෙක් ඌට යමක් පැවසුවහොත් කිකී වහා ඊට පිළිතුරු සැපයුවේය. එහෙත් ඌ කතා කළේ ඉංග්‍රීසි බසින් නිසා ඒ කියන කිසිවක් නරඹන්නන්ට වැටහුණේ නැත. එසේ වෙතත් කිකී පිළිතුරු සැපයූ විලාසයත් පිළිතුර අග නැගූ සිනහවත් නිසා ප්‍රේක්ෂකයෝ මහ හඬින් සිනාසුණහ.

''ටිකෝපුලින් වෝල්යෝ?'' කිසිවෙක් කිකීගෙන් විමසුවේය.

''දොර වහන්න. පොලීට හෙම්බිරිස්සාව දොස්තර ළඟට යන්න'' කිකී එකවර කියාගෙන යද්දී ජැක්ට පවා සිනා නොවී සිටීම අපහසු විය.

කිකී නැගූ විවිධ ශබ්ද ප්‍රේක්ෂකයෝ මහත් සේ ප්‍රිය කළහ. උගේ කිවිසුම්, ඉක්කාවන් හා කැස්ස අසමින් නරඹන්නෝ ඇස්වලින් කඳුළු එනතුරු සිනාසුණහ. බිම් ගෙයක් හරහා දුම්රියක් පැමිණෙන විට නැගෙන හඬ කිකී අනුකරණය කරනු අසන්නට ඔවුහු ප්‍රිය කළහ. තණ කොළ කපන යන්ත්‍රයේ හඬ කිකී අනුකරණය කළ ද ඒ ගැන අවබෝධයක් නරඹන්නන්ට නොතිබුණේ තණකොළ කපන යන්ත්‍ර ටෞරි-හේසියාවේ නොතිබූ බැවිනි. එසේ වුව ඔවුහු කිකී කිකිළියක මෙන් කෙකර ගානු, ෆැන්ක්ගේ වලසුන් මෙන් ගොරවනු හා බල්ලකු මෙන් බුරනු අසන්නට කැමති වූහ.

ඔව්. කිකී සාර්ථකව තම කාර්යයන්හි නියැලුණේය. මේ අර්බුදකාරී වාතාවරණය යටතේ උගෙන් ලැබුණ සහාය ජැක් මහත් සේ අගය කළේය. කිකීගේ දක්ෂතා නිසා උපයාගත් මුදලින් ජැක් පෙඩ්රෝ ගේ මව තමාට ලබා දෙන ආහාර සඳහා ගෙවීම් කළේය. පෙඩ්රෝ ගේ වෑන් රථය පාවිච්චි කරනවාට කුලී ගෙවුවේය. ඉතිරිවන මුදල් ඔහු තම ලේන්සුවේ ගැටගසාගෙන පරෙස්සමෙන් රැක ගත්තේ බෝර්කෙන් වෙත ගිය විට ඒවායින් ප්‍රයෝජනයක් ලැබෙතැයි සිතමිනි. චිම්පන්සීන් දෙදෙනා ෆීෆෝ හා ෆම් ළඟ පාතක සිටින විට ඔහු ඒ මුදල් පිළිබඳ දැඩි අවධානයකින් යුතුව සිටියේ උන් ගැටකැපීමට දක්ෂයන් වූ හෙයිනි.

''අපට හෙට බෝර්කෙන්වලට යා ගන්න පුළුවන් වේවි'' එක් සන්ධ්‍යාවක ගමන් අරඹන්නට අණ ලැබෙද්දී පෙඩ්රෝ පැවසුවේය.



''ලොක්කාට එහේ කූඩාරම් ගහගන්න හොඳ තැනක් ලැබිලා. මාලිගාව පිහිටා තියෙන කන්ද පාමුල පිට්ටනියක්''

ජැක්ගේ හදවත වේගයෙන් ස්පන්දනය විය. බෝර්කෙන් වෙත අවසානයේ ඔහු ළංව සිටියි. ගමනට සතියක්ම ගත වී තිබීම ඔහුගේ කනස්සල්ලට හේතු විය. කෙසේ වෙතත් ඊළඟ දිනයේ බෝර්කෙන් වෙත ළඟා වූ පසු ලූසී-ඈන්, පිලිප් ඇතුළු පිරිස ගැන ආරංචියක් දැන ගන්නට ලැබෙනු ඇතැයි ඔහු බලාපොරොත්තු වූයේය. ලූසී-ඈන් සනීපයෙන් සිටිනවා ඇත්ද? කෙසේ වෙතත් මාලිගයේ සිර වී සිටින්නට සිදුවීම නම් ඇය කිසිසේත්ම ප්‍රිය නොකරන බව නිසැකය.

ඔවුහු ඊළඟ දින සන්ධ්‍යාවේ බෝර්කෙන් වෙත ළඟා වූහ. ජැක් ඇතදීම මාලිගාව දුටුවේය. පැරණි කතාවක් වූ 'ආතර් රජු හා ඔහුගේ නයිට්වරුන් දසදෙනා' හි කියැවෙන අද්භූත ගොඩනැගිල්ලක් බඳුව ජැක් එය දුටුවේය. ශක්තිමත් ඒ මාලිගාවේ සිව් කොනේ කුළුණු හතරක් ඇති බව පෙනිණි.

''බෝර්කෙන් මාලිගාව' වනාන්තරය මැදින් වැටී තිබූ රළු මාවත කෙළවර වූ එළිමහන් ප්‍රදේශයට ළඟා වූ විට හදිසියේම පෙඩ්රෝ මාලිගය දැක පැවසුවේය. ඔහු එම කන්දට අත දිගු කළේය. ''ඔය මාලිගාවේ හුඟ දෙනා හිරකාරයන් බවට පත් වෙලා ඉන්නවා. එහාට ගිය හුඟාක් අය ගැන ආපහු කිසිම ආරංචියක් ලැබිලා නැහැ. ඒකේ පොළොව යට හිරගෙවල් ඇතුළත......''

''එපා'' ජැක් බියපත් ස්වරයෙන් පැවසුවේය. ''මට ඔය වගේ දේවල් ගැන කියන්න එපා''

පෙඩ්රෝ විමතියෙන් ඔහු දෙස බැලුවේය. ''මොකද ඔයාට වෙලා තියෙන්නේ? මාලිගාවට බය වෙලාද? නැහැ නේද?''

''නැහැ'' ජැක් පිළිතුරු දුන්නේය. ''හ්ම්... කොහේද හිරකාරයන් රඳවාගෙන ඉන්නවා කීවේ? අර කුළුණුවලද? නැත්නම් විශේෂ තැනකද?''

''දන්නෙ නැහැ'' පෙඩ්රෝ පිළිතුරු දුන්නේය. ''සමහර වෙලාවට අපි මාලිගාව කිට්ටුවට යනවා. නමුත් හුඟාක් ළං වෙන්න, මාලිගාවට ඇතුළු වෙන්න අපට අවසර නැහැ''

මාලිගාව පිහිටි කන්ද පාමුල එළිමහන් පිට්ටනියක සර්කසයේ කූඩාරම් ඉදි කෙරිණි. කූඩාරම් ඉදි කෙරෙනු බලන්නට ප්‍රදේශවාසීහු පැමිණියහ. සර්කසයක් බෝර්කෙන් වෙත පැමිණීම ප්‍රදේශවාසීන්ගේ මහත් සතුටට හේතු වී ඇති බව පැහැදිලිව පෙනිණි. ළමයි සතුටින් කෑ ගසමින් සිනාසෙමින් ඒ මේ අත දුව පැන්නාහ. එක් කුඩා දුරිවියක් පෙඩ්රෝ වෙත දිව ආවාය. ඔහු ඇයව ආදරයෙන් පිළිගන්නට මෙන් දෑත් විහිදාලූ අතර ඇය කෑ ගසමින් ඔහුගේ දෑත් අතරට පැන්නාය. ''පෙඩ්රෝ... පෙඩ්රෝ අලපිනොටොලිඕටා''

පෙඩ්රෝ ද එම භාෂාවෙන්ම පිළිතුරු දුන්නේය. ඉන්පසු ඔහු සතුටින් සිනාසෙමින් ජැක් වෙත හැරුණේය. ''මේ මගේ පුංචි ඥාති සොහොයුරිය හේලා'' ඔහු කීවේය. ''ඇගේ පියා විවාහ වී ඉන්නේ මගේ නැන්දා සමඟ. ඔහු හේසියන් හමුදාවේ සෙබළෙක්'' යළි හේලා වෙත හැරුණු ඔහු මහත් උනන්දුවකින් යුතුව ප්‍රශ්න කිහිපයක් විමසුවේය.

''හේලා කියනවා එයාගේ අම්මයි තාත්තායි දෙන්නාම මෙහේ කියලා. දූන් මාලිගාවේ මැඩම් ටැටිඹිසාගේ පරිවාර සේවිකාවක හැටියට ඇගේ අම්මා කටයුතු කරනවාලු. ඒ නිසා හේලා දූන් ඇගේ අම්මා එක්ක ඉන්නේ මාලිගාවේලු''

එය ජැක්ට ඉතා වටිනා හා සුබදායී පුවතක් විය. සමහර විට තමාට ලූසි ඇන් හා අනෙක් අය ගැන ද ආරංචියක් දැනගත හැකි වෙතැයි ඔහුට සිතිණි. ඔහු මහත් උනන්දුවෙන් යුතුව කුඩා හේලා දෙස බැලුවේය. දුරදිග නොසිතා එකවර ඇයගෙන් ප්‍රශ්න කිරීම නුසුදුසුය. එහෙයින් ඔහු විමසිය යුත්තේ මොනවාද යන්න ගැන කල්පනා කළේය.

''පෙඩ්රෝ... මැඩම් ටැටිඹිසාට දරුවන් ඉන්නවාද?'' ඔහු අවසානයේ විමසුවේය. ''ම්... ම්... ඇය දරුවන්ට මාලිගාව එහෙම පෙන්නන්න කැමති ද දන්නෙ නැහැ නේද?''

''මැඩම් ටැටිඹිසාට දරුවන් නැහැ'' පෙඩ්රෝ පැවසුවේය. ''මට ඒ වග නිශ්චිතවම කියන්න පුළුවනි. ඇයට දරුවන් සිටියා නම් ඇය ඒ එක දරුවෙක් රජ කරවන්න උත්සාහ කරනවා නිසැකයි. ඇය දක්ෂ ඒ වගේම නපුරු කාන්තාවක්''



ජැක් විමසුවේ කුමක්ද යන්න දැන ගැනීමට හේලාට අවශ්‍ය විය. පෙඩ්රෝ කී සියල්ල අසා සිටි ඇය පෙඩ්රෝගේ කනට කර මොනවාදෝ කොඳුළාය. ඉන්පසු ඇය තම ඇඟිල්ලක් දෙතොල් මත තබා ඇඟවූයේ තමා පැවසූ කිසිවක් නොපවසන ලෙසිනි.

''බොළඳ කෙල්ල'' පෙඩ්රෝ කීවේය. ''ඔයා දවල් හීන දකිනවා''

''මොනවද එයා කියන්නේ?'' හේලා පැවසූ සියල්ල අසා දැන ගැනීමේ නොඉවසිල්ලෙන් යුතුව ජැක් විමසුවේය. ඇය මාලිගයේ වෙසෙනවා නම් එහි සිටින අනෙක් අය ද දැක තිබිය යුතුමය.

''හේලා කියනවා මැඩම් ටැටිඹිසා දරුවන් කිප දෙනෙක් අරං හදාගන්නවා වගේ කියලා. එයා එහෙම කියන්නේ මාලිගාවේ එක කොටසකට අම්මා එක්ක යද්දී ළමයි කිප දෙනකුගේ කට හඬ ඇහුණාලු'' පෙඩ්රෝ සිනාසෙමින් පැවසුවේය. ''ඒ වගේම ඒ කටහඬ ඇහුණු පැත්තට යන්න අවසර තියෙන්නේ. මැඩම් ටැටිඹිසාටත් පැරිටෝලෙන් සිටුවරයාටත් විතරමයිලු. ඒ ඇයි කියලා කවුරුවත්ම දන්නේ නැතිලු. ඒ වගේම ඒ ගැන හේලා තමන්ගේ අම්මාට කීවාම අම්මා තර්ජනය කළාලු කතා හදන්න එපා කියලා''

''මට තේරෙනවා'' ජැක් පැවසුවේය. ''ඇය දන්නවාද ඒ කටහඬ ඇහුණේ මොන ගොඩනැගිල්ලෙන් ද කියලා. අපි මේ ඉන්න තැන ඉඳන් ඇයට ඒ ගොඩනැගිල්ල පෙන්වන්න පුළුවනිද?''

''එයා කියන කතා ඒ තරම් විශ්වාස කරන්න එපා ජැක්'' පෙඩ්රෝ කීවේය. ''අපේ පුංචි හේලා කතන්දර මවලා කියන කෙනෙක්''

''කොහොම වුණත් හේලාගෙන් අහන්නකෝ'' ජැක් පැවසුවේය. පෙඩ්රෝ එම ප්‍රශ්නය හේලා වෙත යොමු කළේය. කළු ගලින් තැනුණු මාලිගය දෙස බලා සිටි ඇය දකුණු පස ගොඩනැගිල්ල වෙත අත දිගු කළාය.

''අරකු'' ඇය පෙඩ්රෝට කීවේ කෙඳිරීමක විලාශයෙනි. ඇය එය හේසියානු භාෂාවෙන් පැවසුව ද ජැක්ට ඇය කී දෑ වැටහිණි. නැවතත් ඇය දෙතොල් මත ඇඟිල්ලක් තබා ජැක්ට හා පෙඩ්රෝට ඇඟවූයේ ඒ කී දෑ කිසිවකුට නොපැවසිය යුතුය යන්නයි.

රසකැවිලි මිලට ගෙන දෙන්නට ජැක් ඇය කැඳවාගෙන ගියේය. තමාට එම රටේ භාෂාව කතා කළ හැකිවූවා නම් මැනවැයි ඔහුට සිතිණි. කිකී තරම් නොවූවත් ඔහු ද හේසියානු භාෂාවෙන් වචන කිහිපයක් ඉගෙනගෙන සිටියේය. හේලා සමඟ සම්පූර්ණ කතා බහක් පවත්වාගෙන යන්නට තරම් හේසියානු භාෂාව පිළිබඳ දැනුමක් ජැක්ට නොතිබිණි.

ඇය මඟ දිගට මොන මොනවාදෝ කියැවූ නමුත් ඔහුට ඒ එක වචනයක් හෝ වැටහුණේ නැත. ජැක් රස කැවිලි මිලට ගෙන දුන් විට ඇය ජැක් වැළඳගෙන හාදුවක් දුන්නාය. ඉන්පසු ඇය වේගයෙන් දිව ගියේ තමාට ලැබුණ රසකැවිලි තම මිතුරු මිතුරියන්ට පෙන්වීමේ අදහසින් විය හැක.

සියලු ඉදිකිරීම් කටයුතු ඉක්මනින් නිමා වූ නමුත් සර්කස් සංදර්ශනය ආරම්භ වීමට නියමිත වූයේ පසුදා සන්ධ්‍යාවේ සිටය. ජැක්ට එම කාලය කාර්ය බහුල එකක් වූ අතර ඔහු මහත් වෙහෙසට පත්ව සිටියේය. එසේ වුව එදින රාත්‍රියේ මාලිගාව ආසන්නයට ගොස් පරීක්ෂාකාරී වීමට ඔහු තදින් අදිටන් කරගෙන සිටියේය. එසේ යන්නට පෙඩ්රෝ ද කැඳවා ගැනීම උචිත ද? නැත. තමාට පිලිප් හා අනෙක් අය මුණගැසෙන්නට අවස්ථාවක් ලැබුණහොත් තමන් අසල පෙඩ්රෝ සිටීමෙන් සියල්ල අවුල් වී යාමට ඉඩ තිබේ යැයි ජැක් සිතුවේය. අනෙක් අතට පෙඩ්රෝට සියල්ල පැහැදිලි කර දෙන්නට ජැක්ට සිදුවනු ඇත. පෙඩ්රෝ එම පුවත කොයි ආකාරයකට බාර ගනීවි ද යන්න නිශ්චිතව කීමට නුපුළුවන.

රාත්‍රී ආහාර ගැනීම සඳහා වෑන් රියට යද්දී පෙඩ්රෝ ගේ මව ඔහු කැඳවා මොන මොනවාදෝ කීවාය. ඒවාට ඇහුම්කන් දුන් පෙඩ්රෝගේ මුහුණ අඳුරු වී තිබිණි.

''මොකද වෙලා තියෙන්නේ?'' ජැක් විමසුවේය.



''වලසුන් පුහුණු කරවන ෆැන්ක් අසනීප වෙලා'' පෙඩ්රෝ පැවසුවේය. ''ලොක්කා සැහෙන්න කනගාටු වෙනවාලු''

''ඇයි?'' ජැක් විමසුවේය. ''ඔව්. ෆැන්ක්ට අසනීපයි කියන්නේ හෙට වලසුන්ගේ දර්ශන ඉදිරිපත් වෙන්නේ නැහැ. එහෙම නේද? සමහර විට හෙට වෙනකොට එයාට සනීප වෙන්නත් ඉඩ තියෙනවා''

''වලසුන්ගේ දර්ශන අඩුවෙනවා කියන්නේ සර්කස් එකට ලොකු පාඩුවක්. නරඹන්නන් ඒ දර්ශනවලට කැමතියි'' පෙඩ්රෝ පැවසුවේය. ''ඒත් ඊට වඩා ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ෆැන්ක් නැතිව වලසුන් බලාගන්න වෙන කවුරුවත් නැහැ. ෆැන්ක් අසනීප වෙලා නං වලසුන් අසරණයි. අඩුගානෙ උන්ගෙ කූඩු සුද්ද කරන්න උන්ට කෑම දෙන්න.... කවුරුවත් නැහැ. එතකොට උන් එකිනෙකා පොර කා ගන්නවා. එහෙම වුණු එක වතාවක උන් කූඩු කඩාගෙන එළියට පැන්නා. අමාරුවෙන් ඇඳෙන් නැගිටලා ඇවිත් එවෙලේ ඔහු යාන්තම් වලසුන් පාලනය කර ගත්තා. ඒ වෙලාවේ ඔහු කලබල වුණා. වලසුන් අතින් මිය යන්න පවා ඉඩ තිබුණා.''

''පව්. අසරණ ෆැන්ක්'' ජැක් පැවසුවේය. ''කොහොම වුණත් හෙට වෙනකොට එයාට සනීප වේවි කියලා අපි බලාපොරොත්තු තියාගනිමු. ඒ වගේ විශාල වලසුන් කූඩු කඩාගෙන එළියට පැනලා මේ කඳවුර දෙවනත් කරනවා දකින්න මම කොහෙත්ම කැමති නැහැ. ෆැන්ක් උන් එක්ක හැසිරෙන විදිය මම දැකලා තියෙනවා. ඔහු උන් එක්ක ක්‍රීඩා කරනවා. උන්ට සරදම් කරනවා. උන් ඔහු ළඟ හැසිරෙන්නේ හරියට කිකරු බල්ලන් වගේ''

''ෆැන්ක්ට වගේ නපුරු සතුන් පාලනය කිරීමේ හැකියාව හැමෝටම නැහැ'' පෙඩ්රෝ පැවසුවේය. ''වතාවක් ඔහු යටතේ සිංහයන් වගේම දිවියන් දෙදෙනෙක් ද හිටියා. ඔහු උන්ට පුහුණු කළා. හදිස්සියේම ෆැන්ක් කිව්වා උන් එක්ක දර්ශන ඉදිරිපත් කරන්න කැමති නැහැ කියලා. ඊට පස්සෙ උන් සතුන් වත්තකට විකුණුවා. ඒ කොහොම වෙනත් එතකොටත් උන් ලෝකයේ හොඳින්ම පුහුණුව ලැබූ සිංහයන් හා දිවියන්''

''දැන් ඔහු යටතේ ඉන්නේ වලසුන්'' ජැක් කීවේය. ''ඔහු උන්ට හුඟාක් ආදරය කරන්න ඕනෙ. ඒ සතුනුත් ඔහුට ආදරය කරන්න ඕනෙ. ඒ වගේ තවත් පුද්ගලයන් ඉන්නවා පෙඩ්රෝ. සතුන්ට ආදරය කරන සතුන් එක්ක කටයුතු කරන පිරිමි ළමයෙක් ගැන මම දන්නවා'' ඔහු එසේ පැවසුවේ පිලිප් ගැන සිතමිනි.

''එයා සිංහයන් දිවියන් හෝ වලසුන් එක්ක කටයුතු කරලා තියෙනවාද?'' පෙඩ්රෝ විමසුවේය. ''නැහැ. මම හිතන්නේ නැහැ. බල්ලන්, බළලුන්, මීයන්, ගෙම්බන් වගේ සතුන්ට ළං වෙන එක ලෙහෙසියි. උන් එක්ක කැමති විදියකට කටයුතු කරන්න පුළුවන්. ඒ වුණත් බළල් පවුලේ සිංහයන්, දිවියන් එක්ක කටයුතු කරන එක පහසු නැහැ''

''ඔව්. ඒ කතාව ඇත්ත'' ජැක් පැවසුවේ එවැනි විශාල සතුන් වෙත ළං වන්නට තවම පිලිප්ට අවස්ථාව ලැබී නැති බව සිහිපත් කරමිනි. ''මං හිතන්නේ හෙට වෙන කොට ෆැන්ක්ට සනීප වේවි. වලසුන්ගේ කුඩු පිරිසිදු කිරීමේ කාරිය ගැන මට නං හිතන්නවත් බැහැ''

ජැක් වෙනදා මෙන් ඉක්මනින් නින්දට වැටුණේ නැත. පෙඩ්රෝගේ වෑන් රථය ඇතුළත දිග හළ මෙට්ටය මත වැතිර සිටියා මිස නින්දට යන්නට ඔහුට වුවමනාවක් තිබුණේ ද නැත. මාලිගය වෙත යාමට ඔහුට අවශ්‍ය වී තිබිණි. ඔහු ඊට පෙර දිනක වෙළෙඳසලකින් විදුලි පන්දමක් මිලට ගෙන තිබිණි. අඳුරේ ඇවිද යාමට එය අවශ්‍ය වන බව ඔහු කල්පනා කළේය.

පෙඩ්රෝ ගොරවන හඬ ඇසුණු වහා ජැක් මෙට්ටයේ අනෙක් පසට පෙරළුණේය. පෙඩ්රෝ අවදි කරවන්නට ජැක්ට අවශ්‍ය වූයේ නැත. තම ඇඳුම් ද අරගෙන ඔහු වෑන් රියෙන් පිටතට ආවේය. අඳුරේම ඒවා ඇඳගත් ඔහුගේ උර මත විමතියට පත් කිකී සිටි අතර දෙදෙන එක්ව මාලිගය තිබූ කන්දට නැංගේය.

පිලිප් ඇතුළු පිරිසට කතා කරන්නට අවස්ථාව ලැබුණොත් පමණක් ඔවුන් එහි සිටින බව විශ්වාස කිරීමේ හැකියාව ඔහුට තිබිණි.

# 18. මාලිගාව ඇතුළට

ජැක් ඉතා සෙමෙන් හඬ නොනඟමින් කඳවුරෙන් පිට වූයේය. සියල්ල නිහඬව නිසලව තිබිණි. කිසිම රථයක් ඇතුළත විදුලි ලාම්පුවක් හෝ ඉටිපන්දමක් දැල්වුණේ නැත. කඳවුර ඉදිකිරීමේ දී වෙහෙසට පත් කණ්ඩායමේ සියලු දෙනා ඉක්මනින්ම නින්දට පිවිස සිටියහ. ඒ ඊළඟ දිනයේ සර්කස් දර්ශන ආරම්භ කරනු පිණිස හොඳින් විවේක ගන්නා අපේක්ෂාවෙනි.

එය තරුවලින් අහස පිරී තිබූ, එහෙත් සඳ පායා නොමැති රාත්‍රියක් වූයේය. එහෙයින්ම අවට ආලෝකයක් පැතිර නොතිබිණි. එසේ වුව මාවත යාන්තමට පෙනුණු නිසාවෙන් ජැක්ට විදුලි පන්දම දැල්වීමට අවශ්‍ය නොවීය. ඉක්මනින්ම ඔහුගේ දෑස අඳුරට හුරුවිය. තරුවලින් නිකුත් වූ ආලෝකය ඔහුට කිසිවක නොහැපී ඉදිරියට ගමන් කරන්නට තරම් ප්‍රමාණවත් විය.

කන්ද නැඟගත් ඔහු මාලිගය වටා වූ පවුරට ළං විය. විදුලි පන්දම දල්වා පවුරේ ඒ මේ අතට ඇල්ලූ ඔහු තමාට ඉහළට නැඟිය හැකි ස්ථානයක් සොයා ගත්තේය. එතැන ගල් රළු වූ අතර පවුර සමතල නොවීය. ඔහු පැළඳ සිටි රබර් අඩි සහිත පාවහන් ද පවුරේ ඉහළට නැඟෙන්නට ඔහුට උපකාරී විය. රබර් අත් වැසුම් පැළඳ සිටියා නම් කළුගල් තදින් අල්ලාගෙන ඊටත් වඩා පහසුවෙන් පවුරට නැඟෙන්නට ඉඩ තිබිණැයි ඔහුට සිතිණි.

පවුර මුදුනට නැඟුණු ඔහු විදුලි පන්දම දල්වන්නේ නැතිවම වට පිටාව පිරික්සුවේය. තමා ළංව සිටින්නේ මාලිගය පසෙක වූ ගෙමිදුලකට බව ඔහුට වැටහිණි. ඔහුගේ ඇස් වෙහෙසට පත්ව තිබිණි. ඔහුට මාලිගාවේ වැඩි කොටස පෙනුණු අතර එය ශක්තිමත්ව හා දූවැන්තව ඉහළට නැඟ තිබිණි. එය ඇතුළට යා ගන්නට හා පිලිප් ඇතුළු පිරිස හමුවන්නට අවස්ථාව තමන්ට ලැබේ ද යන සැකය ජැක්ගේ සිතෙහි විය.

බිමට පැනගත් ඔහු උද්‍යානය හරහා දණගාගෙන මෙන් ඉදිරියට ඇවිද ගියේය. හදිසියේ යමක් ඔහුගේ සිරුරේ පැටලුන අතර ඔහු බියට පත් විය. කිකි ද බියපත්ව හඬ නැඟුවේය. යමක් ඔහුගේ හිස වටා එතිණි. එය කුමක් ද? බියට පත්ව සිටි ජැක් එය ගසා දමමින් ඉදිරියට දිව ගියේය. එහෙත් එය නැවතත් ඔහුගේ සිරුරේ පැටලී ඔහුගේ මුහුණ සම්පූර්ණයෙන්ම වසා දැමුවේය. තම සිරුරේ මෙසේ පැටලෙන්නේ කුමක්දැයි බලන්නට ජැක් සිය විදුලි පන්දම ක්ෂණයකට දල්වා නිවා දැමුවේය. එය කුමක්දැයි දුටු ඔහු මහත් සැහැල්ලුවෙන් සිනාසුණු අතර තමා මෝඩයකු විණැයි ඔහුට සිතිණි. ඔහු ගමන් කර ඇත්තේ සේදූ රෙදි වනා තිබූ වැලක් වෙත ය. මුලින් ඔහුගේ සිරුරේ පැටලී තිබුණේ ඇඳ ඇතිරිල්ලකි. දෙවනුව ඔහුගේ මුහුණ වැසී තිබුණේ ජර්සියකිනි.

''ජර්සියක්!'' ජැක් නතර වූයේය. ජර්සි ටෞරි-හේසියානුවන් ඇඳ සිටිනු ජැක් දුටුවේ නැත. ඔහු නැවතත් විදුලි පන්දම දල්වා ජර්සිය පරීක්ෂා කළේය. ඔව්... එය ලූසි-ඈන්ගේ හෝ ඩිනාගේ විය යුතුය. ඒ පිළිබඳ සැකයක් නැත. ඔවුන් නිසැකවම මෙම මාලිගයේ රඳවා සිටිනවා විය යුතුය. දැන් ඔහු ඔවුන් ආසන්නයටම පැමිණ සිටියි.

නතර වී ඔහු කල්පනාවට වැටුණේය. පිරිස රහසේ රඳවාගෙන සිටිනවා නම්, ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් සෝදා මෙසේ වැලක දමා තිබීම අමුතුය. මිනිසුන් ඒවා දැක විමතියට පත්වීමට ඉඩ තිබේ. එසේනම් මේ ගෙමිදුල හැම පසෙකින්ම වට වූ වැඩි දෙනා නොපැමිණෙන තැනක් විය යුතුය. මෙතැනට එන්නේ මැඩම් ටැටිඔසා පමණක් විය හැක. මේ රෙදි සෝදා දැමුවේ ඇයද? ළමයින් ගැන කිසිවකු දැන ගන්නවාට ඇය අකමැති නම් ඒවා සෝදා දැමුවේ ඇයම විය හැකිය.



සමහර විට හේලාගේ මව ද මේ රහස්‍ය තත්ත්වයේ කොටස්කාරියක විය හැක. ඇය ළමයින්ගේ ඇඳුම් සෝදනවා, ළමයින් වෙනුවෙන් අහර පිසිනවා විය හැක. ළමයින්ගේ කටයුතු කිසිවකු අතින් සිදුවිය යුතුය.

මේ කුඩා ගෙමිදුලේ සිට මාලිගයට ඇතුළුවන්නට මඟක් තිබිය යුතුය. බොහෝ විට මේ ආසන්නයේ ඇත්තේ මුළුතැන්ගෙය හෝ රෙදි සෝදා පිරිසිදු කරන තැන විය හැකිය. ජැක් මාලිගයේ සවිමත් බිත්ති දෙසට ඇවිද ගියේය. විදුලිපන්දම දල්වා ඒ මේ අතට අල්ලා පරීක්ෂා කළේය. කිසිවකු ඔහු දැකීමට ඉඩ තිබිණි. එහෙත් ඒ අවදානම නොගෙන ඔහුට මාලිගයට ඇතුළුවීමට තැනක් සොයාගැනීම අපහසුය.

ඔහු සිතූ පරිදිම රෙදි සේදීමට පාවිච්චි කරන කුඩා කාමරයක් එතැන තිබිණි. ඔහු දොර අරින්නට උත්සාහ කළ ද ඊට අගුළු දමා තිබිණි. ජැක් එම කුඩා ගොඩනැගිල්ල දෙස හොඳින් බැලුවේය. එය මාලිගාවේ බිත්තියටම අල්ලා තිබූ අතර ඔහු එහි වහලය දෙසට විදුලි පන්දම යොමුකොට බැලුවේය. යමක් දුටු ඔහුගේ හදවත උද්යෝගයෙන් ස්පන්දනය වන්නට විය.

වහලයට මඳක් ඉහළින් කවුළුවක් තිබූ අතර එහි ජනෙල් පියනට වීදුරු යොදා නොතිබිණි. ඉතා පැරණි හා පටු කවුළුවක් වූ එයට කිසිදා වීදුරු යොදා තිබෙන්නට නැතැයි ජැක් සිතුවේය.

''දැන් ටිකක් පරෙස්සමෙන් කල්පනා කරලා බලමු'' ඔහු තමාටම කියා ගත්තේය. ''වහලය උඩට නැඟගන්න පුළුවන් වුණොත් එතැනින් ජනේලයට ළං වෙලා මට මාලිගාව ඇතුළට රිංගා ගන්න පුළුවනි. පිලිප්ලා ගැන හොයා බලන්නත් පුළුවනි. ඒත් වහලයට නැඟගන්නේ කොහොමද? වහලය උසයි. ආධාරයක් නැතිව මට වහලෙට නැඟගන්න බැහැ''

ඇත්තෙන්ම බිම සිට උඩට පැන වහලයේ කෙළවරක් අල්ලා ගන්නට බැරි තරම් උසක වහලය පිහිටා තිබිණි. බිත්තිය දිගේ වහලය උඩට නැඟෙන්නට බිත්තියට සවි වූ පයිප්පයක් හෝ වෙනත් යමක් නොතිබිණි.

''ඉණිමඟක්'' ජැක් සිතුවේය. ''මට ඉණිමඟක් හොයාගත හැකි වුණොත්''

බලාපොරොත්තු රහිතවම ඔහු වටපිටාවේ ඇවිද සොයා බලන්නට පටන් ගත්තේය. කිසිවක් නිවැරදිව සිතාගත නොහැකිව කිකී ජැක්ගේ උර මත සිටියේය. කිසිම හඬක් නැඟිය යුතු නැති බව ඌ දැන සිටියත් වවුලකු තමා වෙත පියඹා එද්දී කිකී සිහින් හඬක් නැඟුවේය. ගෙමිදුල එතරම් විශාල නොවීය. ජැක් ඒ වටා ඇවිද්දේය. ඔහු පැමිණියේ කුඩා මඩුවක් අසලටය. දොර වසා තිබුණ ද එහි අගුළු දමා නොතිබිණි. හඬ නොනැඟෙන සේ ඉතා සෙමෙන් දොර විවෘත කළ ඔහු ඇතුළට විදුලි පන්දමේ ආලෝකය යොමු කළේය. පුදුමෙනුත් පුදුමය. එහි ඉණිමඟක් තිබිණි. ජැක්ට සිය දෑස් අදහා ගන්නට නොහැකි විය. ඔහු ඉණිමඟ වෙත ගියේය. පැරණි ඉණිමඟක් වූ එහි සමහර හරස් පොලු දිරාපත්ව තිබිණි. නමුත් එය පැවතියේ පාවිච්චියට ගත හැකි තත්ත්වයකය. ඔහු උත්සාහ කර බැලිය යුතුම විය.

ඔහු ඉණිමඟ මඩුවෙන් පිටතට ගනිද්දී මඩුවේ තිබූ හිස් ටින් කිහිපයක් පෙරළී ගියේය. නැඟුණු මහත් ශබ්දය රාත්‍රියේ නිශ්ශබ්දතාව බිඳිමින් පැතිර යද්දී ජැක් හුස්ම නොගෙන සිටගෙනම සිටියේය. ඔහු බලාපොරොත්තු වූයේ මාලිගයේ කවුළුවලින් විදුලි පන්දම් එළි ගෙමිදුලට එල්ල වේය කියාය.

එහෙත් එවැන්නක් සිදු නොවිණි. සියල්ල යළිත් නිහඬව අඳුරේ පැවතිණි. ඔහු සැනසුම් සුසුමක් හෙළුවේය. සමහර විට ඒ හඬ මාලිගයේ කිසිවකුට ඇසෙන්නට නැත. නොඑසේනම් මාලිගය ඇතුළත ඒ ආසන්නයේ කිසිවකු නොසිටිනවා විය හැක.

ඔහු ඉණිමඟ ඔසවාගෙන රෙදි සේදීමේදී යොදා ගන්නා ගොඩනැඟිල්ල වෙත ගියේය. ඉණිමඟ වඩා දිග හෝ වඩා බර නොවීය. එසේ වුව එහි දිග තම කාර්යයට සෑහෙතැයි ජැක් සිතුවේය. ඔහු ඉණිමඟ බිත්තියට හේත්තු කළේය. එය වහලය තරමටම උස් විය. විදුලි පන්දම අල්ලා දිරා ගිය හරස් පොලු කිහිපය පරීක්ෂා කළ ඔහු විදුලි පන්දම නිවා දමා සාක්කුවේ බහා ගත්තේය. වික්ෂිප්තභාවයට පත් කිකී එහා මෙහා පියාඹද්දී ඔහුගේ ඊළඟ



පියවර වූයේ මාලිගා බිත්තියේ වූ කවුළුව වෙත ළඟා වීමය. සමතල නොවූ වහලය දිගේ දණගාගෙන ඉදිරියට ගිය ඔහු කවුළුව තිබූ තැනට පැමිණියේය. බිත්තිය අල්ලාගෙන නැගී සිටි ඔහු විදුලි පන්දම අල්ලා කවුළුව දෙස බැලුවේය.

''ෂිහ්... ඒක තියෙන්නේ මට අල්ලන්න බැරි උසක. උඩ පැනලා අල්ලාගන්නවත් බැරි තරම් උසක''

නැවතත් තමාට ඉණිමඟ පාවිච්චි කළ හැකිදැයි ඔහු කල්පනා කළේය. ආපසු වහලය කෙළවරට දණගාගෙන ගිය ඔහු ඉණිමඟ ඉහළට ඇදගන්නට උත්සාහ කළේය. ඔසවාගෙන ඒම පහසු වූවත් වහලය මත දණගසාගෙන ඉණිමඟ ඉහළට එසවීම පහසු කාර්යයක් වූයේ නැත. දැඩි වෙහෙසක් දැරීමෙන් අනතුරුව ඔහු ඉණිමඟ වහලය මතට ඔසවා ගත්තේය. ඉන්පසු ඔහු මිනිත්තු කිහිපයක් විවේක ගත්තේ ඉණිමඟ වහලය මතට ගැනීම සඳහා ඔහුට සෑහෙන ශක්තියක් වැය කිරීමට සිදු වූ බැවිනි. කෙසේ වෙතත් සතුටු සිතින් ඉණිමඟ කවුළුව පහළට ගෙන යන්නට ඔහු සූදානම් වූයේය. ඉණිමඟ කවුළුවට හේත්තු කළායින් අනතුරුව ඉතිරි සියල්ල ඉතා පහසු යැයි ඔහු සිතුවේය.

ඉණිමඟ ඔහු සිටි තැනින් ඉහළට ගෙන යාම භයානක කාර්යයක් බව ඉක්මනින්ම ඔහුට වැටහිණි. දෙවතාවක්ම ඔහු වහලය මත ඇද වැටිණි. අවසානයේ කවුළුව පහළට ආ ඔහු ඉණිමඟ ඉහළට එසවීය. ආරක්ෂා සහිත තැනක ඉණිමඟ රඳවා තැබීමට ඔහු අවසානයේ සමත් වූයේය.

දැන් ඔහුට ඉණිමඟ දිගේ ඉහළට නැඟෙන්නට පුළුවන. එසේ ඉහළ නඟින විට ඉණිමඟ ලෙස්සා ගියහොත් සිදුවන දෑ ගැන සිතීම පවා අපහසු විය. ඉණිමඟ ලෙස්සා නොයේවායි ඔහු ප්‍රාර්ථනා කළේය. ඔහු ඉක්මනින්ම ඉහළට නැග්ගේය. ඔහුගේ හදවත වේගයෙන් ස්පන්දනය විය. ඉණිමඟ නොවැටී තිබේවිද? ඔහු කවුළුවේ රාමුව අල්ලා ගනිද්දීම ඉණිමඟ ලෙස්සා ගියේය. වහලය දිගේ හඬ නඟමින් රූටා ගිය ඉණිමඟ තවත් විශාල ශබ්දයක් නංවමින් ගෙමිදුලට වැටිණි. දැන් මාලිගයේ සිටින අය අවදි වී ඒ හඬ කුමක්දැයි සොයා බලනු ඇත.

ජැක් වහා කවුළුවෙන් ඇතුළට රිංගා වකුටු වී නිහඬව සිටියේය. ඔහු එසේ මිනිත්තු හතරක් පහක් සිටින්නට ඇත. කිකී ද ඔහු වෙත යළි පියඹා ආවේය. අවසානයේ නැඟිටගත් ඔහු කවුළුවෙන් පිටතට එබී බැලුවේය. කිසිවකු පැමිණ නැතිසේය. විදුලි පන්දමක හෝ ලන්තෑරුමක එළියක් ඔහුට නොපෙනිණි. මාලිගයේ එම කොටසේ කිසිවකු වාසය කරන්නේ නැතුවා වන්නට පුළුවනැයි ඔහු සිතුවේය. කිසිවකු වාසය කළා නම් එම පුද්ගලයාට අනිවාර්යයෙන්ම ඉණිමග වහලය දිගේ රූටා පහළට වැටුණු ශබ්දය ඇසිය යුතුව තිබිණි.

විදුලි පන්දම දල්වා තමා සිටින්නේ කොතැනකද කියා පරීක්ෂා කළ යුතුද? ඔහු තවත් මිනිත්තුවක් පමණ නිවාඩුව සිට එක ක්ෂණයට විදුලි පන්දම දල්වා යළි එය නිවා දැමුවේය. ඒ ක්ෂණයේ ඔහු අවශ්‍ය දෑ දැකගත්තේය. ඔහු සිටියේ ගෘහ භාණ්ඩ එක පිට එක ගොඩ ගසා තිබූ කුඩා කාමරයකය.

''මං හිතන්නේ අතිරේක ගෘහ භාණ්ඩ ගබඩා කර තිබෙන කාමරයක්'' ඔහු සිතුවේය. ''යමු කිකී.... හැබැයි මතක තියා ගන්න... දැන් අපි මෙතැනින් පිටවෙන්න වෙනිං මාර්ගයක් හොයා ගන්න ඕනෙ. අපි ආව මේ මාර්ගයෙන් අපට ආපහු යන්න බැහැ. දැන් ඉණිමඟ තියෙන්නේ බිම''

දොරෙන් පිටතට ආ ඔහු පිවිසියේ කොරිඩෝරයකටය. කිසිම ශබ්දයක් ඔහුට ඇසුණේ නැත. හාත්පස පැවතියේ ගන කළුවරකි. ඔහු යළිත් විදුලි පන්දම දැල්වූයේය. ඔව්. කළුගලින් තැනුණු එම කොරිඩෝරයේ බිමට බුමුතුරුණු පවා එළා නොතිබිණි. පුටු හෝ වෙනත් ගෘහ භාණ්ඩ ද එහි නොවූ අතර එය මාළිගයේ කිසිවකු පාවිච්චි නොකරන කොටසක් බව පැහැදිලිව පෙනිණි.

ඔහු කොරිඩෝරය දිගේ ඇවිද ගියේය. රබර් අඩි සහිත පාවහන් නිසා ඒවායෙන් හඬක් නොනැඟිණි. එම කොරිඩෝරයේ කෙළවර විශාල කවුළුවක් තිබිණි. ඊට යොදා තිබුණේ විවිධ වර්ණයන්ගෙන් යුත් වීදුරුය. එතැනින් හැරී ජැක් තවත් කොරිඩෝරයකට පිවිසුණේය. දිගු හා පෙර කොරිඩෝරයට වඩා පළල් එකක් වූ එහි ද බුමුතුරුණු හෝ ගෘහභාණ්ඩ නොතිබිණි.



එසේ වුව එම කොරිඩෝරයේ මැදක් දුර ඇවිද යද්දී සියල්ල වෙනස් විය. ඔහු පිවිසියේ බුමුතුරුණු හා සුව පහසු ගෘහ භාණ්ඩ සහිත කොටසකටය. විශාල චිත්‍ර බිත්ති මත එල්ලා තිබිණි.

''දැන් මම පරෙස්සම් වෙන්න ඕනෙ'' ජැක් සිතුවේය. ''ඔන් අර අතන රවුම් මේසය මත ලාම්පුවක්. ඒකෙන් විහිදෙන්නේ අඩු ආලෝකයක් වුණත් කාට හරි මාව පෙනෙන්න ඒ එළිය ඇති''

ඉදිරියට ගිය ඔහු විවෘත වූ දොරක් දුටුවේය. ඔහු කුතුහලයෙන් යුතුව එම කාමරයට එබී බැලුවේය. විදුලි පන්දමේ ආලෝකයෙන් ඔහු දුටුවේ එහි බිත්ති මත චිත්‍ර හා කැඩපත් බොහෝ ගණනක් එල්ලා ඇති ආකාරයයි. කාමරය මැද හොඳින් ඔප දැමූ රවුම් හැඩැති විශාල මේසයක් තිබිණි.

ඔහු නැවතත් කොරිඩෝරය දිගේ ඉදිරියට ගමන් කළේ කුමක් කළ යුතුදැයි සිතමිනි. ළමයින් රඳවා සිටින්නේ යැයි හේලා කී ගොඩනැගිලි කොටස ඇත්තේ කොයි පැත්තේද? ජැක් ගමන් කළ යුත්තේ ඒ පැත්තට වුව එම පැත්ත නිවැරදිව සොයා ගන්නේ කෙසේද? කොරිඩෝරය දිගේ ඉදිරියටම ගමන් කළ යුතු යැයි ඔහු සිතුවේය. ඉක්මනින්ම ඔහුට පඩිපෙළක් හමුවනු ඇත. ඒ පඩිපෙළ මාලිගයේ තවත් කොටසකට යන්නක් විය හැක. ඔහු ළඟා වූයේ විවෘතව තිබූ තවත් දොරක් අසලටය. ඔහු එම දොරෙන් ද එබී බැලුවේය.

එය කොතරම් විශිෂ්ට මාලිගයක්ද? එහි කොතරම් වටිනා ගෘහ භාණ්ඩ තිබේද? තමා මේ බලාසිටින්නේ මාලිගයේ පුස්තකාලය දෙස බව ජැක්ට වැටහිණි. ගෙබිම සිට සිවිලිම දක්වා උස් වූ රාක්ක රැසක පොත් දස දහස් ගණනක් අසුරා තිබිණි. දෙවියනි. මේ සියලු පොත් එක් අයෙකුට සිය ජීවිත කාලය ඇතුළත කියවා හමාර කළ හැකිද? කොහෙත්ම නුපුළුවන.

ශබ්දයක් ඇසුණු වහා ජැක් සිය විදුලි පන්දම නිවා දමා ගල් ගැසී සිටියේය. එම හඬ නැඟුණේ ඔහු සිටි පුස්තකාල කාමරය ඇතුළතින්මය. එම ශබ්දය ඇසුණේ ජැක්ගේ පසුපසිනි. එය සිහින් ගෙරවීමක් බඳු ශබ්දයකි. කිකී ද ජැක් මෙන්ම විමතියට පත්ව සිටියේ එම හඬ ඇසාය.

# 19. මැදියම් රැයේ වික්‍රමය

වීර්ර්ර්ර්ර්ර් ! වීර්ර්ර්ර්ර්ර් !

''ඩිං ඩොං, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්, ඩොන්ග්''

ජැක් වහා අසල වූ අසුනක් මතට ඇද වැටුණේය. ඔහුගේ හදවත වේගයෙන් ස්පන්දනය වෙමින් තිබිණි. එය විශාල හෝරා යන්ත්‍රයකින් නැඟුණු හඬකි. මධ්‍යම රාත්‍රිය එළැඹ තිබේ. ජැක් සතුටට පත් වූයේ වේලාව මැදියම් රය නම් මාලිගයේ සියලු දෙනා තද නින්දකට පිවිස ඇතැයි සිතමිනි.

ඔහු නැඟිට දොර වෙත ඇවිද ගියේය. නැවතත් ඔහු කොරිඩෝරය දිගේ ඉදිරියට ගමන් කළ අතර ඉක්මනින්ම ඔහුට හමුවූයේ පඩි පෙළකි. ඉතා ලස්සන ගන බුමුතුරුණක් පඩිපෙළට එළා තිබිණි.

''මම හිතන්නේ මේ පඩි පෙළ යොමු වෙන්නේ මාලිගයේ ඉදිරි පස ශාලාවට ඇතුළුවන දොරටුව ආසන්නයේ ඇති ශාලාවට. ඔව්... ඒකෙන් මට යමක් හිතා ගන්න පුළුවනි. ඉදිරිපස ඇතුළුවන දොර එතැන නම් මම යන්න ඕනෙ ගොඩනැගිලි කොටස තව එහා, යමු. කිකී කොරිඩෝරය දිගේම තව ඉස්සරහට''



අවසානයක් නැතිවා සේ පෙනුණු කොරිඩෝරය දිගේ දෙදෙන තව දුරටත් ගමන් කළහ. කොරිඩෝරයේ එම කොටස් ලාම්පු වලින් ඉතා හොඳින් ආලෝකවත්ව තිබූ අතර ජැක් ඒ ගැන සතුටට පත් වූයේ නැත. ඔහුට පසුකරන්නට සිදු වූ සෑම දොරක්ම පාහේ වසා තිබිණි. ඒවා නිදන කාමර විය හැකි අතර ඔහු ඒවා පරීක්ෂා කිරීමට යාමෙන් ද වැළකී සිටියේය. ඔහු පැමිණියේ ඕක් ලීයෙන් නිමැවුණු දැවැන්ත දොරක් අබියසටය. පිලිප්ලා රඳවා තිබෙන කොටසට පිවිසෙන්නේ මෙතැනින් විය හැක. එම දොර ඔහු පසුකරගෙන ආ අනෙක් දොරවලට වඩා වෙනස් එකකි. ඔහු ඉතා සෙමෙන් එම දොරේ අගුළ කරකවා තල්ලු කළේය. එතැනින් එහා වූයේ ගල් පඩි පෙළකි. මඳ ආලෝකය සහිත ලාම්පු වලින් පඩි පෙළට ආලෝකය සැපයුන අතර ඔහු කල්පනා කළේ එම පඩිපෙළ දිගේ ඉහළට යන්නේ ද කියාය. එම පඩි පෙළ අනෙක් ළමයින් රඳවාගෙන සිටිනවා යැයි සිතෙන කොටසට යා හැකි මඟ බව ඔහු සිතුවේය.

ඇඟිලි තුඩුවලින් ඇවිදිමින් ඔහු පඩිපෙළ ඉහළට නැඟුණේය. විමතියෙන් වටපිට බැලූ ඔහුට වැටහුණේ තමන් තවත් මහලකට පිවිස ඇති බවය. පහළ මහලට වඩා වැඩි වෙනසක් එම මහලේ තිබිණි. එය ඉතා විශාල ශාලාවක් වූ අතර එහි තිබුණේ ඉතා වටිනා දොර ජනෙල් රෙදිය. එක කෙළවරක නරඹන්නන් සඳහා වෙන් වූ අසුන් පෙළක් තිබූ අතර අනෙක් කෙළවර තිබුණේ කුඩා වේදිකාවකි. ඒ මත වාද්‍ය භාණ්ඩ තිබිණි. ගෙබිම ඉතා හොඳින් ඔප දමා තිබූ අතර එම ශාලාව කුමක් දැයි ජැක් හඳිසියේම වටහා ගත්තේය.

''මේ ආලිංගන නැටුම් පැවැත්වෙන ශාලාව'' ඔහු සිතුවේය. ''හ්ම් මෙහේ මොනතරම් නැටුම් පැවැත්විලා ඇත්ද? මට ආයෙමත් මඟ වැරදිලා වගේ. නැහැ... නැහැ... මේ ශාලාවෙන් තව තැනකට යන පඩි පෙළක් හෝ කොරිඩෝරයක් තියෙන්න ඕනෙ''

ඔහු නැටුම් ශාලාව වටා ඇවිද්දේය. අනෙක් කෙළවර තිරයක්. පසුපස තිබූ දොරක් සොයා ගන්නට ජැක්ට හැකිවිය. එය විවෘත කරගෙන ඔහු පිවිසියේ ඉතා කුඩා කුටියකටය. එම කුටියේ අනෙක්

පස දොර විවෘත කළ ඔහු දුටුවේ සර්පිලාකාරව ඉහළට නැඟෙන ගල් පඩි පෙළකි.

''මේක පිලිප්ලා රඳවා සිටින කොටසට යන පඩිපෙළ වෙන්නම ඕන'' ජැක් සිතුවේ සතුටිනි. ''ආහ්... ඒ මොකක්ද?''

ඔහුට ඇසුණේ ගල් පඩි මත ගැටෙන බූට් සපත්තු වලින් නැඟෙන හඬකි. ඔහු වහා ඒ අසල වූ තිරයකට මුවා වූයේය. පාවහන් හඬ වඩ වඩාත් ළංව ඇසී යළිත් ඈතට ඇදී යන බවක් ැඟිණි ජැක් සෙමෙන් සිය හිස තිරයෙන් මැත් කර බැලුවේය. .පළ දිගේ පහළට බසිමින් සිටියේ සෙබළෙකි. තුවක්කුවක් ා මත තබා සිටි ඔහු එම කොටසේ ආරක්ෂාවට රඳවා ඇති සෙබළකු විය හැක. පහළ කොරිඩෝරයක් දිගේ ඔහු නොපෙනී ගිය අතර ඔහුගේ පියවර හඬ ද නැසී ගියේය. යළිත් වරක් ඔහු පහළ පඩි පෙළ කෙළවරට පැමිණ ඉහළට නැඟෙන්නට පටන් ගත්තේය. ඔහු සැරසී සිටියේ හේසියානු හමුදා නිල ඇඳුමෙනි. ාකස් කණ්ඩායම සමඟ එක්ව ගමනේ යෙදෙද්දී ජැක් කිහිප ාතාවක්ම නිල ඇඳුමෙන් සැරසුණු හේසියානු සොල්දාදුවන් දැක ිබිණි. ඒ සොල්දාදුවා සමහර විට හේලාගේ පියා වන්නට ද පුළුවන.

යළි ඉහළට නැඟුණු සොල්දාදුවාගේ පියවර හඬ නැසී යන තුරු පමා වූ ජැක් පඩි පෙළ දිගේ ඉහළ නැඟෙන්නට පටන් ගත්තේ තමා හා සොල්දාදුවා අතර කාල පරතරය මිනිත්තුවකට වඩා නැති බව වටහා ගනිමිනි. සොල්දාදුවා සිය මුර සංචාරයේ ළඟ වටයට හැරෙන්නට පෙර ඔහු කොහේ හෝ සැඟව ගත යුතුය. රවුම් කවුළුවක් සහිත කුඩා වේදිකාවක් අසලට ඔහු ළඟා වූයේ ශාල පෙට්ටගමක් හා ඉපැරණි පුටුවක් එතැන තිබූ අතර , එහා වූයේ අඳුරු පැහැ ඕක් ලීයෙන් නිමැවුණු දැවැන්ත දාරටුවකි. ලූසි-ඈන් ලා සිටින්නේ එම දොරෙන් පසුපස ද? ඇගේ ම කියා අඬගැසීම සුදුසුද?

දොර වෙත ඇඟිලි තුඩු වලින් ඇවිද ගිය ඔහු දොර තල්ලු ළ නමුත් එයට අගුළු ලා තිබිණි. එහි අගුළ කැරකුවද එය විවෘත ූයේ නැත. එහි යතුරු හිලක් තිබුණ ද යතුරක් නොතිබිණි. ඔහු



නැමී යතුරු හිලෙන් ඇතුළත බැලුව ද ඔහුට කිසිවක් ම නොපෙනිණි. ඔහුට කිසිම හඬක් ඇසුණේ ද නැත. කළයුතු හොඳම දෙය කුමක්දැයි ඔහු කල්පනා කළේය. දොරට තට්ටු කළොත්, එහි ඇතුළත සිටින්නේ ළමයින් නොවේ නම්, එහි සිටින අන් කිසිවකු ඒ හඬ අසනු ඇත. තමා දැකීමෙන් ඒ තැනැත්තා සතුටට පත් නොවන බවත් එම තැනැත්තාගේ අනතුරු ඇඟවීමත් සමඟ දිව එන සෙබළුන්ගෙන් තමාට ගැලවීමක් නොමැති බවත් ජැක් වටහා ගත්තේය.

ඒ සමඟම ඔහු සිය විදුලි පන්දම් එළියෙන් යමක් දැක විමතියට පත් විය. ඒ දුටු දෙය ඔහුට ඇඟවූයේ පිලිප්ලා නිසැකවම ඒ ඇතුළත සිටින බවය. දොර පහළ වූ ඉඩ පරතරය හරහා රිංගා ආ ඒ පුංචි සත්වයා සිය විශාල කළු පැහැ දෑස් පුළුල් කරගෙන ජැක් දෙස බලා සිටියේය.

''පිලිප් ගේ ඩෝමවුස්'' තමාටම මුමුණාගත් ජැක් සත්වයා වෙත පහත් විය. ''ස්නූසි, ඔයා ස්නූසි නේද? ඔයා පිලිප්ගේ හුරතලා. එහෙම නං පිලිප් මෙතන ඉන්නවා''

ඩෝමවුස් ඉතා හොඳින් හීලෑ වී සිටියේය. ළමයින් සමඟ සෑහෙන කාලයක් ජීවත්ව සිටි බැවින් ඌ ළමයින් කෙරේ බියක් දැක්වූයේ නැත. ඒ වන විට ඩිනා පවා ඌ කෙරෙහි තිබූ බිය පහ කරගෙන සිටි අතර ඌ අනෙක් ළමයින්ගේ මෙන්ම ඩිනාගේ සිරුර පුරා ද දිව යාමට පුරුදු වී සිටියේය. ඌ ජැක් ගේ අතට නැඟී විමතියෙන් මෙන් බැලුවේ ජැක්ගේ උරහිස මත සිටි කිකී දෙසය. කිකී ද ඌ දෙස බලා සිටි නමුත් ඌට හිරිහැරයක් කරන්නට සිතුවේ නැත.

''මම මෙතැන ඉන්න විත්තිය ඔයාට ඉවෙන් වගේ දැනුණාද ස්නූසි?'' ජැක් කෙඳිරිලි හඬින් විමසුවේය. ''මහ රෑ කවුද ඇවිත් ඉන්නේ කියලා බලන්නද ඔයා ආවේ? කොහොමද මම පිලිප්ව අවදි කරවාගන්නේ?''

මාලිගයෙන් පිටත සිට බකමූණකු කෑ ගසන හඬ ඇසිණි. ඒ හඬ ඇසුණු වහා බියට පත් ඩෝමවුස් ජැක්ගේ අතෙන් බිමට පැන දොරෙන් රිංගා කාමරය ඇතුළට දිව ගියේය. බකමූණාගේ

හඬ ජැක්ට අදහසක් ලබා දුන්නේය. බකමූණකුගේ හඬ අසා මුර හටයා කලබල වන්නේ නැත. දොරට යටින් කාමරය ඇතුළත සිටින පිලිප්ට ඇසෙන සේ බකමූණකු මෙන් හඬ නඟන්නට ජැක්ට පුළුවන. එම හඬ පිලිප්ට වඩා ළංව ඇසුණ ද මුර හටයාට එය ඇසෙන්නේ සෑහෙන දුරකින් නැඟෙන හඬක් ලෙසිනි. දොරට ගසනවාට වඩා එසේ කිරීම හොඳය. දොරට ගැසුවොත් එම හඬ ගල් පඩිපෙළ දිගේ දෝංකාර දී මුර හටයා එතැනට කැඳවනු ඇත.

ජැක් දොර අසල මුනින් තලා වී, මුහුණ දොර හා ගෙබිම අතර වූ පරතරයේ තබාගෙන දෑත් මුව වටා රඳවා බකමූණකු මෙන් හඬ නැඟුවේය. බකමූණකු නොව ඒ හඬ නඟන්නේ මිනිසෙකැයි කීමට බකමූණකුට පවා අපහසු වන තරමට ජැක් නැඟූ හඬ බකමූණකුගේ හඬට සමාන විය. ජැක් නැඟූ හඬ දොර යටින් ඇතුළුව කාමරය පුරා දෝංකාර දුන්නේය.

ජැක් ඇහුම්කන් දුන්නේය. ක්‍රීක් හඬක් ඇසිණි. එය යහනකින් නැඟුණු හඬක් ද? ඊළඟට ඔහුට ඇසුණේ පිලිප් ගේ කට හඬය.

''ගුසී, ඇහුණ ද බකමූණෙක් කෑ ගහනවා. හරියට මේ කාමරේ ඇතුළේ වගෙයි''

එහෙත් ගුසී තද නින්දකට පිවිස සිටිනවා විය හැක. ජැක්ට ඔහු පිළිතුරු දෙනු නොඇසුණේ එහෙයින් විය යුතුය. ජැක් නැඟිට සිය මුව දොරට තබා ගත්තේය. උද්යෝගය නිසා ඔහුගේ සිරුර වෙව්ලමින් තිබිණි. ''පිලිප්.... පිලිප්...''

විමතිය පළ කරන හඬක් පළමුව ඇසිණි. ඊළඟට ඇසුණේ පිලිප්ගේ කට හඬය. ''කවුද ඒ? කවුද මට කතා කරන්නේ?''

''මම.... ජැක්... දොර ළඟට එන්න''

කාමරය ඇතුළතින් පළමුව පියවර හඬක් ද ඊළඟට යතුරු හිල ආසන්නයෙන් හුස්ම ගන්නා හඬක් ද ඇසිණි.

''දෙයියෝ සාක්කි. ජැක්.. ඔයා කොහොමද මෙහාට ආවේ? ජැක් මේ මොන තරම් පුදුමයක්ද?''



''මගේ කතාව කියන්න වෙලාවක් නැහැ'' ජැක් මිමිණුවේය. ''ඔයා හොඳින්ද? කොහොමද ලූසී-ඈන්?''

''අපි හැමෝම සනීපෙන්'' පිලිප් කීවේය. ''අපි මෙහාට ආවෙ ගුවන්...''

''ඒ ටික මම දන්නවා'' ජැක් කීවේය. ''කියන්න. ඉන් පස්සෙ මොනවද වුණේ?''

''කාරෙකකින් අපිව මෙහාට ගෙනාවා'' යතුරු හිල ආසන්නයේ තම මුව තබාගෙන පිලිප් මිමිනුවේය. ''ගුසී අසනීපයෙන්. අපිට කාරෙකේදී මැඩම් ටැටිඕසා මුණගැහුණා. එයා ගුසී ගැන හරිම කේන්තියෙනුයි ඉන්නේ. එයා මේ මාලිගාවේ ඉන්නවා.... එයාගේ සහෝදරයා පැරිටෝලෙන් සිටුවරයාත්. එළියේ මොනවා වෙනවාද කියලා අපි දන්නේ නැහැ. ඔයා දන්නවාද? ගුසී ඉන්නේ එයාගේ බාප්පා ගැන කනගාටුවෙන්''

''මම දන්නා තරමට එයාගේ බාප්පා තවම සිහසුනේ ඉන්නවා'' ජැක් කීවේය. ''ඒත් මට හිතෙන විදියට ඉක්මනින්ම මොන මොනවා හරි වේවි. එහෙම වුණොත් ගුසී අමාරුවේ වැටෙනවා''

''ජැක් ඔයාට පුළුවනි ද අපිව බේරාගන්න'' පිලිප්ගේ ස්වරයෙහි වූයේ බලාපොරොත්තු සහගත බවකි. ''කොහොමද ඔයා මෙහාට ආවේ? මං හිතාන හිටියේ තවම ඔයා හැතැප්ම දාස් ගාණක් ඈති ගල් වළ ළඟ නිවහනේ කියලා. ඒත් ඔයා මෙතැන. මේ දොරෙන් එහා පැත්තෙ. ෂික්. අපරාදෙ මේ දොර අගුළු දාලා''

''ඔව්. යතුර තියෙන්නේ කොහේද කියලා දන්නවානම් ඉතිරි ටික හරිම පහසුයි. ඔය කාමරේ කවුළුව තියෙන්නේ උතුරු පැත්තට ද නැගෙනහිරට ද?''

''උතුරට'' පිලිප් කීවේය. ''හරියට සණ්ඨාර කුළුන පිටිපස්සෙන්. ගුසී කියනවා ඒ සණ්ඨාරේ ගහනවා නම් ඒ අනතුරු අඟවන්න කියලා. සතුරු සේනා ඈත එනවා දක්කාම අතීතයේ ගැහැව්වේ ඒ සණ්ඨාරෙලු. අපි දැන් දන්නවා ඔයා මෙහේ කියලා. අපට බලාපොරොත්තු තියා ගන්න පුළුවනි''

''ලුසී-ඈන් ආදරෙන් මතක් කළා කියන්න'' ජැක් කීවේය. ''එයාලා ඉන්නෙත් ඔය කාමරේමද?''

''නැහැ. ගෑනු ළමයින් වෙන කාමරයක. මං ගිහින් එයාලාව අවදි කරවන්නද? ඔයා එක්ක කතා කරන්න එයාලා හුඟක් කැමති වේවි''

''ඔව්'' එහෙත් ඒ සමඟම ජැක් ගල් ගැසුණේය. මුර භටයාගේ පියවර හඬ පඩි පෙළ ඉහළින් ඇසෙමින් තිබිණි. ''කවුදෝ එනවා'' ජැක් මිමිණුවේය. ''ආයෙත් මම එන්න උත්සාහ කරන්නම්. අපි මොකක් හරි සැලැස්මක් හදා ගනිමු''

ජැක් වටපිට බැලුවේය. මුර භටයා පැමිණෙන්නේ තමන් කතා කළ හඬ ඇසී දැයි ඔහු කල්පනා කළේය. එතැන සැඟව ගන්නට තැනක් තිබුණේ ද නැත. ඔහු වහා එතැන වූ පෙට්ටගම විවෘත කොට බැලුවේය. එහි තිබුණේ කඩමාලු කිහිපයක් පමණි. ජැක් වහා කිකී ද සමඟ පෙට්ටගම ඇතුළට පිවිස පියන වසා ගත්තේය. ඒ මොහොතේම එතැනට පැමිණි මුර භටයා සිය අතක වූ ලන්තෑරුම ඔසවා අවට පරීක්ෂා කළේය. සියල්ල හොඳිනි. ඔහු පඩිපෙළ පහළට බසින්නට පටන් ගත්තේය. සෙබළාගේ පියවර හඬ ඈතට ඇදී යද්දී ජැක්ට සැහැල්ලුවක් දැනිණි. ඔහු පෙට්ටගමෙන් පිටතට පැමිණ යළි සවන් දුන්නේය.

යතුරු හිල හරහා යළිත් පිලිප්ගේ හඬ ඇසිණි. ''එයා ගියා. එයා එන්නේ පැයකට සැරයක්. ජැක් කොහොමද කිකී?''

''එයා දුනුත් මාත් එක්ක'' ජැක් පැවසුවේය. කිකී සර්කසයේ ලබා ඇති ජනප්‍රියත්වය ගැන පිලිප්ට පැවසීමට සිතුවත්, ඊළඟ මොහොතේ ජැක්ට සිතුණේ තමා ටෞරි-හේසියාවට පැමිණි ආකාරය හා අනෙක් සිද්ධි නොකියා එයා පමණක් කීමෙන් ඵලක් නැති බවය.

කිකී යතුරු හිලට ළංව කෙඳිරුවේය. ''නාසය පිසගන්න. දොර වහන්න. ඩිං ඩොං බෙල්. දෙවියන් වහන්සේ රජතුමා රැක ගනිත්වා!''



''ඔයාගේ කට හඬ ආයෙ අහන්න ලැබුණට සතුටුයි කිකී'' පිලිප් කීවේය. ''මම ලුසී ඈන්ලාට කතා කරන්නද?''

''එපා'' ජැක් පැවසුවේය. ''මම ආපහු යන්න ඕනෙ. ආයෙත් මුණගැහෙමු පිලිප්''

ඔහු පඩිපෙළ දිගේ සෙමෙන් පහළට බැස්සේය. නතර වී ඔහු සවන් දුන්නේය. මුර භටයා කොහිද? ඔහු නැවත පහළ කොරිඩෝරය දිගේ ඇවිද යනවාද? ජැක් නැවත නැටුම් ශාලාවට ඇතුළු වී මොහොතක් නතර වී එහි තිබූ මඳ ආලෝකයෙන් වටපිට බැලුවේය.

ශාලාව කෙළවර තිබූ මිනිසකුගේ උසට සමාන චිත්‍රයක් සෙමෙන් චලනය විය. පසෙකට වූ චිත්‍රය මුලින් තිබූ තැන වූයේ අඳුරු කුහරයකි.

''දෙවියනි, මේ සිදුවන්නේ කුමක්ද?''

# 20. රහස් මඟ

එම අඳුරු සිදුරෙන් පිටතට ආවේ මිනිසෙකි. ජැක් එකවර එම පුද්ගලයා කවුරුන්දැයි හඳුනාගත්තේ නැත. එහෙත් ඔහු එක ඇසකට පමණක් උපැසක් පැළඳ සිටියේය.

''සිටුවරයා'' ඔහු සිතුවේය. ''මේ මහ රෑ එයා මෙතැන මොනවා කරනවාද?''

ඒ සමඟම සිටුවරයා සිටි තැනට මඳක් ඈතින් දොරක් විවෘත විය. එතැනින් පිටතට ආවේ කාන්තාවකි. ඇය කවුරුන්දැයි ජැක් වහා හඳුනාගත්තේය. ඒ ගල් වළ ළඟ නිවහනේදී රෝගාතුර කාන්තාවක ලෙස රඟ පෑ, අගමැති බිරිය මැඩම් ටැටිඕසාය.

එය ඇය හා ඇගේ සොහොයුරා අතර රහසිගත හමුවක් බව පෙනිණි. ඔහු පැමිණියේ කොහි සිටද? ඔහු කලබලයට පත්ව සිටින වගක් පෙනෙන්නේ ඇයි? දෙදෙන ඉක්මනින් කතා බස් කළ අතර මැඩම් ටැටිඕසා මහත් සතුටට පත් වූ වගක් පෙනිණි. ඇය ඔහුගේ දෙකම්මුල් සිප ඔහුගේ පිටට තට්ටු කළාය.

''එයාගේ සැලසුම් මොනවා වුණත් ඒවා සාර්ථක වෙලා වගේ'' ජැක් සිතුවේය.

''මම හිතන්නේ රජතුමා ගැන. මේ අය රජතුමා ඉක්මනින්ම අල්ලාගන්න සූදානම් වගේ. එහෙම වුණොත් ඉක්මනට ගුසී කාමරයෙන් පිටතට අරන් සිංහාසනයේ හිඳුවාවි. ඒ වුණාට



සිටුවරයාගේ පෙනුම නං හොඳ නෑ වගේ. මිනිහා කලබල වෙලා. ඔව්, අද රෑම මොකක් හරි කෙරෙනවා වගේ''

තව දුරටත් චුවමනාවෙන් කතා බස් කරමින් ඔවුන් දෙදෙනා පිවිසියේ මැඩම් ටැටිඕසාගේ කාමරයටය. දොර වැසිණි. වීදුරු ගැටෙන හඬක් ජැක්ට ඇසිණි. ඔවුන් ජයපැන් බොනවාද? මොනවා හෝ සිදුවෙමින් තිබේ. තමා සමඟ බිල් ද සිටියා නම් මැනවැයි ජැක්ට සිතිණි. එහෙත් ළමයින් පස් දෙනාම මේ වන විට ටෞරි හේසියාවේ යැයි බිල් නිකමටවත් නොසිතනවා නිසැකය. ගුවන් යානයෙන් ඔවුන් මෙහි පැමිණි ආකාරය ගැන සිතන්නට පවා බිල්ට අපහසුය. ඔහු එංගලන්තය පුරා ළමයින් සොයනවා විය හැක.

ජැක් බිත්තියේ වූ සිදුර දෙස බැලුවේය. එතැනින් යා හැක්කේ කොතැනටද? ඒ මඟ ගොස් බැලිය යුතු යැයි ජැක්ට සිතිණි. අසල කාමරය ඇතුළත කතා බහ සහ වීදුරු ගැටෙන හඬ තවදුරටත් ඔහුට ඇසිණි. ඔහු වහා සිදුර අසලට විත් ඇතුළට එබී බැලුවේය. අඳුර මිස වෙනත් කිසිවක් ඔහුට නොපෙනිණි. ඒ සමඟ ඔහුට ඇසුණේ මැඩම් ටැටිඕසාගේ කාමරයේ දොර විවෘත වන හඬය. කළ හැකි අන් කිසිවක් ඉතිරිව නොතිබුණෙන් ඔහු සිදුර ඇතුළට පිවිසියේය. එතැන පඩි පෙළක් වූ අතර හරි හැටි පය නොතැබීම නිසා ඇද වැටුණු ඔහු පඩි පෙළ පහළට රෝල් වී ගියේය. රෝල් වී යාම නතර වූ පසු ඔහු මහත් කල්පනාවෙන් ඇහුම්කන් දුන්නේ තම ඇද වැටීම සිටුවරයාට හා ඔහුගේ සොහොයුරියට ඇසී ඇත් ද කියාය.

නැත. පඩිපෙළ ඉහළින් තව දුරටත් යාන්තමට ඔහුට ඇසුණේ ඔහුගේ කතා බහය. ඒ සමඟම ඔහුට තවත් හඬක් ඇසිණි. යමක් චලනය වන හඬ ඔහුට ඇසෙද්දී සිදුරේ කෙළවරින් ආ මඳ ආලෝකය සම්පූර්ණයෙන්ම නැති වී ගියේය.

''හිහ්... චිත්‍රයෙන් අර සිදුරු වැහුණා. දැන් මම මේක ඇතුළේ කොටු වුණා'' ජැක් සිතුවේ බියපත් සිතිණි. නැවත පඩිපෙළ දිගේ ඉහළට නැග ගත් ඔහු චිත්‍රය පසුපස අල්ලා බැලුවේය. තද දූවයෙන් තැනී තිබූ එම චිත්‍රයේ පසුපස, බිත්තියේ සිදුරට හරි හැටි ගැළපී

තදින් වැසී තිබිණි. ඔහු එය තල්ලු කර බැලුව ද එය සෙලවුණේ හෝ නැත. එය තල්ලු කිරීමට ඔහු වැඩිපුර උත්සාහ නොකළේ යම් හඬක් නැගුණොත් එය සිටුවරයාට ඇසෙනු ඇත යන බියෙනි.

විදුලි පන්දම දල් වු ඔහු දුටුවේ පඩිපෙළ කෙළවර පටු උමගක් තිබෙන බවය. එහෙත් ඔහුට පෙනුණේ එම පටු උමඟ මාලිගයේ අභ්‍යන්තරය දෙසට විහිදෙන බවකි. ඒ දිගේ ගමන් කළ ඔහු පිවිසියේ පහළ මහලකටය. ඒ සමඟම දකුණු පස තිබුණේ එක එල්ලේ පහළට බසින පඩි පෙළකි. විදුලි පන්දමේ ආධාරය ඇතිව-ඔහු එම පඩි පෙළ දිගේ පහළට බැස්සේය. ඔහුට හමු වූයේ තවත් කුඩා කුටියකි. එහි වම් පස බිත්තියෙන් ආලෝක ධාරාවක් ඒ ඇතුළට වැටී තිබිණි. මේ කුටිය කුමක්ද?

වම් පස බිත්තියේ වූ කුඩා සිදුරකින් කාමරය ඇතුළට ආලෝකය වැටී තිබූ අතර එය නිතර පාවිච්චියට ගැනෙන කුටියක් සේ පෙනිණි. එහි මැද රවුම් මේසයක් හා ඒ වටා පුටු ද තිබූ අතර මේසය මත කඩදාසි කිහිපයක් තිබෙන අයුරු ද ජැක්ට දැකගත හැකි විය.

''හ්ම්.... ඔත්තුකාරයන් රහසේ මුණ ගැහෙන තැනක් වගේ'' ජැක් කල්පනා කළේය. ''අපි තව ඉස්සරහට යමු''

පටු උමං මඟ පහළට යොමු වූ නමුත් එවර එහි පඩි පෙළක් තිබුණේ නැත. එය නොඋස් උමඟක් වූ නිසා ජැක්ට සිදු වූයේ හිස නමාගෙන ගමන් කරන්නටය. එය දෙදෙනකුට මාරු විය නොහැකි තරමට පටු මඟක් ද විය. කිකී විරෝධය පෑවේ එම උමගේ ඉහළ කිකීගේ හිසේ ද ගැවුණු බැවිනි.

හදිසියේ උමඟ කෙළවර තිබුණේ කුඩා රවුම් හැඩැති කුටියකි. එහි පැරණි සුන්බුන් ගොඩ ගසා තිබිණි. ඊට ඇතුළු වීමට තිබුණේ පටු රවුම් සිදුරකි. ජැක් ඒ සිදුරෙන් පිටතට රිංගන විට සිතුවේ තමන් සර්කසයේ ලොක්කා තරම් තර නොවීම භාග්‍යයක් බවය.

''මෙතනින් අපට කොහාට ද යන්න වෙන්නේ?'' ජැක් සිතුවේය. ඔහු විදුලි පන්දම දල්වා හාත්පස පරීක්ෂා කළේය. සුන්බුන් මිස එතැන ද වෙනත් කිසිවක් නොවී ද ඔහු ඉහට ඉහළ සිවිලිමට



විදුලි පන්දමේ ආලෝකය යොමු කළේය. ඒ සිවිලිම පිහිටා තිබුණේ ඔහුගේ හිසට අඟල් දෙක තුනක් ඉහළිනි.

'ඕහ්... බිම් දොරක්. ඔව් බිම් දොරක්. මේක ඇරගන්න පුළුවන් වෙච්ද දන්නේ නැහැ''

ජැක් වෙර යොදා බිම් දොර තල්ලු කළ අතර එය විවෘත විය. එහි පියන අනෙක් පසට වැටුණේ මහ හඬක් නගාගෙනය. ජැක් බියට පත් වූ අතර කිකී ද තිගැස්සී හඬ නැගුවේය. කිසිවකු දිව ආවේ නැත. ''ඔය කවුද?'' යි කිසිවකු හඬ නගා විමසුවේ ද නැත. මිනිත්තුවක් පමණ නිහඬව සිටි ජැක් සිදුරෙන් ඉහළට හිස යොමා බැලුවේය. තමා දැන් සිටින්නේ කොහිද? තමා බියකරු සිහිනයකට මැදිව සිටින්නා සේ ඔහුට දැනිණි. උමං මාර්ග, පඩිපෙළ, කුඩා කුටි, බිම් දොර... ඊළඟට කුමක්ද?

ඔහු නැවත විදුලි පන්දම දල්වා අවට පිරික්සුවේ බිම් දොරෙන් ඉහළට නැගීමෙන් අනතුරුවය. ඔහු සිටියේ ඉතා උස්, එහෙත් පටු, කළු ගලින් තැනුණු ගොඩනැගිල්ලක් ඇතුළතය. විදුලි පන්දම ඉහළට ඇල්ලූ වහා තමා සිටින්නේ කොහිදැයි ජැක් අවබෝධ කර ගත්තේය.

''සණ්ඨාර කුළුණ. පිලිප් ගේ කාමරය ඉස්සරහා තියෙන සණ්ඨාර කුළුණ. එහෙම නං මම ආවේ මාලිගාවට යන්න තියෙන රහස් උමඟක් හරහා. හොඳ සොයා ගැනීමක්''

ඔහු සණ්ඨාර කුළුණේ දොර වෙත පා නැගුවේය. එහි දොරක් වෙනුවට තිබුණේ ආරුක්කුවකි. එය තනා තිබුණේ විශාල සණ්ඨාරය සඳහා මිස වෙනත් කිසිම කාරණයක්, අවශ්‍යතාවක් සඳහා නොවේ.

බිම් දොර වැසූ ඔහු ඊළඟට අනාවරණය කර ගත්තේ මහත් සතුටක් හා සැහැල්ලුවක් දනවන කාරණයකි. සණ්ඨාර කුළුණ පිහිටා තිබුණේ මාලිගය වටා වූ පවුරුවලට පිටතිනි. ඔහුට කිසිම බාධාවකින් තොරව එක එල්ලේ සර්කස් භූමියට දිව යා හැකිව තිබිණි.

''ඒක නම් ලොකු වාසනාවක්'' ජැක් සිතුවේය. ''දැන් යමු කිකී. ගිහිං ටිකක් නිදාගනිමු''

වැඩි වේලාවක් ගතවන්නට පෙර ජැක් යළි පෙඩ්රෝගේ වෑන් රියට රිංගා ගත්තේය. පෙඩ්රෝ අවදි වූයේ නැත. මෙට්ටය මත වැතිරගත් ජැක් කල්පනාවට වැටුණේය.

ලුසී-ඈන් හා අනෙක් ළමයින් කරදරයක් නැතිව සිටීම ජැක්ගේ සතුටට හේතු විය. ගුසී සිහසුනට නැංවෙන තුරු පිලිප්ට ඩිනාට හා ලුසී ඈන්ට ආරක්ෂාව ලැබෙනු ඇත. බ්‍රිතාන්‍යය ගුසීගේ බාප්පාගේ පස ගෙන ඔහු නැවත සිහසුනට පත් කරවන්නැයි බලපෑම් කළහොත් ළමයින් තිදෙන ප්‍රාණ ඇපකරුවන් බවට පත්වනු නිසැකය. බ්‍රිතාන්‍ය රජය තමන් අපහසුවට පත් කරවන ක්‍රියාමාර්ග ගතහොත් ළමයින් ප්‍රාණ ඇපකරුවන් ලෙස සලකමින් ඕනෑම බිහිසුණු දෙයක් කිරීමට පැරිටෝලෙන් සිටුවරයා හා මැඩම් ටැටිඕසා පසුබට නොවන බව ජැක්ට වැටහිණි.

''ගුසීගේ බාප්පා අත්අඩංගුවට පත් වන්නට හා ගුසී සිහසුනට නංවන්නට කලින් ඒ අයව බේරාගන්න වෙනවා'' ජැක් කල්පනා කළේය. ''මම කොහොම හරි බිල්ට මේවා දන්වන්න ඕනෙ. ඒත් ඒක ලේසි වෙන්නෙ නැහැ. මේ පැත්තේ මිනිස්සු සිටුවරයාට පක්ෂපාතියි. බයයි. බිල්ට හැමදේම දන්වන්න උත්සාහ කළොත් මාව අහුවේවි''

කල්පනා කරමින් සිටින අතරතුර ජැක් වෙත නින්ද ළඟා වූයේ ඔහුටත් නොදැනීය. විශාල වික්‍රමයක නියැලී මහත් වෙහෙසට පත්ව සිටි ඔහු පසුදා උදෑසන ෆෑන්ක් මහතාගේ වලසුන් මහ හඬින් කලබල කරන විට පවා අවදි වූයේ නැත. වලස්සු තම කූඩු කඩා ගෙන පිටතට ඒමට උත්සාහ දරූහ.

උදෑසන ආහාර ගන්නා අතරතුර පෙඩ්රෝ ජැක්ට සියලු විස්තර පැවසුවේය. ''කවුරුවත් උන්ගේ කූඩු ළඟට යන්නේ නැහැ. උන් තවම එකිනෙකා කා ගන්න පටන් අරගෙන නම් නැහැ. ඒත් උන් ඉක්මනටම ඒ තත්ත්වයට වැටේවි. එහෙම වුණොත් ආයෙත් උන්ගෙන් මේ සර්කස් එකට වැඩක් නැහැ''

''තවම ෆෑන්ක් මහත්මයාට සනීප නැද්ද?''

''නැහැ. අසනීප තත්ත්වය නරක අතට හැරිලා'' පෙඩ්රෝ පිළිතුරු දුන්නේය. ''ලොක්කාත් හිත නරක් කරගෙන. අර සතුන්



ගැන දන්න ඔයාගේ යාළුවා ඉන්නේ මේ ළඟද? ඔයා කිව තරමට එයා දක්ෂ නං සමහර විට එයාට පුළුවන් වේවි වලසුන් කීකරු කරගන්න''

ජැක් වහා නැඟී සිට සිතන්නට පටන් ගත්තේය. පිලිප්ට වලසුන් කීකරු කර ගන්නට හැකි වෙතැයි ජැක් විශ්වාස කළේය. එහෙත් පිලිප් සිටින්නේ කොතැනදැයි පෙඩ්රෝට පවසන්නේ කෙසේද? එසේ පැවසුවද පිලිප් ඇතුළු පිරිස බේරාගන්නට පෙඩ්රෝ උපකාර කරනු ඇත්ද?

''මොනවද කල්පනා කරන්නේ?'' ජැක් දෙස කුතුහලයෙන් යුතුව බලමින් පෙඩ්රෝ විමසුවේය. ''ඔයාට මොකක් හරි ප්‍රශ්නයක්ද?''

''මෙහෙමයි.... මට යාළුවාව එක්කරගෙන එන්න පුළුවනි. ඒත් ඒකට මට උදව් ඕනෙ'' ජැක් කීවේය. ''එයා ඉන්නේ මේ ළඟම''

''ඇත්තටම? ඇයි ඔයා මට නොකිව්වේ? කොහේද එයා ඉන්නේ?''

ජැක් යළි කල්පනා කළේය. පෙඩ්රෝ ගැන විශ්වාසය තැබිය හැකිද? ඔහු පෙඩ්රෝගෙන් මෙසේ විමසුවේය. ''පෙඩ්රෝ... මට ඇත්තම කියන්න. රජතුමා හා අලොයිසියස් කුමාරයා අතර ප්‍රශ්නෙදි ඔයා කාගේ පැත්ත ද අරං ඉන්නේ? මම අහන්නේ... ඒ ගැන ඔයා මොනවාද හිතන්නේ?''

''කිසිම පැත්තක් අරං නැහැ'' පෙඩ්රෝ එක එල්ලේ පිළිතුරු දුන්නේය. ''කවුරු රජ වුණත් මට ප්‍රශ්නයක් නැහැ. ඒ වුණාට මේ රටේ සිවිල් යුද්ධයක් ඇති වෙනවා දකින්න නං මට වුවමනා නැහැ. එහෙම වුණොත් අපි ඉක්මනට රටෙන් පිටවෙන්න ඕනෙ. යුද්ධය එක්ක සර්කස් පෙන්නන්න බැහැනෙ. ඇයි ඔයා මගෙන් එහෙම ඇහැව්වෙ?''

''ඒ ගැන මම ඔයාට පස්සෙ කියන්නම්'' තමා පමණට වඩා පෙඩ්රෝ හා කතා කළ බව අවබෝධ කර ගත් ජැක් පැවසුවේය. ''ඒත් මම මේ ටික කියන්නම්... මට මගේ යාළුවාව... අනෙක්

යාළුවන් එක්කම මෙහාට එක්කරගෙන එන්න පුළුවන් වුණොත්, සිවිල් යුද්ධයක් ඇතිවීම වැළකේවි. ෆැන්ක්ගේ වලසුන් පවා ඉක්මනින්ම...''

''මොනවාද ඔයා මේ කතා කරන විකාර?'' පෙඩ්රෝ විමසුවේ කුතුහලයෙන් මෙනි.

ජැක් තවත් කිසිවක් පැවසුවේ නැත. එහෙත් මධ්‍යාහ්නය වන විටද ෆැන්ක් සුවයක් නොලැබූ අතර වලසුන්ගේ තත්ත්වය තවත් නරක අතට හැරිණි. සියල්ල පෙඩ්රෝට පවසන්නේ ද යන්න ගැන ජැක් කල්පනා කළේය. පිලිප් හා අනෙක් අය එහි කැඳවාගෙන ආ හැකි නම් ඔවුනට සැඟව ගන්නට සර්කසය ඉතා හොඳ ස්ථානයකි. එහෙත් ගුසි හසුවීමට ඉඩ තිබේ. ඔහුගේ වෙස් මාරු කළ යුතුය. ඒ කොයි අන්දමකටද?

''හරි... එයාගෙ කොණ්ඩෙ දිගයි. ඇහි බැම ගනයි. ඇස් කළු පාටයි. එයාට පුළුවනි ගෑනු ළමයෙක් වගේ අඳින්න'' ජැක් සිතුවේය. ''අද සර්කස් දර්ශනයෙන් පස්සෙ සේරම එයාට කියනවා''

බොර්කෙන් හිදී සර්කස් කණ්ඩායම ප්‍රථම දර්ශනය ඉදිරිපත් කළේය. එහෙත් වලසුන්ගේ දර්ශන ගැන පූර්ව ප්‍රචාරයන් ලබා දී තිබූ නිසා නරඹන්නන් පැමිණ සිටියේ එම දර්ශන ද නරඹන අපේක්ෂාවෙනි. එම අපේක්ෂා බිඳගත් සමහර ප්‍රේක්ෂකයෝ මුදල් ආපසු ඉල්ලා සිටියහ.

''අපි කොහොම හරි වලසුන්ගේ දර්ශන ඉදිරිපත් කරන්න ඕනෙ'' සර්කසයේ ලොක්කා ගර්ජනා කළේය. ''අපි කොහොම හරි ෆැන්ක් සනීප කර ගන්න ඕනෙ. නැත්නං වලසුන් පාලනය කරගන්න පුළුවන් වෙන කාව හරි ගෙනෙන්න ඕනෙ. කෝ ෆැන්ක්? අර වලසුන් ඉක්මනට ම පොර කාලා මරා ගනීවි''

ආහාර ගැනීමෙන් අනතුරුව ජැක් පෙඩ්රෝට කතා කළේය. ''මට ඔයාට කියන්න හුඟාක් දේවල් තියෙනවා'' ඔහු කීවේය. ''මට ඔයාගේ උදව් ඕනෙ පෙඩ්රෝ. මේක හුඟාක් වැදගත්''

''මම අහගෙන ඉන්නේ'' පෙඩ්රෝ කීවේ එක එල්ලේ ජැක් දෙස බලමිනි. ''හැම දෙයක්ම මට කියන්න. මම ඔයාට උදව් කරන්න පොරොන්දු වෙනවා. ඔව්... සහතිකයි.''

# 21. සැලැස්ම

''කොහාටද අපි යන්නේ?'' ජැක් විමසුවේය. ''ඔයාගේ වෑන් එකට? මේ කතාව කාටවත් ඇහෙන්න බැහැ. එහාට යමුද?''

ඔවුහු වෑන් රියට නැඟී දොර වසාගත්හ. පෙඩ්රෝ විස්මිත භාවයට පත්ව සිටියේය. ජැක් පවසන්නට සැරසෙන්නේ මොනවාද?

ජැක් ඔහුට සියල්ල පැවසීම ආරම්භ කළේය. ගුසි ගල් වළ ළඟ නිවහනේදී තමන් ටෞරි-හේසියාවේ රජ කුමරු වග හෙළි කළ ආකාරය ජැක් පවසන විට පෙඩ්රෝගේ දෑස් විමතියෙන් පුළුල් විය. ගුසි පැහැරගත් ආකාරය, තමා මෝටර් රථයේ ඩිකියට නැඟී හා ගුවන් යානයට රහසේ ගොඩ නැඟී ටෞරි-හේසියාවට පැමිණි ආකාරය ද ජැක් පෙඩ්රෝට විස්තර කර කීවේය.

''ඔයා නං පුදුමාකාර.... පුදුමාකාර...'' පෙඩ්රෝ ජැක් දෙස බලා සිටියේ මහත් ගෞරවයකින් යුතුවය. පෙඩ්රෝට තවත් කතා කරන්නට ඉඩ නොදුන් ජැක් තව දුරටත් තම කතාව කියාගෙන ගියේය. අවසානයේ ජැක් ඔහුට විස්තර කර කීවේ තමන් පෙරදා රැයේ යෙදුණු වික්‍රමය පිළිබඳවය.

''මගේ ජීවිතේට මම මේ වගේ කතාවක් අහලා නැහැ'' පෙඩ්රෝ විමතියෙන් යුතුව කීවේය. ''ඇයි ඊයේ රෑ එහේ යන්න මට කතා නොකළේ? ඔයා කළේ මහා භයානක දෙයක්. තනියම.....''

''මොනවා වුණත්.... මම වික්‍රමයක යෙදුණා'' ජැක් පැවසුවේය. ''මට අවශ්‍ය වුණේ කොහොම හරි මගේ සහෝදරියයි, අනෙක් අයවයි හොයා ගන්න. දැන් පෙඩ්රෝ... මට අවශ්‍ය මෙන්න මේකයි. රජතුමා පැහැර ගන්න හෝ මරා දමන්න කලින් මට ඒ හතර දෙනා බේරාගන්න ඕනෙ. එහෙම නැත්නං ගුසී රජ කෙරෙව්වොත් අපට කිසි දෙයක් කර ගන්න ලැබෙන්නෙ නැහැ. ගුසී අතුරුදහන් වුණොත් කුමන්ත්‍රණකාරයන්ට කිසිම දෙයක් කරගන්න වෙන්නෙ නැහැ. ඔවුන්ට ගුසී සිහසුනට තංවන්නම වෙනවා. ඔවුන්ට එහෙම කරන්න ඕනෙ වෙන්නෙ ළමයෙක් සිහසුනේ තබාගෙන තමන්ට අවශ්‍ය දේවල් කරගන්න පුළුවන් වෙන නිසා. ගුසී සිහසුනේ තබාගෙන අගමැතිට, මැඩම් ටැට්ඕසාට වගේම පැරිටෝලෙන් සිටුවරයාට අවශ්‍ය විදියට රටේ පාලනය ගෙනියන්න හැකි නිසා. ඔයාට වැටහෙනවාද?''

''ඔව්, මට තේරෙනවා'' පෙඩ්රෝ පැවසුවේය. ''ඒත් මට හිතාගන්න බැරි මගේ ඇස් ඉස්සරහම ඉතිහාසය මෙහෙම ලියැවෙන එක ගැන. මම ඒකෙ කොටස්කාරයෙක් වෙන එක ගැන. මේ ඇත්තමද? මට හිතාගන්න බැහැ''

''මේ සිද්ධවෙන හැමදෙයක්ම ඇත්ත'' ජැක් පැවසුවේය. ''ඇත්තම ඇත්ත. පෙඩ්රෝ අපට පිලිප් මෙහාට එක්කරගෙන එන්න පුළුවනි නම්..... පිලිප්ට පුළුවන් වේව් ෆැන්ක් වගේම වලසුන් පාලනය කර ගන්න. පිලිප්ට ඕන සතෙක් මෙල්ල කර ගන්න පුළුවන්. වතාවක් ඇල්සේෂන් බල්ලන් රංචුවක් අපි පස්සෙන් එළවාගෙන ආවා. අපි හිතුවේ ඒ වෘකයන් රංචුවක් කියලා. එක පාරම පිලිප් නතර වෙලා ආපහු හැරිලා උන්ව යාළු කර ගත්තා''

පෙඩ්රෝ සියල්ලටම හොඳින් ඇහුම්කන් දුන්නේය. පෙඩ්රෝ විමතියට පත්ව සිටි අතර ඔහු සිතුවේ ජැක් අමුතුම අන්දමක පිරිමි ළමයෙක් කියාය. එහෙත් ඔහු තමාට පැවසූ කතාව ඇදහිය නොහැක්කක් වැනිය. එසේ වුව පෙඩ්රෝ එම කතාව විශ්වාස කළේය. කිසිම දෙයක් ගැන ජැක් බොරු නොකියන බව පෙඩ්රෝ දැන සිටියේය.

''හොඳයි. දැන් මම මොනවාද කරන්න ඕනේ?'' පෙඩ්රෝ අවසානයේ විමසුවේය. ''ඇත්තෙන්ම මම ඔබට උපකාර කරන්නම්. අවංකවම ඔබට උදව් කරන්නම් ජැක්. මුර භටයන් ඉන්න



බෝර්කෙන් මාලිගාවේ හිර කරලා ඉන්න ඔයාගෙ යාළුවන් බේරා ගන්නේ කොහොමද? මට නං හිතාගන්න බැහැ. ඒක කරන්න අමාරු වැඩක්''

ජැක් කල්පනාවට වැටුණේය. එය කිරීමට අසීරු කාර්යයක් ලෙස ඔහුට ද හැඟිණි. සැලසුම් කිහිපයක්ම ඔහුගේ සිතේ ඇති වූ නමුත් ඒ කිසිම සැලැස්මක් සාර්ථක නැති වග ඔහුට වැටහිණි.

ඔහුට නැවතත් රෙදි සෝදන කුටියේ වහලයෙන් මාලිගයට යා ගත නොහැකි වන වග වැටහිණි. ඉඤිමඟ මේ වන විට මාලිගයේ ආරක්ෂකයන් විසින් සොයාගනු ලැබ එතැනින් ඉවත් කර ඇතුවාට සැක නැත. එම මාර්ගයෙන්ම මාලිගයට ගිය ද අගුළු දමා ඇති කාමරයකින් පිලිප් හා අනෙක් තිදෙන පිටතට ගන්නේ කෙසේද? කාමරයේ යතුර කොතැනකදැයි ඔහු දන්නේ නැත.

''ආපහු ආව මාර්ගයෙන් නැවත මාලිගාවට ඇතුළු වුණා කියලා හිතමු.'' ජැක් කල්පනා කළේය. ''බිම් දොරෙන් ඇතුළු වෙලා උමඟ දිගේ ගියත් අර චිත්‍රය ඉවත් කරන්නේ කොහොමද? චිත්‍රය ඉවත් කරලා සිදුර පාදා ගන්නා ක්‍රමය මම දන්නේ නැහැ. ඒ ක්‍රමය දැන ගත්තත් ආයෙත් මතු වෙන්නේ කාමරයේ දොර ඇරගන්නේ කොහොමද කියන ප්‍රශ්නය. කාමරයේ යතුර තියෙන තැන කවුද දන්නේ?''

පෙඩ්රෝ ද කල්පනාවට වැටී සිටියේය. සිවිල් යුද්ධයක් ආරම්භ වීම නවත්වන්නේ කෙසේද යන්න ඔහු දැන සිටියේ නැත.

''ජැක්'' අවසානයේ ඔහු කතා කළේය. ''අපි මේ ගැන වෙන කාට හරි කියලා උදව් ඉල්ලා ගනිමුද? මගේ හොඳම යාළුවන් දෙන්නා අර සරඹකාරයන් දෙන්නා. ටෝනි හා බින්ගෝ. සමහර විට ඔවුන් අපට ක්‍රමයක් කියාවි. අපට වඩා හොඳට මේ ගැන ඒ අයට හිතන්න පුළුවනි''

ජැක් සැකයෙන් යුතුව පෙඩ්රෝ දෙස බැලුවේය. ''ඒ අය මේ රහස් කාටවත් කියන එකක් නැද්ද? අපි දන්නා දේවල් කවුරුවත් දැන නොගන්නා එක වැදගත්. මාලිගාව ඇතුළේ සිරකරගෙන

ඉන්න ළමයින් බේරාගන්න කවුරුන් හෝ උත්සාහ දරනවා කියා සිටුවරයා දැන ගත්තොත් ඔහු ළමයින්ව වෙන තැනකට ගෙන යාවි. ඒ එක්කම තමන්ගේ සැලැස්ම ඉක්මනින් ක්‍රියාත්මක කරාවි''

''ටෝනියි බින්ගෝයි ගැන බය වෙන්න දෙයක් නැහැ'' පෙඩ්රෝ කීවේය. ''ඒ අය මට ඉන්න හොඳම යාළුවෝ. මේ වගේ වැඩකදී ඒ අය කර අරින්නේ නැහැ. වික්‍රමයන්ට එයාලා කැමතියි. මම දැන්මම ගිහින් එයාලාව එක්කරගෙන එන්නම්''

පෙඩ්රෝ පිටව ගිය අතර ජැක් තව දුරටත් කල්පනා කළේය. තවත් අයකුට මේ සියල්ල පවසන්නට සිදුවීම ජැක්ගේ සතුටට හේතු වූයේ නැත. කෙසේ වෙතත් ඉක්මනින්ම යළි වෑන් රියේ දොර විවෘත විය. පෙඩ්රෝ සමඟ ටෝනි හා බින්ගෝ පැමිණ සිටියහ.

''ඇයි අපිව මුණගැහෙන්න ඕනෙ කීවේ?'' කඹය මත ගමන් කරන්නා ටෝනි විමසුවේය. ''ලොක්කා එක්ක ප්‍රශ්නයක්ද?''

''නැහැ'' පෙඩ්රෝ කීවේය. ''මේ බලන්න ජැක්. මම මෙයාලාට විස්තර කියන්නම්. මේ අයට ඉංග්‍රීසි ඒ තරම් තේරෙන්නේ නැහැ. මම ඔවුන් හොඳට දන්න ඉතාලි භාෂාවෙන් සේරම කියන්නම්. ඒක ඉක්මන්''

''හොඳයි'' ජැක් පැවසුවේ පෙඩ්රෝ මෙන් තමා ද භාෂා හයක් හතක් දැනගෙන සිටියා නම් මැනවැයි සිතමිනි.

පෙඩ්රෝ පැවසූ කිසිවක් ඔහුට වැටහුණේ නැත. සර්කස් කණ්ඩායම්වල සිටිනා ස්පාඤ්ඤ, ප්‍රංශ හා ඉතාලි ජාතිකයන් මෙන්ම ඔහු ද අතපය වනමින් වේගයෙන් කතාව කියාගෙන ගියේය. ටෝනි හා බින්ගෝ විමතියෙන් යුතුව එම කතාවට ඇහුම්කන් දුන්හ.

ඉන්පසු ඔවුහු අදහස් හුවමාරු කරගන්නට පටන් ගත්හ. ඔවුන් කතාබහ කරන්නේ මොනවාදැයි දැන ගන්නට ජැක්ට අවශ්‍යව තිබිණි. අවසානයේ පෙඩ්රෝ සිනාසෙමින් ඔහු වෙත හැරුණේය.

''මම මෙයාලට සේරම කීවා'' ඔහු කීවේය. ''ඔයාලගේ යාළුවන් බේරගන්න ක්‍රමයක් ඔවුන්ට තියෙනවා. ඒක හුඟාක් හොඳ අදහසක්''



''මොකක්ද ඒ අදහස?'' ජැක් විමසුවේ සතුටිනි. ''මම හිතන්නේ ඒක ක්‍රියාවට නංවන්න පුළුවන් අදහසක් වෙන්නැති''

''මම ඒක එයාට කියන්නද?'' පෙඩ්රෝ ටෝනිගෙන් විමසුවේය. ''මට පුළුවනි ඔයාලට වඩා ඉක්මනින් ඒක එයාට තේරුම් කර දෙන්න''

''කියන්න'' ටෝනි හිස ඉහළ පහළ සැලුවේය.

''ඔයා බිම් දොරෙන් සඤ්ඤාර කුළුනට ආ හැටි මම එයාලට කීවා'' පෙඩ්රෝ පැවසුවේය. ''ඒ එක්කම මම කිවා ළමයින් රඳවාගෙන ඉන්න කාමරය ඉස්සරහමයි සඤ්ඤාර කුළුණ තියෙන්නෙත් කියලා. ඔවුන් කියනවා කුළුණේ ඉදන් කාමරයේ ජනේලයකට කඹයක් විසිකරන එක පහසුයිලු''

''ඔව්. ඒත් ඊට පස්සෙ?'' ජැක් විමසුවේය. ''ටෝනිට පුළුවන් වුණාට ඒ අයට කඹයක් දිගේ ඇවිදින්න බැහැ. එයාලා වැටේවි''

''මේ අහන්න'' පෙඩ්රෝ පැවසුවේය. ''කරණම්වලට ඒ අය යොදා ගන්න හරස් පොල්ල, ට්‍රැපීසිය ඔයා දැකලා තියෙනවා. එහෙම නේද? ඒ ට්‍රැපීසිය රෝදවලින් කඹයට සම්බන්ධ කළාම එයින් කඹයේ ඉස්සරහටත් පස්සටත් යන්න පුළුවනි. ඔයාගේ යාළුවන්ට පුළුවනි වරකට එක්කෙනා ගානෙ ඒ හරස් පොල්ල මත වාඩි වෙන්න. ඉන් පස්සේ අපට පුළුවනි ඒ අයව මේ පැත්තට කඹය දිගේ ඇදගන්න? ඒ ක්‍රමය පහසු නැද්ද?''

''දෙවියනේ!'' ජැක් විමතියෙන් යුතුව පැවසීය. ''කොහොමද කඹය ඒ කාමරයට යැවුවත්.....?''

''කලබල වෙන්න එපා'' ටෝනි අසීරුවෙන් ඉංග්‍රීසි වචන එකතු කළේය. ''අපි සඤ්ඤාර කුළුණට නැඟලා කඹයක කෙළවර ඔයාගේ යාළුවන්ට දීලා ගැට ගස්සනවා. ඊළඟට ට්‍රැපීසිය අරගෙන මම කඹය දිගේ ඇවිදගෙන කාමරයට යනවා. ට්‍රැපීසිය කඹයට සම්බන්ධ කරලා. ඒකට නංවන කෙනා එක්ක මම එනවා. ආපහු යනවා. තව කෙනෙක් ගේනවා. හතර වතාවයි. සේරම බේරිලා. හොඳ අදහසක් එහෙම නේද?''

''ඒත් ඕක කරන්න පුළුවනිද?'' ජැක් විමසුවේය. ''භයානක නැද්ද?''

''නෑ.... නෑ..... මේ වැඩේ පහසුයි. මම වගකීම බාර ගන්නම්. මම ටෝනි. මාව විශ්වාස කරන්න''

බින්ගෝ සිය හිස සැලුවේ ටෝනි ගේ කතාව අනුමත කරන බව අඟවන්නට මෙනි. එය හොඳ අදහසක් වන්නේ සරඹකරුවන්ට හා කඹ මත ඇවිදින්නන්ට පමණකැයි ජැක් සිතුවේය.

''එතකොට අර ළමයා... මොකක්ද නම කීවේ? හරි පිලිප්. එයාට පුළුවන් වෙයි නේද අර ෆැන්ක් ගේ වලසුන්ව බලාගන්න''ටෝනි විමසුවේය. ''එහෙම වුණොත් හැමෝම එයාට කැමති වේවි.''

''ඒක ඇත්ත. හැමෝම එයාට කැමති වේවි'' ජැක් ටෝනි හා එකඟ වූයේය. කෙසේ වෙතත් සාමාන්‍ය මිනිසුන්ට බිහිසුණු යැයි සිතෙන ක්‍රියා සරඹකරුවන්ට සාමාන්‍ය දේවල් බව ජැක් නැවත සිතුවේය.

''අපි අදම වැඩේ කරමු'' ටෝනි කීවේය. ''අපි ඕනෙ කරන දේවල් ලෑස්ති කරගන්නම්. මේ ගැන ලොක්කාට කියනවාද?''

''නැහැ... දැන්ම නෙවෙයි'' පෙඩ්රෝ කීවේය. ''අනික කියනකොට වුණත් කුමාරයා ගැන කියන්න අවශ්‍ය නැහැ. ජැක්ගේ මිතුරෙක් වලසුන් මෙල්ල කර ගන්න එක්කරගෙන ආ වගක් කීවාම ඇති. අනෙක් තුන්දෙනා අඳුන්වාදෙන විදිය ගැන පස්සේ අපි කල්පනා කරලා බලමු''

ටෝනි හා බින්ගෝ වෑන් රථයෙන් පිට වී කතා බස් කරමින් ගියහ. තමන් ඉදිරියේ ඇති අභියෝගාත්මක කාර්යය ගැන ඔවුහු මහත් උනන්දුවෙන් සිටියහ.

ජැක් නැවත නැවතත් ටෝනිගේ සැලැස්ම ගැන කල්පනා කළේය. එම සැලැස්ම සාර්ථක වේවිද? ලුයි ඈන් ට්‍රැපීසියේ නැඟීමට බිය වේවිද? ගුයි එහි නැගෙන්නට බිය වේවිද? හිසකේ



දිගුව තිබුණ ද ගැහැනු ළමයෙකු මෙන් වෙස් මාරු කර ගන්නට ඔහු කැමති වේවිද? අකමැති වූවොත් ඔහු සඟවන්නට වෙනත් ක්‍රමයක් නැත.

රාත්‍රියේ සර්කස් දර්ශනය සුපුරුදු වේලාවට ආරම්භ කෙරිණි. වලසුන්ගේ දර්ශන ඇතුළත් නොවීම පිළිබඳ සමහර ප්‍රේක්ෂකයෝ අරගල කළහ. ෆැන්ක් ලෙඩ ඇඳෙන් නැඟිටගන්නට උත්සාහ දැරුව ද එය සාර්ථක නොවීය. සිටගන්නට පවා ප්‍රාණවත් බවක් ෆැන්ක් සතුව නොතිබිණි. සර්කසය ආරම්භ වූ වග හැඟුණු ශබ්දවලින් වටහා ගත් වලස්සු තවත් අරගල කළහ. එදින කිසිවකුට කූඩු වලට ළං වන්නට උන් ඉඩ දුන්නේ නැත. උන්ට ආහාර කූඩුවල කූරු අතරින් කූඩු ඇතුළට විසි කෙරිණි. එහෙත් උන් ඒවා ආහාරයට ගත්තේ නැත. උන් එම ආහාර පෑගුහ. හිසෙන් ඒවා එහා මෙහා තල්ලු කරමින් ගෙරවූහ.

දර්ශනය අවසාන වූ පසු බෝර්කෙන් ජනතාව සතුටින් කතා බස් කරමින් සිනාසෙමින් සිය ගෙවල් දොරවල් බලා ගියහ. කූඩාරම ඇතුළත පිරිසිදු කිරීමට ජැක් පෙඩ්රෝට උපකාර කළේය.

''අද රෑ ගැන ද හිතන්නේ?'' ජැක් කල්පනා කරමින් සිටිනු දුටු පෙඩ්රෝ විමසුවේය. ''මම දැක්කා ටෝනි ට්‍රැපීසියක් අරගෙන යනවා. ඒ අද රෑට පාවිච්චි කරන්න වෙන්නැති''

රාත්‍රී ආහාර ගැනීමෙන් අනතුරුව 'මා' ඇනුමක් ඇරියාය. ''නිදිමතයි'' කී ඇය යහනට ගියාය. ජැක් හා පෙඩ්රෝ ඔවුන්ගේ වෑන් රථයට ගොස් සරඹකරුවන් දෙදෙන පැමිණෙන තුරු පමා වූහ. වෑන් රියේ දොරට තට්ටු කරන හඬ ඇසූ පෙඩ්රෝ දොර විවෘත කළේය.

''යමු'' පිටත සිටි ටෝනි පැවසුවේය.

පෙඩ්රෝ හා ජැක් වෑන් රියෙන් බැස ගත්හ. සිව්දෙන අඳුරේම මාලිගය පිහිටි කන්ද වෙත ගමන් කළහ. දැවැන්ත මාලිගය හා ඒ වටා වූ පවුරු අඳුරේ දිස් වූයේ පාළු හා අද්භූත මන්දිරයක් මෙනි.

ඔවුහු සණ්ඨා කුළුණ වෙත ළඟා වූහ. ටෝනි හා බින්ගෝ දහවල් කාලයේදී එය හොඳින් පරීක්ෂා කර තිබිණි. ''අපි ඇතුළ් වෙමු'' පෙඩ්රෝ පහත් ස්වරයෙන් පැවසීය. විදුලි පන්දම ක්ෂණයකට දැල් වූ ඔවුහු වහා එහි ඇතුළු වූහ.

විදුලි පන්දම හා සව්මත් කඹයක් බින්ගෝ අත තිබූ අතර ට්‍රැපීසිය හෙවත් හරස් පොල්ල තිබුණේ ටෝනි අතය. ඔවුහු සණ්ඨා කුලුණේ ඉහළ බැලූහ. ඔවුන් කුළුණේ ඉහළට නැඟගත්තේ කෙසේද?

''බිත්තියට සවි වූ යකඩ ඉණි මං පෙති තිබෙනවා'' ටෝනි පැවසුවේය. ''මම මුලින් යන්නං. ඔයාලා මගේ පස්සෙන් එන්න''

# 22. බේරී පළා එම

යකඩ ඉණි මං පෙති ආධාරයෙන් ඉහළට නැගීම අපහසු කාර්යයක් වූයේ නැත. ටෝනි වහා කුළුණේ වහලය මතට ළඟා විය. ජැක් ගේ උරහිසෙන් ඉවත් වූ තිති ඉහළට පියඹා ගොස් සණ්ඨාව මත වැසුවේය. යකඩ ඉණිමග විශාල යකඩ බාල්කයක එල්ලෙමින් තිබෙන සණ්ඨාවෙන් ඉහළට ද විහිදිණි. එම බාල්කයට ඉහළින් වූයේ කළු ගලින් තැනුණු කුඩා වේදිකාවකි. ඒ වේදිකාව හරහා වහලයට යා හැකි අන්දමින් සිදුරක් තිබිණි. වහලයේ සිට ටෝනි යළි වේදිකාවට බැස ගත් අතර, ජැක් පෙඩ්රෝ හා බින්ගෝ පිළිවෙළින් වේදිකාව මතට පැමිණියහ.

ගල් වේදිකාව හතර පැත්තේම විවෘත ආරුක්කු තිබිණි. එම ආරුක්කු විවෘතව තිබුණේ උතුර, දකුණ, නැගෙනහිර හා බටහිර දිසාවන්ටය. ටෝනි බැලුවේ මාලිගය දෙසට විවෘතව ඇති ආරුක්කුව දෙසය. එතැන සිට ඔහු මාලිගයේ කවුළුවට ඇති දුර සිතින් මැන බැලුවේය. ජැක් ද ආරුක්කුවෙන් එබී බැලූ අතර අන්ධකාරයේ ඔහුට පෙනුණේ එතැන් සිට කවුළුවට සැහෙන දුරක් ඇති බවය. ඔහුගේ සිරුර වෙව්ලා ගියේය. ක්‍රියාත්මක කෙරෙන්නට යන අදහස ගැන සැකයක් හා බියක් ඔහුගේ සිත්හි ඇති වූයේ පොළොවේ සිට තමන් සිටින තැනට ඇති උස ප්‍රමාණය දුටු විටය.

එහෙත් ටෝනි හෝ බින්ගෝ හෝ එම උස එතරම් ගණනකට ගත්තේ නැත. ඔවුන් එකිනෙකා හා කතා බහ කරමින් කළ යුතු දෑ සාකච්ඡා කළේ මහත් වුවමනාවෙන් යුතුවය. තමන් කළ සැලැස්ම සාර්ථක කරගත හැකිය යන විශ්වාසය ඔවුන් දෙදෙනාගේම සිත්හි තිබිණි.

ටෝනි යමක් පෙඩ්රෝට පැවසුවේය. පෙඩ්රෝ එය ඉංග්‍රීසි බසින් ජැක්ට කීවේය. ''ටෝනි කියනවා එයා ලෑස්තියි කියලා. ඔහු අහනවා අර කාමරේ ඉන්න යාළුවන්ගේ අවධානය අප වෙත ලබා ගන්නේ කොහොමද කියලා. මේ සැලැස්මට මුල ඉඳලාම ඔවුන්ගේ උදව් අවශ්‍ය වෙනවා''

''එක්කෝ අපි විදුලි පන්දම කවුළුව වෙත යොමු කරලා කිහිප වතාවක් පත්තු කර කර නිවන්න ඕනෙ. එහෙම නැත්නං බකමූණෙක් වගේ කෑගහන්න ඕනෙ. එතකොට පිලිප් ඒවි'' ජැක් පැවසුවේය.

''බකමූණෙක් වගේ කෑ ගහන එක හොඳයි'' ටෝනි පැවසූ වහා ජැක් මුවට දෑත් ළං කර බකමූණකු ලෙස නැවත නැවතත් හඬ නැගුවේය. ඔවුහු තමන් ඉදිරිපස ඇති කවුළුව දෙසම නෙත් රඳවාගෙන සිටියහ. හදිසියේම කවුළුවට එපිටින් කාමරය ඇතුළත සිට විදුලි පන්දමක් දැල්වෙන්නට හා නිවෙන්නට පටන් ගත්තේය.

''අන්න... පිලිප්'' සතුටින් පැවසූ ජැක් තමා අත වූ විදුලි පන්දම ද පත්තු කරමින් නිවූයේය. ''පිලිප්'' ඔහු පහත් ස්වරයෙන් කතා කළේය. ''ඔයාට මාව ඇහෙනවද?''

''ඔව්. ඒත් ඔයා කොහේද? මට ඔයාව පෙනෙන්නෙ නැහැ'' පිලිප් පැවසුවේ වෙව්ලන ස්වරයකිනි.

''එයාට කියන්න කඹය දිගේ ටෝනි එනවා කියලා'' පෙඩ්රෝ පැවසුවේය. ''ඒත් අපි ඊට කලින් කඹයේ එක කෙළවරක් කාමරයට යවන්න එපායැ... ගල් කැටයක නූලක් බැඳලා නූලේ අනෙක් කෙළවර කඹයේ බැඳලා ගල් කැටේ කාමරයට වීසි කරමු. එයාට පුළුවනි නූල ඇදලා කඹ කෙළවර කාමරයට ගන්න''



''ඊට වඩා හොඳම ක්‍රමයක් මං දන්නවා'' ජැක් හදිසියේ පැවසුවේය. ''කිකීට නූල කාමරයට අරගෙන යන්න බාර දෙමු. කඹය නෙවෙයි. කඹය ඌට බර වැඩියි. නූල හොටේ පටලවාගෙන පියාඹන්න ඌට පුළුවනි''

''අහ්.... ඒක හොඳ අදහසක්'' ටෝනි පැවසුවේ ජැක් ගේ යෝජනාව ස්ථිර කරමිනි. ''ඒ ක්‍රමයෙන් වෙලාවත් ඉතිරි වෙනවා''

''පිලිප්... කිකී දැන් නූලක් අරගෙන ඔතැනට එනවා'' ජැක් පැවසුවේය. ''ඒ නූල ඔහාට අදින්න නූල අග කඹ කෙළවර ඔය පැත්තට ආවාම. ඒක කොහේ හරි තදින් ගැට ගහන්න''

''හරි.... ඒත්... ඔය මොනවද කරන්න හදන්නෙ? මට තේරෙන්නෙ නැහැ'' පිලිප් ගේ ස්වරයෙහි වූයේ වෙව්ලන සුලු බවකි.

''කිකීට කතා කරන්න'' ජැක් සිය විධානය දුන්නේය. ඒ සමගම ඔහු නූලේ කෙළවර කිකීගේ හොටයේ පැටලුවේය. ''ඕක පිලිප් ළඟට ගෙනියන්න කිකී''

''කිකී'' පිලිප් ගිරවාට කතා කළේය. ''කිකී එන්න මෙහාට''

කිකී එක එල්ලේ පිලිප් සිටි කවුළුව වෙත පියාසර කළේය. තමා හොටයේ පටලවාගෙන යන නූල් පට කෙළවර ඇති දෑ නොදැනම පිලිප් වෙත ගිය කිකී ඔහුගේ උර මත වැසුවේය. පිලිප් වහා නූල අල්ලාගෙන කඹය තමන් වෙත ඇද්දේ වේලාව අපතේ නොයවමිනි. සාමාන්‍ය කඹයක් නොවූ එය ගනකම අඩු, බරින් වැඩි, එහෙත් නම්‍යශීලී එකක් විය. අනෙක් පසින් 'ඔය ඇති' යැයි පැවසෙන තුරුම පිලිප් කඹය ඇද්දේය. දැන් ඔහු කඹය ආරක්ෂා සහිතව තදින් ගැට ගැසිය යුතුය. කුමකද?

ඔහු පළමුව තම කාමරයේ වූ ලාම්පුව දැල්විය. ඒ සමගම ඔහු එහි තිරය පහත් කළේ අවම ආලෝකයක් කාමරය පුරා පතුරුවා හරිනු පිණිසය. ඊළඟට ඔහු කල්පනා කළේ කඹය ගැට ගසන්නේ කොතැනකද කියාය.

ඔහුගේ යහනේ පාද සවිමත් යකඩෙන් තැනී තිබිණි. පිලිප් යහන ජනේලය අසලට තල්ලු කළේය. ගුසී තිගැස්සී අවදිව ඇඳෙන් බිමට පැන්නේය. කඹයේ කෙළවර යකඩ ඇඳේ පාදය තදින් ගැට ගැසූ පිලිප් කඹය ඇද බැලුවේය. කඹය ගැලවී නොයන බව පිලිප්ට විශ්වාසය. ඇඳ බිත්තියට හේත්තු වී තද වී තිබෙන නිසා එය චලනය වීම ගැන බියක් ද නැත. දැන් කඹය ඕනෑම අයෙකුට ප්‍රයෝජනයට ගන්නට පුළුවන.

''මොකද මේ? මොනවද සිද්ධ වෙන්නේ?'' ගුසී විමසුවේ ලාම්පුවේ එළිය අඩු නිසා කිසිවක් පැහැදිලිව දැක ගත නොහැකිවය.

''නිස්සද්ද වෙන්න'' කතා කළ නොහැකි තරමට උද්යෝගයෙන් පසු වූ පිලිප් පැවසුවේය. ''එළියේ ජැක් ඉන්නවා. ගිහින් ගැහැනු ළමයින් අවදි කරවන්න. ඒත් දෙයියන්ගේ නාමෙට කවුරුවත් සද්ද කරන්න නං එපා''

කුළුණේ සිටි ටෝනි කඹය ඇද බැලුවේය. බින්ගෝ ද ඔහුට එකතු විය. දෙදෙනාම එක්ව කඹය ඇද පරීක්ෂා කර බැලුවේ අනෙක් කෙළවර ගැටය ශක්තිමත් ද කියාය. කඹය මතට නැඟී ඇවිද යන්නට පෙර සියල්ල නිවැරදි ද යන්න ටෝනි දැනගත යුතුම විය.

''ගැටය හොඳින් තද වෙලා'' බින්ගෝ තමාට හුරු බසින් පැවසුවේය. ''ඔයාට බය වෙන්න දෙයක් නැහැ''

ටෝනි කාලය අපතේ නොයවා ආරුක්කුවේ ඉහළ එල්ලී කඹය මත පා තැබුවේය. බින්ගෝ විදුලි පන්දම දල්වා කඹයේ ඉදිරියට එල්ල කළේය. ටෝනි සිය පාදයෙන් කඹය පද්දවා එහි ශක්තිය පිරික්සුවේ ජැක් විමතියෙන් යුතුව බලා සිටිද්දීය. ටෝනි ඊළඟ මොහොතේ විදුලි පන්දම් එළියට පෙනුණු කඹය දිගේ වේගයෙන් ඉදිරියට ගමන් කිරීම ආරම්භ කළේය.

අනෙක් පස තිබූ කවුළුව වෙත ගිය ටෝනි එහි රාමුව මත සිටගෙන මොහොතක් සිට හිස නමා කවුළුව හරහා කාමරයට රිංගා යහන මතට පා තැබුවේය. සුදුමැලි වූ මුහුණින් යුතුව පිලිප් ඔහුගේ සුරත අල්ලා ගත්තේය.



''මගේ අම්මේ! භයානක වැඩක්. ඔයා වැටෙන්නත් ඉඩ තිබුණා''

ගුසී විසින් අවදි කරවනු ලැබූ ගැහැනු ළමයි කාමරයට පිවිසියහ. කිකී ඔවුන් වෙත පියඹා ගිය අතර ඔවුහු විස්මිතභාවයට පත් වූහ. ''මේ කවුද?'' ලුසි ඈන් විමසුවේ යහන මතින් බිමට පැනගත් ටෝනි දෙස බලමිනි. ''මොනවද මේ වෙන්නේ?''

''කතා කර කර ඉන්න වෙලාවක් නැහැ'' සිදු වන්නේ කුමක් ද යන්න නිවැරදිව නොදැන සිටි පිලිප් පැවසුවේය. ''අපිව මෙතැනින් බේරාගන්න යනවා. එච්චරයි''

ටෝනි, තමන් රැගෙන ආ කඹයත්, ට්‍රැපීසිය හා කප්පියත් ඇඳී තිබූ කඹයට සවි කළේය. දැන් ඕනෑම අයකුට හරස් පොල්ල හෙවත් ට්‍රැපීසිය මත හිඳගන්නට පුළුවන. ටෝනි පිලිප් දෙසට හැරුණේය.

''ඔයා ඉඳගෙන අල්ලාගන්න'' කඹයේ එල්ලෙමින් තිබූ හරස් පොල්ල පෙන්වමින් ටෝනි පැවසුවේය. ''මම හෙමින් හෙමින් ඔයාව ජැක් ළඟට යවන්නම්''

පිලිප් බිය විය. ඔහු කඹයේ එල්ලෙමින් තිබූ හරස් පොල්ල හා එය කඹයට සවි වී තිබූ කප්පිය දෙස බැලුවේය. අදහස ඔහුට වැටහිණි. කප්පිය සෙමෙන් තල්ලු කරගෙන ටෝනි අනෙක් පසට ගමන් කරනු ඇත. හරස් පොල්ල මත වාඩි වී ගමන් කරන තැනැත්තා අනෙක් පසින් බැස ගත් විට ටෝනිට නැවත ට්‍රැපීසිය තල්ලු කරගෙන මාලිගය පසට ඒමට පුළුවන.

''ඉක්මනට'' ටෝනි නොඉවසිල්ලෙන් යුතුව පැවසීය. ''ඔයා මුලින්ම''

''ඔව්'' පිලිප් කීවේ තමන් නිරුපද්‍රිතව අනෙක් පසට ගිය විට අනෙක් අය ද බියකින් තොරව තමන් අනුගමනය කරනු ඇතැයි සිතමිනි. ඔහු විස්මිතව සිට ගුසී හා ගැහැනු ළමයින් වෙත හැරුණේය.

''මම මුලින්ම යනවා. බයවෙන්න එපා'' ඔහු පැවසුවේය. ''ඊළඟට ලුසී-ඇන්. ඊට පස්සෙ ගුසී ඔයා. අන්තිමට ඩීනා''

යහනට නැඟ ඉන්පසු ජනෙල් රාමුවට පා තැබූ ඔහු කඹය අල්ලාගෙන ට්‍රැපීසිය මත වාඩි වූයේය. එය එතරම් අසීරු කාර්යයක් නොවිණි.

''මම එනවා'' වික්ෂිප්තව සණ්ඨා කුළුණ මත සිට බලා හුන් තිදෙනාට කී ටෝනි කඹය මතට නැඟී කප්පිය තල්ලු කරගෙන සණ්ඨා කුළුණ වෙත ගියේය. පිලිප් යමක් සිතන්නට ද පෙර ඔහු අනෙක් පසට ළඟා වී සිටියේය. ඔහු ආරක්ෂිතව සණ්ඨා කුළුණේ කළු ගල් වේදිකාව මතට නංවා ගැනිණි. ජැක් පිලිප් ගේ සුරත අල්ලාගෙන සෙලවීය. තමන් වචනයක් හෝ කතා කර ගත නොහැකිව සිටින බවක් ජැක්ට වැටහිණි. පිලිප් ද ගොලු වී සිටියේය.

ටෝනි ට්‍රැපීසිය ඇදගෙන අනෙක් පසට කඹය මතින් දිව ගියේය. ලුසී-ඇන්ගේ සිරුර බිය නිසා දරදඬු වී තිබුණි ද හරස් පොල්ල මත නැඟී කඹය අල්ලා ගන්නට ඇයට හැකි විය. ඒ සඳහා ටෝනි ද ඇයට උපකාර කළේය. තමා හා පොළොව අතර ඇති දුර දුටු ඇය යම් තිගැස්මකට ලක් වූව ද, ඇය ද සිය ගමන සාර්ථකව නිම කළාය.

ටෝනි නැවත පැමිණියේ ට්‍රැපීසියට ගුසී නංවා ගනු පිණිසය. තල්ලු කරගෙන විත් බලෙන් මෙන් ඔහු ට්‍රැපීසියට නංවා ගන්නට ටෝනිට සිදු විය. අනෙක් පසට යන අතර මඟදී බිය නිසාම ගුසී බිමට ඇද වැටේදැයි ටෝනිට නොසිතුණා නොවේ. එහෙත් ගුසී ගමන පුරා කඹය තදින් අල්ලා ගෙන සිටි අතර ඔහුගේ දත් කිටි කිටි හඬින් වෙව්ලුවේය. නිරුපද්‍රිතව සණ්ඨා කුළුණට ළඟා වූ විට ලද සහනය නිසාම ඔහුගේ දෑසින් කඳුළු බේරිණි.

ඩීනාගෙන් කරදරයක් වූයේ නැත. ඇය බියක් නොපෙන්වූවාය. බියක් සමහර විට ඇයට දැනුණ ද ඇය එය පෙන්වූයේ නැත. ඇය පහසුවෙන් අනෙක් පසට ළඟා වූවාය. හදිසියේ සියලු දෙනා මහත් සතුටට පත්ව සිටියහ. ලුසී-ඇන්



නොනැවතී ජැක්ට හාදු දුන්නාය. පුංචි කළු ගල් වේදිකාව මත පමණට වඩා වැඩි පිරිසක් සිටි නිසාවෙන් ටෝනි එහි පය ගසාගෙන සිටියේ ඉමහත් අසීරුවෙනි.

''කඹයට මොකද කරන්නේ?'' පෙඩ්රෝ විමසුවේය. ''අර පැත්තේ ගැටය ලිහලා කොහොමද අපි මේක ආපහු ගන්නේ?''

''අපි ඕක තියලා යමු'' ටෝනි කීවේය. ''ආපහු ඕක ගන්න ක්‍රමයක් නැහැ. අපි ළඟ තව කඹ තියෙනවානේ''

''එහෙම නං අපි පහළට බහිමු'' ජැක් යෝජනා කළේය. එහෙත් මෙතෙක් සියල්ල යහපත්ව සිදුවූවත් හදිසියේ වැරදියට යමක් සිදුවන්නට ඉඩ ඇතැයි ඔහුට සිතිණි. ''මම මුලින්ම බහින්නං''

ඉක්මනින්ම ඔවුහු සණ්ඨා කුළුණ පාමුල වූහ. ''දැන් නිස්සද්ද වෙන්න'' ජැක් මිමිණුවේය. ඔවුන් ඉතා නිහඬව කන්ද බෑස්සේ සර්කසයට ළඟා වනු පිණිසය.

ලුසී ඇන් ජැක්ට ළංව ඔහුගේ ඉණ වටා සුරත යවාගෙන ගමන් කළාය. තම සොහොයුරිය ආරක්ෂා සහිතව සිටීම ජැක්ට මහත් සතුටට කාරණයක් විය. ගුසී කිසිවක් වටහා ගත නොහැකිව, බිය මුසු සිතිවිලි සහිතව ඉදිරියට ගමන් කළේය. ඇත්තෙන්ම සිදුවෙමින් පවතින්නේ මොනවාද යන්න ඔහුට නිවැරදිව වැටහී නොතිබිණි.

''ගැනු ළමයි වෑන් එක ඇතුළේ නිදා ගන්නාවේ'' පෙඩ්රෝ පැවසුවේ ය. ''ඔයායි මායි ගුසියි වෑන් එක යට නිදා ගනිමු''

එහෙත් ඔවුන් වෑන් රථයට ළඟා වන්නට පෙර පරිසරයේ එතෙක් පැවති නිහැඬියාව බිඳී ගියේය. ඒ මහත් ශබ්දය කුමක් ද?

''සණ්ඨාව...... සණ්ඨාව'' ජැක් තම දෑතින් දෙසවන් වසා ගනිමින් කෑ ගැසුවේය. ''සණ්ඨා කුළුණේ සණ්ඨාව... ආන්... දේවස්ථානයේ සණ්ඨාවත්... අපොයි තව කොහේ හරි සණ්ඨාවකුත් නාද වෙනවා. මොකක්ද මේ සිද්ධ වෙන්නෙ? ගුසී මාලිගාවෙ නැති වග එයාලා මෙච්චර ඉක්මනට දැනගෙන ද?''

සර්කස් කණ්ඩායමෙ අය අවදිව සිය වැන් රථ හා කැරවෑන් රථවලින් පිටතට දිව ආහ. නගරය දෙසින් ජනතාව කෑ ගසනු ඇසිණි. සතර අත ලාම්පු දැල්විණි. සණ්ඨා තව දුරටත් නාද විය.

''එහා ගමෙ සණ්ඨාත් නාද වෙනවා'' ජැක් විමතිය පළ කරමින් පැවසුවේය. ''සණ්ඨා නාද කරමින් ජනතාවට යම් අනතුරක් අඟවනවා. ඒ අනතුර මොකක් වෙන්න පුළුවනිද? ගුසී බේරි පලා ගියා කියලා තවම කවුරුවත් දන්නෙ නැතිව ඇති. අනෙක ගුසී මාලිගාවෙ හිරකරලා හිටිය බව දන්නෙ සිටුවරයාත් ඔහුගේ සහෝදරයත් විතරයිනෙ''

නැත. සණ්ඨා නාද වෙන්නේ ගුසී ගැන පවසන්නට නොවේ. ඊට වඩා බරපතළ කාරණයක් අඟවමිනි.

''රජතුමා! රජතුමා අතුරුදහන් වෙලාලු. එතුමා හොයා ගන්න නැතිලු. රජතුමා අතුරුදහන් වෙලා''

නගර වැසියෝ කෑගසමින් අනෙක් අයට ආරංචිය දැනුම් දුන්හ. ඔවුන්ගේ රජතුමාට සිදු වී ඇත්තේ කුමක්ද? එතුමා ඝාතනය කොට ඇත්ද? රට පුරා සණ්ඨා නාද වෙමින් පැවසුයේ ඔවුන්ගේ රජතුමා සතුරු ග්‍රහණයට හසු වී ඇති බවය.

''අපි නියම වේලාවට ගුසීව එතැනින් බේරා ගත්තේ'' ජැක් පැවසුවේය. ''තව පැය භාගයක් ප්‍රමාද වුණා නම් සේරම ඉවරයි''

''ඔව්'' පිලිප් කීවේය. ''ගුසී සිහසුන මත හිඳුවන්න ඔහු කැඳවා ගෙන යන්න ආ විට ඔහු පලා ගිහින් වග දැනගන්නා පැරිටෝලෙන් සිටුවරයාගේ මුහුණ කළු වන හැටි බලන්න මං ආසයි. දැන් රජතුමා අතුරුදහන්. ගුසීත් නැහැ. සිහසුනේ හිඳවන්න කවුරුවත් නැහැ''

ගුසී කියවන්නට පටන් ගත්තේය. ''මගේ බාප්පාට මොකද වුණේ? කෝ එයා? මට දැන්ම රජ වෙන්න ඕනෙ නැහැ''

''කටවහගන්නවා'' ජැක් දැඩි ස්වරයෙන් පැවසුවේය. ''මෙහේ ඉන්න හැමෝටම ඔයා රජ කුමාරය වග අඟවන්න ද ඔයාට ඕනේ? කවුරු හරි ඔයා ගැන ඔත්තුව දුන්නොත් වැඩි වෙලා යන්න කලින් පැරිටෝලෙන් සිටුවරයා ඔයාව ආපහු අල්ලා ගනීවි. වැන් එකට නැඟලා කැනොගහා ඉන්නවා''

# 23. වලසුන්ගෙන් පරෙස්සම් වන්න

ජැක් වහා ගුසි හා ගැහැනු ළමයින් දෙදෙන පෙඩ්රෝගෙ වැන් රිය වෙත කැඳවාගෙන ආවේය. කලබලයට පත්ව සිටින මිනිසුන් අතරට ඔවුන් කැඳවාගෙන ඒම ජැක්ගේ අපේක්ෂාව නොවිය. සර්කස් කණ්ඩායමේ සියලු දෙනා ද සිය රථවලින් පිටත විත් තැන තැන රොක්ව කතා බස් කරමින් සිටියහ. කදවුරේ කිසිවකු ගුසි හඳුනාගත යුතු නැත. වහා ඔහුගේ වෙස් මාරු කළ යුතුව ඇතැයි ජැක් සිතුවේය.

පෙඩ්රෝ ද ඒ බව වටහාගෙන සිටියේය. කිසිවකු කුමාරයා හඳුනාගත හොත් සර්කස් කණ්ඩායමට ඇතිවන අනතුරුදායක තත්ත්වය ගැන ඔහුට ද හොඳ අවබෝධයක් තිබිණි. කුමාරයා සඟවාගෙන සිටීමේ චෝදනාව මත සර්කසයේ අයට ද බන්ධනාගාරගත වන්නට සිදුවනු නියතය. ඒ සිතිවිල්ල නිසා පෙඩ්රෝ කලබලයට පත්ව සිටියේය.

''ජැක්! මට මේ ගැන අම්මාට කියන්න වෙනවා'' පෙඩ්රෝ පැවසුවේය. ''කියන්නම වෙනවා. වෙන කාටවත් වඩා හොඳින් ගුසීව හංගන්න පුළුවන් වෙන්නෙ අම්මාට. මම ඇයට කියන්නම්. ඇය අපට උදව් කරාවි.''

ඊට එකඟ වනු හැර වෙන කළ හැකි යමක් ජැක් සතුව නොතිබිණි. පෙඩ්රෝ සිය මව වෙත ගොස් කලබලයෙන් මොන මොනවාදෝ පවසන ආකාරය ජැක් බලා සිටියේය. ඉන්පසු දෙදෙනාම 'මා' ගේ කැරවෑනයට නැඟුණාහ.

ගැහැනු ළමයින් හා ගුස් මේ වන විට පෙඩ්රෝගේ වැන් රථයට වී සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳ කවුළුවලින් එබී බලමින් සිටියහ. කිකී ද සිටියේ ඔවුන් සමඟය. ලුසී-ඈන් මෙම කලබලයේ අග මුල නොදැන සිටියාය. ජැක් කොහිද? ඔහු පැමිණ මේ කලබලය ගැන ඇයට නොපවසන්නේ මන්ද?

සිය මවගේ කැරවෑනයෙන් පිටතට බැසගත් පෙඩ්රෝ කෙළින්ම ජැක් වෙත ආවේය. ''සේරම හරි'' ඔහු පැවසුවේය. ''මා හැම දෙයක්ම බලාගනීවි. කුමාරයාව හංගාගෙන තියාගන්න. එයා බය නැහැ. මේ වාගේ දේකට මා සම්බන්ධ වෙන්නෙ බොහොම කැමැත්තෙන්. ඇය ඉක්මනටම කුමාරයාට ගවුමක් අන්දලා කොණ්ඩෙ ගොතලා රිබන් පටිවලින් බැඳලා ඇය ළඟම රඳවාගනීවි. හැමෝටම ඇය කියාවි තමන්ගේ මිණිපිරී ටික දවසකට තමන් ළඟ නතර වෙන්න ආවා කියලා''

ගුසී ගැහැනු ළමයකු මෙන් වෙස් මාරු කරගෙන සිටිනු සිතින් මවා ගත් ජැක්ගේ මුවග සිනහවක් ඇඳිණි. ''එයාට සෑහෙන්න කේන්ති යාවි. සෑහෙන කලබලයකුත් කරාවි''

''ඒවා 'මා' ගණන් ගන්නේ නැහැ'' පෙඩ්රෝ පැවසුවේ සිනාසෙමිනි. ''එයාට පාරක් දෙකක් දෙන්න අම්මා ආයෙ හිත හිතා ඉන්න එකකුත් නැහැ. මම ගුසී 'මා' ළඟට එක්කරගෙන යන්නං. 'මා' එයාට ඇන්දුවාට පස්සෙ කවුරුවත් ඒ අලොයිසියස් කුමාරයා කියා හඳුනාගන්න එකක් නැහැ''

පෙඩ්රෝ පිටව යද්දී ජැක් පිලිප් වෙත හැරී සිනාසුණේය. ''පව්. අසරණ ගුසී.. එයාව කෙල්ලක් විදියට අන්දන එක හොඳ අදහසක් නේද?''

කඳවුරේ ඈත කෙළවරකින් පළමුව කෑගැසීම් ද අවසානයේ විලාපයන් ද නැඟිණි. පිරිස ජැක් සිටි තැනට කෑ ගසමින් දිව ආහ.

''වලස්සු. වලස්සු. උන් කූඩුවෙන් එළියට පැනගෙන''

ටෝනි ජැක් වෙත දිව ආවේය. ''සතුන් පාලනය කිරීමේ හැකියාව තිබෙනවාය කී ඔයාගේ යාළුවා කෝ? ආ... අර ඉන්නෙ.



වලස්සු එළියට පැනලා තියෙන්නේ කූඩුවේ යකඩ කූරු තුනක් කඩාගෙන ඔයාගේ යාළුවාට මොකක් හරි කරන්න පුළුවන් වේවි නේද? ෆැන්ක්ට ඇඳෙ බැහැ ගන්න බැරි තරමට අමාරුයි''

වලසුන් ගැන පිලිප් කිසිවක්ම නොදැන සිටියත් ජැක් පැවසූ දෑ ඇසූ ඔහු ජැක් සමඟ වලසුන් සිටි දෙසට දිව ගියේය. ''ඔයාට උන් ගැන මොනවා හරි කරන්න පුළුවන් වේවි පිලිප්. ටෝනි ඔයාලාව බේරාගන්න අපට උදව් කළා. අපි එයාලාට උදව් කරන්න ඕනෙ. වලසුන් මෙල්ල කරගන්න බැරුව උන්ට වෙඩි තියන්න සිද්ධ වුණොත් ඒක සර්කස් එකට විශාල පාඩුවක්.''

එක් වලසකු තව දුරටත් කූඩුව ඇතුළත රැඳී සිටියේ අවට සිටි පිරිස නිසා බිමට පැන ගන්නට බියෙනි. එහෙත් ඌ මහ හඬින් ගෙරවිය. කිසිවකු ඌ අසලට යන්නට කැමති වූයේ නැත. ආසන්නයේ වූ කූඩුවක ෆිෆෝ සහ ෆම් නමැති චිම්පන්සීන් දෙදෙනා සිටියේ බියෙන් වෙව්ලමිනි.

''අනේ ළමයිනේ ඌ ළඟට නං යන්නෙපා. ඒකා භයානකයි. අනික් උන් දෙන්නා ගැනත් බලාගෙන. උන් කුලප්පු වෙලා...''

මැඩම් ෆිෆී ජැක් දෙසට කෑ ගසාගෙන දිව ආවේ තම චිම්පන්සීන් දෙදෙනා ආරක්ෂා සහිතව කූඩුව ඇතුළත සිටින බව දැකගැනීමෙන් පසුවය.

''මේ කැඩුණු කූඩුවේ ඉන්න වලහා පිටට එන එක වළක්වන්න කාටවත් බැරිද?'' පිලිප් විමසුවේය. ''ඌ ඉක්මනටම පිටට පනීවි''

''සේරම බයයි'' ටෝනි පැවසුවේය. එහෙත් කුඩා සිරුරැති මැඩම් ෆිෆී බිය වූයේ නැත. පසෙක දැල්වෙමින් තිබූ විශාල විදුලි ලාම්පුවක් ඔසවා ගත් මැඩම් ෆිෆී කූඩුව අසලට දිව ගියාය. කූඩුවේ කූරු කැඩුණු තැන්වලට ඉදිරියෙන් බිම විදුලි ලාම්පුවේ දැඩි ආලෝක ධාරාව කූඩුවේ කැඩුණු තැනට වැටෙන පරිදි තැබූ ඇය ආපසු දිව ආවාය. එම ආලෝකයට බිය වී පසුපසට ගිය වලසා කූඩුවේ කෙළවරකට ගුලි විය. ඌ බෙහෙවින් බියට පත්ව සිටියේය.

''හරි.. ආයෙ ඌ කලබල කරන එකක් නැහැ'' පිලිප් ඇයට පැවසුවේ ස්තුති පූර්වකය. ''ඔය එළිය තියෙන තුරු ඌ කූඩුවෙන් පිටතට එන්න උත්සාහ කරන්නේ නැහැ. කෝ අනෙක් උන්?''

''අරහේ... ලොක්කාගේ කැරවෑනය වටේට ඉව කර කර ඉන්නවා'' ජැක් පැවසුවේ මඳක් ඈතට ඇඟිල්ල දිගු කර පෙන්වමිනි. ''මම හිතන්නෙ ලොක්කා ඇතුළට වෙලා ගැහි ගැහි ඉන්නවා ඇති''

''කොහෙන්ද මට මස් කෑල්ලක් හොයා ගන්න පුළුවන්?'' වලසුන් සිටි දෙසට දිව යමින් පිලිප් විමසුවේය. ''එහෙම නැත්නං පැණි ටිකක්...''

''පැණි.... ඔව්... පෙඩ්රෝගේ අම්මා ළඟ පැණි බුජමක් තියෙනවා මං දැක්කා'' එසේ පවසමින් ජැක් දිව ගියේ 'මා' ගේ කැරවෑනය වෙතය. එහි ඇතුළත ගුසී සේද රෙද්දෙන් මැසූ ගැහැනු යට ඇඳුමකින් සැරසී කෑ ගසමින් විරෝධය දක්වමින් සිටියේය. එහෙත් එම විරෝධයත් 'මා' ගණනකට ගත් බවක් නොපෙනිණි. ජැක් පැණි ඉල්ලා සිටින විට පවා ඇය විමතියට පත් වූයේ නැත.

''අර රාක්කයේ'' යැයි පිළිතුරු දුන් ඇය ගුසීගේ හිස පීරන්නට පටන් ගත්තාය.

කිරි ගරුඬෙන් තැනුණු බුජම ඔසවා ගත් ජැක් පිලිප් වෙත දිව ගිය අතර ඒ වන විට පිලිප් වලසුන් දෙදෙනාට තවත් ළංව සිටියේය. වලසුන් වරින් වර හැරෙමින් පිලිප් දෙස හෙළුවේ සැකමුසු බැල්මකි.

''මේ වෙනකොටත් උන් එක්කෙනෙකුට තුවාල කරලාලු'' ජැක් සිහින් හඬින් පැවසුවේය. ''පිලිප් මොන දේ කළත් පරෙස්සමෙන්''

''මං ගැන බයවෙන්න එපා'' පිලිප් කීවේය. ''මුන්ට නොපෙනෙන තැනකට ඔයා යන්න ජැක්''

පැණි පුරවා තිබූ බුජමට දෑත දැමූ පිලිප් දෑතේම මැණික් කටුව දක්වා පැණිවලින් පොඟවා ගත්තේය. ඉන්පසු ඔහු වලසුන් වෙත ඇවිද ගියේ අතරමඟ වූ තණකොළ මත පැණි බින්දු හලමිනි.



වලස්සු පිලිප් දෙස බලා ඔහුට අනතුරු අඟවන්නට මෙන් ගෙරවූහ. ආපසු හැරුණු පිලිප් ඇවිද විත් පැණි බුජම ආසන්නයෙන් තණ ගොල්ල මත හිඳගත්තේය.

ඒ වන විට බොහෝ පුද්ගලයෝ එක්ව පිලිප් දෙස බලා සිටියහ. මේ කොලුවා කවුරුන්ද? බිහිසුණු වලසුන් දෙදෙනා ගණනකට නොගෙන ඔහු මේ කරන්නේ මොනවාද? පිරිස කුතුහලයෙන් හා බියෙන් යුතුව බලා සිටියේ ඕනෑම මොහොතක ආපසු හැරී දිවීමට ද සූදානමිනි.

ජැක් වලසුන්ට නොපෙනෙන තැනකට ගිය ද ඒ පිලිප්ට උපකාර අවශ්‍ය වුවහොත් දිව ඒමට නොහැකි තරම් දුරකට නම් නොවේ. සතුන් පාලනය කරගන්නට පිලිප්ට ඇති හැකියාව ගැන ජැක් තදින් විශ්වාසය තබාගෙන සිටියේය.

පිලිප් විසින් තණ ගොල්ලේ තැන තැන විසිර වූ පැණිවල සුවඳ ඉක්මනින්ම වලසුන් දෙදෙනාට දැනිණි. උන් පැණිවල රසයට බෙහෙවින් ඇලුම් කළහ. ඇත්ත සමහර අවස්ථාවල උන්ට පැණිවලින් සංග්‍රහ කොට තිබිණි. හිස් පැණි ටින් එකක් උන්ට ලැබුණු විට උන් ඒවා ලෙව කෑමට මහත් කැමැත්තක් දැක්වූහ.

ඉව කළ වලසුන් දෙදෙනා තණ ගොල්ලට දිව ආහ. පැණි වැටී ඇති තැනක් දුටු විට එක් වලසෙක් එතැන ලෙව කෑවේය. දෙවන වලසා ගොරවාගෙන එතැනට විත් පළමුවැන්නා පසෙකට තල්ලු කර දැමුවේය. එහෙත් පැණි තැවරී ඇති තවත් තැනක් ගැන ඉව වැටුණු ඌ වහා එතැනට දිව ගොස් කෑදර ලෙස එතැන වූ පැණි ලෙව කෑවේය. තැන තැන පැණි වැටී ඇති බව වටහාගත් වලස්සු උද්යෝගයෙන් යුතුව ඉව කරමින් ඒ තැන් සොයා ගියහ. උන් දින දෙකක් තිස්සේ ආහාර ප්‍රතික්ෂේප කර සිටි නිසා උන්ට උන් දැනෙමින් තිබුණේ දැඩි කුසගින්නකි. තවත් පැණි සොයමින් උන් ඉව කළහ.

වලසුන් දෙස බලා සිටි පිරිසට හුස්ම ගන්නට පවා අමතක වී තිබිණි. දැවැන්ත වලසුන් දෙදෙනා ටිකින් ටික පැණි බුජම අසල හිඳගෙන සිටින පිරිමි ළමයාට කිට්ටුවන බව ඔවුහු දුටුවාහ. අනතුර ඔහුට ආසන්න වෙමින් තිබෙනවා නොවේද?

''කවුද ඒ? එයාට අනතුරක් වේවි. එතැනින් අයින් වෙන්න කියන්න'' ඔවුහු පැවසූහ.

එහෙත් ටෝනි හා බින්ගෝ ඔවුන් නිහඬ කළහ. ''නිස්සද්ද වෙන්න. ඒ ජැක්ගේ යාළුවෙක්. වලසුන් තර්ජනාත්මක විදියට ළං වුණොත් ඈතට දුවගන්න එයාට පුළුවනි''

පළමු වලසා තණගොල්ලේ තැවරුණු පැණි සොයමින් පිලිප් අසලටම පැමිණි අතර උගේ හිස බිමට නැඹුරු වී තිබිණි. යළිත් පැණි බුජමට අත දමා ඉවතට ගත් පිලිප් එය ඒ මේ අත වැනුවේ පැණිවල සුවඳ වලසුන්ට හොඳින් දැනෙනු පිණිසය. හිස එස වූ වලසා පිලිප් දුටුවේය. මඳක් පසුපසට ගිය ඌ කෝපයෙන් මෙන් ගෙරෙවුවේය. බිම හිඳගෙන සිටින්නේ කවුරුන්ද? අසල වූ ලාම්පුවකින් නිකුත් වූ ආලෝකයෙන් උගේ දෙනෙත් රතු පැහැයෙන් දිළිසිණි. පිරිස අතරින් භීතිය අඟවන හඬ නැඟිණි.

පිලිප් කතා කරන්නට පටන් ගත්තේය. ඒ ජැක් නිතර 'පිලිප් ගේ සුවිශේෂ කටහඬ' යනුවෙන් හඳුන්වන හඬිනි. ඔහු නිතර සතුන් කීකරු කර ගන්නට ඒ සුවිශේෂී හඬින් කතා කරයි. එය පහත් හා ඒකස්වරයෙන් නැඟෙන කාරුණික හඬකි. එදෙස බලා සිටි ජැක් සිතුවේ පිලිප්ගේ ඒ හඬට සතුන් වශී වනවා කියාය.

ඒ හඬට ඇහුම්කන් දුන් වලසා සෙමෙන් ගොරවමින් පසුපසට ගොස් දෙවන වලසාගේ සිරුරේ හැපිණි. තව දුරටත් පිලිප් තමාට විශේෂ වූ හඬින් වලසුන්ට කතා කළේය. ඔහු පවසන්නේ මොනවාද? ජැක්ට ඒ පවසන දෑ නැසිණි. මේ ආකාරයට සතුන්ට කතා කරන්නට ඔහු ඉගෙන ගත්තේ කෙසේද? ඒ හඬට සතුන් ඇහුම්කන් දෙන්නේ ඇයි? එහෙත් එදෙස බලා සිටි සර්කස් කණ්ඩායමේ බොහෝ දෙනා දැන සිටියේ සතුන් පුහුණු කරන්නන් වැඩි දෙනකු සතුන් කීකරු කර ගන්නට - හීලෑ කරගන්නට - සුරතල් කරන්නට ඒ හා සමාන හඬ නංවන බවය. එහෙත් මේ අරුම පුදුම නිර්භීත කොලුවා කතා කරන්නේ සාමාන්‍ය වලසුන්ට නොව කුලප්පු වී රෞද්‍ර ලෙස හැසිරෙන වලසුන් දෙදෙනෙකුටය. ඔවුහු ඔහුට ඇහුම්කන් දෙමින් සිටිති.



දෙවන වලසා සිය දෙකන් ඔසවමින් මඳක් ඔහුට ළං විය. ඌ ඉව කළේය. ඌ ඉව කළේ පැණි සුවඳට පමණක් නොවේ. පිලිප් ගේ ගඳයට ඌ ඉව කළේය. වලසා ඊට කැමති විය. එය මිත්‍රශීලී ගඳයකි. වලස්සු නිතරම ගඳ දෙකක් අනුව මිනිසුන් කොටස් කරති. ඒ තමන් කැමති ගඳයක් ඇති අය හා අකමැති ගඳයක් සහිත අය වශයෙනි.

ඌ පිලිප් අසලටම පැමිණ ඔහු ඉව කළේ ඔහු සෙලවුණහොත් වහා පහර දෙන සූදානම හා බලාපොරොත්තුව ඇතිවය. පිරිස අතරින් අයකු බියෙන් කෑගැසුවත් වලසා එය ගණනකට ගත්තේ නැත. පිලිප් දිගින් දිගටම සිය සුවිශේෂී හඬින් කතා කළ අතර වලස්සු ඊට වශී වී සිටියහ. පිරිස පවා ඒ හඬට යම් තරමකට වශී වී සිටි වග සත්‍යයකි. වලසා පැණි තැවරී තිබූ පිලිප්ගේ අත ලෙව කෑවේය. පිලිප් සෙලවුණේ හෝ නැත. බියකින් තොරව වලසා ලෙවකෑම දිගටම කරගෙන ගියේය.

අනෙක් වලසා ද එතැනට පැමිණියේය. අනෙකා බිය නැතිව පිලිප්ගේ අතක් ලෙව කනු දුටු ඌ පැණි තැවරී තිබූ පිලිප්ගේ අනෙක් අත ලෙව කන්නට පටන් ගත්තේය. තත්පර දෙක තුනක් ඇතුළත වලස්සු දෙදෙනාම පැණිවල රසයෙන් තුල්මත්ව සිටියහ. මේ කොලුවා මිත්‍රයෙකි. ඔහු කවුරුන්දැයි උන් නොදැන සිටියත් ඔහු තමන්ගේ මිත්‍රයකු බව උන් අවබෝධ කරගෙන සිටියෝය.

පිලිප් දිගින් දිගටම ඒක ස්වරයෙන් හා කාරුණිකව උන්ට කතා කළේය. දැන් තමා සෙලවෙන්නට බිය විය යුතු නැතැයි ඔහුට සිතිණි. එහෙයින් සෙමෙන් එක අතක් එස වූ ඔහු එය බුජමට දමා පැණි තවරාගෙන නැවත උන්ට ලෙව කන්නට දුන්නේය.

එක් වලසෙක් ඔහු අසලින් සුවපහසුව වැතිර අත ලෙව කන්නට පටන් ගත්තේය. පිරිස සැනසුම් සුසුම් හෙළූහ. බුජම අනෙක් වලසාට දුන් පිලිප් නිදහස් අතින්, සුවපහසුව වැතිර සිටි වලසාගේ හිස පිරිමදින්නට පටන් ගත්තේය. ඌ සතුටින් සිහින්ව ගෙරවීය.

දූන් සතුටින් පසුවන වලසුන් සාමකාමිය. උන්ගේ කැමැත්තට සරිලන හා විශ්වාසය දිනා ගත් අයෙක් දූන් උන්ට හමු වී සිටියි. උන් තම පාලනය යටතේ සිටින බව පිලිප් අවබෝධ කර ගත්තේය. උන් යළිත් කලබල වූවොත් ඒ පිරිසේ කිසිවකු අනුවණ ක්‍රියාවක් කළොත්, හදිසියේ මහ හඬක් නැගුවොත් හෝ උන් වෙත වේගයෙන් දිව ආවොත් පමණකි. එහෙත් ඒ කාරණා සර්කස් කණ්ඩායමේ අය හොඳින් දූන සිටියහ. ඒ පිරිස සතුන්ගේ හැසිරීම් රටා ගැන අවබෝධයක් නැති අය නොවේ.

පිලිප් සෙමෙන් නැගී සිටි නමුත් ඉක්මනින් කිසිවක් නොකළේය. ඔහුගේ සෑම චලනයක්ම සෙමෙන් හා මෘදුව සිදු විය. ඔහු එක අතකින් බුජම ඔසවාගෙන අනෙක් අතින් එක වලසකුගේ ගෙල අල්ලාගෙන කූඩුව දෙසට පිය මැන්නේය. වලස්සු තම තොල් ලෙවකමින් කලබලයකින් තොරව ඔහු පසුපස පිය මැන්නාහ.

පිලිප් උන් සමඟම කූඩුව අසලට පැමිණ එහි දොර විවෘත කොට උන් ඊට ඇතුළු කළේය. පැණි බුජම ද කූඩුව ඇතුළත තැබූ ඔහු කූඩුවේ දොර වසා එතැනින් ඉවත් විය.

පිරිස ජයගොස් නැගූහ. ''පුදුම නිර්භීත ළමයෙක්. ඔහු කවද? වලසුන් ආරක්ෂා සහිත බව ෆැන්ක්ට කියන්න. කවුද මේ ළමයා?''

# 24. අලුත් උදෑසනක්

පිලිප් ජැක්ට කතා කළ්ය. ''ජැක්.... සෑහෙන මස් ප්‍රමාණයක් හොයාගෙන මට ගෙනත් දෙන්න''

''මම ගේන්නම්'' යැයි පැවසූ ටෝනි වහා දිව ගියේය. ඔහු නැවත පැමිණියේ අශ්ව මස් විශාල කුට්ටි කිහිපයක් පනිට්ටුවක දමා ගෙනය. එය අතට ගත් පිලිප් කූඩුවේ දොර ඇර මස් කුට්ටි කූඩුව ඇතුළට වීසි කළේ කුසගින්නෙන් පසුවන වලසුන්ට කාරුණිකව කතා කරන අතරතුරය. උන් ඒ වන විට ආහාර ගැනීමට සූදානම්ව සිටියහ. උන් තව දුරටත් බියට හෝ කෝපයට පත් වලසුන් නොවේ. උන්ට දැඩිව දූනුණේ කුසගින්නය. වලසුන් තිදෙන මස් කුට්ටි රස කරමින් ගිල දූමූහ.

''උන් ඕනෑ තරම් මස් ගිල දමපුවාවෙ. ඊළඟට උන් නිදාගනීවි. උන් නිදා ගන්නා අතරතුරේ කාට හරි පුළුවනි. කැඩුණු කූඩුව හදන්න'' පිලිප් කීවේය. ''අර විදුලි ලාම්පුව, කූඩුව හදලා ඉවරවෙන තුරු අයින් කරන්නෙපා. ඒක එතැන තියෙන තුරු උන් එකෙක්වත් කැඩුණු කූරු අතරින් එළියට පනින්නෙ නැහැ''

සියල්ලෝම පිලිප් වටා රොක් වූහ. ''මෙයා ජැක්ගේ යාළුවෙක්'' ඔවුහු එකිනෙකාට පැවසූහ. ''එයාව මෙහාට එක්කරගෙන ඇවිත් තියෙන්නේ එයා වලසුන් මෙල්ල කරන්න සූරයෙක් නිසා. එන්න ඇත්තේ වෙන සර්කස් එකකින්... ලොක්කාට එයාව මුණ ගැහෙන්න ඕනෙලු''

සිය කැරවෑනයේ කවුළුවෙන් ලොක්කා සියල්ල බලා සිට තිබිණි. ඔහු මහත් ප්‍රීතියට පත්ව සිටියේය. පෙඩ්රෝ පිලිප්ට කීවේ ඔහු කැඳවාගෙන එන්නැයි සර්කස් කණ්ඩායමේ නායකයා තමාට දැනුම් දුන් බවය. ඒ අනුව පෙඩ්රෝ සමඟ ජැක් හා පිලිප් ගමන් කළේ ලොක්කාගේ විශාල කැරවෑනය වෙතය.

ලොක්කා භාෂා කිහිපයක්ම මිශ්‍ර කරමින් පිලිප්ගේ දක්ෂතා අගය කොට ඔහුට ස්තුති කළේය. පෙඩ්රෝ ලොක්කා පැවසූ සියල්ල පිලිප්ට පැහැදිලි කර දුන්නේ සිනාසෙමිනි. ''ඔහු අහනවා මොනවාද ඔබ වෙනුවෙන් ඔහු අතින් කෙරෙන්න ඕනෙ කියලා. ඒ එක්කම වලසුන් වෙඩි තබා මරා දැමීමෙන් බේරුණේ ඔයා නිසා කියලාත් කියනවා. ඔයා ඉල්ලන ඕනෙ දෙයක්, එයාට දෙන්න පුළුවන් දෙයක් නං ඔයාට දෙනවා කියලාත් ලොක්කා කියනවා''

පිලිප්ට පෙර ජැක් පිළිතුරු දුන්නේය. ''අපට අවශ්‍ය එකම එක දෙයයි. දැන් බොර්කෙන් ප්‍රදේශයේ විශාල කලබලයක්. අපි සේරටම සර්කස් කණ්ඩායම එක්ක ඉන්න පුළුවනිද? ෆැන්ක් සතීප වන තුරු වලසුන් බලාගෙන ඉන්න පිලිප් කැමතියි. ඒත් එයා එක්ක ගෑනු ළමයින් දෙන්නෙක්... අපේ සහෝදරියන් ඉන්නවා. ටෞරි හේසියාවේ සිවිල් යුද්ධයක් ඇති වෙයි කියන බය නිසා දැන් අපි එකට ඉන්න ඕනෙ''

ලොක්කා සිතුවේ මේ සොහොයුරියන් ද සර්කස්කාරියන් ය කියාය. ඔහු හිස ඉහළ පහළ සැලුවේය. ''ඔව්.... ඒ අයට ඉන්න පුළුවනි. ඒ ඔයාගෙ සහෝදරියන්ටත් එක එක දක්ෂතා පෙන්වන්න පුළුවන් නිසා. එහෙම දක්ෂතා පෙන්වන්න පුළුවන් අයට මොන සර්කස් එකේ ද ඉඩ නැත්තෙ? ඒත් අපි හෙට මෙහෙන් පිට වෙනවා. තව දුරටත් බොර්කෙන්වල ඉන්න එක භයානකයි. මේ භූමිය අයිති පැරිටෝලෙන් සිටුවරයාට. රජතුමාගේ අතුරුදහන් වීමට එයා සම්බන්ධ නම් කරදර පටන් ගන්න කලින් අපි මෙහෙන් යන එක තමා හොඳ''

''මොනවාද ලොක්කා කීවේ?'' ජැක් පෙඩ්රෝගෙන් විමසුවේය.



පෙඩ්රෝ, ලොක්කා කී දෙය ඉංග්‍රීසි බසට පරිවර්තනය කළේය. ජැක් හා පිලිප් මහත් සතුටට පත් වූහ. ඔවුන් සියලු දෙනාට සර්කසයේ රැඳෙන්නට පුළුවන. සර්කස් කණ්ඩායම හෙට වෙනත් ස්ථානයකට යාමට සැරසීම ද හොඳය. ඔවුන්ට ඉක්මනින්ම අනතුරුදායක ප්‍රදේශයෙන් පිට මං වීමට පුළුවන. සමහර විට බිල්ට පණිවිඩයක් යැවීමේ අවස්ථාව ඔවුනට ලැබෙන්නට ද පුළුවන.

පෙඩ්රෝගේ වෑන් රිය දෙසට පිරිමි ළමයි තිදෙන ඇවිද ගියහ. ඔවුනට කතා කිරීමට බොහෝ දේ තිබිණි. වේලාව පාන්දර දෙක පමණ වී තිබුණ ද පිරිමි ළමයින් තිදෙනාගෙන් එක් අයකුට හෝ වෙහෙසක් - නිදිමතක් දැනුණේ නැත. එදින රැයේ සිදු වූ සියල්ල ගැන නැවත කතා කිරීමේ අවශ්‍යතාව ඔවුනට තිබිණි.

අතරමඟදී හමු වූ සර්කස්කරුවෝ පිලිප්ගේ පිටට තට්ටු කළහ. ඔහු සිනාසෙමින් හිස නමා ඔවුනට ආචාර කළේය. අවසානයේ ඔවුහු වෑන් රියට නැඟී ගැහැනු ළමයින් දෙදෙනා සහ කිකී සමඟ එක් වූහ.

''දොර වහන්න'' කිකී එකවර පැවසුවේය. ''දෙපා පිහදා ගන්න. රජතුමා කැඳවාගෙන එන්න''

''මම හිතනවා අපට ඒකත් කරන්න පුළුවන් වේවි කියලා කිකී'' තම උරහිස වෙත පියඹා ආ ගිරවාට ජැක් පැවසුවේ සිනාසෙමිනි. ''ඒත් රජතුමා ගැන නං කතා කරන්නෙපා. ඔහ්... ලූසී ඈන්, ඔයා තව පොඩ්ඩෙන් මාව බදාගෙන ඉඹලා මාව ඉවරයක්ම කරනවා. එවෙලේ මට මතක් වුණේ වලසුන්ව.''

''මට කරන්න දෙයක් නැහැ'' පිලිප් ට ද හාදුවක් දෙමින් ලූසී ඈන් කීවාය. ''ඔයා හා පිලිප් ගැන මම හිටියේ හරිම බයෙන්. ඒ සේරම හරියට බය හිතෙන හීනයක් වගේ. ඔයාලා අපි ළඟට එනතුරු මං මඟ බලාගෙන හිටියා. ගුසීත් ගියා. ඇත්තටම එයා කෙල්ලෙක් වෙන්න යනවාද?''

''ඔව්'' ජැක් පැවසුවේ මෙට්ටය මත හිඳ ගනිමිනි. ''දැන් අපි කතා කරලා ඉදිරි සැලසුම් හදන්න ඕනෙ. මුලින්ම මේක කියන්න ඕනෙ. පිලිප්ගේ දක්ෂතාව නිසා ලොක්කා අපි හැමෝටම සර්කස්

කණ්ඩායම එක්ක ඉන්න ඉඩ දුන්නා. මීට වඩා හැංගෙන්න හොඳ තැනක් තවත් අපට නැහැ''

''ඒක ඇත්ත'' ඩිනා කීවාය. ''ඒත් සිටුවරයා අපිව හොයන්න මෙහාටත් ආරක්ෂක භටයන් එවන්න බැරි නැහැ. ගැනු ළමයෙක් විදියට ඇන්දොත් ගුසී හොයා ගන්න බැහැ. ඒත් මං... පිලිප්... ලුසී-ඇන්? අපි තුන්දෙනාම ඇඳගෙන ඉන්නේ බ්‍රිතාන්‍ය ඇඳුම්. ඉක්මනින්ම අපිව අඳුනාගනීවි''

''මම ඒ ගැන හිතුවෙ නැහැ.'' ජැක් පැවසුවේය. ''මාත් ඇඳගෙන ඉන්නේ බ්‍රිතාන්‍ය ළමයින් අඳින ඇඳුම්. පෙඩ්රෝ කිකීගේ දක්ෂතා පෙන්නලා උපයාගත්ත සල්ලිවලින් මම කොටසක් ඉතිරි කරගෙන ඉන්නවා. ඔයාට පුළුවනි ද හෙට උදෙන්ම ඒ සල්ලිවලින් අපට මේ රටට ගැළපෙන ඇඳුම් ටිකක් මිලට අරගෙන දෙන්න''

''මා ඒ සේරම ඔයාලට හරිගස්සලා දේවි'' පෙඩ්රෝ පැවසුවේය. ''ඇය මහන්න දක්ෂ කාන්තාවක්. ඇය මහලු ලුසියාගෙන් රෙදි මිලට ගනීවි. සර්කස් කණ්ඩායමේ ඇඳුම් බාරව ඉන්නෙත් මහලු ලුසියා. ඒ එක්කම අපි ටෝනිට කීවාම 'ටෝනි ඔයාලාගේ හම් දුඹුරු පාට කරාවි. හරියට හේසියානුවන් වගේම පෙනෙන්න. ඔයාලා ඉංග්‍රීසි නං කතා කරන්නෙපා''

''නෑ. අපි කතා කරන්නේ නෑ. අපි අපිම හදාගත්ත අපැහැදිලි දෙඩවිල්ලකින් කතා කරන්නං. අපි ආවේ කවපව රටෙන්. කතා කරන්නේ කවපව භාෂාව. ඒ කතා කිරිල්ල මෙන්න මෙහෙමයි. ගුනිලිලි පොන්ඩිචෙරි. ටැපුලාකා චූන්ටී... කටට එන මොනවා හෝ ශබ්ද. ඒවායේ අර්ථ නැහැ....''

සියල්ලෝම සිනාසුණහ. ''මරේ මරු'' පෙඩ්රෝ කීවේය. ''කවුරුන් හෝ ඇවිත් ඔයාලා ගැන ඇහුවොත් මම කියන්නේ ඔයාලා කවපව රටෙන් කියලායි. එතකොට ඔවුන් ඔයාලාගෙන් මොනවා හරි ඇහුවොත් කවපව භාෂාවෙන් උත්තර දෙන්න. කොහොම වෙතත් කෝ අපේ පරණ කවපවයා''

කිකී වහා කවපව ගා කතා කරන්නට පටන් ගත්තේය. ඔවුහු ඌට ඇහුම්කන් දුන්හ. ''ඇත්තටම කිකී ඔයා නං කවපව රටේ ගිරවෙක්ම තමයි''



ඩිනා ඇනුමක් ඇරියාය. කිකී වහා එය අනුකරණය කළේය. එම ඇනුම් සියල්ලන්ටම නිදිමත ඇති කළේය. ''හෙට උදෙන්ම කඳවුර අස් කරන්න පටන් ගනීවි'' පෙඩ්රෝ නැගී සිටිමින් පැවසුවේය. ''ගැනු ළමයිනේ හොඳට නිදාගන්න. අපි තුන්දෙනා මොනවා හරි බිමට එළාගෙන වෑන් එක යට නිදා ගන්නවා. ගුසී මම හිතන්නේ දැනටත් ගැනු ළමයෙක් වගේ ඇඳගෙන 'මා' ගේ කැරවෑන් එක ඇතුළේ නිදි ඇති''

කෙසේ වෙතත් ගුස් ඒ වනවිට ද නින්දට පිවිස නොසිටියේය. ඔහු වැතිරගෙන 'මා' ගේ තදින් හුස්ම ගැනීමට හා ගෙරවීමට ඇහුම්කන් දිගෙන සිටියේය. කෝපයෙන් පසු වූ ඔහු සිතුවේ තමා ලජ්ජාවට පත් කර ඇත කියාය. 'මා' ඔහු නියම ගැහැනු ළමයකු මෙන් අන්දවා තිබිණි. ඇය විවිධ ක්‍රමවලට ඔහුගේ හිසකේ සැකසුවාය. එක කරලකට කොණ්ඩය ගොතනවාට වඩා කරල් දෙකකට කොණ්ඩය ගෙතීම ඔහුට සුදුසු යැයි 'මා' අවසානයේ තීරණය කර තිබිණි.

දිගු විශාල සායක් හා රතු පැහැ බ්ලවුසයක් ඔහුට ඇන්දවූ ඇය කොළ පැහැති ස්කාෆයක් ඔහුගේ ඉණ වටා බැන්දාය. ගුසී ලජ්ජාවෙන් හඬා වැටුණේය.

එහෙත් 'මා' සමඟ වාද කරන්නට ගුසී කැමති වූයේ නැත. ගුසී මුලින් කෙළින් සිටගැනීම ප්‍රතික්ෂේප කළ විට 'මා' ඔහුගේ තට්ටමට පහර කිහිපයක් දුන්නාය. ඉන් කම්පනයට පත් ගුසී කෑ ගැසුවේය.

''ඔයා දන්නවාද මම රාජ කුමාරයෙක්''

''ශාහ්...'' 'මා' ගණනකට නැතිව කීවාය. ''මට ඔයා නිකංම නිකං කොල්ලෙක් විතරයි. කුමාරවරු වෙනුවෙන් නාස්ති කරන්න මට කාලයක් නැහැ''

ගුසී නින්දට ඇතුළු වන්නට උත්සාහ දැරුවේය. එහෙත් කොණ්ඩා කරල් දෙක හා ඇඳුම තව දුරටත් ඔහුගේ සිතට බරක් විය. තමන් බේරී පලා ආ අන්දම ගැන සිතන්නම ඔහු වෙව්ලුවේය.

කඹය හා ට්‍රැපීසිය ගැන මෙන්ම ට්‍රැපීසියේ නැඟී ආ අන්දම ගැන ද නැවත සිතන්නට පවා ඔහු බිය විය. ඔහු නැවත තම බාප්පා ගැන සිතන්නට පටන් ගත්තේය. ඔහු ඝාතනයට ලක් වීද? අසරණ ගුසීගේ සිතට සාමයක් තිබුණේම නැත.

වෙහෙසට පත්ව සිටි ළමයින් පස්දෙනා වෙත ඉක්මනින් අලුත් උදෑසනක් පැමිණියේය. පිලිප් වලසුන්ගේ කූඩුව අසලට ගියේ උන්ගේ හැසිරීම් නිරීක්ෂණය කරන්නටය. කූඩුවේ කැඩුණු තැන් යළි සකසා තිබිණි. හොඳින් කුස් පුරවාගෙන සිටි වලසුන් තව දුරටත් පසු වූයේ අඩ නින්දේය. එහෙත් පිලිප් දුටු වහා උන් සෙමෙන් ගෙරවූහ. එකෙක් සිය ඉදිරි පාදයෙන් පිලිප්ගේ සිරුර ස්පර්ශ කරන්නට ද තැත් කළේය.

''හොඳයි... මෙයාලා හොඳින්'' තමා දෙස බලා සිටි සර්කස්කරුවන් කිහිප දෙනාට ඔහු පැවසුවේය.

ෆැන්ක් සුවපත් වෙමින් සිටිය ද ඔහුට තවමත් යහනෙන් බැසීමේ හැකියාව ලැබී නොතිබිණි. පිලිප් ඔහු බලන්නට ගියේය. කුඩා මිනිසා පිලිප්ගේ අතගෙන කෘතඥතාපූර්වකව පිලිප්ට නොවැටහෙන බසකින් මොන මොනවාදෝ පැවසුවේය. ඒ බස නොවැටහුණ ද පිලිප් ඔහු පවසන්නට ඇත්තේ මොනවාදැයි අනුමාන කළේය. ෆැන්ක් තම වලසුන්ට සැලකුවේ තමාගේම සොහොයුරන්ට මෙනි. පෙරදා රැයේ උන් කූඩුව කඩාගෙන පිටතට පැන ඇති බව දැනගත් ෆැන්ක් හැසිරුණේ පිස්සුවෙන් මෙනි.

''ඔයා බයවෙන්න එපා. ඔයාට සනීප වනතුරු මම උන්ව බලාගන්නම්'' පිලිප් පැවසූ අතර ඒ කී දෙය වටහා ගත් ෆැන්ක් සතුටින් පිලිප්ගේ සුරත ගෙන මිරිකුවේය.

ඊළඟ වැදගත් කාරණය වූයේ ඇඳුම්ය. කඳවුර පැය තුනක් ඇතුළත ගලවා අස් කරන්නට නියම වී තිබූ නිසා 'මා' කඩිමුඩියේ වැඩ කටයුතු කළාය. ඉංග්‍රීසි ජාතික ළමයින් සිව් දෙනා හේසියානු ළමයින් මෙන් ඇන්දවීමේ වගකීම බාර වී තිබුණේ ඇයටය. ඇය වහා ගියේ මහලු ලූසියා වෙතය. ලූසියාගේ ඉඳිකටුව ද වේගයෙන් ක්‍රියාත්මක විය. සර්කස් කණ්ඩායම බොර්කෙන් වෙතින් පිටව



යාමට සූදානම් වන විට කිසිවකුට හඳුනාගත නොහැකි තරමට ජැක්, පිලිප්, ඩිනා සහ ලූසි-ඈන් වෙනස්ව සිටියහ. ටෝනි ඔවුන්ගේ සම හේසියානුවන්ගේ මෙන් අඳුරු කර තිබිණි. ගැහැනු ළමයි දිග සායවලින් සැරසී පැහැපත් රිබන් පටිවලින් කොණ්ඩා ගැට ගසාගෙන සිටියහ.

පිරිමි ළමයි දෙදෙනාගෙන් දිස් වූයේ හදිසියේ පමණට වඩා වියපත් වූ බවකි. ලූසි ඈන් ජැක් දෙස බැලුවේ විමතියෙනි. මේ දුඹුරු පැහැ සමැති ගැටවරයා තමාගේ සහෝදරයාම දැයි ඇයට සිතා ගන්නට අපහසු තරමට ඔහුගේ වෙස් මාරුව සාර්ථක වී තිබිණි.

'මා' වඩාත් සතුටට පත්ව සිටියේ ගුසී වෙස් ගන්වා ඇති ආකාරය සම්බන්ධයෙනි. ගුසී ගැහැනු ළමයකුම මිස පිරිමි ළමයකු යැයි යාන්තමට හෝ සිතන්නට කිසිවකුටත් පුළු ඉඩක් හෝ තිබුණේ නැත. අසරණ ගුසී කැරවෑනයෙන් පිටතට එන විට පෙඩ්රෝ හඬ නඟා සිනාසුණේය. ගුස්ගේ මුහුණ ලජ්ජාවෙන් හා කෝපයෙන් රතු වී තිබිණි.

''මේ මගේ මිණිපිරි ඈනා-මාරියා'' 'මා' පුළුල් සිනහවක් මුව රඳවා ගෙන පැවසුවාය.

ගුසී හඬන්නට මෙන් මුහුණ බෙරි කර ගත්තේය.

''මව් අඬන්න'' පෙඩ්රෝ කීවේය. ''එතකොට අනික් අයට තේරේවි ඔයා ඈනා-මාරියා නෙවෙයි කියලා''

''සමහර ගෑනු ළමයින් අඬනවා'' ඩිනා පැවසුවාය. ''මත්... ගුසී... නෑ. මං කිවේ ඈනා-මාරියා අඬන්නෙ නැහැ''

''ඇත්තටම එයා ලස්සනයි'' ජැක් පැවසුවේය. ''එයාගේ දිග කොණ්ඩය නිසා වැඩේ හුඟාක් පහසු වෙලා''

''මං ඉක්මනටම කොණ්ඩේ කොටට කපා ගන්නවා'' ගුසී දත් මිටි කමින් පැවසුවේය.

''එහෙම කරන්න ඔයාට බැහැ. මේ රටේ කුමාරවරුන්ගේ කොණ්ඩය දිගට තියෙන්න ඕනෙ කියලා ඔයාමනේ අපට කිවේ'' ඩිනා පැවසුවාය.

''මම කුමාරයෙක් වෙන්නෙ නැහැ'' ගුසී අසරණ ආකාරයෙන් පැවසුවේය. ඔහුගේ පෙනුම ද අසරණ හා අහිංසක වූ අතර ලුසී-ඈන්ගේ සිතෙහි ඔහු පිළිබඳ ඇතිවූයේ අනුකම්පාවකි.

''මට විහිළු කරන්න එපා'' ගුස් ආයාචනා කළේය. ''මං මේකට කැමති නැහැ. මට හරිම ලජ්ජයි''

''හරි ගුසී... නෑ... ඇනා-මාරියා'' ජැක් කීවේය. ''අපි ඔයාට විහිළු කරන්නෙ නැහැ. දුන් හිනාවෙන්න. වැඩිකල් යන්නෙ නැතිව ඔයා ආයෙම රාජ කුමාරයෙක් වේවි. ඒක මට විශ්වාසයි''

''ඔව්. මගේ බාප්පා ජීවතුන් අතර ඉන්නවා නම්....'' ගුසී ශෝකී ස්වරයෙන් පැවසුවේය. ''බාප්පා මැරිලා නම්.... රජ වෙන්න වෙන්නේ මට''

''දෙවියන් වහන්සේ රජතුමා රැකගනිත්වා'' කිකී තම හිස ඔසවමින් ගාම්භීර හඬකින් පැවසුවේය. ''දොස්තර එක්කරගෙන එන්න. රජතුමා බේරා ගන්න''

# 25. හදිසි සෝදිසියක්

ඉක්මනින්ම බෝර්කෙන් වෙතින් බැහැරට යන වංගු බහුල මඟ වැන් හා කැරවැන් රථ පෙළ ගමන් කරනු දැක ගත හැකි විය. ගැහැනු ළමයින් දෙදෙනා සහ ගුසි සිටියේ පෙඩ්රෝගේ රථයේය. රිය පැදවූයේ පෙඩ්රෝය.

'මා' ගේ රිය ජැක් විසින් පදවනු ලැබූ අතර ඇය මහත් සතුටින් පසුවන බව පෙනිණි. අසරණ ගුසි දකින හැම මොහොතකම ඇගේ මුවග ඇඳුණේ පුළුල් සිනහවකි.

වලසුන් රැඳවූ කූඩුව සහිත රිය පදවනු ලැබුවේ පිලිප් විසිනි. ෆැන්ක් ගේ කුඩා වැන් රිය පැදවූයේ ටෝනිය. එම රිය ඇතුළත ඇතිරූ මෙට්ටයක් මත ෆැන්ක් වැතිර සිටියේය. ඔහුගේ රෝග තත්ත්වය ක්‍රමයෙන් සුව අතට හැරෙමින් තිබූ අතර පිලිප් වලසුන් ගැන වග බලා ගන්නා බව දැන සිටීම ඔහුගේ සිතට සැනැල්ලුවක් විය. ඇත්තෙන්ම ඔහුගේ සිත පිරී තිබුණේ පිලිප් ගැන කෘතඥතා පූර්වක සිතුවිලි සමුදායකිනි. ෆැන්ක්ට උපකාර කිරීමට ලැබීම පිලිප්ට ද සතුටක් විය. සර්කස්කරුවෝ නිතර එකිනෙකාට උපකාර කිරීමට සූදානමින් සිටි පිරිසක් වූහ. එය සර්කස්කරුවන් සතු වූ උසස්ම ගුණාංගයක් ලෙස හැඳින්විය හැක.

වලසුන්, චිම්පන්සීන් හෝ අනෙක් සතුන් වේගයෙන් රිය පැදවෙනවාට අකමැති වූ නිසාම රථ පෙළ ඉදිරියට ඇදුණේ සෙමිනි. නැවතත් ගමන් ඇරඹී තිබීම නිසා සත්තු වික්ෂිප්ත භාවයට

පත්ව සිටියහ. තමන් සිටි රියේ කවුළුවෙන් පිටත බලමින් චිම්පන්සීන් දෙදෙනා ෆිෆෝ සහ ෆම් එකිනෙකා හා කතා බස් කරමින් උන්හ.

''කොහාටද අපි යන්නේ?'' ඩිනා විමසුවේ පෙඩ්රෝගෙනි. පෙඩ්රෝ උරහිස් හකුළා ගත්තේ ඒ පිළිබඳ ඔහු ද නොදන සිටි හෙයිනි.

''අපි බෝර්කෙන් වලින් ඈතට යනවා. ඒ ඉක්මනට මෙහේ කලබල ඇති වෙන්න ඉඩ තියෙන නිසා'' පෙඩ්රෝ පැවසුවේය. ''සාමකාමී තැනක් හොයා ගන්න තමයි මේ යන්නේ. ප්‍රධාන මාර්ගවලින් ඈත පිටිසරබද මාවතක් අයිනේ තමා අපට කඳවුරු බඳින්න වෙන්නේ. කලබල පටන් ගත්තොත් මහා මාර්ගවල නිතර සෙබළුන් එහෙ මෙහෙ යනවා''

හේසියානු ඇඳුම ඩිනාට මනාව ගැළපිණි. ''අපි යන්නේ පිටසරබද පළාතකට වගේ'' ඩිනා ලූසී-ඈන්ට පැවසුවේය. ''අපරාදේ. අපට බිල්ටයි අම්මාටයි කතා කරන්න ලැබෙන එකක් නැහැ. එයාලා දැන් අපි ගැන බොහොම කනගාටුවෙනුයි ඉන්නවා ඇත්තේ''

''පොලිසියට අපි ගැන දන්වලා ඇති. පොලිසිය අපව හොයනවාත් ඇති. ඒත් ඒ බ්‍රිතාන්‍යයේ... අපි මෙහේ'' ලූසී-ඈන් පැවසුවාය. ''කොහොම වුණත් දැන් අපි උන්ගෙන් බේරිලා. ඒ වගේම දැනට ආරක්ෂා සහිතව ඉන්නවා. මාලිගාවට වෙලා ඉන්න එක නම් මට එපා වෙලා තිබුණේ. එයාලා අපට ගෙනත් දුන්න කාඩ් කුට්ටම් වලින් සෙල්ලං කරනවා ඇර අපට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ''

ඔවුහු දිවා ආහාරය සඳහා දහවල් එකට පමණ ගමන නතර කළහ. මාවතේ එක පසෙක වෑන් රථ නතර කළ සර්කස්කරුවෝ ඒ රථවලම හිඳගෙන ආහාර ගත්හ. ඒ අප්‍රේල් මාසය වුවද කාලගුණය සමාන වූයේ ග්‍රීෂ්ම ඍතුවටය. දැඩි හිරුරැස් පතිත වූ අතර බෑවූ බෑවූ හැම අතම විවිධ පැහැ ගත් මල් පිපී තිබිණි.



පිලිප් හා ආහාර බෙදා හදා ගනු පිණිස ඔහුගේ ඩෝමවුස් ද පිටතට පැමිණියේය. හැම විටෙකම ඔහු ළඟම සිටියත් සර්කස්කරුවන් උස් හඬින් කරන කතා බහට බිය වූ ඌ පිටතට පැමිණියේ අවට නිහඬව පැවති අවස්ථාවන්හිදී පමණකි. පිලිප් ගේ අත්ල මත හිඳගෙන ඌ කඩල ඇටයක රස බැලුවේ වරින් වර සිය කළු පැහැ ඇසින් පිලිප් දෙස බලමිනි.

''ඔයා නොහිටියා නම් අපට මොනවා වේවි ද කියලා හිතා ගන්න බැහැ ස්නූසි'' පිලිප් කීවේය. ''අර මාලිගාවේ හිරවෙලා ඉන්දැද්දී ඔයා ඔයාගේ පුංචි පුංචි සෙල්ලම් පෙන්නලා අපිව හිනැස්සුවා. ඊළඟට එදා රෑ දොර යටින් රිංගලා ගිහින් අපි ඉන්නේ කොතැන ද කියලා ජැක්ට කීවා''

ඉක්මනින්ම ඔවුහු යළි ගමන් ඇරඹූහ. තමන් ගමන් කරන රථය පදවන්නේ පිලිප් බව දැකගත් වලස්සු පාඩුවේ නිදාගත්හ. ගමන අරඹන්නට පෙර පිලිප් ඔවුනට කෑම සැපයූ අතර, උන් ඔහු පිළිගත්තේ සතුටින් පහත් ස්වරයෙන් ගොරවමිනි. ඒ හඬ ඇසූ ෆෑන්ක් ද සතුටට පත් විය.

වංගු සහිත මාර්ගයේ ගමන් කළ රථ පෙළ ප්‍රධාන මාර්ගයට පිවිසියේ යළි සැතපුම් දෙකක් ඈතින් ඇති හන්දියකදී පිටිසරබද මාවතකට හැරෙන අපේක්ෂාවෙනි. එහෙත් මඳ දුරක් යද්දී යමක් සිදු විය. හමුදා රථ තුනක් සර්කස් කණ්ඩායමේ රිය පෙළ අභිබවා ගොස් නතර කෙරිණි. ඒවායින් බැස ගත් කපිතාන්වරයකුගේ නායකත්වයෙන් යුත් සෙබළ පිරිසක් රථ පෙළ නවතන්නට සංඥා කළහ. රථ පෙළ නතර කෙරිණි. සර්කස්කරුවෝ මුහුණු අඳුරු කර ගත්හ. සොල්දාදුවන් රිය පෙළ නතර කරන්නට අණ කරන්නේ ඇයි? තමන් කිසි වරදක් කර නැත.

ඔවුහු රථවලින් බැස තැන් තැන්වලට රොක් වූහ. 'මා' ගේ වෑන් රථය පදවමින් සිටි ජැක් 'මා' වෙත හැරුණේය. 'හිතුව දේ සිද්ධ වුණා' ඔහු පැවසුවේය. ''සොල්දාදුවන් ලෑස්ති වෙන්නෙ අපේ රථ පරීක්ෂා කරන්න. ගුසීට යමක් කරන්න පවරන්න. ඔයාගේ මිණිපිරී වගේ කියලා හිතාගෙන එයාට බණින්න. ගුසී... ඔයා

කෙල්ලෙක්. මතකයිනේ... මොනවා ඇහුවත් උත්තර දෙන්න යන්න එපා. එක වචනයක්වත් කියන්නෙපා. පුළුවනි නම් බොරු ලජ්ජාවක් මවා පෙන්වන්න''

සිදුවන්නට යන්නේ කුමක්දැයි පෙඩ්රෝ ද දැන සිටියේය. ඔහු වහා ගැහැනු ළමයින් දෙදෙනා වෙත හැරුණේය. ''එළියට ගිහින් අනෙක් අය එක්ක මිශ්‍ර වෙන්න. ටෝනියි බින්ගෝයි එක්ක යන්න. මාත් එනවා. මම මය දෙන්නාගේ කරට අත් දාගෙන ඔයාලා මගේ සහෝදරියන් හෝ මිතුරියන් හැටියට පෙනෙන්න සලස්සනවා''

පිලිප් නොසෙල්වුණේ තමා සිටින්නේ හොඳම තැනක යැයි සිතූ බැවිනි. ඔහු පදවන්නේ වලසුන් සහිත රථයයි. ඔහු වලසුන් පුහුණු කරවන්නෙකැයි සොල්දාදුවන් නිසැකවම සිතනු ඇත.

ලොක්කා වෙත ගිය කපිතාන්වරයා උස් ස්වරයෙන් කතා කරන අයුරු පෙඩ්රෝ අසා සිටියේය.

''අපි තමුසෙලාගේ වාහන පරීක්ෂා කරන්නයි ලෑස්ති වෙන්නේ. අපට අවශ්‍ය කෙනෙක් ඔහේලා එක්ක ඉන්නවා කියා අපි සැක කරනවා. ඒ කෙනා ඔහේලා එක්ක හිටියොත් ඒක ඔහේලාට හොඳක් වෙන්නෙ නැහැ. එහෙම කෙනෙක් ඉන්නවා නම් එයා දැන්ම අපට බාර දෙන එක හොඳයි. ඒ නැතුව අපි එයාව හොයාගත්තොත් තමුසෙලාට බරපතළ දඬුවම් විඳින්න සිද්ධ වේවි''

ලොක්කා වෙතින් පළවූයේ විමතියට පත් බවකි. ''කපිතාන් මොනවා කියනවාද කියලා මට තේරෙන්නේ නැහැ. වාහන පරීක්ෂා කරන්න. ඒකෙ ප්‍රශ්නයක් නැහැ''

ලොක්කා සිතුවේ හමුදාව සොයන්නේ හමුදාවෙන් පැන ආ තරුණ පුද්ගලයකුය කියායි. ඔවුන් සොයන්නේ කුඩා පිරිමි ළමයකු බවත් ඒ ළමයා අලොයිසියස් රජකුමරු බවත් ඔහු දැන සිටියේ නැත.

කපිතාන්වරයා උස් හඬින් අණ නිකුත් කළේය. සොල්දාදුවන් රථ පෙළ පිරික්සුවේ ඒ වෑන් රියකින් යමෙක් පිටතට පැන දිව යා ද යන්න ගැන ද විමසිලිමත් වෙමිනි. වෑන් රථ ඇතුළත තිබූ බඩු



භාණ්ඩ හා රෙදි මිටි පවා එහා මෙහා කරමින් ඔවුන් පිරික්සුවේ ඒවාට මුවා වී කිසිවකු සිටිනවා ද කියා ය.

පිලිප් දුටු සොල්දාදුවෝ නතර වූහ. ඔවුනට අණ ලැබී තිබුණේ කෙසේ හෝ ගුසී ද අනෙක් ළමයින් තිදෙනා ද සොයා ගන්නට කියාය. ළමයින් සර්කස් කණ්ඩායමේ සිටියොත් රජ කුමරු කොහේද යන්න ඔවුන්ගෙන් දැන ගන්නට සොල්දාදුවන්ට පුළුවන.

ඔවුන් වලසුන් සිටි රථය වෙත එද්දී ඔවුන්ගේ පාවහන් පොළවේ ගැටී නැඟුණේ මහ හඬකි. ඒ හඬ වලසුන් තිදෙනා කෝපයට පත් කිරීමට සමත් වූහ. උන් මහ හඬින් ගොරවමින් සොල්දාදුවන් දෙස බැලූහ. ටෝනි එතැනට පැමිණ සොල්දාදුවන්ට අවවාද කළේ වලසුන් සිටින කූඩුවෙන් මඳක් ඈත්ව සිටින්න කියාය.

''මුං ඊයෙත් කුලප්පු වුණා'' ටෝනි පැවසුවේය. ''මේ වලසුන් පුහුණුකරුගේ සහායකයා. වලසුන් කීකරු කරගන්න ඔහුට පුළුවන් වුණා. පේනවානේ වලස් කූඩුව කැඩිලා හදලා තියෙන හැටි. පොඩ්ඩක් ඈතට වෙලා නොහිටියොත් උන් කූරු මතට පැනලා ආයෙමත් කූඩුව බිඳ දමාවි''

ටෝනි පැවසූ කිසිවක් පිලිප්ට නොවැටහුණු නමුත් පවසන්නට ඇත්තේ මොනවාදැයි ඔහු අනුමාන කළේය. ප්‍රශ්න කිරීමෙන් බේරෙන්නට කළ යුතු හොඳම දෙය කූඩුව ඇතුළට පිවිසීම බව පිලිප් තීරණය කළේය. ඔහු කූඩුව ඇතුළට පිවිසි වහා වලස්සු ඔහු වටා සතුටින් රොක් වූහ.

ඈත සිට ඒ දෙස බලා සිටි සොල්දාදුවෝ සහ කපිතාන්වරයා සෑහීමකට පත් වූහ. පිරිමි ළමයා සර්කසයට අයත් කෙනෙකි. වලසුන් පුහුණුකරුගේ සහායකයාය. නොඑසේනම් මෙසේ වලසුන් අසලට යා නොහැක. ඔහු සොයන්නැයි අණ ලැබී ඇති ළමයින්ගෙන් කෙනකු නොවේ. ඔවුන් ඊළඟ වෑන් රිය වෙත පිය මනිද්දී ටෝනි පිලිප් දෙස බලා ඉඟි මැරුවේය.

''හොඳයි'' ටෝනි කීවේය. ''ඔයා ඔතැනම ඉන්න. වෙන කොතැනකටත් වඩා ඔයා වලසුන් මැද ඉන්න එක ආරක්ෂා සහිතයි''

සොල්දාදුවෝ වැන් රියෙන් වැන් රියට පරීක්ෂා කළහ. පෙඩ්රෝ දෙපස සිටගෙන චිම්පන්සීන් දෙස බලා සිටි ඩිනා සහ ලුසී ඈන් දෙස වුවමනාවෙන් බැලුවේ නැත.

කපිතාන් පෙඩ්රෝ දෙස බැලුවේය. ඔහු තමන් සොයා ආ පිරිමි ළමයින් දෙදෙනාගෙන් කෙනකු විය නොහැකිද? ඔහු පෙඩ්රෝට කතා කළේය. පෙඩ්රෝ ගැහැනු ළමයින්ගේ ගෙල වටා දෑත් දමාගෙනම ඔහු වෙත පැමිණියේය. කපිතාන් ඔහුගෙන් යමක් විමසුවේ ටෞරි-හේසියානු භාෂාවෙනි. මෘදු ලෙස එම බසින්ම පිළිතුරු දුන් පෙඩ්රෝ සිය මවගේ කැරවෑනය වෙත අත දිගු කළේය. ඔහු පැවසුවේ තමන් ගමන් කරන්නේ තම මව හා ඥාති සොහොයුරිය ඈන්-මාරියා සමඟ බවය.

''එතකොට මේ ගෑනු ළමයින් දෙන්නා?'' කපිතාන් විමසුවේය.

''මේ අයත් සර්කස් එකේ කට්ටිය. මේ අය අර වලසුන් බලා ගන්නා පිරිමි ළමයා එක්ක ඉන්න දෙන්නෙක්. තුන්දෙනාම කචපච ජාතියේ. හේසියන් භාෂාව මේ අය දන්නේ නැහැ. ඒත් ඔබට යමක් අහන්න අවශ්‍ය නම් මේ අය ප්‍රංශ බස ටිකක් දන්නවා''

'කචපච' යන වචනය පෙඩ්රෝ පවසනු ඩිනාට ඇසිණි. ඒ සමඟම ඇය අනුමාන කළේ තමා හා ලූසී ඈන් කචපච ජාතියට අයත් යැයි පෙඩ්රෝ පවසන්නට ඇත කියාය. ඩිනා වහා කපිතාන් දෙස බලා සිනාසෙමින් අතපය වනමින් තේරුමක් නැති වචන පෙළක් තෙපළමින් කචපච ගාන්නට පටන් ගත්තාය. ලූසී-ඈන් වරින් වර හිස වැනුවේ තමා ඇය හා එකඟවන බව පෙන්වමිනි.

''හරි... හරි... ඇති'' කපිතාන් සිය භාෂාවෙන් පැවසුවේය. ''මේ කතා මට තේරෙන්නේ නැහැ. වචනයක්වත් තේරෙන්නෙ නැහැ. මොනවාද මෙයා කීවේ?''

පෙඩ්රෝ සිනාසුණේය. කපිතාන්වරයා කචපච රටේ කපිතාන්වරුන්ට වඩා කඩවසම් යැයි ඇය පැවසූ බව පෙඩ්රෝ කීවේය. සිනාසුණු කපිතාන් ගැහැනු ළමයින් දෙදෙනාට ආචාර කළේය. ඉන්පසු ඔහු ඔවුන් වෙතින් ඉවත් වූයේ ගැහැනු ළමයින්



ද බ්‍රිතාන්‍ය ජාතිකයන් නොවේ යැයි සිතමිනි. කචපච රට ගැන අසා නැති හෙයින් ඒ රට ඇත්තේ ලොව කුමන ප්‍රදේශයක දැයි සොයා බලන්නට ඔහු සිතුවේය.

සොල්දාදුවෝ 'මා' ගේ කැරවෑනයට ළඟා වූහ. ජැක් තවදුරටත් රැඳී සිටියේ රියැදුරු අසුනේය. කිකී ඔහුගේ උර මත රැඳී සිටියේය. කතා නොකරන ලෙස ඔහු ඌට උපදෙස් දී තිබිණි. ඒ උගේ ඉංග්‍රීසි වචන නිසා තමන් අසුවේය යන බියෙනි. ''ඒත් ඔයාට සද්ද කරන්න පුළුවන්'' ඔහු කී අතර ඌ එය මනාව වටහා ගත්තේය. සොල්දාදුවන් එතැනට එන විට කිකී කැස්සේය. සොල්දාදුවෝ විමතියෙන් ඌ දෙස බැලූහ.

''ජ්වෝක්'' ජැක් කිකීට පැවසුවේය. ''ජ්වෝක්, අර්කා ජ්වෝක්'' ඔහු එම වචන වල අරුත 'දක්ෂ ගිරවා' යන්න බව දැන සිටියේ කිකීගේ දස්කම් දැක මිනිසුන් 'අර්කා ජ්වෝක්' යනුවෙන් නිතර කෑ ගැසූ හෙයිනි.

කිකී ඊළඟට ඉක්කා ගැසුවේය. සොල්දාදුවෝ සිනාසුණහ. කිකී සිනාසී කිකිළියක මෙන් කෙකර ගෑවේය. සොල්දාදුවෝ කිකීගේ දක්ෂතා දකිමින් මහත් සේ ප්‍රීති වෙද්දී ඔවුන් පසුපසින් රෞද්‍ර හඬක් නැඟිණි. ඒ ඔවුන්ගේ කපිතාන්වරයාය.

''ඇයි මේ කොල්ලා ළඟට වෙලා කාලෙ නාස්ති කරන්නෙ?'' කපිතාන් විමසුවේය. ''ගිරවෙක් එක්ක ඉන්න එයා සර්කස්කාරයෙක් වග පේනවානෙ. මේ කැරවෑනය පරීක්ෂා කරන්න''

කපිතාන් පැවසුවේ මොනවාද යන්න වටහා ගත හැකි තරමට හේසියානු බස ගැන අවබෝධයක් ඒ වන විට ජැක් ලබා සිටියේය. ජැක් ගැන සොල්දාදුවන්ට හෝ කපිතාන්ට සැකයක් නැත. ඩිනා හා ලූසී ඈන් ගැන ද ඔවුහු සැක නොකළහ. දැන් ඉතිරිව සිටින්නේ ගුසී පමණකි. ඔහු සාර්ථකව උදා වී ඇති වාතාවරණයට මුහුණ දෙනු ඇත්ද?

සොල්දාදුවෝ දෙදෙනෙක් කැරවෑනයට ගොඩ වූහ. 'මා' පසෙකින් හිඳගෙන සිටින ගුසී ඔවුනට පෙනිණි. ''කවුද මේ?'' ඔවුහු උස් හඬින් විමසූහ. ''මොකක්ද එයාගේ නම?''

# 26. වෙළෙන්දාගේ වෑන් රථය

ලජ්ජාවෙන් මෙන් ඔවුන් දෙස බැලූ ගුසී, වහා යළි 'මා' ගේ උකුලේ සිය මුහුණ සඟවා ගත්තේය. එය 'මා' ගේ අදහසක් ක්‍රියාවට නැංවීමකි.

''ඔය.... ඔය'' හේසියානු භාෂාවෙන් 'මා' පැවසුවාය. ''නැඟිටලා මේ මහත්තුරුන්ට උත්තර දෙන්න, මගේ පුංචි ඈන්-මාරියා'' ඇය සොල්දාදුවන් වෙත හැරුණාය.

''ඔහේලා සමාවෙන්න ඕනෙ'' මා කීවාය. ''මේ පුංචි කෙල්ල හරි ලජ්ජාකාරි. හ්ම්.... නැගිටපං පුංචි කෙල්ලේ. නැගිටලා ඔය කරන දේ මේ මහත්තුරුන්ට පෙන්නමු''

නැගී සිටි ගුසී ලැජ්ජාවෙන් මෙන් සිය හිස බිමට නැඹුරු කරගෙනම තමා අත වූ ගෙත්තම සොල්දාදුවන්ට පෙන්වීය. කවුළුවෙන් බලා සිටි ජැක් සිතුවේ ගුසීගේ රඟපෑම ඉහළ මට්ටමක පවතිනවා කියාය. එම ගෙත්තම පෙන්වීම නුවණැති ක්‍රියාවකි. එය පෙන්වන්නැයි උපදෙස් දෙමින් ගෙත්තම ගුසීගේ අතට දී තිබුණේ 'මා' ය. එම ගෙත්තම ඊට පෙර කරමින් සිටියේ 'මා' බව ජැක් දැක තිබිණි.

''මේ මගේ මිනිපිරී'' මා කීවාය. ''මේ කරුණාවන්ත මහත්තුරුන්ට කතා කරන්න ඈනා-මාරියා''



ගුසී කිසිත් නොකියා යළි සිය මුහුණ ඇගේ උකුලේ සඟවා ගත්තේය.

''එයාට කරදර කරන්නෙපා'' එක් සොල්දාදුවෙක් පැවසුවේය. ''එයා වගේම මගේ දූත් ලැජ්ජයි''

''ලජ්ජාකාරි වුණාට මෙයාට හොඳට මැහුම් පුළුවනි'' මා ආඩම්බරයෙන් පැවසුවේ ගුසී ගේ හිස පිරිමදිමිනි. ''නැගිටින්න දරුවෝ. මේ මහත්තුරු ඔයාව ගිලින්නේ නැහැ''

''අපි යනවා'' පළමු සොල්දාදුවා කීවේය. ''මෙන්න මේ කාසිය එයාට දෙන්න ටොෆී ගන්න කියලා. මෙයාව දැක්කාම මට මගේ දුව මතක් වෙනවා''

ඔහු දුන් කාසිය අතට ගත් 'මා' එය ගවුම් සාක්කුවේ දමා ගත්තාය. සොල්දාදුවන් දෙදෙන ඉවතට යනු දුටු ජැක් සැනසුම් සුසුමක් හෙළීය.

''ඔක්කොම හරි. එයාලා ගියා. ගුසී ඇත්තටම ඔයා හොඳම නළුවෙක් වගේ රඟපෑවා. රඟපෑමේ හැකියාව ඔයාට සහජයෙන්ම තියෙනවා.''

ගුසී හිස ඔසවා වටපිට බැලුවේය. සිනාසෙමින් සිටි ඔහුගේ මුහුණ රතු වී තිබිණි. ''මට ඒ විදියට හැසිරෙන්න ඉගැන්නුවේ 'මා' කිසිම වෙලාවක මූණ නොපෙන්නා උකුලේම හංගාගෙන ඉන්න කීවෙත් 'මා' මං රඟපාන්න කැමතියි. ඒත් ගෑනු ඇඳුම් ඇඳගෙන නං නෙවෙයි. දැන් මම බේරිලා. එහෙම නේද?''

''මං එහෙම හිතනවා'' ජැක් පැවසුවේ මාර්ගය දෙස බලමිනි. ''සොල්දාදුවන් එයාලගේ වාහන ළඟට ගිහින් ඒවාට නගිනවා. ඔව් පළවෙනි වාහනය යනවා. අනික්වාත්. හප්පා. සෙබළුන් මේ වාහනය ළඟට එනකොට මට හීන් දාඩිය දැම්මා''

හමුදා රථ මාර්ගයේ ඉදිරියට ගිය වහා වලසුන්ගේ කූඩුවෙන් බැසගත් පිලිප් අනෙක් අය වෙත දිව ආවේ සිනාසෙමිනි. ඔවුනු 'මා'ගේ කැරවෑනය අසල රොක් වූහ. ජැක් පැවසූ ගුසී ගේ රඟපෑමේ දක්ෂතාව පිළිබඳ කතාවට ඇහුම්කන් දුන්හ.

ගුසී සතුටට පත්ව සිටියේය. ඔහු නිතර අනායයන්ගේ පැසසුමට ලක්වන්නකු නොවීය. පිරිස තම රංගන දක්ෂතාව ගැන කතා කිරීම ඔහුගේ සතුටට හේතු විය. ඔහු 'මා' ගේ කැඩපතට එබී බැලූ අතර ඔහුට පෙනුණේ කරල් දෙකට ගෙතූ හිසකේ හා රිබන් පටිය. ඔහුගේ මුහුණ අඳුරු විය.

''මට මං ගැනම දුකයි'' ඔහු පැවසුවේ කැඩපත දෙස බලාගෙනය. ''දැන් මම මගේ ඇඳුම් අඳින්නම්''

''නැහැ... නැහැ... දැන්ම නෙවෙයි'' ජැක් වහා කීවේය. ''එහෙම කළොත් ඔයා හිතන්නත් කලින් කවුරු හරි ඔයාව අඳුනාගනීවි. කොහේ හරි ආරක්ෂා සහිත තැනකට යනතුරු ඔයා ඉන්න ඕනෙ ඔය විදියට වෙස් මාරු කරගෙන. ගුසී ඔයා රඟපාන්න ආසයිනේ. ඔයා ඇත්තටම හුගාක් හොඳට රඟපානවා''

රථ පෙළ නැවත ගමන් ඇරඹූ නමුත් ගමන ආරම්භයේදී බොහෝ දෙනා අතර වූ උද්යෝගය හීන වී තිබිණි. රාත්‍රියේ ඔවුනට නිදාගත හැකි වූයේ කෙටි කාලයකි. නින්දට හා ගමනට ඇති වූ බාධා නිසා ඔවුහු වෙහෙසට පත්ව සිටියහ. සවස හයට තේ පානය සඳහා ගමන නතර කළ ඔවුහු තවත් අඩ පැයකින් පමණ පසු නැවත ගමන් ඇරඹූහ.

ඔවුහු ගමන් කළේ පාලු පිටිසරබද මාර්ගයක් ඔස්සේය. මාර්ගය අබලන් තත්ත්වයක පැවැති නිසා ගමන සිදුවූයේ සෙමිනි. එහෙත් කිසිවකු ඒ ගැන සිත කරදර කර ගත්තේ නැත. දර්ශනය ඇරඹෙන්නට ළං වූ විට කලබල වනු හැර අන් කිසිම අවස්ථාවක කලබල වීම සර්කස්කරුවන්ගේ පුරුද්ද නොවීය.

ඔවුන් රාත්‍රියේ කන්දක් පාමුල කඳවුරු ලා ගත්හ. පෙරදා රැයේ හරිහැටි නින්ද නොලැබූ නිසා සියල්ලෝම ඒ රැයේ ඉතා හොඳින් නිදා ගත්හ. උදෑසන ඔවුන් යළි ගමනට සූදානම් වූයේ තම ගමනාන්තය කොතැනදැයි නිවැරදිව නොදැනය.



ලොක්කා හදිසියේම පැවසුවේ පිරිස වැරදි තැනකින් හැරී ඇති නිසා ආපසු සැතපුම් කිහිපයක් ගොස් නිවැරදි තැනින් හැරී ආ යුතු බවය. රථ සියල්ල ආපසු හරවා ගැනිණි. ඔවුන් පසු කළේ ඉතා පාළු ප්‍රදේශයකි. අතරමග දී කිසිවකු හමු වූවා නම් ඒ ඉතාමත් කලාතුරකිනි.

''මට වෙළෙඳ සලකට දෙකකට යන්න ඕනෙ'' 'මා' අරගල කළාය. ''මට බඩු මුට්ටු ගන්න තියෙනවා. අපි හැමෝටම එක එක දේවල් මිලට ගන්න තියනවා. වෙළෙඳසල් තියෙන පළාතකටයි අපි යන්න ඕනෙ. මම ගිහින් ලොක්කාට කියනවා''

එහෙත් ඇය ඔහු හමුවට ගියේ නැත. ඒ ඇය ලොක්කාට බිය වූ බැවිනි. කපු නූල්, පලතුරු හා කොණ්ඩා කටු ඇයට අවශ්‍යව තිබිණි.

''කලබල වෙන්න ඕනෙ නැහැ මා. අපට සංචාරක වෙළෙන්දකුගේ වෑන් එකක් මඟදී මුණගැහේවිනේ.'' මා ගේ කරච්චලය ඉවසිය නොහැකි තැන පෙඩ්රෝ කීවේය.

''මොන වෑන් එකක්?'' ජැක් විමසුවේය.

''ඔය ඈත තියෙන ගම්වලට හැම ජාතියකම බඩු මුට්ටු පටවාගෙන වෑන්වලින් යන වෙළෙන්දන් මේ රටේ ඉන්නවා.'' පෙඩ්රෝ පැහැදිලි කර දුන්නේය. ''එහෙම වෙළෙන්දෙක් අපට හමුවේවි කියලා හරියටම කියන්න බැහැ. මම එහෙම කීවේ අම්මාගේ කන්කරච්චලය කොහොම හරි නවත්තාගන්න ඕනෙ නිසා''

එදින අඳුර වැටෙද්දීම ගමන නවතා කඳවුරු බඳින්නට ලොක්කා අණ කළ අතර සැවොම ඒ ගැන කැමැත්ත පළ කළහ. ඉක්මනින්ම ගිනි මැල දැල්වුණු අතර පිසෙන ආහාරයන්ගේ සුවඳ හාත්පස පැතිර යන්නට විය.

මඳ වෙලාවකට පසු පෙනුණේ කඳවුර දෙසට පැමිණෙන වෑන් රථයකි. මුලින්ම එය දුටු මැඩම් ෆිෆී මහ හඬින් කෑ ගැසුවාය. සියල්ලෝම මාවත දෙස බැලූහ.

''මා ඔයා වාසනාවන්තයි'' පෙඩ්රෝ කීවේය. ''ඒ එන්නේ සංචාරක වෙළෙන්දකුගේ වෑන් රියක්''

කුඩා කළු පැහැ වෑන් රිය සර්කස් කණ්ඩායමේ කඳවුර දෙසට පැමිණියේය. එහි ඉදිරිපස අසුනේ ටෞරි-හේසියානු ඇඳුම්වලින් සැරසී ගත් දෙදෙනෙක් සිටියහ. දැඩි හිරු රැසින් පිළිස්සුණු සම සහිත ඔවුන්ගෙන් එක් අයකු කුඩා සිරුරැත්තකු වූ අතර අනෙකා තර සිරුරක් සහිත අයෙක් වූයේය.

''ගුසී එයාලාට නොපෙනී ඉන්න එක හොඳයි'' ජැක් පැවසුවේය. ''සමහර විට අපිව නැවත පරීක්ෂා කරන්න මේ දෙන්නා එවලා ද කියලා කවුද දන්නෙ?''

''අපොයි!'' ලුසි ඈන් මැසිවිලි නැඟුවාය. ''එයාලා ආයෙමත් මේ සේරම පරීක්ෂාවට ලක් කරනවා කියලා නම් කියන්නෙපා''

කුඩා සිරුරැත්තා වාහනයෙන් බැස වාහනයේ පැත්තක් විවෘත කළේය. එහි ඇතුළත වූ රාක්ක මත විවිධ බඩු මුට්ටු ගොඩ ගසා තිබිණි. එය ඇත්තෙන්ම කුඩා ගම්මානයන්හිදී දැක ගත හැකි සිල්ලර කඩයකට සමාන විය.

''ඒකේ හැම දේම තියෙනවා. මා ඔයාට ඕනෙ දේවල් මම මිලට ගන්නද?'' පෙඩ්රෝ විමසුවේය.

''එපා. මං ඇවිත් ගන්නං. ඇනා-මාරියා ඔහොම ඉන්න''

''අපිත් ගිහිං අපට අවශ්‍ය බඩු මුට්ටු මොනවාද තියෙන්නේ කියලා බලමුද? ජැක් ඔයා ළඟ හේසියානු සල්ලි තියෙනවා නේද?'' ඩිනා විමසුවාය. ''මට සබන් කෑල්ලක් දෙකක්. තව ඒ වගේ දේවල් කිහිපයක් ගන්න තියෙනවා. ඒ අය ඔත්තුකාරයන් නෙවෙයි වගේ. නියම වෙළෙන්දන් වගෙයි පෙනෙන්නේ''

''ඔව්. මටත් එහෙම හිතෙනවා.'' ජැක් පැවසුවේය. ''අපි එතැනට යමු. ගුසී මෙහේ හිටපුවාවේ''

අනෙක් අය ජංගම වෙළෙඳසල වෙත යද්දී අසරණ ගුසී පමණක් 'මා' ගේ කැරවෑනය ඇතුළතට වී සිටියේය.



කුඩා මිනිසා බඩු මුට්ටුවල මිල පවසමින් ඒවා අලෙවි කළ අතර තර මිනිසා ඔහුට සහාය ලබා දුන්නේය. ඔහු කිසිවක්ම නොපැවසූ නමුත් අනෙකා වාචාලයෙක් වූයේය. සියලු දෙනා සමඟ මොන මොනවා හෝ කතා බහ කරමින් අලුත් ආරංචි ඇද්දැයි විමසන්නට ද ඔහු අමතක නොකළේය.

''මොනවද ඔහේලාට ලැබුණු අලුත් ආරංචි?'' ඔහු 'මා' ගෙන් හා මහලු ලූසියාගෙන් විමසුවේය. ''ඔහේලා ආවේ බොර්කෙන් ප්‍රදේශයේ ඉඳලා නේද? රජතුමා ගැන මොකුත්ම ආරංචි නැද්ද? තවම රජතුමා හමුවෙලා නැහැ නේද?''

'මා' ඔහුට පැවසුවේ පෙරදා රැයක සණ්ඨා නාද වූ ආකාරයයි. මහලු ලූසියා 'මා' ගේ කතාවේ අඩු ලුහුඬු තැන් සම්පූර්ණ කළාය.

''පුංචි කුමාරයා අලොයිසියස් කොහේද?'' මහලු ලූසියාට දැනගන්නට අවශ්‍ය විය. ''එයාලා කියනවා කුමාරයා එංගලන්තයේ පාසලක ඉගෙන ගන්නවා කියලා. රජතුමා මිය ගිහින් නම් කුමාරයා මෙහාට කැඳවාගෙන එන්න වේවි නේද?''

''සොල්දාදුවන් ඇවිත් අපිවත් පරීක්ෂා කළා'' මැඩම් ෆිෆී පැවසුවාය. ''මොනවාද එයාලා හොයා ගන්න බැලුවේ? රජතුමා වෙන්නැති''

සැවොම සිනාසුණහ. මඳ වේලාවක් තිස්සේ වෙළෙඳාම හා කතා බහ සිදුවිය. ගැහැනු ළමයින් සඳහා රසකැවිලි මිලට ගන්නට ජැක් වෑන් රථය වෙත ගියේය. කිකී ඔහුගේ උරහිස මත වසා සිටියේය.

''සුබ උදෑසනක්. සුබ රාත්‍රියක්'' කිකී එක දිගට පැවසුවේය. වෙළෙන්දා සිනාසුණු නමුත් ඔහුගේ සහායක තර මිනිසා සිනාසුණේ නැත. ඒ වෙනුවට ඔහු වහා හැරී බැලුවේ කිකී දෙසය. ජැක්ට යම් අපහසුවක් දැනිණි. ඔහු එසේ කිකී දෙස පමණක් බැලුවේ මන්ද? එම පුද්ගලයාගේ හැඩරුව හොඳින් බලා ගන්නට ජැක්ට අවශ්‍ය වූ නමුත් ඒ වන විට තදින් අඳුර පැතිරී තිබිණි.

ලූසී-ඈන් ටොෆී බෝතලයක් පෙන්වූවාය. ''අර ටොෆී වලට මං ආසයි'' ඇය එසේ පැවසුවේ ඉංග්‍රීසි බසිනි. තර මිනිසා ගල් ගැසුණු බව ජැක් නිරීක්ෂණය කළේය. ලූසී-ඈන් ඊළඟට පවසන

දෙය අසන්නට ඔහු සූදානමින් සිටින බවක් පෙනිණි. ඔහු රාක්කයක තිබූ ටින් එකක් අතට ගත්තේය. ලුසී-ඈන් වහා සිය හඬ අවදි කළාය.

''අන්න අන්නාසි ටින් එකක්. ඒක ගන්න. කිකී ඕකට කැමතියි''

තර මිනිසා වහා ඔවුන් වෙත හැරෙද්දී ජැක් ලුසී-ඈන් අඳුරට තල්ලු කළේය. මේ මිනිසා ඔත්තුකාරයෙකි. ඒ ගැන ජැක්ට කිසිම සැකයක් නොතිබිණි. ඔහු නැවත ඒ මිනිසා දෙස බැලූ නමුත් මිනිසාගේ හැඩ රුව හොඳින් නොපෙනිණි. සැම ටෞරි-හේසියානු පිරිමියකුටම මෙන් ඔහුට ද කැරළි ගැසුණු හිසකේ තිබූ අතර ඔහු උඩු රැවුලක් ද වවා සිටියේය. ජැක් දුටුවේ එපමණකි.

''ඇයි මොකද ජැක්?'' ලුසී-ඈන් විමතියෙන් යුතුව ඇසුවේ ජැක් ඇය ඩිනා හා පිලිප් වෑන් රිය අසලින් ඉවතට තල්ලු කරගෙන යන විටය.

තමන්ට සිතුණු දේ ඔහු පැවසූ අතර අනෙක් තිදෙන කලබලයට පත් වූහ. ඔවුන් වහා 'මා' ගේ කැරවෑනය වෙත ගියේ ගුසී ආරක්ෂා සහිතව සිටිනවා දැයි දකින්නටය. ඔහු එහි සිටිනු දුටු ඔවුනට මහත් සැහැල්ලුවක් දැනිණි.

''ගුසී ඔයාගෙ ගෙත්තම අතට ගන්න'' ජැක් පැවසුවේය. ''සැක සහිත කෙනෙක් අපි දැක්කා. ලුසී ඈන් ඉංග්‍රීසියෙන් කතා කරනවාත් ඒ මිනිහට ඇහුණා. කිකී කතා කළෙත් ඉංග්‍රීසියෙන්. ඒ මිනිහා ඕනෙවට වඩා උනන්දුවක් දැක්වූවා''

''මං හිතන්නේ මිනිහා ඉක්මනින්ම මෙතැනින් පිටවෙලා යාවි'' පිලිප් පැවසුවේය. ''මම ගිහින් බලාන ඉන්නම්. ඒ අය ගියාම මම ඇවිත් කියන්නම්''

එහෙත් වෙළෙඳ රිය පිටව ගියේ නැත. වෑන් රථයේ පසෙක වූ විශාල දොර වසා දමා වෙළෙඳාම කෙළවර කළ මිනිස්සු දෙදෙන වෑන් රථය ආසන්නයේ ගිනි මැලයක් දල්වාගෙන යම් අහරක් පිස ගත්හ.



''එයාලා රැය මෙතැනම ගත කරනවා'' පිලිප් වාර්තා කළේය. ''ඒක ඒ තරම් හොඳ නැහැ නේද? අනික මැඩම් ෆිෆී මට කීවා පුංචි මිනිහා කිකී ගැන ප්‍රශ්න ඇහුවා කියලා. ඒ මිනිහා අහල තියෙනවා ගිරවා අයිති ළමයා කණ්ඩායමේ කෙනෙක් ද? එයාගේ වෑන් එක කොහේද? කියලාත්'

''දෙවියනේ'' ජැක්ට කියැවිණි. ''අපි මොකද කරන්නේ? අපට මෙතැනින් මේ රෑ පලා යන්න බැහැ. අනික කොහාට කියලා යන්නද? අපි මේ ඉන්නෙ කොහේද කියලාවත් අපි දන්නෙ නැහැනේ. අපට තියෙන හොඳම දේ බලාපොරොත්තු විතරයි. ගුසී 'මා' එක්කම හිටපුවාවෙ. අපි පුරුදු විදියට ගෑනු ළමයින් නිදා ගන්න වෑන් එක යට නිදා ගනිමු. සේරටම වඩා වැදගත් ගුසී. අපිව ඒ තරම් වැදගත් නැතත් සිටුවරයා හිතනවා ඇත්තේ අපි ඉන්න තැනකම ගුසීත් ඉන්නවා ඇති කියලායි''

පෙඩ්රෝගේ වෑන් රියට ගිය ගැහැනු ළමයින් දෙදෙන ඇඳුම් මාරු කරගෙන නින්දට පිවිසියහ. ගුසී 'මා' ගේ ආරක්ෂාව යටතේ සිටි අතර අනෙක් පිරිමි ළමයි තිදෙන වෑන් රිය යටට වී වැතිර ගත්හ. පෙඩ්රෝ ඉක්මනින්ම නින්දට පිවිසි අතර සිත් කරදරයෙන් පසු වූ පිලිප් හා ජැක් අවදියෙන් සිටිමින් එකිනෙකා හා මිමිනූහ.

හදිසියේම ජැක් පිලිප් ගේ සිරුරට ඇන්නේය. ''කවුරු හරි එනවා'' ඔහු පිලිප්ගේ සවනට කෙඳිරුවේය. ''කවුරු හරි වෑන් එක ළඟට දණ ගාගෙන එනවා''

ජැක් විදුලි පන්දම අතට ගෙන සූදානම් වූයේය. ඔව්, කිසිවකු වෑන් රථය අසලට දණ ගා ගෙන එන බව නිසැකය. ජැක් වහා විදුලි පන්දම දැල් වූයේය.

විදුලි පන්දම් ආලෝකයෙන් පෙනුණේ අසල දණ ගසාගෙන සිටි මිනිසාගේ විමතිය පිරි මුහුණයි. ඒ ජංගම වෙළෙඳ රියේ සිටි තර මිනිසාය. ඔහුගේ හිසකේ විදුලි පන්දමේ එළියෙන් හොඳින් දිලිසිණි.

''මොනවද ඔහේට ඕනෙ?'' ජැක් විමසුවේ දැඩි ස්වරයකිනි. ''ඇයි මෙතැනට දණ ගාගෙන ආවේ? අපි අනෙක් අයවත් ඇහැරවලා ඔහේව අල්ලා දෙන්නද?''

# 27. විමතිය සහ සැලැස්ම

''ශ් ....... ෂ්'' මිනිසා හදිසියෙන් මෙන් කීවේය. ''මම.....''

ඔහු තවත් යමක් පවසන්නට පෙර අමුතු දෙයක් සිදු විය. විමතියෙන් මෙන් ඔහු දෙස බලා සිටි කිකී වහා ඔහු වෙත පියඹා ගොස් ඔහුගේ උරහිස මත වසා මහත් සෙනෙහසින් උගේ හොටය ඔහුගේ කම්මුලක ඇතිල්ලුවේය.

''කිකී'' මිනිසා පැවසුවේ උගේ ගෙල පිරිමදිමිනි.

''සිලි-බිලි' කිකී කීවේ ආදරණීය ස්වරයකිනි. ''සිලි-බිලි-දොස්තර එක්කරගෙන එන්න''

විමතියට පත්ව සිටි ජැක්ට වචනයක් හෝ කතා කර ගත නොහැකි විය. කිකී මෙසේ හැසිරෙන්නේ ඇයි? කිකී ඔහු හඳුනන්නේ කෙසේද? පිලිප් අනුමානයක් ඇති කර ගත්තේය. ඔහු වහා වෑන් රථයෙන් පිටතට රිංගා ගියේය.

''බිල් ! බිල් ! මේක හීනයක්. බිල් මේ ඔයා නේද? ඔයා බොරු කොණ්ඩයක් දාගෙන නේද ඉන්නේ?''

සිනාසුණු තර මිනිසා ඔහුගේ කළු පැහැ කොණ්ඩය ගලවා දැමුවේය. ඔව්. ඔහු පැළඳ සිටියේ බොරු කොණ්ඩයකි. එය රහිතව ඔහු සැබෑ ස්වරූපයෙන් දිස් වූ අතර වෙනසක් තිබිණි නම් ඒ උඩු රැවුල පමණකි. එය ද ඇලවූ බොරු රැවුලක් විය.



''බිල්. මට මේක විශ්වාස කරන්නත් අමාරුයි'' පිලිප් පැවසුවේය. බිල් පිලිප්ට අතට අත දුන්නේය. ජැක් ද වෑන් රිය යටින් රිංගා පිටතට ආවේය. මෙය සිහිනයක් මිස සැබෑවක් විය නොහැකි යැයි ඔහුට සිතිණි.

නමුත් එය සත්‍යයකි. ඒ බිල්මය. ඔහු මහත් චුවමනාවෙන් ගැහැනු ළමයින් ගැන විමසුවේය. ''ඒ දෙන්නා හොඳින් ඉන්නවා දැකීම මට ලොකු සතුටක්'' බිල් පැවසුවේය. ''එයාලාගේ ඇඳුම් නිසා මට මුලින් එයාලා අඳුනාගන්න බැරි වුණා. ඊත් මම ලූසි ඈන්ගේ කට හඬ ඇඳින්නා. කිකීවත් ඇඳින්නා. ඌ ඔයාගේ උරහිස උඩ ඉන්නවා දැක්කම මට මගේ ඇස් අදහා ගන්න බැරි වුණා. කෝ ගැහැනු ළමයින්? මේ වෑන් එක ඇතුළේ ද?''

''ඔව්, ඔයා අපේ වෑන්එක ගැන විමසූ විත්තිය අපට ආරංචි වුණා'' ජැක් පැවසුවේය. ''අපි හිතුවේ ඔයා ඔත්තුකාරයෙක් කියලයි. ඒ ඔයා කියා තිකමටවත් අපි හිතුවේ නැහැ. ඒ වගේම ඔයා මේ රැ අපිව හොයාගෙන ඒවි කියලත් හිතුවේ නැහැ. අපි වෑන් එකට ගිහින් ඒ දෙන්නාව අවදි කරවමු. පෙඩ්රෝවත් අවදි කරවමු. එයා අපේ හොඳ යාළුවෙක්''

ඉක්මනින්ම මහත් සතුටට පත් පිරිස වෑන් රිය ඇතුළත රොක්ව සිටියහ. කිකී ද ඔවුන් හා එක්ව සිටියේය. ලූසි-ඈන් බිල්ගේ අතේ එල්ලී සිටියේ ඔහුට අඟලක්වත් එහාට යන්නට ඉඩ නොදීය. ඇගේ දෑසින් වැගිරුණු කඳුළු කම්මුල් දිගේ පහළට රූටා වැටුණේය.

''මම අඬනවා නෙවෙයි බිල්. මේ සතුටු කඳුළු. මට ඒ කඳුළු නවත්තාගන්න අමාරුයි'' කඳුළු අතරින් සිනා නගමින් ලූසි-ඈන් පැවසුවාය.

බිල් තම කලිසම් සාක්කුවෙන් විශාල ලේන්සුවක් ගෙන ලූසි ඈන්ගේ කඳුළු පිස දැමුවේය. ඔහු ලූසි-ඈන් වෙත දැක්වූයේ ඉමහත් සෙනෙහසකි. ''දැන් හිනාවෙලා ඉන්න. දැන් අපි ආයෙත් එකතු වෙලා. ඔයාලාට පුළුවන් වේවි බොහොම වැදගත් තොරතුරු ටිකක් මට දෙන්න''

''කොහොමද අම්මා?'' පිලිප් විමසුවේය. ''එයා දුකෙන්ද?''

''හුඟාක් දුකෙන්'' බිල් පිළිතුරු දුන්නේය. ''ඔයාලා පැහැරගත් දවසෙ රෑ අපි දෙන්නා උන්ට අහුවුණා. ඊළඟ උදෑසන ගමේ මහත්මිය ඒ පැත්තට එන තුරුම අපට අත පය බැඳගෙන ඉන්න සිද්ධ වුණා. අපි පොලිසියට දැන්වූවා. පොලිසිය රට පුරාම ඔයාලව හොයනවා. ගුසීත් ඔයාලා එක්කම අතුරුදහන් වෙලා කියා අපි පොලිසියට කීවෙ නැහැ. එහෙම නොකීවේ ඒ ආරංචිය ටෞරි-හේසියාවට එන්න ඕනෙ නැති නිසා''

''අපිව මෙහාට ගෙනාවෙ ගුවන් යානයකින්. ගුවන් තොටුපොළේ ඉඳන් කාරෙකින්'' පිලිප් පැවසුවේය. ''එහෙදි කාරෙකේ ඩිකියේ හැංගිලා ඇවිත් ජැක් ගුවන් යානයට නැඟගෙන තිබුණා. ඒ නිසා අපිව ගෙනිච්චේ බොර්කෙන් මාලිගාවට වග ජැක් දැනගෙන තිබුණා. අපිව බේරාගත්තේ ජැක්''

''මම කිකී එක්ක සර්කස් කණ්ඩායමට එකතු වුණා.'' ජැක් පැහැදිලි කළේය. ''පෙඩ්රෝ මට හැමදේකදිම සැහෙන්න උදව් කළා. මෙයාලාව බේරා ගන්න අපට ටෝනිගෙයි බින්ගෝගෙයි සහායත් ලැබුණා. හප්පා.... ඒ වැඩේ නං සැහෙන භයානකයි''

ළමයින් බේරා ගත් ආකාරය ජැක් බිල්ට විස්තර කර කියද්දී බිල් එම විස්තරයට සවන් දුන්නේ මහත් විමතියෙන් යුතුවය.

මොන දේ සිදුවූවත් ළමයි නිර්භීතව ඒවාට මුහුණ දී අසරණ ගුසී ද සමඟ දැන් නිදහස ලබාගෙන සිටිති.

''ඒත් බිල්. ඔයා මෙහාට ඇවිත් මොනවාද කරන්නේ කියලා තවම අපට කීවේ නැහැ'' ජැක් පැවසුවේය.

''මෙහෙමයි. මේ රටේ රජතුමා ඝාතනය කරලා හෝ අත් අඩංගුවට අරගෙන වග අපේ රජයට දැන ගන්න ලැබුණාම ඔවුන්ට අවශ්‍ය වුණා හරියටම ඇත්ත තත්ත්වය දැනගන්න'' බිල් පැවසුවේය. ''ඒ වගේම ගුසී සොයා ගැනීමත් අත්‍යවශ්‍ය වුණා. ටෞරි හේසියන් රජතුමා ගුසී බාරදීලා තිබුණේ මටනේ. ඒ නිසා මම මෙහාට ඇවිත් තොරතුරු සොයා ගන්න ඕනෙ කියලා අපේ රජය තීරණය කළා''

''මෙහේ එන්න කලින්ම ඔයාට හිතුණ ද අපිත් ඉන්නේ ටෞරි-හේසියාවේ කියලා?'' පිලිප් විමසුවේය.



''ඔව්. ගුසී ගෙනගිය දිහාවටම ඔයාලාවත් ගෙනියන්න ඇති කියලා මම මුල ඉඳන්ම නිගමනය කරගෙන හිටියා. ඒ අපේ රජය ගුසී සම්බන්ධයෙන් යම් බලපෑමක් කළොත් ඔයාලාව ප්‍රාණ ඇපකාරයන් හැටියට යොදා ගන්න බවත් මම දැනගෙන හිටියා'' බිල් කීවේය. ''රජතුමා අතුරුදහන් වූ බව ආරංචි වූ හැටියෙම අපි නියත වශයෙන්ම දැන ගත්තා ගුසී ඉන්නෙ පැරිටෝලෙන් සිටුවරයාගේ බල ප්‍රදේශය වූ බොර්කෙන් හි යම් තැනක කියලා. එහේ යම් තැනකම රජතුමාත් හිරකරගෙන ඇති කියලා අපි සිතුවා. ඒ නිසා හේසියන් භාෂාව හොඳින් කතා කරන්න පුළුවන් කෙනෙකුයි, මායි කෙළින්ම මේ රටට ඇතුළු වී ජංගම වෙළෙන්දන් හැටියට වෙස් වලාගෙන ඔත්තු සෙව්වා.''

''ඔයාත් ආවාම අම්මා තවත් දුක් වෙන්න ඇති'' ඩිනා පැවසුවාය.

''හෙට සමහරවිට ඇගෙන් මට පණිවිඩයක් ලැබේවි... දැන් මට මේක කියන්න. රජතුමා රඳවාගෙන ඇති කියලා ඔයාලා සැකකරන තැනක් තියෙනවද?''

''බොර්කෙන් මාලිගාවේ'' ජැක් නොපැකිළ පැවසුවේය. ''මට ඒක විශ්වාසයි. ඒ ඇයි කියලත් මම කියන්නම්''

තමා මාලිගයට ඇතුළු වූ ආකාරය ද සිටුවරයා හා මැඩම් ටැටිඕසා රහසේ සාකච්ඡා කළ අයුරු ද ජැක් බිල්ට විස්තර කර කීවේය.

''එදා රෑ ඊට පස්සෙ තමා රජතුමා අතුරුදහන් වෙලා කියන ආරංචිය පැතිරුණේ. ඔවුන්ගේ සැලසුම් එතෙක් නිවැරදිව ක්‍රියාත්මක වුණා. සිටුවරයා ඇගේ සොහොයුරිය හොයාගෙන එන්න ඇත්තේ රජතුමා මාලිගාවේ කොතැනක හෝ හිර කරලා. අනික රජතුමා හිර කරගෙන තියාගන්න සිටුවරයාගේ මාලිගාව තරම් වෙන හොඳ තැනක් ඔවුන්ට ඇත්තේ නැහැ. ඊළඟට රජ කරවන්න ඔවුන් හිතා හිටිය ගුසී රඳවාගෙන හිටියෙත් ඒ මාලිගාවෙමයි''

බිල් ජැක් කළ විස්තරයට සවන් දුන්නේ මහත් උනන්දුවෙන් යුතුවය. ''ඔයා හිතන විදිය හරි'' බිල් පැවසුවේය. ''මාලිගාවට ඇතුළු වුණා නම් අපට මොනවා හරි දැනගන්න පුළුවන් වේවි. මා එක්ක ඇවිත් ඉන්න රොනල්ඩ්ට හේසියානු භාෂාව හොඳට කතා කරන්න පුළුවනි. රොනල්ඩ්ට සමහර විට පුළුවන් වේවි මාලිගාව

ඇතුළට යන්න ක්‍රමයක් හොයා ගන්න. ඔය මොකක් හරි හදන්න ආව කෙනෙක් වගේ. නැත්නං ඒ වගේ වෙන රාජකාරියකට ආ කෙනෙක් වගේ''

''එයා කරන්න ඕනෙ දේ මම දන්නවා'' ජැක් පැවසුවේ මහත් උද්යෝගයෙන් යුතුවය. ''මාලිගාව ඇතුළට යන්න පාරක් මම දන්නවා බිල්. පළවෙනි දවසේ මම මාලිගාවෙන් පිටතට ආ පාර, විශාල නැටුම් ශාලාවේ රහස් දොරකින් ඇතුළු විය හැකි උමං මාර්ගයක් හරහායි මං ආවේ. නැටුම් ශාලාවේ විශාල චිත්‍රයක් පිටිපස්සේ තියෙන රහස් දොරකින් උමඟට ඇතුළු වෙන්න පුළුවනි. ඒත් ඒ පින්තූරය එහා මෙහා කරන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ''

''ඒකට ක්‍රමයක් අපි හොයා ගනිමු'' බිල් පැවසවේය. ''ජැක් මේ වැඩේට ඔයා එනවාද මා එක්ක යන්න? රොනල්ඩ්ටයි මටයි මාලිගාවට ඇතුළු වන පාර පෙන්නන්න ඔයාට පුළුවනිද? රජතුමා ජීවතුන් අතරද? එතුමා හිරකරගෙන ඉන්නේ කොහේද? කියන ප්‍රශ්නවලට උත්තර හොයන්න අපට පුළුවන් වුණොත් හරි. කුමන්ත්‍රණකාරයන්ගේ සැලසුම් අවුල් වෙලා ඇත්තේ ගුසී අතුරුදහන් වෙලා නිසා. දැන් රටට රජ කෙනෙක් නැහැ. සිහසුනේ හිඳුවන්න කුමාරයෙක් නැහැ. දැන් ඔවුන් ඉන්නේ ලොකු අමාරුවක වැටිලා''

''අනිවාර්යයෙන්ම මම එනවා බිල්'' ජැක් පැවසුවේය.

''මාත් එනවා'' පිලිප් පැවසුවේය.

''නැහැ. ඔයා මේ ගෑනු ළමයින් ආරක්ෂා කරගෙන මෙහේ ඉන්න ඕනෙ'' බිල් පැවසුවේය. ''මම ඔයාලාගෙන් එක්කෙනෙක් එක්කරගෙන යන්නම්. ගුසී ගැනත් ඇහැ ගහගෙනම ඉන්න. ඔයාට පෙඩ්රෝත් උදව් කරාවිනෙ''

''එහෙමනං අපි දැන්ම යමු ද?'' ජැක් විමසුවේ නොඉවසිල්ලෙන් යුතුවය. ''මේ දවස්වල රාත්‍රියත් බොහොම අන්ධකාරයි''

''ඉක්මන හුඟාක් හොඳයි'' නැඟී සිටිමින් බිල් පැවසුවේය. ''ඔහොම ඉන්න. මම රොනල්ඩ් එක්කරගෙන එන්නම්. මුලින්ම මට එයාට දෙන්න උපදෙස් කිහිපයකුත් තියෙනවා. මේ විස්තර ඇහුවාම එයා පුදුම වේවි''



බිල් පිටව ගියේය. ඉතිරි පස්දෙනා අතර පැතිර ගිය නිහැඬියාව බිඳ දැමුවේ කිකීය. ''ඩිං ඩොං බෙල්. බිල්ස් ඉන් ද වෙල්... පූසි ගොට් අ කෝල්ඩ්... හච්චීචීචීං...''

''ඇත්තටම බිල් මේ රෑ අපට මෙහෙම මුණගැහිමත් පුදුමයක් නේද? මුලින්ම එයාව අඳුනාගත්තෙ කිකී'' ජැක් පැවසුවේය.

''දැන් සේරම හරි'' ලුසී-ඈන් තෙපලුවේ සතුටිනි.'' බිල් කවදත් ආව ගමන් හැම ප්‍රශ්නයක්ම විසඳෙනවා''

''ඒ වුණාට අද රෑට කරන්න තියෙන වැඩේ නං ලේසි නැහැ'' ඩිනා පැවසුවාය.

බිල් රොනල්ඩ් ද කැඳවාගෙන එතැනට පැමිණියේය.

''ලෑස්ති නං අපි යමු නේද?'' බිල් පැවසුවේය.

වෑන් රථයෙන් බිමට බැස ගත් ජැක්, බිල් හා රොනල්ඩ් පසුපස ගමන් කළේය. ඔවුහු ජංගම වෙළෙඳ වෑන් රිය අසලට ආහ. ඔවුන්ගේ සූදානම ආපසු බෝර්කෙන් බලා යාමටය. එතැන් සිට බෝර්කෙන් වෙත තිබුණේ විශාල දුරක් නොවේ. ගත වූ දෙදින පුරා සර්කස් කණ්ඩායම ගමන් කළේ ඉතාමත්ම සෙමිනි. බෝර්කෙන් බලා යාමට පැය දෙකකට වඩා ගත නොවන්නේ යැයි ජැක් අනුමාන කළේය. රොනල්ඩ් රථය පැදවීය. කිකී සුපුරුදු ලෙස ජැක්ගේ උරහිස මත වසා සිටියේය. ඌ ජැක් සමඟ ඕනෑම දෙයකට මුහුණ දීමට සූදානමින් සිටියේය.

ඔවුහු බෝර්කෙන් වෙත ළඟා වූහ. නගරය ගන අඳුරේ ගිලී පැවතිණි.

''සර්කස් කණ්ඩායම කඳවුර ඉදිකරගෙන සිටිය තැන වෑන් රථය නතර කරන එක හොඳයි'' ජැක් ඔවුන්ට මඟ පෙන්වමින් පැවසුවේය. ''ඊට පොඩ්ඩක් එහා කන්ද උඩයි මාලිගාව තියෙන්නේ''

විශාල පඳුරු ගොන්නක් පසුපස ඔවුහු වෑන් රිය නතර කළහ. ඉන්පසු ඔවුහු මාලිගාව දෙසට ගමන් ඇරඹූහ.

''අර තියෙන්නේ සණ්ඨා කුළුණ'' ජැක් පැවසුවේ ඊට ළං වෙමිනි. ''ඒත් ඒ වටේ දැන් මුරට සෙබළුන් යොදවලා ද දන්නේ නැහැ. අපට එදා යන්න වුණේ කට්ටිය බේරාගෙන යොදා ගත්ත කඹය එහෙම්ම තියලා''

ජැක් හදිසියේ දුටුවේ. මාලිගයේ කවුළුවලින් නිකුත් වන ආලෝකයකි. එම ආලෝකයෙන් මාලිගයේ ඉහළ මහලක කවුළු හය හතක් දිලිසිණි. එහි අදහස මේ මැදියම් රැයේ මාලිගය ඇතුළත වැදගත් යමක් සිදුවන බවය.

''එතැන සිද්ධ වෙන දේ දැනගන්න තිබුණා නං හොඳයි'' බිල් එම කවුළු දෙස බලමින් පැවසුවේය. ''සමහර විට එතැන රැස්වීමක් පැවැත්වෙනවා වෙන්න පුළුවනි''

''උමඟ දිගේ එද්දී මම රැස්වීම් පැවැත්වෙන තැනක් කියා සිතිය හැකි කුඩා කාමරයක් පහුකරගෙන ආවා'' ජැක් පැවසුවේය. ''එතැන රවුම් මේසයක්, පුටු, කඩදාසි හා තීන්ත තිබුණා. එතැනම තවත් කාමරයක් ඉහළින් අර කාමරය දෙස බැලිය හැකි ආකාරයේ කුඩා සිදුරකුත් තිබුණා. අපට ඒ කාමරයට ගියොත් අනෙක් කාමරයේ සිදුවන දේවල් බලන්න, සිදුවෙන කතා බහට ඇහුම්කන් දෙන්න පුළුවන් වේවි''

''අපි එතැනට යන්නම ඕනෙ'' බිල් පැවසුවේය. ''යමු... ඉක්මනටම. සණ්ඨා කුළුණට. ජැක් කොහේද ඔයා කීව බිම් දොර තියෙන්නේ?''

ඔවුහු බාධාවකින් තොරව සණ්ඨා කුළුණට පිවිසියහ. ජැක් පහසුවෙන්ම බිම්දොර සොයා ගත්තේය. බිල් එය විවෘත කළ පසු තිදෙනාම උමඟට ඇතුළු වූහ. ඉන්පසු බිල් සෙමෙන් හඬ නොනැඟෙන සේ බිම් දොර වසා දැමුවේය.

''ඉස්සර වෙන්න ජැක්'' ඔහු කීවේ ප්‍රබල ආලෝක ධාරාවක් නිකුත් කෙරෙන විදුලි පන්දමක් දල්වමිනි. ඒ සමඟම ජැක් දුටුවේ බිල් හා රොනල්ඩ් අත රිවෝල්වර තිබෙන බවය. එහි අදහස තමන් නියැලී සිටින්නේ බැරෑරුම් කාර්යයක බව ජැක් වටහා ගත්තේය.

''මේ පැත්තෙන්'' ගොඩ ගසා තිබූ සුන්බුන් අතරින් රිංගා යමින් ජැක් කීවේය. ''පුළුවන් තරං නිස්සද්දව. දැන් මෙහෙන්''

# 28. නැවතත් බෝර්කෙන් මාලිගයට

ජැක් පිවිස සිටියේ ඉතා පටු නොඋස් උමඟකටය. එම උමඟ ඔහුට හොඳින් මතක තිබුණේ එහි ඔහු දණ ගාගෙන ගමන් කළ බැවිනි. ජැක් බිල්ට හා රොනල්ඩ්ට මඟ පෙන්වමින් ඉදිරියෙන්ම ගමන් කළ අතර බිල් අත වූ ප්‍රබල විදුලි පන්දමෙන් ඔවුන් ගිය මඟ ආලෝකවත් විය.

හදිසියේ ජැක් නතර වූයේය. ''අර මන්තු බලන සිදුර තියෙන තැනට දැන් අපි හුඟාක් කිට්ටුයි'' ඔහු මිමිණුවේය. ''එතැන යම් හමුවක්, රැස්වීමක් පැවැත්වෙනවා නම් ඒ ගැන බලන්න ඇහුම්කන් දෙන්න පුළුවන් වෙන්නේ එක්කෙනාටයි. මට මතක විදියට එතැන තියෙන්නේ එකම එක සිදුරයි''

''එතෙන්ට ගියාම මට කියන්න'' මිමිණූ බිල් යළි ඉදිරියට ගමන් කිරීම ඇරඹුවේය. වැඩි වේලාවක් ගත වන්නට පෙර ජැක් දුටුවේ දකුණු පස බිත්තියේ සිදුරකින් උමඟට වැටෙන සිහින් ආලෝක ධාරාවකි. ඒ ඔවුනට අවශ්‍ය කළ සිදුරයි.

ඔහු ඒ ගැන බිල්ට මුමුණා කීවේය. ආලෝක ධාරාව දුටු බිල් හිස ඉහළ පහළ වැනුවේය. ඔහුට ජැක් පසුකර ඉදිරියට යන්නට තරම් ඉඩක් උමගේ තිබුණේ නැත. එහෙයින් ජැක් සිදුර පසු කොට ඉදිරියට ගමන් කළේ බිල්ට එම සිදුරට ළං වීමට ඉඩ සලසමිනි. රොනල්ඩ් බිල් පසුපසට වී නිහඬව සිටියේය. තමා ද නිහඬවම සිටිය යුතු බව කිකී දැන සිටියේය.

බිල් තම ඇස සිදුරට ළං කළේය. ජැක් විස්තර කළ ආකාරයටම රවුම් මේසයක්, පුටු, කඩදාසි හා තීන්ත සහිත කාමරය බිල්ට පෙනිණි. ලාම්පු කිහිපයක්ම එහි දල්වෙමින් තිබූ අතර මේසය වටා වූ සියලු පුටු පිරී තිබිණි. එතැන ප්‍රධානත්වය සිටුවරයා උසුලන බව පෙනුණු අතර ඔහු අසලම මැඩම් ටැට්ඕසා හිඳගෙන සිටියාය. ඔහුගේ අනෙක් පස හිඳගෙන සිටින්නේ අගමැතිවරයා බව බිල් වටහා ගත්තේ ඔහු හේසියානු අගමැතිවරයා ඡායාරූපවලින් දක ඇති බැවිනි. ඔහු වෙතින් කිසියම් රෝගී ස්වභාවයක් ප්‍රකට වූ අතර හමුදා නිල ඇඳුමෙන් සැරසී ගත් කිහිප දෙනෙක් ද එතැන අසුන්ගෙන සිටියහ.

මේසය අසල උස මිනිසකු සිටගෙන සිටි අතර ඔහුගේ හැඩරුව ගුස්ටාව්ට සමාන යැයි බිල්ට හැඟිණි. ඒ අනෙකකු නොව ටෞරි-හේසියාවේ රජතුමාය. බිල්ට යම් සැහැල්ලුවක් දැනිණි. රජතුමන් ඝාතනයට ලක් වී නැත. රජතුමාට මෙතැනින් ගැලවී යා ගත හැකි වුවහොත් සිවිල් යුද්ධයක් ඇතිවීම වළක්වා රටේ තත්ත්වය යහපත් අතට හරවා ගත හැකි වනු නිසැකය.

හොඳින් ඇහුම්කන් දුන්නට බිල්ට කාමරය ඇතුළත සිදුවන කතා බහ පැහැදිලිව ඇසුණේ නැත. එහෙත් සිදුවන්නේ කුමක්ද යන්න වටහා ගන්නට ඔහුට ඇසුණු ප්‍රමාණය සෑහිණි.

රජතුමාට බල කෙරුණේ සිහසුන අතහැර රජකමෙන් විශ්‍රාම ගෙන ගුසීට කිරුළ පළඳින්නට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න කියාය.

''කිරුළ අතහැරීම ගැන සඳහන සහිත මේ ලියැවිල්ලට ඔබ අස්සන් නොකරනවා නම් එය ඔබගේ තරකටම හිටීවි'' පැරිටෝලෙන් සිටුවරයා තර්ජනය කළේය. ''අස්සන් කරන්නම ඕනෙ. අපි ආයෙ නම් කියන්නෙ නැහැ. මේ අන්තිම වතාව''

බිල් කතා බහ වටහා ගත්තේ අසීරුවෙනි. ඒ ඔහුට හේසියානු බස ගැන හොඳ අවබෝධයක් නොතිබූ නිසාවෙනි. ඔහු එම භාෂාව යාන්තමට හෝ ඉගෙන ගන්නට පටන් ගත්තේ ටෞරි-හේසියාවට පැමිණෙන්නට සිදුවන බව දැනගැනීමෙන් අනතුරුවය.

අගමැතිවරයා සිය විරෝධය පළකරමින් යමක් පැවසූ නමුත් සිටුවරයා එය ගණනකට නොගන්නා බව පෙනිණි. මැඩම් ටැට්ඕසා කෝපයෙන් මොන මොනවාදෝ පවසා යළි හිඳගත්තේය. යළිත්



රජතුමා මොනවාදෝ සෙමෙන් පැවසූ අතර බිල්ට ඒ එකම වචනයක් හෝ ඇසුණේ නැත.

''හොඳයි'' සිටුවරයා පැවසුවේය. ''එහෙම නං අද රෑ එළිවෙන කොට ඔහේ හිත හදාගන්න ඕනෙ. අද රෑ විතරයි ඔබට තියෙන්නේ. අපි මේ රැස්වීම අවසන් කරනවා''

සිටුවරයා ද අනෙක් අය ද නැඟී සිටියහ. සිටුවරයා තම සොහොයුරිය හා අගමැතිවරයා සමඟ එතැනින් පිටව ගියහ. රජතුමා හමුදා නිලධාරීන් සිව්දෙනෙකුට මැදිව ගමන් කළේ ශෝකයෙන් හා බිමට නැඹුරු කරගත් හිසින් යුතුවය. කුඩා කාමරයේ ලාම්පු නිවී යද්දී එහි පැතිර ගියේ නිශ්ශබ්දතාවකි. බිල් වහා රොනල්ඩ් වෙත හැරී තමා ඇසූ හා දුටු දෑ විස්තර කර කීවේය.

''රජතුමාට ඉතිරි මේ රාත්‍රිය විතරයි. අස්සන් කරන්න බැහැ කීවොත් රජතුමා ඉවරයි. මට හිතෙන විදියට එතුමා අස්සන් කරන්න බැහැ කියාවි''

ඉන්පසු තිදෙන අතර පැතිර ගියේ නිහැඬියාවකි. බිල් කල්පනා කළේ තමන් ටෞරි-හේසියා අගනගරයට ගොස් සිදුවන සියල්ල දන්වා රජතුමා බේරාගන්නට පිරිස කැඳවාගෙන එන්නේ ද කියාය. ඒ සඳහා සෑහෙන කාලයක් ගත වන හෙයින් එය කළ නොහැක්කක් බව බිල් තීරණය කළේය. බෝර්කෙන් සිට අගනුවරට සෑහෙන දුරක් තිබිණි. කරන්නට ඉතිරිව තිබුණේ එකම එක දෙයක් පමණකි. ඒ තමන් කෙසේ හෝ රජතුමා බේරා ගැනීම බව බිල් වටහා ගත්තේය.

ඔහු තම අදහස ජැක්ට කොඳුරා කීවේය. ජැක් හිස ඉහළ පහළ සැලුවේය. ''ඔව්. ඒත් රජතුමා අද රාත්‍රියේ රඳවා තබන්නේ කොහේද කියා අපි දැනගන්න ඕනෙ. ඔහු මාලිගාවේ කාමරයක තබන එකක් නැහැ. ඒ රජතුමාත් ගුසී වගේම පැනයාවි කියන බිය නිසා කොහොමටත් අපි නැටුම් ශාලාවට යමු. චිත්‍රය එහාට කරලා අපි කොහොම හරි මාලිගාවට ඇතුළු වෙමු.

යළිත් ජැක් පෙරමුණ ගත්තේය. ඉක්මනින්ම ඔවුහු පඩිපෙළ වෙත ළඟා වූහ.

''මේ පඩිපෙළ ඉහළ තමයි මම කීව චිත්‍රය තියෙන්නේ'' ජැක් පැවසුවේය. ''ඒක එහාට කරලා සිදුරු විවෘත කරගන්න මාර්ගයක්, ක්‍රමයක් තියෙනවාද බලන්න''

බිල් හා රොනල්ඩ් පඩි පෙළ ඉහළට ගොස් බිත්තිය අත ගෑහ. බිල්ගේ අතට හසු වූයේ ලීවරයකි. එය ඇද්ද වහා චිත්‍රය සිදුර මතින් ඉවත් වනවා විය හැක. ඔවුහු හොඳින් ඇහුම්කන් දුන්හ. ශාලාවෙන් කිසිම හඬක් නෑසිනි. අවදානම ගෙන සිදුර විවෘත කරගන්නට බිල් තීරණය කළේය. ඔහු ලීවරය ඇද්ද වහා චිත්‍රය සෙමෙන් සෙමෙන් පසෙකට වන්නට විය. සිදුර විවෘත වුවත් ඔවුහු නිහඬවම මදක් පමා වූහ. ශාලාවට ප්‍රවිෂ්ඨ විය හැකි ආකාරයෙන් සිදුර විවෘත විය. ඒ විශාල ශාලාව එකම එක ලාම්පුවකින් පමණක් ආලෝකවත් වෙමින් තිබිණි. බිල් සිදුරෙන් පිටතට හිස යොමා බැලුවේය.

''ශාලාවේ කවුරුවත්ම නැහැ'' ඔහු අනෙක් අයට කොඳුරා කීවේය. ''අපි ශාලාවට ඇතුළු වෙමු.''

ඔවුහු සිදුර හරහා ශාලාවට ඇතුළු වූහ. තිදෙනාම රබර් අඩි සහිත පාවහන් පැළැඳ සිටි නිසාවෙන් ඔවුන් ඇවිදින විට කිසිම හඬක් නොනැඟිණි.

''කෝකටත් අපි රජතුමා මේ මාලිගාවේම කාමරයක රඳවාගෙන ඉන්නවාද කියා හොයා බලමු.'' ජැක් පැවසුවේය. ''විශේෂයෙන්ම ගුසීලා රඳවා තැබූ තැන. එතැනට යන විදිහ මට මතකයි. මම ගිහිං බලන්නම්. එතකං මේ තිරවලට මුවා වෙලා ඉන්න''

නැටුම් ශාලාවෙන් පිටව සර්පිලාකාර පඩි පෙළ ආසන්නයට ආ ජැක් හොඳින් ඇහුම්කන් දුන්නේය. කිසිම හඬක් ඇසුණේ නැත. ඔහු වහා පඩිපෙළ දිගේ ගමන් කළේ ගුසී ඇතුළු පිරිස රඳවාගෙන සිටි කාමරය වෙතටය. එහි දොර විවෘතව ඇති බවත් කාමරය අඳුරෙන් පිරී ඇති බවත් ජැක්ට පෙනිණි. රජතුමා එම කාමරයේ රඳවා නැත. ඔහු නැවත නැටුම් ශාලාව වෙත ගියේය. රොනල්ඩ් හා බිල් සැඟව සිටි තැනට ගිය ජැක් සිහින් හඬින් කතා කළේය. ''වැඩක් නැහැ. දොර ඇරලා. රජතුමා එතැන නැහැ''

''හොඳින් ඇහුම්කන් දෙන්න'' බිල් හදිසියේම පැවසුවේය. ''මට සද්දයක් ඇහෙනවා''

ඔවුහු ඇහුම්කන් දුන්හ. එය සොල්දාදුවන්ගේ පාවහන් පොළවේ ගැටෙන විට නැඟෙන හඬකි. ඒවා ක්‍රමයෙන් ළං ළංව



ඇසිණි. ඇසුණු ශබ්දයන්ගෙන් වැටහුණේ පුද්ගලයන් දෙදෙනකු හෝ තිදෙනකු පැමිණෙමින් සිටින බවය. ශබ්දය නැටුම් ශාලාවෙන් ඈතට යද්දී බිල් තිරයෙන් පිටතට හිස යොමුකර බැලුවේය.

''සෙබළුන් දෙන්නෙක්'' ඔහු මිමිණුවේය. ''මම හිතන්නේ ඔවුන් යන්නේ තවත් සෙබළුන් දෙදෙනකු ඉන්නා තැනට. සේවා මුර මාරු කරගන්න. ඒ යන්නේ රජතුමා ඉන්න තැන මුර කරන්න වෙන්න බැරිද? අපි මෙතැනටම වෙලා බලා ඉඳිමු. සේවා මුර අවසන් කළ සෙබළුන් දෙන්නෙක් මෙතැනින් යන්න ආවොත් අපි දන්නවා මුලින් සෙබළුන් දෙදෙනා ගියේ මුර සේවයට බව. ඊළඟට අපි ඒ සෙබළුන් දෙදෙනා හොයාගෙන යමු''

''මම මෙහාට ආව පළවෙනි දවසෙත් මුර භටයෙක් ඒ පඩි පෙළ දිගේ පහළට ගියා'' ජැක් පැවසුවේය. ''මම හිතන්නේ පහළ තියෙන්නේ සිර කුටි. රජතුමා ඇත්තේ ඒ කුටියක සිරකරලායි''

''ඇහුම්කන් දෙන්න'' රොනල්ඩ් පැවසුවේය.

නැවතත් සෙබළුන්ගේ පාවහන් හඬ ඇසුණු අතර එවර එතැන පසු කර ගියේ වෙනත් සෙබළුන් දෙදෙනෙකි. පළමු සෙබළුන් ගිය දෙසට නොව විරුද්ධ දිශාවට ගමන් කළ ඔවුන්ගේ පාවහන් පොළොවේ ගැටෙන හඬ නෑසී යන තුරුම තිදෙන තිරයට මුවා වී සිටියහ.

''දැන් අපි වැඩ කරන්න ඕනෙ'' බිල් පැවසුවේය. ''හොඳට ඇස් කන් ඇරගෙන''

ඔවුහු පඩි පෙළ දිගේ පහළට බැස පළමු සෙබළුන් දෙදෙනා ගමන් ගත් කොරිඩෝරයට ඇතුළු වූහ. කොරිඩෝරය කෙළවරදී දකුණට හැරී පඩි කිහිපයක් බැස පෙරට වඩා පටු කොරිඩෝරයකට පිවිස ගමන් කරන්නට ඔවුනට සිදු විය. එම කොරිඩෝරය කෙළවරදී නැවත වතාවක් එක පසෙකට හැරෙන්නට සිදු වූ නමුත් ඔවුහු වහා නතර වූහ. නැවතත් ඔවුනට ඇසුණේ සෙබළුන්ගේ පියවර හඬය. ඒවා කෙමෙන් ළං ළංව ඇසෙන්නට විය.

තිදෙන සිටි තැනට මදක් එපිටින් කාමරයක දොර ඇරී තිබිණි. තිදෙන වහා එය ඇතුළට රිංගා ගත්හ. කාමරයේ පැවතියේ ගන අඳුරකි. සෙබළුන් කාමරය පසුකරගෙන කොරිඩෝරයේ ඉහළට ගිය ද මඳ වෙලාවකට පසු නැවතත් සෙබළුන්ගේ පාවහන් හඬ

ඇසෙන්නට විය. එම හඬ තමන් පසුකරගෙන ගිය පසු ද බිල් ඒ හඬට ඉතා හොඳින් ඇහුම්කන් දීගෙන සිටියේය. ඔවුන් ආපසු හැරෙන්නට පෙර සෑහෙන දුරක් ගමන් කරන බව ඔහුට අවබෝධ විය.

''මම හිතන්නේ රජතුමා හිර කරලා ඉන්නේ මේ කොරිඩෝරය මැද තියෙන කුටියක.'' බිල් කීවේය. ''ඒ කුටිය පසුකොට සෙබළුන් සෑහෙන දුරක් ගමන් කරලායි ආපහු හැරෙන්නේ. නැවත වතාවක් ඔවුන් අපි මේ සිටින තැන පසුකරගෙන යන තුරු ඉඳිමු. ඉන් පස්සෙ අපි හෙමිහිට ඉස්සරහට ගිහිං බලමු. සෙබළුන් ආපහු එන හඬ ඇහුණොත් අපට කොරිඩෝරය කෙළවරට ගිහින් හැංගෙන්න වෙලාව තියෙනවා''

ආපසු ඇවිද ආ සෙබළු, තිදෙන සැඟවගෙන සිටි කාමරය පසු කරගෙන ගමන් කළහ. බිල්, රොනල්ඩ් හා ජැක් වහා කාමරයෙන් පිටව සෙබළුන් ගිය දිසාවට විරුද්ධ දෙසට වේගයෙන් ගමන් කළහ. ඔවුන් පිවිසියේ ඉදිරි මඟ වැසුණු කෙළවරකටය. දැවැන්ත දොරක් ඉදිරියේ තිබූ අතර එහි යතුරකින් ඇරෙන අගුළක් මෙන්ම සොයිබ රැසක් ද තිබිණි. සොයිබ දමා තැතුවාට දොරට යතුරු දමා ඇති බව වැටහුණේ බිල් එය විවෘත කිරීමට උත්සාහ දැරූ විටය.

''ස්.. ස්... ස්...'' හදිසියේ රොනල්ඩ් හඬ නැඟුවේ අනෙක් දෙදෙනා අඳුරු කෙළවරකට ඇද ගන්නා අතරතුරය. බිල් හා ජැක් විමසිලිමත් වූයේ රොනල්ඩ් අනතුරු ඇඟවූයේ කුමකට ද කියාය. ඔවුන් සිටි තැනට මඳක් එපිටින් දොරක් විවෘත විය. ඔවුන් ඒ දොර නොදුටුවේ එය ද බිත්තියේම කොටසක් සේ පෙනෙන පරිදි තැනී තිබූ බැවිනි. කිසිවෙක් ලන්තෑරුමක් ද අතැතිව පැමිණියේය. ඒ අනෙකකු නොව පැරිටෝලෙන් සිටුවරයාය. ඔහු පැමිණ ඇත්තේ රජතුමා මරා දමන්නද? නොඑසේනම් කිරුළ අත හරින්නැයි නැවත වතාවක් රජතුමාට බල කර කීමට ද?

බිල් තවත් යමක් දුටුවේය. ඒ සිටුවරයා අත තිබූ ලොකු යතුරකි. එය රජතුමා රඳවා සිටින කුටියේ යතුර බවට කිසිම සැකයක් නොතිබිණි. සෙබළුන් ආපසු පැමිණෙන හඬ ඇසූ සිටුවරයා වහා ආපසු ගියේ දොර යාන්තමට වසාගෙනය. ඔහුගේ ඉරියව් වලින් පැහැදිලි වූයේ සෙබළුන් එහි පැමිණ ආපසු ගියාට පසු ඔවුනට නොපෙනී යළි කොරිඩෝරයට පිවිසීම ඔහුගේ අභිලාෂය වූ බවයි.



''රොනී'' බිල් තම මිතුරාගේ සවනට මුව ළං කොට කොඳුළේය. ''අපි ඒ යතුර ගන්න ඕනෙ. ඔයාට තේරුණානෙ? අපි සිටුවරයා අල්ලාගන්නත් ඕනෙ. මම දොර ඇරගෙන රජතුමා කුටිය ඇතුළේ ඉන්නවාද බලන තුරු ඔයා සිටුවරයා ගැන බලාගන්න. සිටුවරයාට කිසි සද්දයක් කරන්න ඉඩ තියන්නෙපා''

''ඒක මං නියමෙට කරන්නං'' රොනි කීවේය.

සෙබළු කොරිඩෝරය කෙළවරට පැමිණ ආපසු හැරී යළි ඉදිරියට ගමන් කළහ. ඔවුන්ගේ පියවර හඬ ගුසි යද්දී දොර යළිත් විවෘත වූ අතර එක අතකින් ලන්තෑරුම ද අනෙක් අතින් යතුර ද ගෙන සිටුවරයා කොරිඩෝරයට පිවිසියේය.

සියල්ල සිදු වූයේ ඉතා වේගයෙනි. කුමක් සිදුවී ද යන්න ජැක් පවා පැහැදිළිව දුටුවේ නැත. සිටුවරයා විමතියට පත් වූ වගක් පෙනෙන විටම ඔහු දුටුවේ බිල් යතුර අරගෙන දොර දෙසට දිව යන අයුරුය. රොනි සිටුවරයා ඇදගෙන ගමන් කළේ විවෘත වූ දොර දෙසටය. ලන්තෑරුම නිවී ගියේය. ඉන්පසු හාත්පස පැතිර ගියේ දැඩි නිහැඬියාවකි.

ආපසු පැමිණි රොනි විදුලි පන්දම දැල්වීය. බිල් දොර විවෘත කරන ආකාරය ඔහුට පෙනිණි. ''මට අර දොර පිටිපස්සෙ අඳුරු පුංචි සිර කුටියක් හම්බ වුණා.'' රොනල්ඩ් පැවසුවේය. ''ඒක සිටුවරයාට හොඳට ගැළපෙනවා. මම මිනිහාගෙ අතපය බැඳලා ඒක ඇතුළට දාලා දොර වැහුවා. කැමති නං මිනිහාට කෑ ගහන්න පුළුවනි. හැබැයි ඒ කෑ ගැහිල්ල කාටවත් ඇහෙන එකක් නැහැ''

''නියම වැඩක් රොනී'' බිල් කීවේය. ''යතුරෙන් අගුළ විවෘත වුණත් තවත් සොයිබ හයක් විතර තියෙනවා. අපි මේවා ඇරගෙන කාමරය ඇතුළට යා ගන්න කලින් සමහර විට සෙබළුන් ආපහු ඒවි''

රොනල්ඩ් වහා දොර ආසන්නයේ තිබූ ලාම්පුව නිවා දැමුවේය. ''සොයිබ ඇරලා කියලා සෙබළුන් දකින්න ඕනෙ නැහැ'' රොනී පැවසුවේය. ''ඉක්මන් කරලා ඇතුළට යන්න බිල්. මම ජැක් එක්ක පිටතින් ඉඳලා සෙබළුන් ගැන වග බලා ගන්නම්''

# 29. සිටුවරයා දණින් වැටෙයි

අවසානයේ දොර විවෘත කරගත් බිල් කුටිය ඇතුළට ගියේය. ඉතා සිහින් ආලෝක ධාරාවක් කුටිය ඇතුළතින් පිටතට ගලා ආවේය. රොනී වහා යළි දොර වසා දැමුවේය. ජැක්ට දැනුණේ තම හදවත වේගයෙන් ස්පන්දනය වන බවයි. බිල් රජතුමා ද කැඳවාගෙන පිටතට ඒමට පෙර සෙබළුන් ආපසු පැමිණේවිද?

දොර යළිත් වතාවක් විවෘත වූ අතර එවර සිහින් ආලෝකය නොපෙනිණි. කුටිය ඇතුළත වූ ලාම්පුව බිල් විසින් නිවා දමනු ලැබ තිබිණි. ඔහු සමඟ තවත් අයෙක් සිටියේය. ඒ රජතුමාය.

''දැන් සේරම හරි'' ජැක් සිතුවේය.

සෙබළුන් ආපසු එමින් සිටි අතර ඔවුන්ගේ පියවර හඬ පැහැදිලිව ඇසිණි. බිල් වහා බිත්තියේම කොටසක් සේ පෙනෙන දොර විවෘත කරගෙන රජතුමා සමඟ ඇතුළට පිවිසියේය. රොනී හා ජැක් ද ඔහු අනුගමනය කළහ.

''නියම වෙලාවට! ඔයා හිතන්නේ සෙබළුන් දොරේ සොයිබ ඇරිලා තියෙනවා නොදකීවි කියලද?'' ජැක් විමසුවේය. ''ඒ සොයිබ ආපහු දාන්න ඔයාට වෙලාවක් ලැබුණෙ නැහැනෙ''

''අපට ඉක්මනටම දැනගන්න ලැබේවි'' බිල් පැවසුවේය. ''ඒ අය ඒවා දකීවි. ඒවා ගැන පරීක්ෂාකාරී වීම එයාලගේ රාජකාරිය''



හදිසියේම ජැක් කලබලයට පත් වූයේය. ''කිකී....? කෝ කිකී? ඌ ටිකකට කලින් මගේ උරහිසේ වහලා හිටියානෙ. දැන් ඌ නැහැ. කිකී අහකට පියාඹනවා මට දැනුණේ නැහැ. බිල්... කිකී ඇත්තේ දොරෙන් එහා කොරිඩෝරයේ කොහේ හරි''

කිකී සිටියේ කොරිඩෝරයේය. ජැක් අතුරුදහන් වීම ගැන ඌ කලබලයට පත්ව සිටියේය. ජැක් කොහේද? සෙබළුන් ළඟ ළඟම පැමිණෙන බව කිකීට වැටහිණි. ගිරවා වහා කොරිඩෝර බිත්තියේ ගලක් ගැලවී ගිය තැනකට පියඹා ගොස් වැසුවේය. සෙබළු ගිරවා සිටි තැන පහළට ළඟා වූහ.

''හූ ඌ ඌ ඌ..... හූ ඌ ඌ ඌ ඌ..... හු ඌ ඌ ඌ ඌ''

සෙබළු ගමන නතර කළහ. එක් සෙබළෙක් අනෙකාට යමක් පැවසුවේ බිය මුසු වූ ස්වරයකිනි.

කිකී බල්ලකු මෙන් ගෙරවූයේය. අඳුරු කොරිඩෝරය පුරා ඒ හඬ දෝංකාරය දුන්නේය. සෙබළු වටපිට බැලූහ. බල්ලා කොහිද?

''ඥා... ච්ච්ච්, ඥා.....ච්ච්ච්..... ඥාච්ච්ච්'' කුසගින්නෙන් පෙළෙන බළලකු මෙන් හඬ නැගූ කිකී ඊළඟට සිනාසුණේය. ''කකුල් පිහ ගන්න. නාහෙ සුද්ද කර ගන්න. පොප් පොප් පොප්''

ඒ එක ද වචනයක් සෙබළුන්ට නොවැටහුණු නමුත් ඔවුහු මහත් සේ බියට පත්ව සිටියහ. භීතියෙන් යුතුව ඔවුහු එකිනෙකා වැළඳ ගත්හ.

කිකී මිනිසකු මෙන් කහින්නටත් උගුර පාදන්නටත් පටන් ගත්තේය. සෙබළුන් එතරම් බියට පත් කරවන්නට හැකි වෙතැයි කිකී සිතන්නට නැත. එහෙත් තම අත වූ රයිෆල පසෙකට විසි කළ සෙබළු දෙදෙන සිය භාෂාවෙන් කෑ ගසමින් දිව ගියහ.

ජැක්ට මේ සියල්ල හොඳින් ඇසුණේ කිකී ගැන සොයා බලන අපේක්ෂාවෙන් ඔහු යාන්තමට දොර විවෘත කළ බැවිනි. ඔහු නිහඬව සිනාසෙමින් කිකීගේ දක්ෂතාවනට සවන් දුන්නේය. ඔහු සෙමෙන් කිකීට කතා කළ අතර ඌ වහා සෙබළුන් දිව යද්දී පියඹා විත් ඔහුගේ උර මත වැසුවේය.

බිල් සිතුවේ ඊළඟට කළ යුතු හොඳම දෙය කුමක් ද කියාය. තමන් පැමිණි මාර්ගයෙන්ම ආපසු යාම අනතුරුදායකය. කිකි නැඟූ ශබ්ද අසා බියපත්ව දිව ගිය සෙබළුන් තවත් පිරිස් කැඳවාගෙන ආපසු පැමිණෙන බව නිසැකය.

''බිත්තියේම කොටසක් වගේ පෙනෙන විදියට ඉදි කර තිබුණු අර දොරෙන් අපි මෙතැනට ආවා. සිටුවරයා රඳවා තිබෙන කාමරයට ඇර වෙන තැනකට මේ මග ඔස්සේ යන්න පුළුවන් ඇති සමහර විට'' බිල් රොනිට පැවසුවේය.

''අපි ගිහින් සිටුවරයාගෙන් අහමු'' රොනී අලුත් යෝජනාවක් ඉදිරිපත් කළේය. ''මේ රිවෝල්වරය එයාගේ ඉළ ඇට වලට තද කරලා බලමු එයා කතා කරයි ද කියලා. මේක එයාගේම රිවෝල්වරය''

බිල් සිනාසුණේය. ''ඔයාට ඕක අවශ්‍ය වෙන්නෙ නැහැ. රජතුමා දැක්ක ගමන් එයා කතා කරාවි. රජතුමනි, මම හිතන්නේ ඔබතුමාට පුළුවන් වේවි අපට මග පෙන්වන්න කියලා සිටුවරයාට අණ කරන්න''

චතුරව ඉංග්‍රීසි බස කතා කිරීමේ හැකියාව රජතුමා සතු විය. ගුසී මෙන්ම ඔහු ද කුඩා කල අධ්‍යාපනය ලැබීම පිණිස එංගලන්තයට යවා තිබිණි. දිලිසෙන දෑසින් යුතුව රජතුමා එකඟත්වය පළ කරමින් හිස සැලුවේය. සිටුවරයා හා මේ අවස්ථාවේ වචන කිහිපයක් කතා කරන්නට ලැබීම රජතුමාට මහත් සතුටක් වන බව නිසැක විය.

රොනී විසින් සිටුවරයා රඳවා තබනු ලැබූ සිරකුටියක් බඳු කුඩා කුටියට ඔවුහු පිවිසියහ. දෑත් දෙපා බැඳ සිටි සිටුවරයා පොළොව මත වැතිර සිටියේ මහත් කෝපයෙන් යුතුවය. ඔහු රජතුමා දුටු වහා තිගැස්සුණු ආකාරය දුටු බිල් උපහාසාත්මක ආකාරයෙන් සිනාසුණේය.

''එයාගේ කකුල් ලිහන්න රොනී. අත් දෙක ඔහොම්ම තිබුණාවෙ'' බිල් උපදෙස් දුන්නේය. ''ඔහු රජතුමා ඉදිරියේ ආචාරශීලීව සිටගෙන උන්නාවේ.''



පැරිටෝලෙන් සිටුවරයාගේ දෙපා ලෙහා දැමුණු අතර නැගී සිටි ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබිණි. රජතුමා තේජවන්ත ආකාරයෙන් හේසියානු බසින් සිටුවරයාට කතා කළේය. පළමුව මුරණ්ඩු ආකාරයක් පළ කළ ඔහුගේ හිස කෙමෙන් බිමට නැඹුරු විය. අවසානයේ ඔහු මහත් බියෙන් රජතුමා ඉදිරියේ දණින් වැටුණේය. රජතුමා අවඥාවෙන් මෙන් සිය පාදයකින් ඔහු ඉවතට තල්ලු කොට තවත් මොනවාදෝ පැවසුවේය. සිටුවරයා යළිත් නැගී සිට 'අයි! අයි! අයි!' යනුවෙන් මහත් උනන්දුවෙන් පැවසූ අතර ඔහු කිවේ 'ඔව්! ඔව්! ඔව්!' යන්න බව ජැක් වටහා ගත්තේය.

''එයා අපට මාලිගාවෙන් පිටවෙන්න පාර පෙන්වාවි'' බිල් පැවසුවේය. ''ඒක හොඳයි. සෙබළුන් මේ පැත්තට එන හඬ ඇතින් ඇහෙනවා නේද? එයාලා ඇවිත් ඇරුණු සොයිබත් හිස් කාමරයත් සොයා ගනිවි. රොනි සිටුවරයාට කියමු අපිව මෙතැනින් ඉවතට එක්කරගෙන යන්න කියලා''

දෑත් බැඳ තිබියදීම සිටුවරයා කුඩා කාමරයෙන් පිටතට විත් ඊට විරුද්ධ පස වූ දොරකට පයින් ගසා එය විවෘත කළේය. එතැන වූයේ පහළට යොමු වූ පඩි පෙළකි. ''මම මුලින් යන්නම්'' යැයි කී රොනි, සිටුවරයා පසුපසට තල්ලු කළේය.

පඩිපෙළ දිගේ ගිය ඔවුන් ඇතුළු වූයේ දැවයෙන් තැනූ ජනේල සහිත කාමරයකටය. සිටුවරයා සිය හිසින් ජනේල පෙන්වමින් මොන මොනවාදෝ පැවසුවේය. ඉදිරියට ගිය රොනී ජනේලය පහළට ඇද්දේය. මිනිසකුට රිංගා යා හැකි ප්‍රමාණයේ සිදුරක් එතැන තිබිණි. එහෙත් එම සිදුරේ අනෙක් පස ඇති කිසිවක් පෙනුණේ නැත. ඒ එතැන කිසිවක් එල්ලී තිබූ නිසාවෙනි.

''විචිත්‍ර ගෙත්තමක් සහිත රෙද්දක්'' එල්ලා තිබූ දෙය ස්පර්ශ කළ බිල් පැවසුවේය. ''හොඳයි.. හොඳයි. මෙහේ බිත්තිවල සිදුරු රහස් දොරවල්, උමං මාර්ග පිරිලා වගේ සිටුතුමා. හොඳයි. හොඳයි. ඊළඟට අපි මොකද කරන්නේ? මොනවාද මේ විචිත්‍ර ගෙත්තමෙන් එහා පැත්තේ තියෙන්නේ?''

''එහා පැත්තේ තියෙන්නේ නිදන කාමරයක් කියා සිටුවරයා කියනවා'' රොනී පැවසුවේය. ''මේ සිත්තම පිටුපසින් ගියොත් අපට විවෘත තැනක් හමු වේවිලු. මම ගිහිං බලන්නම්''

සිදුරෙන් ඇතුළු වූ රොනල්ඩ් සිවිලිමේ සිට පොළෝ මට්ටම දක්වා උස් වූ විචිත්‍ර ගෙත්තම පසුපසින් මඳ දුරක් ගමන් කළේය. ගෙත්තම් දෙකක් අතර විවෘත තැනක් ඔහුට හමු විය. ඒ ඉඩෙන් හිස පෙවූ ඔහු දුටුවේ සුව පහසු ගෘහ භාණ්ඩ සහිත නිදන කාමරයකි. විදුලි පන්දම දල්වා පිරික්සූ ඔහුට පෙනුණේ කාමරයේ කිසිවකුත් නැති බවය.

අනෙක් අය ද විචිත්‍ර ගෙත්තම පසු පසින් පැමිණ කාමරයට ඇතුළු වූහ. ජැක් කිවිසුම් ඇරියේ ගෙත්තම පසුපස දූවිලි පිරී තිබූ බැවිනි. කිකී ද කිවිසුම් ඇරියේ සිටුවරයා විමතියට පත් කරවමිනි. ඔහුට ඊට පෙර කිසිම අවස්ථාවක කිකී මුණගැසී තිබුණේ නැත.

''දැන් කොහාටද?'' රිවෝල්වරය සිටුවරයාගේ සිරුරට තද කරමින් රොනල්ඩ් විමසුවේය. සිටුවරයා බියෙන් ඉවතට පැන්නේය.

''රිවෝල්වරය ඕනෙ කියලා මම හිතන්නේ නැහැ'' බිල් පැවසුවේ උපහාසයෙන් සිනාසෙමිනි.

''අවශ්‍ය නම් නැහැ තමයි. ඒත් මේ වගේ දෙපැත්ත කෑ ද්‍රෝහියකුට එහෙම කරන එක මට සතුටක්'' රොනී පැවසුවේය. ''බලය තියෙන කොට සීමාවක් නැතුව අනෙක් අයට තර්ජනය කළ උදවිය ඒ බලය නැතිවුණාට පස්සෙ මේ රිවෝල්වරයට සැහෙන්න බය වෙනවා. දැන් සිටුතුමා කරුණාකරලා කෙටිම ඉක්මන්ම මාර්ගය අපට පෙන්නමු''

රොනී අවසන් වැකිය පැවසුවේ හේසියානු භාෂාවෙනි. සිටුවරයා වහා වෙව්ලන ස්වරයෙන් රොනල්ඩ්ට බැගෑපත් වෙමින් පිළිතුරු දුන්නේය.

''දැන් ලේසියි'' රොනී පැවසුවේය. ''අපට පහළ මහලට ගියාම හම්බ වෙන්නේ මුළුතැන්ගෙයලු. එතැනින් මාලිගාවේ පසුපස දොර හමුවනවාලු. බලමු මෙයා කියන තරමටම ලේසි ද කියලා''

පඩි පෙළක් බැස ගිය ඔවුනට විශාල මුළුතැන්ගෙය හමු විය. බිල්ගේ විදුලි පන්දම් එළි වැදී දිලිසුණේ එහි සිටි බළලුන් තිදෙනකුගේ ඇස්ය. කිකී බල්ලකු මෙන් ගෙරවූ වහා බළල්ලු සී සී කඩ දිව ගියහ.



බිල් මුළුතැන්ගෙයි වූ විශාල දොර විවෘත කළේය. ඔවුන් පිවිසියේ මාලිගය පසුපස මිදුලටය. මිදුල කෙළවර විශාල යකඩ ගේට්ටුවක් තිබූ අතර එහි අගුළු අරින යතුර ද ගේට්ටුව පසෙක එල්ලා තිබිණි. ගේට්ටුව විවෘත කළ බිල් අනෙක් අය ද සමඟ පිවිසියේ බෝර්කෙන් හි මහා මාර්ගයටය.

''එතකොට අපි වෑන් එක නවත්වලා ආවෙ කොහෙද?'' බිල් විමසුවේය. ''ජැක් ඔයාට පුළුවනිද රොනී එක්ක ගිහිං වෑන් එක අරං එන්න. අපි මෙතැනම ඉන්නම්''

ජැක් රොනී සමඟ ගමන් කළේය. එම මාවතේ තිහිප වතාවක් ඇවිද තිබූ බැවින් ජැක්ට වෑන් රිය නතර කර තැබූ ස්ථානයට යාම පහසු කරුණක් විය. රොනී රථය පණගන්වා ගත්තේය.

ඉක්මනින්ම අනෙක් තිදෙනා ද රථයට නංවා ගැනිණි. බිල් සිටුවරයා හා ජැක් වෙළෙඳ භාණ්ඩ සහිත වෑන් රියේ පසුපස සිටි අතර රජතුමා රිය පැද වූ රොනී අසලින් අසුන් ගත්තේය. වෑන් රථයේ පසුපස කොටසේ හිඳගෙන ගමන් කිරීම පහසු නොවූවත් දුර්මුඛව සිටි සිටුවරයා එය ගණනකට නොගත් බව පෙනිණි.

''කොහාටද අපි මේ යන්නෙ? සර්කස් කණ්ඩායම ඉන්න තැනට නොවෙයි නේද?'' හදිසියේ ජැක් විමසුවේය.

''නැහැ. අපි කෙළින්ම ටෞරි-හේසියාවේ අගනුවරට යමු ජැක්'' බිල් පැවසුවේය. ''පුළුවන් තරම් ඉක්මනින් රජතුමා අගනුවර ඉන්න ඕනෙ. එහෙම නැත්නං විශාල අවුලක් ඇතිවේවි. වෙන්නේ මොනවාද කියා කවුරුවත් දන්නේ නැහැ. රජතුමා නැහැ. කුමාරයාත් නැහැ. අගමැතිවරයාත් දුර්වලයෙක්''

''ඔව් මට තේරෙනවා'' ජැක් පැවසුවේය. ''ඒත් රජතුමා එහාට ගිය හැටියේ හැමදෙයක්ම හරියාවි''

''ඔව්, රජතුමා එහේ ගිහිං ජනතාව ඇමතුවාට පස්සේ සේරම කලබල ඉවර වේවි'' බිල් පැවසුවේය. ''ජනතාවට කියන්න දැන් රජතුමාට හොඳ කතාවක් තියෙනවා. මම හිතන්නේ අපේ ගුසී මාලිගාවට පැමිණීමත් අත්‍යවශ්‍ය වේවි. එතකොට ජනතාව දැන ගන්නවා ගුසී හා ඔහුගේ බාප්පා කරදරයක් නැතිව ඉන්නවා කියලා''

''ගුසී ඒකට හුඟාක් කැමති වේවි'' ජැක් පැවසුවේය. ''එයාව එක්කරගෙන එන්න අපි යනවාද?''

''ඔව්. යමු'' බිල් කිවේය. ''අනෙක් අයවත් එක්කරගෙන එන්න එපායැ. ගුසිව බේරාගත්ත මිත්‍රයන්ව දකින්න රජතුමා හුඟාක් කැමති වේවි. එයාලාගේ කතාව අහන්නත් එතුමා කැමති වේවි''

බිල් රජතුමාට පැවසූ කතාව ඇසීමෙන් පසු ගුසීගේ මිතුරන් දැන හඳුනා ගන්නට රජතුමාට අවශ්‍ය වී තිබිණි. එම කතාව කියා අවසන් වන විට ඔවුහු රජ මාලිගාවට ළංව සිටියහ. රාජකාරියේ නියැළී සිටි සේවකයෝ කිහිප දෙනෙක් විමතියෙන් එනමුත් මහත් සතුටින් රජතුමා පිළිගත්හ. රජතුමා කුඩා කාමරයකට ඇතුළු වූයේ බිල්, රොනී හා ජැක් සමඟිනි. සිටුවරයා සොල්දාදුවන් අට දෙනකුගේ රැකවල් මැද සිරමැදිරියකට ගෙන යනු ලැබිණි.

''වම දකුණ, වම දකුණ'' සෙබළුන් මැද සිටුවරයා හිස බිමට නැඹුරු කරගෙන ගමන් කරනු දුටු කිකී කෑ ගැසුවේය. ''රජතුමා සැරදේවා!''

තව දුරටත් අඳුර පැවති අතර හිරු උදාවන්නට පැයක පමණ කාලයක් තිබිණි.

''රජතුමා උදෙන්ම එතුමාගේ තිල රථය අනෙක් අයව මෙහාට එක්කරගෙන එන්න යවනවා. ඔයාටත් ලස්සනට ඉන්න ඕනෙ නම් ජැක් ඔයාට ගුසීගේ ඇඳුම් කිහිපයක් දෙන්නම් කියා රජතුමා කියනවා. අනෙක් අයට වගේම ගුසීටත් ඇඳුම් යැවෙනවා'' බිල් කීවේය. ''එහෙම නැතිව ගැහැනු ළමයෙක් වගේ ඇඳගෙන මාලිගාවට එන්න ගුසී කැමති වෙන එකක් නැහැ''

''ඒක ඇත්ත'' ජැක් ඇණුමක් යැවීය. ''මට නිදිමතයි. ඔයා මොකක්ද කරන්න යන්නෙ බිල්? නිදාගන්නවාද?''

''නෑ. මම ඔයාගේ ඇලී නැන්දාට ගුවන් විදුලි පණිවිඩයක් යවන්න ඕනෙ. අපි සේරම සනීපෙන් බවත් හෙටම අපි මෙහෙන් පිටවෙන බවත් එයාට කියන්න ඕනෙ''

ජැක් අසල වූ සෝපාවක් මත වැතිරුණේය. ඔහුට තවත් එක මොහොතක හෝ අවදිව සිටීමට අපහසු විය. ''හොඳ බිල්'' ඔහු කීවේය. ''ඔයා ආ ගමන් සේරම ප්‍රශ්න ඉවරයි. සුබ උදෑසනක්... අහ්. මම කීවේ සුබ රාත්‍රියක් කියලා''

ඊළඟ තත්පරයේ ඔහු තද නින්දකට පිවිස සිටියේය.

# 30. රජතුමා සැරදේවා !

අවදි වූ වහා ජැක් දුටුවේ තමා වෙත උදෑසන ආහාර අරගෙන පැමිණ සිටින රූමත් ටෞරි-තේසියානු සේවිකාවකි. කිසිවකු ඔහුගේ ඇඳුම් ගලවා සිල්ක් පිජාමාවක් ඇන්දවා ඔහු සුඛෝපභෝගී යහනක් මත සතපවා තිබිණි. ඔහු විමතියට පත් විය.

''පුදුමයි. මේ සේරම කරන තුරු මට ඇහැරිලා නැහැනෙ'' ඔහු සිතුවේය. ''සැහෙන මහන්සියකින් මම ඉන්න ඇත්තෙ. ෂාහ්... ඉස්තරම් උදෑසන ආහාර වේලක්. කිකී. මේ බලන්න. මම මෙතෙක් දැක්ක ලොකුම මිදි පොකුර. එකක් නෙවෙයි දෙකක්ම. මන්න ඔයාට එක මිදි පොකුරක්''

කිකී කොහොමටත් මිදිවලට මහත් කැමැත්තක් දක්වූයේය. උදෑසන ආහාර නිහඬවම ඌ මිදි රස බලන්නට පටන් ගත්තේය. උදෑසන ආහාර ගෙන යළි යහන මත වැතිරුණු ජැක් පෙරදා රැයේ සිදුවීම් නැවත සිහියට නඟා ගත්තේය.

''මට විශ්වාසයි සිටුවරයාට ලැබුණු උදෑසන ආහාර වේල නං කමකට නැතුව ඇති කියලා'' ජැක් කිකීට පැවසුවේය. ''මොනවද ඔයා හිතන්නේ?''

''දොස්තරට හෙම්බිරිස්සාව. රජතුමා එක්කරගෙන එන්න'' පවසමින් කිකී බැලුවේ ජැක් මිදි ගෙඩි කිහිපයක් ඉතිරි කර ඇත් ද කියාය.

''එකයි... දෙකයි... හොඳයි''

''මේ බලන්න කිකී කුමාරයාගේ ඇඳුම් මට අන්දලා'' ජැක් පැවසුවේය. ''හේසියන්ස්ලා දන්නෙ නැද්ද මම රජකුමාරයෙක් නෙවෙයි කියලා''

බිල් කාමරයට පිවිසියේය. ''ඔහ්. ඔයා අවදිවෙලා. ඔයා උදෑසන ආහාර සම්පූර්ණයෙන්ම ඉවර කරලා''

''ඒකට කිකීත් මට උදව් කළා'' ජැක් සිනාසෙමින් පැවසුවේය. ''අනික් අයව එක්කරගෙන එන්න වාහන යැව්වාද බිල්?''

''ඔව්. මං ආසයි එයාලා හොඳින් ඇඳපැළඳගෙන රජතුමාගේ නිල රථයෙන් මෙහාට එන හැටි බලන්න'' බිල් පැවසුවේය. ''රජතුමා බොහොම හොඳ හිතක් තියෙන කෙනෙක්. පෙඩ්රෝ, ටෝනි, බින්ගෝ වගේම පෙඩ්රෝගේ අම්මාත් මාලිගාවට කැඳවාගෙන එන්න කියා එතුමා අණ කළා. ඒ අයටත් ඇඳුම් යැව්වා''

''අපොයි දෙවියනේ'' ජැක්ට ඉබේටම කියැවිණි. '' 'මා' එයා රජ මාලිගාවට එන එක එයාගේ ජීවිතේටම අමතක නොවන සිද්ධියක් වේවි. එහෙම නං අද බොහොම සතුටුදායක දවසක් වේවි''

''ඔව්, අපි අද මෙහෙන් යන්නෙ නැහැ. ඒ වෙනුවට නැන්දා මෙහාට එනවා''

''ෂා... එහෙම නං ඉස්තරම්ම අවසානයක්. නාට්‍යයක වගේ අවසානයේ හැමෝම වේදිකාව උඩ''

''ඔයා නැඟිටින එක හොඳයි ජැක්'' බිල් පැවසුවේය. ''අද දවල් දොළහට රජතුමා ජනතාව අමතනවා. දැන් වෙලාව එකොළහයි. ඊට පස්සේ රාජකීය දිවා භෝජන සංග්‍රහයක්. ඔයා උදේට කාලා බඩ පුරවා ගන්න කලින් ඒ ගැන කියන්න බැරි වුණාට කනගාටුයි''

ජැක් වහා ඇඳෙන් බිමට පැන්නේය. ''එකොළහත් වෙලාද? ලෑස්ති වෙන්න පුළුවන් වේවි ද මන්දා? මම දන්නෙ නැහැ මේ ඇඳුම කොහොම අඳින්නද කියලා. බොත්තම්... පටි... බකල්... මගෙ අම්මේ. මේක රාජකීය ඇඳුමක් ද?''



''අපොයි නෑ. ටෞරි-හේසියාවේ උත්සව අවස්ථාවන්ට අඳින ඇඳුමක්'' ජැක් පැවසුවේය. ''මටවත් රොනල්ඩ්ටවත් ඕවා ගැළපෙන්නෙ නැහැ. ඒත් ඔයාලට ඕවා ලස්සනයි. අපි දෙන්නා අපේ ඇඳුම්ම අඳින්න තීරණය කළා''

එකොළහයි හතළිස් පහ වන විට ජැක් සූදානම්ව සිටියේය. ඔහු කැඩපතක් ඉදිරියේ සිටගෙන හැඩ බැලුවේය. ''නියමයි... මම හරියට නාට්‍යයක රජ කුමාරයෙක් වගේ. මේ ඇඳුමෙන් මගේ පින්තූරයක් අරගන්න ඕනෙ ඉස්කෝලෙ ගියාම යාළුවන්ට පෙන්නන්න. එයාලා පුදුම වේවි''

හදිසියේම මාලිගය පහළ මාර්ගය දෙසින් ජය ඝෝෂාවක් නැඟිණි. ජැක් ජනේලය ඇර පිටත බැලුවේය. කිකී ද මහ හඬින් කෑ ගැහුවේය.

''බලන්න. කිකී... ඔයා දැක්ක ද පළවෙනි කාරෙකේ කවුද ඉන්නෙ කියලා'' ජැක් කෑ ගැසුවේය. ''ලූසි-ඈන්, පිලිප්, ගුසී එක්ක ඩිනා. එයාලා ඒ තරං ලස්සනට ඇඳලා ඉන්නවා ඔයා මීට කලින් දැකලා තියෙනවාද? අර දෙවෙනි කාර් එකේ... මා, පෙඩ්රෝ, ටෝනි, බින්ගෝ.... එයාලත් ලස්සනට ඇඳලා''

එය සත්‍යයකි. සිව් දෙනා අතරින් වඩාත් හැඩ වැඩ වී සිටියේ 'මා' ය. තම මව සේද රෙදිවලින් මැසූ අලංකාර දිගු ගවුමකින් සැරසී රාජකීය රථයේ ගමන් කිරීම පෙඩ්රෝට මහත් සතුටක් දනවන කාරණයක් විය.

පෙඩ්රෝ ද හොඳින් ඇඳ පැළඳ මහත් සතුටින් පසු වූයේය. මෙවන් අත්දැකීමක් යළි තම ජීවිත කාලය පුරා ලබන්නට නොහැකි බැවින් මේ අවස්ථාවේ හැම තත්පරයක්ම රස විඳින්නට ඔහු ඉටාගෙන සිටියේය.

ටෝනි හා බින්ගෝ හොඳින් ඇඳ පැළඳ නිහඬව සිටියහ. ඔවුන් කිසි දිනෙක මේ සර්කස් කඹය මත දක්කම් පාන විට පවා ඔවුන් කිසි දිනෙක මේ තරම් අපහසුවකට කලබලයකට පත් වී නැත. රථ පෙළ ගේට්ටුවෙන් ඇතුළු වෙද්දී කවුළුවෙන් හිස පිටතට දමා ජැක් කෑ ගැසුවේ තමන් මේ සිටින්නේ රජ මාලිගයේය යන්න පවා අමතක කරමිනි.

''ලූසි-ඈන් මම මෙහේ''

කිකී ද කෑ ගැසුවේය. ''හිපිප් හුරේ. දොස්තර එක්කරගෙන එන්න''

දහවල් දොළහේ හෝරාව එළැඹිණි. රජතුමා මාලිගයේ සඳලුතලයට පිවිසියේ මහජනතාවගේ ප්‍රීතිඝෝෂා මධ්‍යයේය. සිදු වූ සියල්ල ජනතාවට පැහැදිලි කර දීමේ අරමුණ ඇතිව එතුමන් ජනතාව ඇමතීම ආරම්භ කරද්දී හාත්පස පැතිර ගියේ දැඩි නිහැඬියාවකි.

ටෞරි-හේසියාවට සිටින්නේ ඉතා ගුණ යහපත් රජ කෙනෙකැයි බිල් සිතුවේය. එතුමන් බලයෙන් පහකොට ගුසී සිහසුනට නැංවීමට සිටුවරයා ඇතුළු පිරිස කළ කුමන්ත්‍රණය සාර්ථක නොවීම ගැන ද බිල් සතුටට පත්ව සිටියේය. ගුසී තවමත් කුඩා ළමයෙකි. තම බාප්පා මෙන් ගුණ යහපත් පාලකයකු වන්නට නම් ගුසී තව දුරටත් හොඳ අධ්‍යාපනයක් ලැබිය යුතුය.

රජතුමා ගුසී තමා අසලට කැඳවා ජනතාවට ඔහු දැක්වූයේය. දින කිහිපයක් තිස්සේ අවිනිශ්චිත භාවයක පසු වූ ජනතාව රජතුමා මෙන්ම කුමාරයා ද හොඳින් සිටිනු දැක මහත් ප්‍රමෝදයට පත් වූහ.

පරිපූර්ණ රජ කුමරකු සේ පෙනුණු ගුස්ටාව් ජනතාව ජයගොස නඟන විට සැම අතට හැරී හිස නමමින් ජනතාවට ආචාර කළේය. ඉතා වටිනා ඇඳුමකින් සැරසී සිටි ඔහුගේ ලෝගුව සුළඟේ සැලිණි. ජැක්ට සිනා ගියේ ඔහු අවසන් වතාවට දකින විට ගුසී ගැහැනු ළමයෙකු ලෙස සැරසී සිටි ආකාරය සිහිවීම නිසාවෙනි.

රජතුමා ජනතාව අමතා අවසන් වීමෙන් අනතුරුව රාජකීය දිවා භෝජන සංග්‍රහය ආරම්භ කෙරිණි. ගුසී, පෙඩ්රෝ, පිලිප් ඇතුළු ළමයි එක මේසයක් වටා වාඩි වී සිටියහ. 'මා' ටෝනි හා බින්ගෝ හිඳගෙන සිටියේ තවත් මේසයක් වටාය. අනෙක් අවස්ථාවලදී අතින් අනා අහර ගැනීම ප්‍රිය කළ ඔවුහු එදින විනීත ලෙස හැඳි ගෑරුප්පු පාවිච්චි කරමින් ආහාර ගත්හ.

ළමයි සයදෙනා මහත් වුවමනාවෙන් එකිනෙකා හා කතා බස් කරමින් තම තමන් මුහුණ දුන් සිදුවීම් ගැන විස්තර කළහ.

''ෆැන්ක්ට දූන් සතිපයි'' පිලිප් පැවසුවේය. ''එහෙම නොවුණා නම් අර වලසුන් තනි කරලා මං කොහොම එන්නද? හලෝ....



ස්තූසි. අන්තිමේ ඔයාටත් අපට එකතු වෙන්න හිතුණද? මෙයා ඇවිත් තියෙන්නේ ආමන්ඩ් සුවඳ දැනිලා. ඩිනා මේ බලන්න''

''එයා මෙතෙන්ට ආ එක ගැන නම් මම සතුටු නැහැ'' ඩිනා පැවසුවාය. ඒ සමඟම ජැක් වෙත හැරුණු ඇය විස්තර කළේ ඇඳුම් පැළඳුම් ද රැගෙන රාජකීය නිල රථ පැමිණ තමන් ඇතුළු පිරිස රජ මාලිගයට කැඳවන බව දැනගත් විට තමන්ට දැනුණු සතුට ගැනය.

''අපට ඒක විශ්වාස කරන්නත් බැරි වුණා'' ඇය පැවසුවාය. ''ඊයේ රෑ වෙච්ච දේවල් අපට විස්තර ඇතිව කියන්න ජැක්. ඔයාලා කොහොමද රජතුමා බේරාගෙන සිටුවරයා අල්ලා ගත්තේ?''

ගුසී ද සතුටින් පසු වූ අතර ඒ බව ඔහුගේ දිලිසෙන දෑසින් පැහැදිලි විය. ඔහු වැඩිපුර කතා කළේය. දැන් ඔහු කිරුළ හිමි රජ කුමරෙකි. අලොයිසියස් ග්‍රාමොන්ඩ් කුමරා දිගු හිසකේ සහිත පිරිමි ළමයෙකි.

''ආං.... ඇලි නැන්දා'' ලුසි-ඈන් එකවර කෑ ගැසුවාය. පුටුව පස්සට කළ ඇය, තමා වඩාත් ආදරය කරන නැනැත්තිය ආදරයෙන් පිළිගැනීම හැර වෙනත් දෙයක් නොසිතා භෝජන සංග්‍රහය පැවැති ශාලාව හරහා දිව ගියාය. ''ඇලි නැන්දේ... ඔයා ඇවිදින්''

සේවකයන් දෙදෙනකු විසින් කනිංහැම් මහත්මිය එම ශාලාවට කැඳවාගෙන එනු ලැබ තිබිණි. බිල් ද ඇය වෙත දිව ආවේය. ඩිනා, පිලිප් හා ජැක් ද ඇය වෙත දිව ආහ.

තම බිරිය රජතුමාට හඳුන්වාදෙනු පිණිස කැඳවාගෙන යන අතරතුර බිල්ගේ දෑස් කඳුළින් තෙත් වී තිබිණි. රජතුමා අසලින්ම ඇයට ද කෑම මේසයේ අසුනක් වෙන්ව තිබුණේ කිසියම් මොහොතක ඇය එංගලන්තයේ සිට ටෞරි-හේසියාවට ළඟා වන බව සියලු දෙනාම දැන සිටි හෙයිනි. ඇය වික්ෂිප්ත භාවයට පත්ව සිටියාය. ඒ ඇය සිදු වූ සියල්ල දැන නොසිටි නිසාවෙනි.

අනෙක් අය කනිංහැම් මහත්මිය හා කතාබස් කර ඇය පිළිගෙන අවසන් වෙද්දී එතැනට සෙමෙන් ඇවිද ආවේ ගුසීය. ඇය ඔහු වෙත සුරත දිගු කළාය. ඔහු නැමී ඇගේ අත සිප ගත්තේය. එය ටෞරි-හේසියානු සිරිත බව දැන සිටි හෙයින් කිසිම ළමයෙක් සිනා නැගුවේ නැත.

දිවා භෝජන සංග්‍රහයෙන් අනතුරුව ළමයි මාලිගය නරඹමින් සැමතැන ඇවිද්දාහ.

''ඔයාට ඔයාගේ නිවාඩුවේ ඉතිරිය මේ මාලිගාවේම ගත කරන්න ලැබීම වාසනාවක්'' ජැක් පැවසුවේය. ''මෙතැන ඉතා හොඳ සුන්දර තැනක්. ඒ වුණාට මම මෙහේ ජීවත් වෙන්න නම් කැමති නැහැ. දවස් දෙක තුනක් නැත්නං සතියක් දෙකක් ඉන්නවා මිස''

''අපට ඔයාව දාලා යන්න වෙනවා ගුසී'' ලුසී-ඈන් පැවසුවේ ශෝකී ස්වරයෙනි. ''මං හිතන්නේ අපි හෙට අනිද්දාට මෙහෙන් පිට වෙලා යනවා. මේ වික්‍රමය අවසන් වීමත් කනගාටුවට කාරණයක්''

''ඔයා හිතන විදියට නෙවෙයි සිද්ධ වෙන්නේ'' ගුසී පැවසුවේ දඟකාරයකු මෙන් දෑස නටවමිනි. ''මම බාප්පාගෙන් ඇහුවා ඔයාලා මගේ අමුත්තන් හැටියට මාලිගාවේ නවත්තාගන්න ද කියලා. ඔයාලා නවතිනවා නේද? එහෙම නැත්නං මුලදී වගේම තවමත් ඔයාලා මට අකමැතිද? ඒ දවස්වල ඔයාලා නිතර මට කොලොප්පං කළා''

''ඔහ්. ගුසී. අපි කොලොප්පං කළා කියන්නේ ඔයාට අකමැති වුණා කියන එක නෙවෙයි'' ලුසී-ඈන් පැවසුවාය. ''ඔයා කියන්නේ ඔයාගේ බාප්පා අපිව මාලිගාවේ නවත්තාගන්න කැමතියි කියලාද? අපි හැමෝවම? ඔන්න බිල් ඇලී නැන්දා එක්ක යනවා නම් මම මෙහේ ඉන්න කැමති නැහැ''

''මය හැමෝම නතර වෙනවා'' ගුසී පැවසුවේ සිනාසෙමිනි. ''කිකී, ස්නූසි දෙන්නාත් ඉන්නවා. ඒත් පෙඩ්රෝ අනෙක් අය එක්ක යනවාලු. එයාලට ඉක්මනටම ආයෙත් සර්කස් දර්ශන පවත්වන්න ඕනෙලු. නිවාඩුව ඉවර වෙලා මාත් ඉස්කෝලේ යන්න මෙහෙන් පිටවෙන තුරුම ඔයාලාත් මෙහේ ඉන්නවා''

''ෂාහ්... අපි ඒකට කැමතියි'' ජැක් පැවසුවේය. ''ඒ කියන්නේ අපට තව සති කිහිපයක් මේ මාලිගාවේ ඉන්න පුළුවනි. මම ඉස්කෝලෙ මගේ යාළුවන්ට පෙන්නන්න ගෙනියන්න පින්තූර ටිකක් ගන්නත් ඕනෙ. එහෙම නැත්නං එයාලා හිතාවි මම කියන්නේ සුරංගනා කතාවක් කියලා''



''එදින සන්ධ්‍යාවේ පෙඩ්රෝ, 'මා' ටෝනි සහ බින්ගෝ ළමයින් පස්දෙනාගෙන් සමුගත්හ. ඔවුන් තව දුරටත් ඇඳ සිටියේ මාලිගයෙන් ඔවුන් වෙත යවා තිබූ හොඳම ඇඳුම් පැළඳුම්ය.

''අපට මේ ඇඳුම් තියාගන්න කීවා'' පෙඩ්රෝ පැවසුවේය. ''මං ආසයි මේ ඇඳුම් ඇඳගෙන සර්කස් ඉදිරිපත් කරන්න. කඹය මත ඇවිදින ශ්‍රේෂ්ඨ ටෝනි හා බින්ගෝ.... මේ විස්මයජනක පෙඩ්රෝ''

ඔහු හිස පහළට නැමුවේය. 'මා' ඔහුගේ තට්ටමට පහරක් දුන්නාය. ''මොනවා වුණත් ඔයා අද රෑට මට අර්තාපල් සුද්ද කරලා දෙන්න ඕනෙ'' ඇය මහ හඬින් සිනාසෙමින් පැවසුවාය. කිකී වහා ඒ සිනහව අනුකරණය කළේය.

සර්කස් කණ්ඩායමේ සාමාජිකයන් තමන්ගෙන් සමුගැන්ම ළමයින්ට ශෝකයක් විය. ඔවුහු ඒ ළමයින්ගේ සැබෑ මිතුරෝ වූහ. ''මට හිතෙනවා ආයෙත් දවසක අපට එයාලව මුණ ගැහේවි කියලා'' ලුසී-ඈන් පැවසුවාය. ''මං එයාලාට හුඟක් කැමතියි''

''ඔයාලා දූන් බාප්පා ළඟට ඇවිත් කරුණාකරලා කියනවාද ඔයාලා නිවාඩුවට මෙහේ නතර වෙනවා කියලා'' ගුසී ආයාචනාත්මක ස්වරයෙන් පැවසුවේ ඔවුන් අදහස වෙනස්කර ගනීවි යි සැකයෙන් මෙනි. ''අනික මට එයාගෙන් යමක් අහන්නත් තියෙනවා. ඒකට මට ඔයාලගේ උදව් ඕනෙ''

ඔවුහු රජතුමාගේ කුටියට ඇතුළු වී ශිෂ්ට සම්පන්න ලෙස ආචාර කළහ. ''හොඳයි අලොයිසියස්'' රජතුමා කාරුණික ස්වරයෙන් විමසුවේය. ''නිවාඩුවේ ඉතිරිය මාලිගාවේම ගත කරන්න ඔයා ඔයාගේ යාළුවන් කැමති කරවා ගත්තාද?''

''එයාලා නතර වේවි'' ගුසී පැවසුවේය. ''තව දෙයක් ඔබතුමාගෙන් ඉල්ලන්න තියෙනවා. ඒක කොයිතරම් වැදගත් ද කියලා මේ අය ඔබතුමාට කියාවි. මට ඒකට ඔබතුමා අවසර දෙනවාද?''

''ඔබ අවසර ඉල්ලන්නේ මොකටද කියා මුලින්ම කියන්න''

''මගේ කොණ්ඩය'' ගුසී පැවසුවේය. ''මට කොණ්ඩය කොටට කපන්න ඕනෙ. මේ ජැක්ගේ පිලිප්ගේ වගේ. මට ගැහැනු ළමයෙක් වගේ ඉන්න බැහැ.''

''නැහැ. ඔයාට හිසකේ කොටට කපන්න දෙන්න බැහැ'' ගුසීගේ බාප්පා පැවසුවේය. ''ඒත් ඔයා ඒ ගැන හිතන හැටි මම දන්නවා. මං පුංචි කාලෙ මාත් එංගලන්තයේ ඉගෙන ගන්න ගියාම ඔය ප්‍රශ්නයට මුහුණ දුන්නා. කොහොම වුණත් මං ඔයාට කොණ්ඩය කොටට කපන්න අවසර දෙන්නම්''

ගුසීගේ මුහුණේ ඇඳී ගියේ පුළුල් සිනහවකි. ''මම හෙටම යනවා'' ඔහු පැවසුවේය. ''හෙට උදේ හතට යනවා. ගිහිං ආයෙ කවදාවත් රිබන්වලින් බඳින්න බැරි වෙන්න මම කොණ්ඩය කොටට කප්පවා ගන්නවා''

''අපට නිවාඩුව මෙහේ ගත කරන්න කියා ආරාධනා කිරීම ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා'' ජැක් කීවේ අනෙක් ළමයින් වෙනුවෙන් ද කතා කරමිනි. ''අපි ඒකට කැමතියි. ගුසීත් අපව නවත්තා ගන්න සිතීම ගැන සතුටුයි''

''ෆූසි - ගුසී'' කිකී කෑ ගැසුවේ අවස්ථාවට නොගැළපෙන දෙයක් පවසමිනි. ''ෆූසි - ගුසී. රජතුමනි, රජතුමනි. දොස්තර කැඳවන්න. නාසය පිසදා ගන්න''

''කිකී'' ජැක් තම ගිරවාට සැර කළේය.

කිකී රජතුමා දෙස බලා හිස ඉහළට ඔසවා යළි පහත් කළේ රජතුමාට ආචාර කරනවාක් මෙනි. ''අතිගරු රජතුමා'' ඔහු කීවේය. ''රජතුමා සැරදේවා!''

- සමාප්තයි -